
කොවිඩ් ව්‍යාප්තිය
ප්‍රතිකාර ලබන පිරිස 2,967




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின



කාලයේ ඔබ්බට දොරටුව
ද්වාර අද පත්‍රය සමග

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බක් පුර පැළවිය ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 100 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 12 සඳුදා


# කොවිඩ් බලපෑමට ලක් වූ පවුල්වලට රු. 5000ක අවුරුදු දීමනාව අද සිට

## රජය තීරණය කරයි

මහින්ද අලුත්ගෙදර

කොවිඩ්-19 ව්‍යසනකාරි තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව සමයේදී රුපියල් 5000ක දීමනාවක් පිරිනැමීමට රජය තීරණය කර තිබේ.

පිට 06

# කෘෂි අමාත්‍යාංශය තිබූ ගොඩනැගිල්ලෙන් ඉවත් කර ගැනීමට බාධා

## පසුගිය වසර 5ට කෝටි 189ක් බදු ගෙවලා

ධනුෂ්ක ගොඩකුඹුර

යහපාලන ආණ්ඩු සමයේ රාජගිරියේ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙන ගිය කෘෂිකර්ම අමාත්‍යාංශය නැවතත් 'ගොවිජන මන්දිරය' වෙත ගෙන යෑමේ කාර්යයට ගොඩනැගිල්ල හිමි පෞද්ගලික සමාගමේ කළමනාකාරිත්වය බාධා සිදු කරන බව වාර්තා වේ.

පිට 06

# ජනවාරියේ සිට මේ දක්වා 580ක් රිය අනතුරුවලින් මිය ගිහින්

රක්ෂණ ශ්‍රියන්ත

දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු වූ රිය අනතුරුවලින් පුද්ගලයන් 580ක් ජනවාරි 01 සිට මේ දක්වා මිය ගොස් ඇති බව පොලිසිය පවසයි.

පිට 06

# 'ගම සමඟ පිළිසඳර' බල ගැන්වීමට ජනාධිපති කාර්යසාධක බළකායක්

නුවන් කොඩිකාර

'ගම සමග පිළිසඳර' ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් යුතු 'ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්යසාධක බළකායක්,' පත් කර තිබේ.

පිට 06


Cargills rewards

කාගිල්ස් රිවෝඩ්ස් සාමාජිකයන් සඳහා විශේෂ දීමනාව

ඔබේ ඊළඟ මිලදී ගැනීමට රු.250ක වට්ටම් වවුචර් පතක්

රු. 2,500ට වැඩි වටිනාකමකින් යුත් බිල්පත් සඳහා 2021 අප්‍රේල් මස 12 සිට 22 වනදා දක්වා වවුචර් පත් නිකුත් කෙරේ.

මෙම වවුචර් පත් භාවිත කළ හැකි වන්නේ 2021 අප්‍රේල් මස 23 සිට 30 වනදා දක්වා රු. 2,500ට වැඩි වටිනාකමකින් යුත් බිල්පත් සඳහාය.

කොන්දේසි සහිතයි.
කාගිල්ස් රිවෝඩ්ස් සාමාජිකයන් සඳහා පමණයි.
දීමනා කාලය තුළ එක් පාරිභෝගිකයකුට හිමි වන්නේ එක් වවුචරයක් පමණයි.

Cargills food city
ගෙදර යන ගමන්
Cargills SINCE 1844


# පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවන් සෙවීම ආණ්ඩුව අත්හැරලා

පහන් විජේසේකර



යාපනයේ නගරාධිපතිවරයා ත්‍රස්තවාදියකු ලෙස හංවඩු ගසමින් ඊට මුවා වී ආණ්ඩුව පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවන් සෙවීමේ කටයුත්ත අත්හැර තිබෙන බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

පිට 06

# සයුරේ වාර්තා බිඳ ලූ ගුවන් විරුවා



ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නායක ගුවන් භට රොෂාන් අබේසුන්දර මහතා තලෙයිමන්නාරම මුහුදු ප්‍රදේශයේ සිට ඉන්දියාවේ ධනුස්කොඩි දක්වාත් නැවත තලෙයිමන්නාරම් මුහුද දක්වාත් පිහිනා නව ආසියානු වාර්තාවක් පිහිටුවීමට ඊයේ (11) සමත් වූ අතර, එහිදී ඔහු සිය ජයග්‍රහණය වාර්තා කිරීමෙන් පසු සිංහ කොඩිය අත දරා වෙරළේ දී ජය සමරූ අයුරු.

# අද බැංකු නිවාඩු නැහැ

## රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර

රජය අද (12) නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළ ද බැංකු නිවාඩු දිනයක් නොවන බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුම් දෙයි.

පිට 06



# පොල්තෙල් නියැදි 109ක විෂ නැහැ

## පරීක්ෂණවලින් තහවුරු වෙයි

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

වෙළෙඳපොළේ අලෙවියට තබා ඇති පොල්තෙල් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණවලදී නියැදි 109ක ඇෆ්ලටොක්සීන් නමැති විෂ රසායනිකය නැති බව තහවුරු වී තිබේ.

දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි නියැදි 125ක් ලබාගත් අතර එම නියැදි පරීක්ෂණ සඳහා පොල් පර්යේෂණ අංශය වෙත යොමු කරනු ලැබිණි.

පිට 06

# නිරෝධායන රීති කඩ කරන්නන් සෙවීමට විශේෂ මෙහෙයුමක්

පිට 06

# යාපනයේ නගරාධිපති අත්අඩංගුවට ගැනීම හෙළා දකිනවා

ඊපීඩීපීය පවසයි

පිට 06

# අත්අඩංගුවට ගැනීම නීති විරෝධියි

යාපනය නගරාධිපති කියයි

පිට 06


පරිසර අමාත්‍යාංශය

නැකතට පැළයක්



රටට හුස්ම දෙන නැකත

2021 අප්‍රේල් 16
උදෑසන 06.40 ට

ඔබත් පැළයක් සිටුවන්න
නැකතට හුස්මක් එකතු කරන්න රටට

සහයෝගිතා අත්වැල
Dialog



ඉඹුලාන ප්‍රදේශයේ වාර්ෂිකව සිදුකරන අලුත් සහල් මංගල්‍යය මෙවරද ඉකුත් 9 ද උඩපොල ශ්‍රී සපුමල් බණ්ඩාර දේවාලයේ කපු මහතාගේ ප්‍රධානත්වයෙන් ඉඹුලාන වෙල්යායේදී පැවැත්විණි. ග්‍රාමනිලධාරීතුමිය, කෘ.ප.නි.තුමිය ප්‍රජා පොලිස් සංවර්ධන කමිටුව හා ගම්වාසීන්මේ අවස්ථාවට එක්වූ අතර, ඉඹුලාන දුටුගැමුණු වැඩිහිටි සමිතියේ අනුග්‍රහය ලැබිණි.










# ජනපති සිරි ඇලන් මැතිනියාරාමයේ පින්කම් මාලාවක

කිරුළපන සිරි ඇලන් මැතිනියාරාමයේ අභිනවයෙන් ඉදිකළ දාන ශාලාව, ගිනිහල් ගෙය, ආවාස මන්දිරය සහ සක්මන් භාවනා උද්‍යානය විවෘත කිරීම නිමිත්තෙන් ඊයේ (11) දහවල් විහාරස්ථානයේ පැවති දානමය පින්කමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එක්ව සිටි අයුරු.

අමාත්‍ය විශ්‍රාමික රියර් අද්මිරාල්, ආචාර්ය සරත් වීරසේකර, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීමේ කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් ප්‍රනාන්දු, ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න යන මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.



## ප්‍රාදේශීය කොටි නායකගේ නම සඳහන් පුවරුව වහා ඉවත් කරන්න

### ත්‍රස්ත විමර්ශනයෙන් කරච්චි ප්‍රාදේශීය සභාවට නියෝග

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**




එල්ටීටීඊ සංවිධානයේ ප්‍රාදේශීය නායකයකුගේ නමකින් නම් කළ කිලිනොච්චියේ ශාන්තපුරම් ප්‍රදේශයේ මාර්ගයක එම නම ඉවත් කරණ ලෙස කිලිනොච්චිය පොලීසිය කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට දැනුම් දී තිබේ.

එම නමින් මේ මාර්ගය නම් කිරීමෙන් පසුව පොලිස් ත්‍රස්ත මර්දන ඒකකය කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කැඳවා ඔහුගෙන් ඒ පිළිබඳ මීට ඉහතදී ප්‍රශ්න කර ඇත.

මෙහිදී ඔහු පවසා ඇත්තේ 'වෙට්රි' යනු ජයග්‍රහණය යන වචනය බවයි. නමුත් මේ පිළිබඳ පොලිස් ත්‍රස්ත මර්දන ඒකකය කළ සොයා බැලීමකදී හෙළි වී ඇත්තේ ශාන්තපුරම් ප්‍රදේශයේ ඒම මාර්ගයේ සිටි එල්ටීටීඊ ප්‍රාදේශීය නායකයාගේ අන්වර්ථ නාමයද 'වෙට්රි' බවයි.

නැවත වතාවක් කරච්චි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කැඳවා කළ ප්‍රශ්න කිරීමේදී ඔහු ඒ බව පිළිගෙන ඇති අතර, පසුව පොලිස් ත්‍රස්ත මර්දන ඒකකය කිලිනොච්චිය පොලීසියට කළ දැනුම් දීමකට අනුව එම නම ඉවත් කරණ ලෙස දැණුම් දී තිබේ.

## වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත අධ්‍යනයට නීතිඥ සංගමයෙන් කමිටුවක්

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කිරීමට ශ්‍රී ලංකා නීතිඥ සංගමය පියවර ගෙන තිබේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත පසුගිය 8 දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර, ජනාධිපති නීතීඥ ඉක්රම් මොහොමඩ් මහතා එහි සභාපතිත්වය උසුලන බව ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ලේකම් රජීව් අමරසූරිය මහතා පවසයි.

ඒ අනුව මෙම කමිටුවට ජනාධිපති නීතීඥ උදිත එගලහේවා, ජනාධිපති නීතීඥ චන්දක ජයසුන්දර, නීතීඥ එරාජ් ද සිල්වා, නීතීඥ මන්ජුක ප්‍රනාන්දුපුල්ලේ සහ නීතීඥ ධන්යා ගුණවර්ධන මහත්ම මහත්මීන් අයත් වෙති. ඊට අමතරව නීතීඥ ශිවාන් කුරේ සහ නීතීඥ යොෂානි දෙමුනි මහත්ම මහත්මීන් එම කමිටුවේ සම කැඳවුම්කරුවන් වශයෙන් කටයුතු කරති.


විශේෂ ආයෝජන කලාපයක් පිහිටුවීම සඳහා කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව නම් වූ පනත් කෙටුම්පත රජය ගැසට් කර තිබෙන අතර, මෙම පනත් කෙටුම්පත මඟින් කලාපයේ ව්‍යාපාර සහ වෙනත් ක්‍රියාකාරකම් කරගෙන යෑම සඳහා ලියාපදිංචි කිරීම්, බලපත්‍ර, අවසර සහ වෙනත් අනුමත කිරීම් ලබාදීම වෙනුවෙන් මෙම කමිටුව පිහිටුවා ඇත.











රටට පුනර්ජනනීය බලශක්ති ඉලක්ක ලබා දෙමින්
තිරසර පරිසර රැකුමට
නායකත්වය ජනපතිඳුන්ගෙන්
MEDIA UNIT MINISTRY OF POWER
දැයම එළිය කරමින් පරිසරය සුරකිමින්
මෙගාවොට් 700ක විදුලි බලයක් ජනනය කරන
ග්‍රාමීය සූර්ය විදුලිබලාගාර
7000ක ව්‍යාපෘතිය ආරම්භ කළා.
විදුලිබල අමාත්‍යාංශය
සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන
ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 12 සඳුදා

# ශිෂ්ටාචාරය වෙත නැවත ගමන් කිරීම!

අලුත් අවුරුද්ද උදා වීමට තවත් ඇත්තේ එකම එක දිනයක් පමණි. රටේ සෑම දිසාවකින්ම වාර්තා වන තොරතුරුවලින් පෙනී යන්නේ අලුත් අවුරුද්ද සැමරීම සඳහා විශාල සූදානමක් ඇති බවය. කොවිඩ් වසංගතය නිසා ගිය වසරේ අවුරුදු සැමරුම දුක්මුසු විය. සංචරණය සීමා විය. උත්සව අවලංගු විය. නිවෙසට සීමා වූ අලුත් අවුරුද්දක් ගිය වසරේ පැවැතිණි. ඊට පෙර වසරේ පාස්කු ප්‍රහාරය නිසා අවුරුදු උත්සව වෙනුවට ශෝකය හා බිය රට පුරා පැතිර ගියේය. කොවිඩ් වසංගතය මුළුමනින්ම අවසන් වී නැතත් මේ වසරේ යම් ඉස්පාසුවකින් යුතුව අලුත් අවුරුද්ද සැමරීමේ අවස්ථාව උදා වී ඇත. එය සහනයකි. කළු වලා මැදින් රිදී රේඛා දුවන කතාව සිහිපත් කළ හැකිය.

ආණ්ඩුව මහජනයාගේ සැනසිල්ලට හේතු - සාධක වන තීන්දු - තීරණ කිහිපයක් ගෙන ඒවා ක්‍රියාවට නංවා ඇත. සමෘද්ධිලාභීන්ට හා දුප්පත්ම ජන කණ්ඩායම්වලට රුපියල් පන්දහසක දීමනාවක් ගෙවයි. එය අද හා හෙට දෙදින තුළ ගෙවා නිම කිරීමට නියමිතය. සතොස ආයතනය සහන මිලට බඩු මල්ලක් ලබාදීම අවුරුදු සමය තුළ අඛණ්ඩව කරගෙන යයි. අවුරුදු උත්සව වළක්වනු වෙනුවට ඒවා පැවැත්වීම සඳහා උපදේශන මාලාවක් නිකුත් කර ඇත. සංචරණ තහනමක් ක්‍රියාත්මක කරනු වෙනුවට සංචරණයේදී පිළිපැදිය යුතු සෞඛ්‍ය - ආරක්ෂණ විධි හඳුන්වා දී ඇත. කඩ - සාප්පු විවෘත කර තබන්නැ'යි ඉල්ලීමක් ද රජය කර තිබේ. අලුත් අවුරුද්දේ පසුබිම නරක නැත.

ශ්‍රී ලංකාව යනු දීර්ඝ ශිෂ්ටාචාරයකට උරුමකම් කියන ප්‍රෞඪ රාජ්‍යයකි. එහි ජනී - ජනයාට හුරු - පුරුදු ආහාර සංස්කෘතියක්, ජීවන චර්යාවක්, නිෂ්පාදන ක්‍රියාවලියක් හා ක්‍රීඩා විලාසයක් තිබේ. කොටින්ම ශ්‍රී ලාංකිකයා යනු පරිපූර්ණ ජන කොට්ඨාසයකි. අලුත් අවුරුද්ද යනු හැම අංශයකින්ම එම පරිපූර්ණත්වය ප්‍රදර්ශනය කරන විශේෂ අවස්ථාවකි. අලුත් අවුරුදු සමය යනු අස්වැන්නෙන් අටු - කොටු පිරී යන කාලයකි. එහි ප්‍රීතිය භුක්ති විඳිමින් චාරිත්‍ර - වාරිත්‍ර ඉටු කරන කාලය ලෙස ද එය හැඳින්විය හැකිය. අලුත් අවුරුද්ද සූර්ය මංගල්‍යය ලෙස ද හඳුන්වයි. සූර්යයා අපේ ජීවිතයේ පදනමයි. සූර්යයා නැති කොට ජීවිතයක් නැත. ජීවිතය නැතිකොට ලෝකයක් ද නැත. සූර්යයා මූලික කොට උත්සව පැවැත්වීමෙන් පෙනී යන්නේ ලාංකිකයා කෘතගුණවේදී මිනිස් සමූහයක් බවය.

අප අතීතය ගැන උදම් අනන්නේ වුව මේ වන විට අතීත ශ්‍රී විභූතිය බොහෝ සෙයින් විනාශ වී ඇත. නිෂ්පාදන රටා, චාරිත්‍ර විධි විකෘති වී ඇත. එහෙත් අතීත හර - පද්ධතීන් යළි කැඳවීම සඳහා කිසියම් උත්සාහයක් අවුරුදු සමය තුළ දැකගත හැකිය. අප ඊට ප්‍රතිශක්තියක් ලබා දිය යුතුය. අපේ අතීත ශ්‍රී විභූතිය විනාශ මුඛයට ගියේ ප්‍රධාන සාධක තුනක් නිසාය. එක විදේශීය ආක්‍රමණ ලෙස හැඳින්විය හැකිය. දෙක බටහිරකරණයට නතු වීම ලෙස පෙන්වා දිය හැකිය. තුන; විවෘත ආර්ථිකය සීමා - මායිම්වලින් තොරව ක්‍රියාත්මක වීම ලෙස උපුටා දැක්විය හැකිය. මේවා එකවර වෙනස් කළ නොහැකිය. එහෙත් යම් ප්‍රතිසංස්කරණ ඔස්සේ අතීත ශ්‍රී විභූතියට සමාන තත්ත්වයක් වෙත අපට ගමන් කළ හැකිය. එම විශ්වාසය වැදගත්ය.

අතීත ශ්‍රී ලංකාවේ ගම යනු ස්වයංපෝෂිත ආර්ථික කලාපයකි. ගමට අවශ්‍ය සියලු දේ එහි තිබිණි. කුඹුරුයාය, ඇළ - දොළ වැව, මූකලාන, හේන් යාය, ගෙවත්ත ඒ අතර ප්‍රධාන විය. ගැමියාගේ නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වූයේ සාමූහික ප්‍රතිපත්ති මාලාවකට අනුවය. ඒ අනුව ගමේ එකමුතුව, සහයෝගය හා සහජීවනය ඉබේම තහවුරු විය. ගැමියා අනාගතය දෙස බලාගෙන සිය නිෂ්පාදන ක්‍රියාවලිය කරගෙන ගිය කණ්ඩායමකි. වහින කාලය ඔව්හු දනිති. පායන කාලය ඔවුහු දනිති. විය පැහැදම් කළ යුතු ආකාරය ද අර පරෙස්සම් කරගත යුතු ආකාරය ද ඔවුහු හොඳින්ම දනිති. එබැවින් අතීත ගැමියා දුප්පත් වූයේ නැත. අසරණ වූයේ නැත. දැන් නැවතත් කාලයට යා නොහැකි වුව යම් ස්ථාවරභාවයක් ඇති කරගත හැකිය.

අතීත ගැමියා අලුත් අවුරුද්ද යොදාගත්තේ ජීවත්වීම සඳහා උත්තේජනයක් ලබාගැනීම සඳහාය. වසන්ත සමය උදාවන්නේ ගොවියාට යම් විවේකයක් ද ලබා දෙමින්ය. ඒ අස්වනු කපා පාගා ගෙට ගත් කාලය නිසාය. මේ විවේක කාලය ප්‍රයෝජනවත් ලෙස ගෙවා දැමීමට සැලැසුමක් ගැමියා ළඟ තිබිණි. එක අතෙකින් චාරිත්‍ර - වාරිත්‍ර ඉටුකරමින් සමාජය එකමුතු කිරීම සිදු විය. තව අතෙකින් සාමය හා සහජීවනය සඳහා වැඩසටහන් තිබිණි. තවත් අතෙකින් ශාරීරික හා මානසික ප්‍රහර්ෂය සඳහා අවශ්‍ය කෙළි - සෙල්ලම් තිබිණි. මේවා එකක් නැර සිදු කිරීමේ හැකියාව නූතන ගැමියාට නැත. එතෙක් කළ හැකි දේ කරමින් අපේ ශිෂ්ටාචාරය වෙත නැවත ගමන් කිරීම වැදගත්ය. ජාතියක් ලෙස නැඟී සිටීමේ පදනම ඇත්තේ ද එහිය.

ශිෂ්ටාචාරයේ මූලය ගත හොත් එය ආර්ථික ක්‍රියාවලිය මත පදනම් වෙයි. මෙසපොතේමියානු, නයිල්, හොවැංහෝ, යන ඕනෑම ශිෂ්ටාචාරයක පදනම ආර්ථිකය විය. අපට ස්වයංපෝෂිත හා පරිපූර්ණ ආර්ථික ක්‍රියාවලියක් අතීතයේ පැවැති බවට ඕනෑතරම් සාක්ෂි තිබේ. එහෙත් විදේශ ආක්‍රමණ නිසා එය විනාශ විය. ඒ අනුව නිදහසින් පසුව වුව අපේ ශිෂ්ටාචාරය හා ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩනැඟුණේ නැත. ඒ වෙනුවට රටේ දිළිඳුකම ඉහළ ගියේය. සාමූහිකත්වය පිරිහී ගියේය. රට දේශපාලන වශයෙන් විවිධ කොටස්වලට බෙදී ගියේය. එහි භයානකම ප්‍රතිඵලය හැටියට දිළිඳුකම පෙන්වා දිය හැකිය. ග්‍රාමීය අංශය, වතු අංශය මෙන්ම නාගරික අංශය ද දිළිඳු පවුල්වලින් සමන්විත වේ. සුළු පිරිසක් සම්පත් අසීමිත ලෙස භුක්ති විඳිති. විශාල පිරිසක් එදිනෙදා ජීවිතයට අමාරුවෙන් මුහුණ දෙති.

වත්මන් ආණ්ඩුවේ දීර්ඝ කාලීන ආර්ථික සැලැසුම් ගොනු කර ඇත්තේ රටේ දිළිඳුකම පිටුදැක ශිෂ්ටාචාරය යළි ගොඩනැඟීම සඳහාය. ගැමි ආර්ථිකය නැංවීමේ වැඩසටහන් මේ වන විටත් සාර්ථකව ක්‍රියාත්මක වෙයි. දේශපාලන විවේචන පැවැතිය ද ඒවායෙහි ප්‍රතිඵල ඇස් පනාපිට දැක ගන්නට ලැබේ. අලුත් අවුරුදු සමය තුළ එක් අදහසක් ඇති කර ගත හැකිය. එනම්; රට ජාතික සංවර්ධනයක් කරා යොමු වී ඇති බවය.

### දිල්රූගෙ සීවිදි

| | |
|---|---|
| පුරවනු සිතා ගිය වසරේ | අඩුපාඩු |
| ගන්නට එපා හැම තැන දුවමින් | වාඩු |
| පෙන්වයි කොරෝනා සිය ගති | කුඩුකේඩු |
| එතකොට වෙන්න වෙයි ගේ අස්සෙම | කූඩු |

# සීමා මායිම් ඇතිව අවුරුදු චාරිත්‍ර රැක ගනිමු



මහජන පවුල් සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ ලේකම් මහේන්ද්‍ර බාලසූරිය



සැණකෙළි සිරිය මුළුමනින්ම පාහේ අහිමිව ගිය එක් බක් මාසයක අඩුපාඩුව පියවා ගන්නට සැරසෙන්නාක් මෙන් මුළු රටම තැන් තැන්වල දුවමින් අවුරුද්දට අඩුමකුඩුම රැස් කරමින් සිටිති. රෙදිපිළි ඇඟලුම් පිරුණු වීදි පුරා අතුරු සිදුරු නොමැතිව ජන ගංගා ගලා යයි. ආහාරපාන පිරුණු සිල්ලර වෙළෙඳසල්වල තත්ත්වයේද වෙනසක් නැත. ලොව පුරා කොරෝනා රෝගීන් ව්‍යාප්ත වීම තවමත් නතර වී නොමැත. කොරෝනා හේතුවෙන් මිය යන පුද්ගලයන් ද කොරෝනා රෝගයට ගොදුරු වූවන්ට අතුරු ආබාධ ඇති වීම පිළිබඳව ද ලෝකය පුරා සෑම තැනකින්ම පාහේ තවමත් විවිධ ප්‍රවෘත්ති අසන්නට ලැබේ. මෙවන් වාතාවරණයක් තුළ අලුත් අවුරුද්දට සූදානම් වන මිනිසුන් අවිචාරවත් ලෙස කටයුතු කළ යුතු ද ?

පසුගිය වසරේ සංචරණ සීමා පනවා තිබීම ආදී හේතූන් මත අලුත් අවුරුදු උත්සවය සමරන්නට ජනතාවට අවකාශ ලැබුණේ ඉතාම අඩුවෙනි. මේ වසරේ එයට සාපේක්ෂව ජනතාව අවුරුද්ද උත්සව ශ්‍රීයෙන් සමරන්නට කඩිනමින් සූදානම් වන ආකාරයක් දක්නට ලැබේ.

වසංගතය නිසා ඇති වී තිබූ භීතිය මිනිසුන්ගේ සිත්සතන්වලින් ටිකෙන් ටික ගිලිහී යමින් පවතින අයුරු දක්නට ලැබෙන්නේ ඔවුන් දෙවසරකට පෙර අලුත් අවුරුදු සැමරූ අයුරින් කිසිදු බියක් සැකයකින් තොරව යළිත් පුරුදු ජීවන රටාවට අවතීර්ණ වන්නට තැත් දරන ආකාරයක් පෙනෙන්නට ඇති බැවිනි.

## නීතිය සහ වගකීම

සාමාන්‍යයෙන් දිගු කාලයක් මුළුල්ලේ එකම දෙයක් එකම ආකාරයට රඳවාගෙන පවත්වා ගන්නට එතරම් පහසු කරුණක් නොවේ. විශේෂයෙන්ම සිතට සතුටක් ඇති කරන දෙයකටත් වඩා වසංගතයක් වැනි පීඩාකාරී තත්ත්වයක් එක දිගට දරා ගෙන සිටීමේදී යම් කිසි තැනකදී ඒ දරාගැනීම පුපුරා යන්නට ඇති ඉඩකඩ ඉහළය.

කෙසේ වෙතත් වසංගත රෝගයක් වැනි අවස්ථාවකදී එය අවසන් වන දින වකවානු සහ කාල සීමාවන් නිර්ණය කරන්නට කිසිවකුට හැකියාවක් නැත. පවතින කොරෝනා වසංගතයෙන් මිදෙන්නට මුළු ලෝකයම යම් යම් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සහ විවිධ අලුත් ක්‍රමෝපායන් සොයා ගනිමින් සිටින විටත් රෝගීන් ප්‍රමාණයේ සහ මරණ සංඛ්‍යාවෙහි අඩුවක් දක්නට ලැබෙන්නේ නැත. එසේම ඇතැම් රටවල ඉතාම ශීඝ්‍රයෙන් අවදානම ඉහළ යමින් පවතී. ගත වන සෑම මොහොතක් පාසාම අප සිටින්නේ අවදානමක බව ඉතා හොඳින් අවධාරණය කර ගැනීම අප සියලු දෙනාගේ වගකීමකි.

අප ජීවත් වන වටපිටාවෙහි අප ආසන්නයේම අවදානම තිබෙන්නට ඉඩ ඇති බව අප අවධාරණය කර ගත යුතුය.

පසුගිය වසරේ සීමාකිරීම්, කොටු කිරීම් මැද ජීවිත ගත කළ ජනතාවට සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද සැමරීම සඳහා පෙර වසරට වඩා වැඩි නිදහසක් ලබා දෙන්නට රජය විසින් ද කටයුතු කර තිබේ. එහෙත් යම් යම් සීමා මායිම් පනවා තිබෙන්නේ තවදුරටත් අප වසංගතයෙන් ආරක්ෂා විය යුතු නිසාය.

මෙහිදී වගකීමෙහි වැඩි ප්‍රතිශතය හිමි වන්නේ මහජනතාවටය. සෞඛ්‍ය අංශවලට හෝ කිසියම් වෙනත් බලය ලත් ආයතනයකට හෝ සියල්ල සම්පූර්ණයෙන්ම පාලනය කිරීමේ හැකියාවක් නොමැත. පනවා ඇති සීමා පිළිබඳව දැඩි අවධානය යොමු කරමින් ආරක්ෂාකාරීව කටයුතු කිරීමේ වගකීම ජනතාව සතුය.

උපදෙස් මාලාවක් නිකුත් කිරීම ඒ සඳහා බලය ලත් පාර්ශ්වයන්ට සිදු කරන්නට හැකි වුවත් ඒවා පිළිපැදීම පිළිබඳව වගකීම ජනතාව සතුව පවතී. නැවතත් මතක් කළ යුත්තේ අලුත් අවුරුද්ද සැමරීම සඳහා සකස් කර ඇති උපදෙස් නිසි අයුරින් අනුගමනය කර ආරක්ෂාකාරීව කටයුතු කරන ලෙසයි.

## සාධාරණ සැකයෙන් පසුවීම

කොවිඩ් 19 දෙවන රැල්ල ටිකෙන් ටික අඩු වෙමින් පවතින නමුත් සමාජය තුළින් ආසාදිතයින් හමුවීම නතර වී නොමැත. තමාගේ ආසන්නයේ සිටින ඉතාම සමීපතම පුද්ගලයා පවා ආසාදිතයකු යැයි යන නිගමනයෙන් යුතුව කටයුතු කරන්නට හැකිනම් ඒ තුළින් තමා තුළම නිර්මාණය වන රෝගයෙන් ආරක්ෂා වීමට ඇති සහජ හැඟීම් හරහා තවදුරටත් ආසාදිතයකු නොවී ආරක්ෂා වන්නට හැකියාව ලැබේ. යුද්ධයකදී හෝ යම්කිසි ත්‍රස්තවාදයකදී ආසන්නයේ සිටින පුද්ගලයා ත්‍රස්තවාදියකු යැයි යන නිගමනයෙන් යුතුව සැකයෙන් බැලූ විට බොහෝ අවස්ථාවල සිදු වන්නට ඇති විශාල අනතුරකින් කල් ඇතිව මිදෙන මාර්ග සොයා ගැනීමට හැකි වූ උදාහරණ ලෝකය පුරා ඕනෑ තරම් අසන්නට දකින්නට ලැබේ. අප මේ මොහොතේ සටන් කරන්නේ ඇසට නොපෙනෙන සතුරකු සමගිනි. එම ත්‍රස්තවාදියාට ඕනෑම මොහොතක අපට පහර දෙන්නට හැකියාව පවතින බව අප ඉතා හොඳින් දැන සිටිය යුතුය.

නිතර මුව වැස්මක් භාවිත කිරීම, බැහැරට ගොස් පැමිණි සෑම අවස්ථාවකම නිසි ආකාරයෙන් පිරිසුදු වීම, සෑම මොහොතකම තදබදය ඇති ස්ථානවලින් බැහැරව දුරස්ථ භාවය ආරක්ෂා කර ගැනීම වැනි දේ මගින් වයිරසයෙන් ආරක්ෂා වීමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගැනීමට සියලු දෙනා සැලකිලිමත් විය යුතුය.

ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද බොහෝ ස්ථාන වලින් විවිධාකාර වූ විකෘති කෙරෝනා ප්‍රභේදයන් පිළිබඳව අසන්නට දකින්නට ලැබෙන අතර එබඳු ප්‍රභේදයක් නතර කර ගත නොහැකි ලෙස පැතිරීමට පටන් ගතහොත් රෝගීන් සංඛ්‍යාව සහ මරණ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇත. ඇතැම් විට මෙතෙක් ලබා දුන් එන්නත්වලට ප්‍රතිරෝධය දක්වන ප්‍රභේදයක් ආසාදනය වීම මගින් එන්නතෙන් නැති ප්‍රයෝජනය ද අහිමි වීමට ඉඩ තිබේ.

සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද එකමුතුකමේ සංකේතයක් බඳු උත්සවයකි. මෙම උත්සව සමයේදී එකිනෙකා එක තැනකට ඒකරාශී වී එකට ආහාරපාන ආදිය අනුභව කරමින් බෙහෙවින් සමීපව කටයුතු කරයි. අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර සකස් වී ඇත්තේ ද සාමූහිකත්වය සහ එකමුතුකම වැඩිදියුණු කරන ආකාරයෙනි. එබැවින් හිසතෙල් ගෑම ආදී චාරිත්‍ර වාරිත්‍ර බොහෝ විට බොහෝ දෙනා එක් රැස් වී කරන ආකාරය එදා සිට අද දක්වාම දක්නට ලැබේ නමුත් පවතින වාතාවරණය තුළ එබඳු දේ පොදුවේ සිදු කිරීමෙන් අනතුර යළිත් අප සමීපයට ආසන්න වීම වළක්වන්නට නොහැකිය.

## හැකිතාක් මඟහැරීම

වසරක් පුරා තිබූ වෙහෙස මහන්සිය අමතක කර දමා සියලු දෙනා එකට එක් වී විනෝදයෙන් කාලය ගත කිරීම සඳහා අවුරුදු උත්සව පැවැත්වීම ද එදා සිට පැවත එන තවත් සිරිතකි අවුරුදු උත්සවවල පැවැත්වෙන තරඟවලද ඇත්තේ එකමුතු බව සහ සාමූහිකත්වය වර්ධනය කරන ක්‍රියාකාරකම්ය. එහෙත් පවතින තත්ත්වය යටතේ එබඳු ක්‍රීඩාවල නිරත වීම ද එතරම් සුබදායක නොවේ. යම් යම් සීමාවන් මධ්‍යයේ අවුරුදු උත්සව පැවැත්වීම සඳහා මාර්ගෝපදේශන මාලා සකස් කර ඇති නමුත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ දී ගැටලු සහගත තැන් මතු වන්නට ඇති ඉඩකඩ ඉතාම ඉහළය. ජන ක්‍රීඩාවල දී සමාජ දුරස්ථ භාවය ආරක්ෂා කර ගැනීම සහ වෙන් වෙන්ව කටයුතු කිරීම කිසිසේත්ම පහසු නොවේ. එබැවින් මාර්ගෝපදේශන බිඳිමින් ඒවාට අනුගත නොවෙමින් උත්සව සංවිධානය කරනවාට වඩා හැකි තාක් උත්සව අවස්ථා අවම කරන්නට හැකි නම් මේ මොහොතේ එය වඩාත් වැදගත්ය.

කොවිඩ් 19 රෝගය ආසාදනය වීම සහ බෝවීම සිදු වන්නේ කුමන ස්ථානයකින් හෝ කාගෙන්ද යන්න පිළිබඳව අපට නිශ්චිතව අදහසක් ප්‍රකාශ කරන්නට හැකියාවක් නැත. එබැවින් අලුත් අවුරුද්ද සැමරීමේ දී හැකි තාක් එක්රොක් වීම් අවම කර පවුලේ සාමාජිකයන් පිරිස පමණක් සහභාගී කර ගනිමින් චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරන්නට හැකි නම් සෞඛ්‍ය මාර්ගෝපදේශනවලට අනුව සීමා මායිම් පනවා ගනිමින් කටයුතු කරන්නට හැකි නම් එළඹෙන වසරේ මෙයට වඩා වඩාත් උත්කර්ෂවත් අයුරින් සහ සිය මනාපයන් පරිදි අලුත් අවුරුද්ද සමරන්නට අවස්ථාව හිමි වනු ඇත.

දැනුවත් කිරීම් මාර්ගෝපදේශන ආදි කිසිදු බලපෑමකින් තොරව වුවද තමා සහ තම පවුලේත් තම වටපිටාවේ ජීවත් වන අයගේ ආරක්ෂාව තර කර ගැනීම ස්වයං අවශ්‍යතාවක් බවට පත් කරගන්නට මහජනතාවට හැකියාවක් තිබෙනවා නම් වසංගතයෙන් මිදෙමින් සුරක්ෂිත රටක තවත් අලුත් අවුරුද්දක් සමරන්නට එළඹෙන වසරේ හෝ නිදහස ලැබෙනු ඇත. අවිචාරවත්ව කටයුතු කරමින් තව කාලයක් සුසුම් ලමින් සිටිනවාද එසේත් නොමැති නම් හැකි ඉක්මනින් සුපුරුදු ජීවිතයට අවතීර්ණ වන්නට ආරක්ෂාකාරීව කටයුතු කරනවාද යන්න පිළිබඳව දෙවරක් නොව කිහිප වරක් සිතා බලන්නට මහජනතාව වගකීමෙන් ක්‍රියා කළ යුතුය.




**සන්ධ්‍යා කරුණාරත්න**
**දිල්රූ ජයසේකර**

# දැන් රටට අවශ්‍ය දීර්ඝ කාලීනව වාසි ලබා ගන්න පුළුවන් පරිසර හිතකාමී ක්‍රම



## විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම

**විදුලි සුරක්ෂිතතාවය, නව උත්පාදනය ක්‍රම ඇති කිරීම, විදුලිය ඉතිරි කිරීම සඳහා ගෙන ඇති වැඩපිළිවෙළ කුමක් ද, සහ විදුලිබල අංශය ප්‍රවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා සමඟ පවත්වන ලද සාකච්ඡාවකි.**

**● විදුලිබල අමාත්‍යවරයා ලෙස ඔබ වැඩ භාර ගෙන මාස ගණනාවක් ඉක්මවා ගියත් ඔබේ කාර්යභාරය පිළිබඳව සහ අමාත්‍යාංශයේ කාර්යය ගැන සමාජයට අවබෝධයක් ලැබී නැහැ. ඒ ගැන පැහැදිලි කිරීමක් කළ හැකිද.?**

ඇත්තෙන්ම අපි අවධානය යොමු කරන්නේ පැවරුණ වැඩේ හරියට කිරීමටයි. මම මේ අමාත්‍යාංශයේ රාජකාරි පටන් ගන්නකොට මේ විෂය ගැන දැන සිටියේ නැහැ. විදුලිය ගැන දැනගෙන හිටියේ ගෙදර ට්‍රිප් සුවිච් එක දැමීම පමණයි. ඒ නිසා මම මුලින්ම මට පැවරුණ විෂය ගැන ඉගෙන ගත්තා. දැන් විෂය ගැන අවබෝධයක් තියෙනවා. දැන් අපේ උත්සාහය විදුලිබල විෂය ඔස්සේ ජනතාවට අවශ්‍ය කරන සේවය ලබා දීමයි.

**● ඔබට මේ කාර්යය තනිව කළ හැකියි කියලා ඔබ විශ්වාස කරනවා ද?**

මම පෞද්ගලිකත්වය සහ පෞද්ගලික ප්‍රතිරූපය බලාගෙන වැඩ කරන කෙනෙක් නෙවෙයි. සාමූහිකත්වය නැතිනම් ටීම් වර්ක් විශ්වාස කරන කෙනෙක්. මට හොඳ රාජ්‍ය ඇමැතිවරයෙක් ඉන්නවා ඒ දුමින්ද දිසානායක මහතා. හොඳ නිලධාරීන්, ඉංජිනේරුවරු, සේවකයන් ඉන්නවා. මම විශ්වාස කරනවා මේ පිරිස සමඟ කණ්ඩායමක් විදිහට වැඩ කරල මහජනතාවට අවශ්‍ය සේවය ලබාදීමට පුළුවන් වෙයි කියලා. අපි දැනටමත් ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් ඉන්නෙ. ජනාධිපතිවරයාට හොඳ දැක්මක් සහ වැඩපිළිවෙළක් තිබෙනවා. එතුමාගේ වැඩපිළිවෙළට අවශ්‍ය සහාය ලබාදීම තමයි කළ යුතු මූලික දේ වෙන්නෙ.

**● ඔබ හිතනවාද දිනෙන් දින ඉහළ යන විදුලි ඉල්ලුම සහ විදුලිය නිෂ්පාදනය අතර ප්‍රමාණාත්මක ගැටලුවක් තියෙනව කියල?**

අනිවාර්යයෙන්ම ඒක අනාගතයේ ලොකු ගැටලුවක් වෙන්න පුළුවන් දෙයක්. 2013 නොරොච්චෝලේ බලාගාරය හැදුවට පස්සෙ ප්‍රධාන පෙළේ බලාගාරයක් ජාතික විදුලි පද්ධතියට ඇතුළත් වෙලා නැහැ. ඒ වගේම අපට තව ජල විදුලි බලාගාර ඉදිකළ හැක්කේ තුනක් පමණයි. ඒවා ඉදිකළා කියල විදුලි අර්බුදයට විසඳුමක් සැලසෙන්නේ නැහැ. එක වර්ෂයකදී මෙරට විදුලි අවශ්‍යතාව සියයට හයකින් ඉහළ යනවා. එයට සරිලන ලෙස විදුලි නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැ. ඒ නිසා විකල්ප උත්පාදන ක්‍රම මෙන්ම විදුලිය නාස්ති වෙන එක වළක්වන ක්‍රමවලට යොමු වෙන්න ඕනෑ. මෙහිදී විදුලි බල ඇමැති විදිහට දකින ඇත්තක් කියන්න ඕනෑ. එදා ජේ.ආර්. ජයවර්ධන මහතා ගාමිණී දිසානායක මහතා මහවැලි බලාගාරය ඉදි නොකරන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නොරොච්චෝලේ ඉදි නොකරන්න අද අපට ජාතික විදුලිය අවශ්‍යතාව සපුරා ගන්න බැරි රටක් වෙලා දවසට පැය අටක් අඳුරේ ඉන්න ජාතිය බවට පත්වීමට ඉඩ තිබුණා. අපි අතර දේශපාලන මතවාද වෙනස්කම් තියෙන්න පුළුවන් ඒත් ඒ නායකයන් රට වෙනුවෙන් කළ මේ දේවල් අගයන්න ඕනෑ.

**● මෙරට පරිසරයට ලොකු හානියක් ඩීසල් බලාගාරවලින් වෙනවා. මේ තත්ත්වය තුළ සිදු වන හානි වළක්වන්න මොන විදිහෙ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කළ හැක්කේ?**

ඔබ කිව්ව් හරි. ඩීසල් බලාගාරවලින් ගස් දහසක් කැපීමට වඩා ලොකු පරිසර හානියක් වෙනවා. ඒ වගේම ඩීසල් විදුලි උත්පාදනය සඳහා ඒකකයකට රුපියල් 27ක් වෙනවා. මෙය ලොකු මුදලක්. අපි ඒත් මෙය පාරිභෝගිකයාට දෙන්නෙ ඉතාමත් සහන මිලකට. විදුලි බල මණ්ඩලය යම් අලාභයක් ලබන්න මේ තත්ත්වයත් එක හේතුවක් වෙනවා. ඒ නිසා අප මූලිකව අවධානය යොමු කරන්න ඕනෑ විදුලිය නාස්තිය නැති කිරීමටයි.

ඒක එක් පුද්ගලයකුට තනිව කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මම ඇමැතිවරයා වුණාට මගේ නියෝගයකට මේ නාස්තිය වළක්වන්න බෑ. අප සියල්ලන් සාමූහිකව එකතු වෙලා විදුලිය පරිහරණය සැලසුම් සහගතව කරන්න ඕනෑ. ඇත්තටම අද ලොකු විදුලි නාස්තියක් වෙනවා.

ඒ නාස්තිය නිසි ලෙස වැළැක් වුව හොත් අපට එක් බලාගාරයකින් උත්පාදනය වන විදුලි ප්‍රමාණයට සමාන කරන්න පුළුවන්. ඒ අතර ඉක්මනින්ම සූර්ය තාප විදුලිය උත්පාදනය වෙත අප යොමු විය යුතුයි.

ඒ ඇතුළු විකල්ප ක්‍රම අනුගමනය කිරීම තුළින් ඩීසල් සඳහා යන වියදම සීමා කර ගන්න පුළුවන්.

**● විදුලිය සංරක්ෂණය කිරීමත් නාස්තිය නතර කිරීමත් සඳහා මොන විදිහෙ වැඩක් ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන්නෙ?**

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ලක්ෂ 43 වන සිසු දරුවන් මේ වැඩ පිළිවෙළට එකතු කර ගන්න කටයුතු කර තිබෙනවා. ඇත්තෙන්ම එක් දරුවකුට එක් විදුලි පහනක් නිවන්න පුළුවන් නම් ගෙදර විදුලි නාස්තිය අඩු කරන්න පුළුවන්. එක රැයකට ලොකු ඉතිරියක් සිදු වෙනවා. ළමුන්ව යහපත් පුරුදුවලට යොමු කරන්න පහසුයි. එමගින් විදුලිය සුරකින අනාගත පරපුරක් අපිට ඇති කරන්න පුළුවන්.

**● අඩු ආදායම්ලාභීන්ට විදුලි සබඳතා නොමිලේ ලබා දීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර ඇති බව සඳහන්. මේ ගැන පැහැදිලි කිරීමක් කළ හැකිද.?**

අද රටේ බොහෝ ප්‍රදේශවලට විදුලිය සම්පාදනය කළත් විදුලි සබඳතා ගන්න බැරි අඩු ආදායම් ලබන අය ඉන්නවා. එයාලගෙ ගේ ඉස්සරහ ලයිට් කණුව තියෙනවා ඒත් විදුලිය ගන්න බෑ. සල්ලි නෑ. අන්න ඒ අයව අපි හඳුනා ගනිමින් ඉන්නවා. ඔවුනට නොමිලේ විදුලි සබඳතා ලබාදීම ආරම්භ කර තියෙනවා. අද ඔන්ලයින් අධ්‍යාපනය ගැන කතා කරන්නේ. ඒත් දහස් ගණනක් වූ පවුල් ප්‍රමාණයක් සල්ලි නැති නිසා විදුලිය නැතිව කළුවරේ ඉන්නවා. ඒ නිසා අප තීරණය කළා මූලිකව මේ විසමතාව වෙනස් කළ යුතුයි කියලා. ඒ වැඩපිළිවෙළ දැන් ඉතාමත් සාර්ථකව සහ වේගවත්ව ක්‍රියාත්මක වෙනවා. අපේ අරමුණ ඉතාමත් ඉක්මණින් සැමට විදුලිය ලබා දීමයි.

**● අමාත්‍යාංශය ගම් හත්දහසකට බලාගාර හත්දහසක් සූර්ය විදුලිබල ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. මේ ගැන පැහැදිලි කිරීමක් කළ හැකිද ?**

ඔව් අපි අලුතෙන් සූර්ය විදුලිබල ව්‍යාපෘතියක් පටන් ගත්තා. මෙය මහජන සහභාගි ව්‍යාපෘතියක් විදිහටයි හඳුන්වන්න පුළුවන් කම තිබෙන්නේ. මේකෙ එකම සුදුසුකම වෙන්නෙ ට්‍රාන්ස්පෝමරයක් ළඟ පර්චස් හතළිහක ඉඩමක් තිබීම පමණයි. අපි දැනටමත් ව්‍යාපෘති හත්සියයකට ටෙන්ඩර් කැඳවලා තියෙන්නෙ. ඇත්තෙන්ම අපේ වගේ හිරු රැස් තදින් වැටෙන රටකට සූර්ය ශක්තිය මඟින් විදුලිය උත්පාදනය කිරීම හොඳින් කරන්න පුළුවන්. මේ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වුණොත් ඩීසල්, ගල් අඟුරුවලට වියදම් වන රුපියල් කෝටි ගණනක සල්ලි අපිට ඉතුරු කරන්න පුළුවන්. මේ සංකල්පය අවුරුදු තුනක් ඇතුළත සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබෙනවා. මෙතැන කිසිදු දේශපාලන බලපෑමක් හෝ වරප්‍රසාද දීමක් වෙන්නේ නැහැ. ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්නෙ. මගෙ අදහසට අනුව දේශපාලනය මැතිවරණ වේදිකාවට සීමා කළ යුතුයි. ඇමැතිවරයා වැඩ කළ යුත්තේ ජාතික වැඩපිළිවෙළක් අනුවයි. අපේ රටට එය හුරු දෙයක් නොවුණට බොහෝ දියුණු රටවල තියෙන්නේ ජාතික වැඩසටහන්.

## සූර්ය විදුලිය උත්පාදනයට දායක වීම මඟින් රටේ පරිසරය සුරක්ෂිත කරනවා



## තව ජල විදුලි බලාගාර ඉදි කළ හැක්කේ තුනක් පමණයි

## ජනාධිපතිතුමාගේ වැඩපිළිවෙළට අවශ්‍ය සහාය දීම තමයි කළ යුතු මූලික දේ

**● විදුලිබල ඇමැතිවරයා ලෙස ඔබේ අරමුණ කුමක්ද .?**

මම මගේ විෂයට අවංකව වැඩ කරන කෙනෙක්. මට ලැබෙන හැම අමාත්‍යාංශයකම 'මම' කියන සංකල්ප අතැර 'අපි' කියන සංකල්පය ප්‍රධාන කර ගෙන වැඩ කළේ. විදුලි බල අමාත්‍යාංශයේදීත් අපි කණ්ඩායමක් විදිහට සාර්ථක වැඩ කොටසක් ඉටු කරන්න සැලසුම් කරගෙන ඉන්නෙ. මම මේ කණ්ඩායමේ නායකයා වුණාට මට තනිවම කණ්ඩායම ජයග්‍රහණය වෙත ගෙන යන්න බෑ. ඒ දේ අනුව තමයි මගේ අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙන්නෙ.


**● පරිසර හිතකාමී මේ වැඩපිළිවෙළ කෙතරම් දුරට සාර්ථක වෙයි කියල ඔබ හිතනවද.?**

අනිවාර්යයෙන්ම අනාගතයේ දී විදුලිය ඇතුළු සියලු ශක්තීන් උත්පාදනය කිරීම පරිසර හිතකාමී ලෙස කළ යුතුයි. විදුලිය උත්පාදනය කිරීම දිනෙන් දින ඉහළ යන ඉල්ලුමක් සහිත දෙයක්. ඒ නිසා ඒ සඳහා පරිසර හිතකාමී විකල්ප වෙත යොමු වෙන්න ඕනෑ. එහි ප්‍රධාන අදියරක් විදිහටයි සූර්ය ශක්තිය වෙත අප අමාත්‍යාංශය යොමු වුණේ. මෙම කාර්යයට රාජ්‍ය ඇමති දුමින්ද දිසානායක මහතා ද ලොකු සහායක් සහ මැදහත් වීමක් කළා. ඇත්තෙන්ම ග්‍රාමීය මට්ටමේ සමිති සමාගම්වලට ද මෙම වැඩසටහන්වලට ලොකු දායකත්වයක් ලබා දෙන්නත් එමඟින් ග්‍රාමීය ආර්ථිකය සක්‍රීය කරන්නත් පුළුවන්කම තියෙනවා. සූර්ය විදුලිය උත්පාදනයට දායක වීම මඟින් රටේ පරිසරය සුරක්ෂිත කරන අතර ගමටත් ගමේ සංවර්ධනයටත් දායකත්වය ලබාදෙන්න පුළුවන්කම ලැබෙනව. එක් සූර්ය බලාගාරයකින් වොට් හැත්තෑපහක උත්පාදනයක් බලාපොරොත්තු වෙනවා. මේ ක්‍රමවේදය හරියට බලගැන්වූ පසු අපට ස්වාභාවික විදුලිය උත්පාදනය මඟින් පරිසරය ආරක්ෂා කර ගැනීමට හොඳ හැකියාවක් ලැබෙනවා. දැන් රටට අවශ්‍ය වෙන්නෙ කෙටි කාලීන දේවල් නොවෙයි. දීර්ඝ කාලීනව වාසි ලබා ගන්න පුළුවන් පරිසර හිතකාමී ක්‍රමයි. ජනපති, අගමැති මැදහත් වීම සහ උපදෙස් මත අප ක්‍රියාත්මක කරන්නෙ ඒ වැඩපිළිවෙළයි.

**උදිත ගුණවර්ධන**




# සංස්කෘතික උත්සව ලෝකය වඩාත් සුන්දර කරයි



සෑම වසරකටම වරක් එළඹෙන වසරේ සුන්දරතම කාලසීමාව උදා වී තිබේ. වසර පුරා සිදු කරන ලද සියලු වැඩකටයුතුවලට යම්කිසි විරාමයක් තබමින් සංස්කෘතිය ඉස්මතු කරමින් විනෝදයට වැඩි තැනක් ලබා දෙන සිංහල සහ හින්දු අලුත් අවුරුදු සමය එළැඹීම ශ්‍රී ලංකාවාසී සියලු දෙනාගේ සතුටට හේතුවකි.

ආගමික සහ වෙනත් විවිධ විනෝදකාමී හේතූන් මත ලොව පුරා සෑම රටකම පාහේ විවිධ ආකාරයෙන් සිදු කරන සැමරීම් උත්සව අසන්නට දකින්නට කවුරුත් ප්‍රිය කරන්නේ ඒ සෑම එකක්ම පාහේ එකිනෙකට වෙනස් වූ අලංකාරයකින් යුතු වන බැවිනි.

විවිධ රටවල් විවිධාකාර වූ අරමුණු සහ හේතු පදනම් කර ගනිමින් කලක් තිස්සේ පවත්වාගෙන පැමිණි වූ උත්සව එකිනෙකට වෙනස් වූ චමත්කාරයක් සහ විවිධත්වයක් ලොව පුරා නිර්මාණය කරයි.

දැල්වෙන පහන්වලට මූලිකත්වය ලබා දෙමින් සමරන දීපවාලී උත්සවය ඉන්දියාවෙහි ප්‍රධාන සංස්කෘතික උලෙළකි. ලොව බොහෝ රටවල් සමරන දීපවාලි උත්සවය යෙදෙන්නේ ඔක්තෝම්බර් මැද සිට නොවැම්බර් මැද දක්වා වූ කාල සීමාව තුළය. ශ්‍රී ලාංකික අලුත් අවුරුදු උත්සවය සිංහල සහ හින්දු ලෙස ආගම් දෙකටම අදාළ සංස්කෘතිකාංගවලට මුල්තැන දෙමින් සමරන ආකාරයෙන්ම ඉන්දියානු දීපවාලි උත්සවය ද හින්දු, සීක් සහ ජෛන යන ආගම් තම ආගමට අනුකූලව විවිධ සංස්කෘතිකාංග යටතේ සංවිධානය කරති. අඳුරට වඩා ආලෝකයට තැන දෙමින්, සෑම තැනක්ම පාහේ පහන් මඟින් ආලෝකවත් කරමින්, තෑගි හෝග හුවමාරු කර ගනිමින් සමරන දීපවාලි උත්සවය ඉන්දියානු ජනයාගේ ආධ්‍යාත්මික සුවය සහ සතුට වර්ධනය කරයි.

ලෝකයේ සියලු දෙනාගේ අවධානය දිනා ගත් හෝලි උත්සවය ද ඉන්දියානුවන් සමරන තවත් අලංකාර විනෝදකාමී උත්සවයකි. විවිධ වර්ණවල පාටකුඩු සිරුරුවල තවරා ගනිමින්, ජලය සමග මුසු කර සෑම තැනකටම ඉසිමින් ඉතාමත් විනෝදකාමී ලෙස සමරන මේ උත්සවය හින්දු භක්තිකයන්ගේ සුවිශේෂීම අංගයකි. විෂ්ණු දෙවියන්ගේ දැඩි භක්තිකයන් වන හින්දු බැතිමතුන් හෝලි උත්සවය දින දහසයක් පමණ කාලයක් පුරා පවත්වයි. හෝලි උත්සවය අති උත්කර්ෂවත්වම සමරන්නේ ඉන්දියාවේ රාජස්ථානයේය.

ශුද්ධ වූ සතියට ගරු කිරීම සඳහා අලු බදාදා සිට මහ සිකුරාදා තෙක් වන ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය සහ මරණය පිළිබඳව සිහිපත් කරමින් ග්වාතමාලාව සමරන උත්සවය semana Santa නමින් හැඳින්වෙයි. සෑම වීදියක්ම පාහේ විවිධ විචිත්‍රාංගවලින් සැරසුණු වර්ණවත් පෙරහර මඟින් හැඩ වැඩ වන අතර ප්‍රධාන පෙරහර සෑම වීථියක් පුරාම සංචාරය කරයි. විවිධ වර්ණවල අලංකාර මල් වලින් සහ සියුම් ලෙස කැටයම් කරන ලද එළවළු සහ පලතුරුවලින් මෙම උත්සවය අලංකාර වේ.

උත්සව සහ සැමරුම් සිදු කිරීම විනෝදය උදෙසාම පමණක් නොවන බව සිහිපත් කර දෙන්නේ සියලු සාන්තුවරුන්ගේ සහ සියලු ආත්මයන්ගේ දින ලෙස නම් කර ඇති නොවැම්බර් මස පළමුවන සහ දෙවන දින නිවාඩු දින ලෙස නම් කරමින් මෙක්සිකෝව එය 'මළවුන්ගේ දිනය' බවට පත් කරගැනීම නිසාය. මිය ගිය සියලු ඥාතීන් සිහිපත් කරමින් ඔවුන් වෙනුවෙන් පූජාසනයක් ඉදිකර ඔවුන් ජීවත්ව සිටියදී ආහාරයට ගැනීමට කැමැත්තෙන් සිටි ආහාරපානාදිය සකස් කර ආහාරයට ගන්නා අතරම ඔවුන් වෙනුවෙන් තෑගි හෝග දීම ද මෙහිදී සිදු වේ. මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම ද මෙම උත්සවයේ ප්‍රධාන අංගයකි.

ශ්‍රී ලංකාවේ සිංහල අලුත් අවුරුද්දට සමගාමී දිනවලම තායිලන්තයේ පවත්වන සොන්ක්‍රාන් (songkran) උත්සවය ද වසන්තය පිළිගැනීම උදෙසා සූදානම් වන උත්සවයකි. අප්‍රේල් මස 13 සිට 15 වන දා දක්වා පැවැත්වෙන මෙම උත්සවයේදී ඔවුන්ට හිමි සාම්ප්‍රදායික අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරන්නට ද ඔවුන් හුරු පුරුදු වී සිටිති. සොන්ක්‍රාන් උත්සවයෙන් අනතුරුව වසරේ වියළි කාලය ටිකෙන් ටික නිමා වී යන අතර ඔවුන් මේ උත්සවය සමරන්නේ වර්ෂයේ උණුසුම අධිකම දිනවලය. එකිනෙකාට ජලය ඉස ගනිමින් ඉතා විනෝදකාමී ලෙස කාලය ගත කරන්නට ඔවුන් මේ දින කිහිපය යොදා ගනිති. කාම්බෝජය, ලාඕසය සහ මියන්මාරය ද විවිධාකාර වූ නම්වලින් මේ කාලසීමාව තුළම මෙබඳු උත්සව සැමරුම් සිදුකරයි.

ජපානයේ පහන් උත්සවය (Obon festival) ද මළවුන් සැමරීම උදෙසා සිදු කරන බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර විධි ඇතුළත් උත්සවයකි. අගෝස්තු මාසයේදී සිදු කරන මෙම උත්සවයේදී කියෝතෝ කඳුකරයේ දැවැන්ත ගිණි ගිනි මැලයක් දල්වනු ලබයි. එසේම Bon Odori නමින් හඳුන්වන නැටුම් සංදර්ශනයක් ද ඔවුන් ඉදිරිපත් කරයි. අවසානයේදී සිය සොහොන් ගැබ් වෙතට සාමකාමීව නැවත ගමන් කරන ආත්ම සිහිකිරීම සඳහා ගංගාවන්හි කඩදාසි පහන් පා කර හරින ආකාරය අලංකාර දර්ශනයක් ලෙස දක්නට ලැබේ.

භූතානයේ සංස්කෘතික උත්සවයක් වන Tsechus ඉතා වර්ණවත් සහ අලංකාර ලෙස සමරනු ලබන්නේ ලොව පුරා සියලු දෙනාගේ අවධානය ඒ වෙතට යොමු කරවා ගනිමිනි. ඈත පිටිසර හුදෙකලා ගම්මානවල සිට රටෙහි ප්‍රධාන ආරාම දක්වා සෑම තැනකම මෙම උත්සවය සමරනු ලබයි. අතිශය ජනප්‍රියත්වයට පත්ව ඇති මෙම උත්සවය වඩාත් අලංකාර කර ගැනීම සඳහා ඔවුන් මාස ගණනක සිට එයට සූදානම් වෙති.

එකිනෙකට වෙනස් වූ විවිධ අරමුණු උදෙසා වූ මෙබඳු අපූරු උත්සව රැසක් ලොව සෑම රටක්ම පාහේ සිය අනන්‍යතාවයන් පිළිබඳව ලෝකයම දැනුවත් කරමින් සමරනු ලබයි. ලෝකය වඩාත් සුන්දර තැනක් ලෙස දිස්වන්නේ මෙබඳු විවිධත්වයකින් සමන්විත වන නිසාය. අප අපේ අනන්‍යතාවයත් )සංස්කෘතිකාංග සුරක්ෂිත කර ගත යුත්තේ ඒ සොඳුරු විවිධත්වය ඉදිරියටත් පවත්වාගෙන යා යුතු බැවිනි. එකට බැඳුණු එකම විශ්ව ගම්මානය විවිධ විෂම සංස්කෘතික අංග මගින් වඩාත් අලංකාර වනු ඇත.

**දිල්රූ ජයසේකර**

# අත්අඩංගුවට ගැනීම නීති විරෝධියි

## යාපනය නගරාධිපති කියයි

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

පොලිස් ත්‍රස්ත මර්දන ඒකකය විසින් තමන්ව අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවත් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී නීතිමය පියවර ගන්නා බවත් යාපනය නගරාධිපති විශ්වලිංගම් මනිවන්නන් මහතා පැවසීය.

ඔහු එසේ පැවසුවේ යාපනය මහධිකරණය මගින් ඔහුව ඇපමත නිදහස් කිරීමෙන් අනතුරුව පෙරේදා (10) මාධ්‍යයට අදහස් දක්වමිනි.

'මගේ එකම අරමුණ යාපනය නගරය පිරිසුදුව තබා ගැනීමයි. ඒ වෙනුවෙන් මමත් මහ රෑ පාරට බැහැලා කුණු කාණු හේදුවා. තවත් මම නගරාධිපතිවරයා වශයෙන් යාපනය පිරිසුදුව තබා ගන්නට යමක් කරන්න තියනවානම් මම ඒක කරනවා.

මට මේ රට බෙදන්නවත් තිබුණු සංවිධානවලට පණ පොවන්නවත් ඕනේ නැහැ.මම කළේ මට ඇති බලය අනුව නගරයේ පිරිසුදුකම පැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්න වෙනම බළකායක් පිහිටුවන්නයි.එයාලට පොලිස් කියන වචනය දාගෙන තියෙන්නේ මම නෙමෙයි.

මේ අය ඇදගෙන ඉන්න ඇදුම කොටි පොලීසියේ ඇදුමම කියලා ඔප්පු කරන්නයි පොලිස් ත්‍රස්ත මර්දන අංශයට උවමනා වුණේ.මේකට දකුණේ මාධ්‍ය සහ සිංහල බෞද්ධ බලවේග විශාල ප්‍රචාරයක් ගෙන ගියා.මේ ඇදුම කොටි පොලීසියේ ඇදුම කියලා ඔවුන් කියන්නේ ඒකේ පාට නිසයි.එහෙමනම් ගුවන් හමුදාවේ ඇදුමත් මේ වගේමයි.ඒකටත් එරෙහිව කටයුතු කරන්න සිද්ධ වෙනවා.තවත් බොහෝ පෞද්ගලික ආරක්ෂක අංශත් මේ පාටටම ඔවුන්ගේ නිල ඇදුම් භාවිත කරනවා.දෙමළ අය මේ පාට ඇන්දම තමයි වැරදි.මේක තමයි විශාලම අසාධාරණය.

මේ වගේ පුංචි දෙයක් වෙනුවෙන් නගරාධිපතිවරයෙක් අත්අඩංගුවට ගැනීම කොතරම් වැරදිද නීත්‍යානුකූල නොවන්නේද කියන දේ දැන් වැටහෙන්ට ඕනේ. ලෝකයේ රටවල් ගණනාවක් මේ නීති විරෝධී අත් අඩංගුවට ගැනීම හෙළා දැක නිවේදන නිකුත් කොට තිබෙනවා.මමත් මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවරක් ගන්නවා.'

# නිරෝධායන රීති කඩ කරන්නන් සෙවීමට විශේෂ මෙහෙයුමක්

**රක්ෂණ ශ්‍රියන්ත,**
**සුභාෂිණී සේනානායක**

අලුත් අවුරුදු සමයේ නිරෝධායන රීතීන් උල්ලංඝනය කරන්නේදැයි සොයා බැලීමට විශේෂ මෙහෙයුමක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලෙස සියලුම පොලිස් ස්ථානවලට පොලිස් මූලස්ථානය මගින් විශේෂ චක්‍රලේඛයක් නිකුත් කර තිබේ.

මෙයට හේතු වී ඇත්තේ උත්සව සමයේ නිරෝධායන රීතීන් උල්ලංඝනය කරමින් සාප්පු සවාරි යාම සහ පොදු ගමනාගමන සේවාවල ගමන් කිරීම බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

ඒ අනුව ඊයේ (11) සිට සියලු සාප්පු, සුපිරි වෙළෙඳ සල් සහ පොදු ගමනාගමන සේවාවල නිල ඇඳුමෙන් මෙන්ම සිවිල් ඇඳුමෙන් සැරසුණ පොලිස් නිලධාරීන් යොදවා නිරෝධායන රීතීන් උල්ලංඝණය කරන පුද්ගලයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේ.

එසේම අලුත් අවුරුදු උත්සව සංවිධානය කිරීමේදී අනිවාර්යයෙන් පොලිසියෙන් අවසර ගත යුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

# චත්මින්ට පිහිටක් වෙමු



මාතලේ, අලුවිහාරය, බීරිදෙවල පාරේ අංක 123/5 ඒ නිවෙසේ පදිංචි චත්මින් නානායක්කාර දරුවා තැලසීමියා රෝගයෙන් පීඩා විඳියි.

එම දරුවාගේ ජීවිතය බේරා ගැනීම සඳහා ඇට මිදුළු බද්ධයක් සිදුකළ යුතු බවට කුරුණෑගල ශික්ෂණ රෝහලේ ජාතික තැලසීමියා මධ්‍යස්ථානයේ විශේෂඥ වෛද්‍ය දයානන්ද බණ්ඩාර මහතා නිර්දේශ කර තිබෙන අතර එම ශල්‍යකර්මය වෙනුවෙන් රුපියල් ලක්ෂ 70ක් පමණ වැයවන බවට ගණන් බලා තිබේ.

මෙම මුදල එම දරුවාගේ මවට සොයා ගැනීමට අපහසු කාර්යයක් වී තිබෙන අතර දරුවා සුවකර ගැනීම සඳහා ආධාර කිරීමට අපේක්ෂා කරන අයෙක් වේ නම් මහජන බැංකුවේ මාතලේ ශාඛාවේ ආරම්භ කර තිබෙන 002200430034150 හෝ ලංකා බැංකුවේ මාතලේ ශාඛාවේ ආරම්භ කර තිබෙන 79175866 හෝ කොමර්ෂල් බැංකුවේ මාතලේ ශාඛාවේ ආරම්භ කර තිබෙන 8080051988 ගිණුම් අංක වෙත මුදල් බැර කරන ලෙස ඉල්ලීමක් කරයි.

## තීරු ලිපි රචක රත්නායක වනසිංහ අභාවප්‍රාප්ත වෙයි

ප්‍රකට තීරු ලිපි රචකයකු වූ රත්නායක වනසිංහ මහතා ඊයේ (11) අභාවප්‍රාප්ත විය. 'නිලමේ' නමින් ඔහු ලියූ තීරු ලිපි පෙළ අතිශය ජනප්‍රිය විය. ඉංග්‍රීසි නවකතා රාශියක් සිංහලට නැගූ රත්නායක මහතා මිය යන විට 92 වියේ පසු විය.

ඒ මහතාගේ ආදාහන කටයුතු අද (12) සවස 4.00ට මහනුවර මහයියාව පොදු සුසාන භූමියේදී සිදු කෙරේ.

# කොවිඩ් හේතුවෙන් යාපනේ සියලු සිනමා ශාලා වැසේ

පවතින කොවිඩ් -19 වයිරස ව්‍යාප්තිය හේතුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ සියලුම සිනමා ශාලා නැවත දැනුම් දෙනතුරු වසා දමා තිබේ. උතුරු පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ ඒ. කේදීෂ්වරන් මහතා ප්‍රකාශ කළේ මේ වන විට එම දිස්ත්‍රික්කයේ විවාහ උත්සව කටයුතු, පුද්ගලික පන්ති පැවැත්වීම ආදිය ද තාවකාලිකව අත්හිටුවා ඇති බවය.

මේ අතර, කොවිඩ් - 19 වයිරසය ආසාදනය වීමෙන් පෙරේදා (10) තවත් පුද්ගලයකු මිය ගිය අතර, කොවිඩ් -19 ආසාදිතව මෙරට දී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව 596 දෙනකු දක්වා ඉහළ ගියේය.

ඒමෙන්ම, ඊයේ දිනය තුළ කොවිඩ් -19 ආසාදිතයන් 268 දෙනකු ද හඳුනාගෙන ඇත.

# පන්දහසේ දීමනාව දීමෙන් සංගම් කිහිපයක් ඉවත් වෙයි

රුපියල් 5000 දීමනාව ලබා දීමේ වැඩපිළිවෙළින් ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරීන්ගේ සංගමය හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගම් කිහිපයක් ඉවත් වන බව පවසයි.

දින දෙකක් වැනි කෙටි කාලයකදී මෙම දීමනාව ලබා දීම අසීරු බැවින් මෙම තීරණය ගනු ලැබූ බව සභාපති සුමිත් කොඩිකාර මහතා ඊයේ (11) පැවැති මාධ්‍ය හමුවකදී පැවැසීය.

සමෘද්ධි නිලධාරීන්ගේ සංගම් ප්‍රකාශ කළේ මෙම දීමනාව දින දෙකක් තුළ ලබා දීම අසීරු බැවින් එය අවුරුද්දෙන් පසු ගෙවීමට ද අවස්ථාව ලබා දෙන්නැයි අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීම් කර තිබෙන බවයි.

# හම්බන්තොට යෝජිත වන අලි රක්ෂිතය ප්‍රකාශයට

**පහන් විජේසේකර**

හම්බන්තොට යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කිරීමට අදාළ ගැසට් පත්‍රය මේ වනවිට රජයේ මුද්‍රණාලය වෙත යොමු කර තිබේ.

අදාළ ගැසට් පත්‍රය කඩිනමින් නිකුත් කිරීම සඳහා ඉකුත් සිකුරාදා දින රජයේ මුද්‍රණාලය වෙත යොමු කළ බව වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර මහතා දිනමිණට කීය.

# යාපනයේ නගරාධිපති අත්අඩංගුවට ගැනීම හෙළා දකිනවා

## එජාපය පවසයි

**ශිරෝමි අබයසිංහ**

යාපනයේ නගරාධිපති විශ්වලිංගම් මනිවාන්නන් මහතා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම හෙළා දකින බව එක්සත් ජාතික පක්ෂය පවසයි.

මහ නගර සභාවේ සේවකයින් විසින් පැළඳ සිටින නිල ඇඳුම් සම්බන්ධයෙන් චෝදනා එල්ල කර මෙම අත්අඩංගුවට ගැනීම සිදු ව ඇති අතර මහජන ඡන්දයෙන් තේරී පත් වූ නිලධාරියෙකු විසින් සිදුකරන ලදැයි කියන යම් වැරැද්දක් පිළිබඳව පොලිස් ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර ඒ පිළිබඳව පරීක්ෂණයක් අදාළ අංශ විසින් සිදු කළ යුතු බවද එක්සත් ජාතික පක්ෂය කියා සිටියි.

මෙම සේවකයින් විසින් පැළඳ සිටින නිල ඇඳුම්වල එල්ටීටීඊයේ නිල ඇඳුම්වලට සමානකමක් ඇති බවට කර ඇති චෝදනාවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කරන ලෙස එජාප නිවේදනයක් නිකුත් කරමින් සියා සිටියි.

# සතොස සහන මල්ලට චෝදනා නැගූ අසේලට කෝටි 50ක් ඉල්ලා එන්තරවාසි යවනවා

## ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

සතොස සහන මල්ලට අභූත චෝදනා එල්ල කළ ආපනශාලාහිමියන්ගේ සංගමයේ සභාපති අසේල සම්පත් මහතාට එරෙහිව රුපියල් කෝටි 50 ක වන්දි ඉල්ලා එන්තරවාසි යැවීමට කටයුතු කරන බව වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ඊයේ (11) පැවැසීය.

මේ වන විට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට තමන් නීතිඥවරයාට දැනුම් දී තිබෙන බවද හෙතෙම කීවේය.

ජනතාව වෙනුවෙන් ලබා දෙන මෙම සහන මල්ලට මේ වන විට විවිධ පුද්ගලයන් අභූත චෝදනා එල්ල කරමින් සිටින බවත් ඒ සියලු දෙනාට එරෙහිව නීති මඟින් කටයුතු කරන බවත් ඇමැතිවරයා පැවැසීය.

සතොස සහන මල්ලට අභූත චෝදනා එල්ල කළ

අසේල සම්පත් මහතා ඉකුත් දින මාධ්‍ය හමුවක් පවත්වමින් සතොස සහන මල්ලේ තිබෙන භාණ්ඩ ප්‍රමිතියෙන් තොර ගුණාත්මක බවෙන් තොර යැයි පවසා තිබේ. මේ නිසා එම භාණ්ඩ සැපයු සැපයුම් කරුවන් හා රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව, ලංකා සතොස ආයතන මගින් ඒ සම්බන්ධයෙන් පොලිසිවලට සිදුකළ පැමිණිලි කර තිබේ. වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් හදානි ජයවර්ධන මහත්මියද මේ සම්බන්ධයෙන් පොලිස් පතිට පැමිණිලි කර තිබේ. මීට අමතරව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේද මේ සම්බන්ධයෙන් කතා කරමින් මෙවැනි අභූත චෝදනා කරන අය කඩිනමින් පොලිස් අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලීමක් කළේය.

# සිනෝෆාම්වලට එරෙහිව අයිතිවාසිකම් පෙත්සමක්

**නෙල්කා මැදගෙදර**

චීනයේ නිෂ්පාදිත 'සිනෝෆාම්' නමැති එන්නත ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතියකින් තොරව කොවිඩ් 19 වයිරසය පාලනය කිරීම මෙරට තුළ භාවිතයට නොගන්නා ලෙස නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තිබේ.

රෝගීන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පෙරමුණ සහ එහි සභාපති ලුයිස් බෙනඩික්ට් ඇතුළු තුන් දෙනෙකු විසින් පෙත්සම ඉදිරිපත් කර ඇත. එහි වගඋත්තරකරුවන් ලෙස සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැතිනි චන්න ජයසුමන, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, එහි සභාපති මහාචාර්ය අසිත ද සිල්වා ඇතුළු සාමාජිකයන් ඇතුළු 24 දෙනෙකු නම් කර තිබේ.

# අඩවි වන නිලධාරියා අල්ලස් දැලේ

**නුවන් හෙට්ටිආරච්චි**

කඹුරුපිටිය අඩවි වන නිලධාරියකු රුපියල් 5000ක මුදලක් අල්ලස් ලෙස ලබා ගැනීමේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

කඹුරුපිටිය ප්‍රදේශයේ පදිංචි ව්‍යාපාරිකයකුගෙන් ලද පැමිණිල්ලකට අනුව මෙම වැටලීම සිදු කර ඇති අතර එම නිලධාරීයා විසින් මෙම අල්ලස් මුදල ලබාගෙන ඇත්තේ කොස් ලී ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දීම සඳහාය.

01 වැනි පිටුවෙන්...

## ගම සමඟ ...

"ගම සමඟ පිළිසඳර" වැඩසටහනෙන් රජය අපේක්ෂා කරන ඉලක්ක සපුරා ගැනීම හා ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස මෙහෙයවීම සහ පසු විපරම් කිරීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් මේ ජනාධිපති කාර්යසාධක බළකායක් පත්කර ඇත.

රාජ්‍ය ඇමැතිවරුන්ගෙන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත 15 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් මේ බළකායට පත් කර ඇති අතර රාජ්‍ය ඇමැතිවරුන් වන නිමල් ලාන්සා, දිලුම් අමුණුගම, කංචන විජේසේකර, සීතා අරඹේපොළ, චන්න ජයසුමන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන කාදර් මස්තාන්, කපිල අතුකෝරල, සංජීව එදිරිමාන්න, නිපුන රණවක, චාමර සම්පත් දසනායක, ටිරාන් අලස්, ගෙවිඳු කුමාරතුංග, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්, චින්තක අමල් මායාදුන්නේ සහ ජයන්ත වීරසිංහ යන මහත්ම මහත්මීහු එහි සෙසු සාමාජිකයෝ වෙති.

ජනාධිපති අතිරේක ලේකම් චන්දිමා වික්‍රමසිංහ මෙනවිය "ගම සමඟ පිළිසඳර" ග්‍රාමීය සංවර්ධන කාර්යයන් හා සම්බන්ධිත අවශ්‍ය සියලු තොරතුරු සම්පාදනය හා සම්බන්ධීකරණය භාරව සිටී.

"ගම සමඟ පිළිසඳර" වැඩසටහනේ දී ජනතාව ඉදිරිපත් කරන ප්‍රශ්න හා ගැටලු විසඳීමට ජනාධිපතිවරයා දෙන උපදෙස් හා නියෝග කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ වෙනත් සියලුම ආයතන ප්‍රධානීන් ද ඇතුළුව ප්‍රාදේශීය මට්ටමේ සියලු නිලධාරීන් සේවා අවශ්‍යතාව මත මෙහෙයවීම කාර්ය සාධක බළකායේ මූලික වගකීමක් වේ.

ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන මඟින් 2021 – 2023 අය වැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන මාර්ග, පානීය ජල සම්පාදන, විදුලිය, දුරකථන සන්නිවේදන, ක්‍රීඩා පිටි, පාසල්, රෝහල්, වෘත්තීය අධ්‍යාපන ආයතන, නාගරික විශ්ව විද්‍යාල, ඉඩම් පැවරීම්, බැංකු හා මූල්‍ය පහසුකම්, වෙළෙඳපොළ, ගබඩා හා යටිතල පහසුකම් ව්‍යාපෘති කඩිනම් කිරීම බළකායට පවරා තිබේ.

රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙළ යටතේ දේශීය හා විදේශීය අරමුදල් ඇතිව ක්‍රියාත්මක සියලුම ව්‍යාපෘති ඉලක්කගත කාලසීමාව තුළ ප්‍රමිතියෙන් යුතුව කඩිනම් කරවීම කාර්ය සාධක බළකායෙන් අපේක්ෂා කෙරේ.

කිසියම් රාජ්‍ය සේවකයකු හෝ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ එබඳු ආයතනයක නිලධාරියකු කාර්ය සාධක බළකාය පවරන රාජකාරී ඉටුකිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින හෝ අවස්ථා තමාට වාර්තා කරන්නැයි ජනාධිපතිවරයා කාර්ය සාධක බළකායට නියම කොට විධාන කර තිබේ.

## රු. 5000ක අවුරුදු දීමනාව ...

ඒ අනුව එම දීමනාව ලබාදීමේ තීරණයට අදාළ චක්‍රලේඛයක් නිකුත් කර තිබෙන අතර ප්‍රතිලාභි පවුල් තෝරා ගැනීම කාණ්ඩ 07ක් යටතේ සිදු කිරීමට නියමිත බව අගමැති කාර්යාලය ප්‍රකාශ කරයි.

අගමැති ලේකම්වරයා විසින් නිකුත් කර ඇති එම චක්‍රලේඛය අනුව සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලාභීන්, වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගී දීමනාලාභීන්, සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව ලබන්නන් සහිත පවුල් සඳහා එම දීමනාව පිරිනැමීමට නියමිතයි.

දීමනාව ගෙවීමේ දී ප්‍රතිලාභී පවුලකට ගෙවීම සිදුකරනු ලබන්නේ එක් කාණ්ඩයක් යටතේ පමණක් බවට අදාළ චක්‍රලේඛය මඟින් දක්වා ඇති අතර ඡන්ද හිමි නාමලේඛනයේ එක් ගෘහ මූලික අංකයක් යටතේ ලියාපදිංචි සිටිය ද එම ගෘහ මූලික ඒකකයේ ප්‍රධාන පවුල් ඒකකයට අමතරව අනු පවුල් වශයෙන් ජීවත්වන පවුල් සඳහා ද ගෙවීම සිදුකෙරේ.

ඒ අනුව මේ යටතේ සමෘද්ධිලාභී පවුල් 1,700,000ක්, සමෘද්ධි පොරොත්තු ලේඛනයේ පවුල් 780,000ක්, අභියාචනා පවුල් 726,000ක්, වැඩිහිටි දීමනා ලබන පවුල් 626,000ක්, ආබාධිත පුද්ගල දීමනාව ලබන පවුල් 123,000ක්, වකුගඩු රෝගීන් සඳහා දීමනාව ලබන පවුල් 44,400ක් ඇතුළුව පවුල් ලක්ෂ 40කට සහ ග්‍රාමීය කමිටු හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ අනුව ජීවනෝපාය අහිමි පිරිස් සඳහා මෙම දීමනාව ලබාදීමට රජය පියවර ගෙන තිබේ.

අද (12) සිට මෙම රුපියල් 5000 දීමනාව ලබාදීමට නියමිතව තිබෙන අතර ඒ අනුව සමෘද්ධිලාභී පවුල්, අඩු ආදායම්ලාභීන් ලෙස හඳුනාගෙන ඇති පවුල්, වැඩිහිටි දීමනාව ලැබෙන පුද්ගලයන් සිටින පවුල්, ආබාධිත දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල්, වකුගඩු රෝගී තත්ත්වය හේතුවෙන් දීමනා ලබන පුද්ගලයන් සිටින පවුල්, සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල් සහ ඉහත සඳහන් පවුල් කාණ්ඩ 6 යටතේ අභියාචනා ඉදිරිපත් කර ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලැබූ පවුල් සඳහා එම දීමනාව ලබාදීමට නියමිතව තිබේ.

එම දීමනාව ගෙවීමේ දී ඉහත සඳහන් ප්‍රතිලාභීන් සිටින පවුලකට රුපියල් 5000ක් පමණක් ලැබෙන සේ ගෙවීම කළ යුතු බවට අගමැති කාර්යාලය ප්‍රකාශ කරන අතර යම් පවුලකට සමෘද්ධි හිමිකම් ලැබේ නම් හා වැඩිහිටි දීමනාව ලැබීමට සුදුසුකම් ලබන පුද්ගලයෙක් වේ නම්, එම පවුලට එක් රුපියල් 5000 දීමනාවක් පමණක් හිමිවේ.

මෙම දීමනාව ගෙවීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මෙන්ම ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු නිලධාරීන් සහභාගි කරගෙන අදාළ දීමනාව කඩිනමින් ප්‍රතිලාභීන් වෙතට සෞඛ්‍ය නීතිරීති අනුගමනය කරමින් ලබාදීමට කටයුතු කරන ලෙස ද අගමැති කාර්යාලය කියා සිටී.

## කෘෂි අමාත්‍යාංශය තිබූ ...

වසර පහක කාලයක් තුළ රුපියල් කෝටි 189කට (රුපියල් ලක්ෂ 18,900) වැඩි මුදලක් වැය කරමින් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය කෘෂිකර්ම අමාත්‍යාංශය ගොවිජන මන්දිරයෙහි නැවත ස්ථාපිත කිරීමට තීන්දු කෙරුණේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වීමෙන් පසුවය.

ඒ අනුව අංක 19/3393/217/001 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2020 ජනවාරි මස 03 වැනි දින අනුමැතිය හිමි වූ අතර එම තීන්දුව එම මාසයේම 30 වැනි දින සිට ක්‍රියාත්මක කෙරිණි.

එහෙත් අමාත්‍යාංශය සතු රාජ්‍ය දේපොළ ගොඩනැගිල්ලෙන් ඉවත් කරගැනීමේ කාර්යයට එම සමාගමේ කළමනාකාරීත්වය මෙම වසරේ මාර්තු මස 11 වැනි දින සිට බාධා කිරීම හේතුවෙන් වැලිකඩ පොලීසියට පැමිණිලි කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ගොවිජන මන්දිරය පාර්ලිමේන්තුවේ වෙනත් කටයුත්තකට අවශ්‍ය බව කියමින් පසුගිය ආණ්ඩුව කෘෂිකර්ම අමාත්‍යාංශය රාජගිරියේ පිහිටි මෙම පෞද්ගලික ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලද්දේ 2016 අප්‍රේල් මස 08 වැනිදාය.

ඒ සඳහා වසර පහක ගිවිසුමකට එළැඹුණු අතර එම කාලය තුළ මාසික කුලී වශයෙන් පමණක් රුපියල් කෝටි 155කට (රුපියල් 1,549,595,263) ආසන්න මුදලක් ගෙවන්නට රජයට සිදුව තිබේ. 2016 අප්‍රේල් මස 08 වැනිදා සිට 2021 මාර්තු මස 07 වැනිදා දක්වා කාලය තුළ මෙසේ රුපියල් කෝටි 155ක් ගෙවන්නට සිදුව ඇත්තේ අමාත්‍යාංශය එම ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීම වෙනුවෙන් කාර්යාල පහසුකම් සැකසීම, ලී බඩු සහ උපකරණ මිලට ගැනීම, සන්නිවේදන පහසුකම් සහ උපදේශන සේවා සඳහා වැය කෙරුණු රුපියල් කෝටි 34ක (රුපියල් 340,607,998) මුදලට අමතරවය.

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොඩනැගිල්ල හිමි පෞද්ගලික සමාගම අතර ගිවිසුම මෙමස 07 වැනි දිනෙන් අවසන් වූ අතර එදිනට බදු ගැනුම්කරු නිරවුල් භුක්තිය බදු දීමනාකරු වෙත හිමිකර දියයුතු බව ගිවිසුමෙහි ඇතුළත් කොට තිබේ.

## පොල්තෙල් නියැදි ...

එම සාම්පලවලින් ලැබී ඇති පරීක්ෂණ වාර්තා 109ක් ඇෆ්ලටොක්සීන් නමැති විෂ රසායනිකය අන්තර්ගත නොවන බව තහවුරු වී ඇති බව රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා සඳහන් කළේය.

ආනයනය කරන ලද පොල්තෙල් සම්බන්ධයෙන් ඇති වූ අර්බුදකාරී වාතාවරණය හමුවේ වෙළෙඳපොළේ අලෙවියට තබා ඇති පොල්තෙල් සම්බන්ධයෙන් පාරිභෝගික අධිකාරිය විශේෂ විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ශ්‍රී ලංකාවට ආනයනය කරන ආහාර ද්‍රව්‍යවල අඩංගු පිළිකාකාරයක් ලෙස සැලකෙන ඇෆ්ලටොක්සීන් ප්‍රමාණය සම්බන්ධ නීති දැඩි කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත.

## අද බැංකු ...

මේ අනුව අද (12) දිනයේ දී සියලු රාජ්‍ය හා පෞද්ගලික බැංකු ශාඛා ගනුදෙනු සඳහා විවෘතව පවතිනු ඇත.

එමෙන්ම අද දිනය බැංකු නිවාඩු දිනයක් නොවන බැවින් කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු ද සාමාන්‍ය ආකාරයෙන් සිදුකෙරෙන බව කොළඹ කොටස් වෙළෙඳපොළ ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා පැවැසීය.

## මහ මොළකරුවන් ...

හිටි හැටියේ පාස්කු ප්‍රහාරයේ මහ මොලකරු බවට පුද්ගලයකු නම් කරමින් ආණ්ඩුව ජනතාව නොමඟ යවන්නට උත්සාහ කරන බව ද විපක්ෂ නායකවරයා සඳහන් කළේය. යාපනය නගරාධිපති අත්අඩංගුවට ගැනීම වැනි සිදුවීම් හරහා සැබෑ ප්‍රශ්න යට ගසමින් නැති ප්‍රශ්න ඉස්මතු කොට සිය එදාවේල දේශපාලනය කිරීමට ආණ්ඩුව කටයුතු කරන බව ද ඔහු කියා සිටියේය.

හෙතෙම මේ අදහස් පළ කළේ විපක්ෂ නායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

## 580ක් රිය අනතුරුවලින් ...

දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු වූ රිය අනතුරුවලින් පුද්ගලයන් 05 දෙනකු පෙරේදා (10) මියගොස් ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

වසරේ වැඩිම රිය අනතුරු සිදුවන්නේ අප්‍රේල් මාසයේ බවත් එයිනුත් අප්‍රේල් 10 සිය 20 දක්වා කාලය තුළ වැඩිම රිය අනතුරු සිදු වන කාලය බවත් එබැවින් මාර්ග නීතිවලට අනුගතව මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොරව රිය පදවන ලෙසත් පදිකයන්ද සැලකිලිමත්ව ගමන් කරන ලෙසත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී. බීමත් රියැදුරන් පමණක් නොව විවිධ මත්ද්‍රව්‍ය භාවිත කර රිය පදවන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පෙරේදා (10) සිට දිවයිනේ සියලුම පොලිස් ස්ථාන එක්ව විශේෂ මෙහෙයුමක් ආරම්භ කර ඇති අතර මාර්ග නීති කඩකරන රියැදුරන් අත්අඩංගුවට ගැනීමට සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධාරීන් පොදු ප්‍රවාහන සේවාවල යොදවා ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

# මරණ දැන්වීම්

**සුවිනීතා වීරසිංහ මැතිණිය** - කොළඹ 5, තිඹිරිගස්යාය, අංක 299 දරණ නිවසේ පදිංචිව සිට නැසීගිය, Design Team Three ආයතනයේ ගරු සභාපති, ප්‍රවීණ ගෘහ නිර්මාණ ශිල්පී දේශමාන්‍ය, දේශකීර්ති, සාම විනිසුරු ගරු, ටී. පී. වීරසිංහ මැතිතුමාගේ ආදරණීය භාර්යාව වූ සුවිනීතා වීරසිංහ මැතිණිය අභාවප්‍රාප්ත විය. **දේහය සඳුදා පෙරවරු 9 සිට පස්වරු 4.00 දක්වා කොළඹ 07, ජයරත්න මල් ශාලාවේ (Restpect), තැන්පත් කර ඇත.** අවසන් කටයුතු එදිනම සවස 4.30 ට බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදු කෙරේ. 028452

# පාස්කු දා ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනාට දඬුවම් කිරීම පමණක් නොව දේපළ රාජසන්තක කිරීමත් කරනවා

## ● ඇමැති සරත් වීරසේකර



**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

පාර්ලිමේන්තුව

පාස්කුදා ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනා දඬුවමට ලක් කිරීම පමණක් නොව ඔවුන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීමට රජය කටයුතු කරන බව මහජන ආරක්ෂක ඇමැති සරත් වීරසේකර මහතා පාර්ලිමේන්තුවේ දී ඉකුත්දා (9) ප්‍රකාශ කළේය.

දේපළ රාජසන්තක කිරීමෙන් ලබා ගන්නා මුදල්වලින් වින්දිතයන්ට අමතරව මුදල් ගෙවීමක් පිළිබඳව සලකා බලන බවත්, අයි.එස් හා වහබ්වාදීන් හඳුනා ගැනීමට බුද්ධි අංශයේ සහාය පමණක් නොව රටේ සමස්ත ජනතාවගේ සහාය අවශ්‍ය වන අතර රටේ සියලු දෙනා විපරමින් සිටින්නේ නම් එවැනි පුද්ගලයන් හඳුනා ගත හැකි බවත් ඇමැතිවරයා පැවසුවේය.

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ විවාදයට එක්වෙමින් ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව ඉකුත් දා (9) රැස් විය. නිවේදන, ලිපි ලේඛන, පෙත්සම් වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව වාචික පිළිතුරු අපේක්ෂාවෙන් මන්ත්‍රීවරුන් ඇසූ ප්‍රශ්නවලට ඇමැතිවරු පිළිතුරු දුන්හ.

මහජන ආරක්ෂක ඇමැති සරත් වීරසේකර මහතා පාස්කු ප්‍රහාරයට අදාළව පසුගිය දින කිහිපය තුළ මේ සභාව තුළ යෝජනා වගේම චෝදනා ඉදිරිපත් වුණා. මේ ප්‍රහාරය නිසා 276 ක් මරණයට පත් වුණා. 500 කට වැඩි පිරිසක් තුවාල වුණා. ශාන්තා මායාදුන්නේ මහත්මිය හා ඇගේ දියණියත් මෙමගින් මිය ගියා. ඒ ගැන අපි අදටත් කම්පා වෙනවා. ජනාධිපතිවරයා පත් වීමෙන් පසුව සැකකරුවන් 108ක් අත්අඩංගුවට ගත්තා. රැඳවුම් නියෝග මත 76 ප්‍රශ්න කරනවා. විදේශ රටවල සිටින 54 න් 50 ක් මෙරටට ගෙනැවිත් ප්‍රශ්න කරනවා. සැකකරුවන්ට නඩු පැවරීමට අපි මේ වන විට කටයුතු කරමින් සිටිනවා. නීතිපතිවරයා අතේ මේ කාර්ය දැන් පවතිනවා. සැප්තැම්බර් 11 වැනිදා අමෙරිකාවේ සිදු කළ ප්‍රහාරය නිසා අත්අඩංගුවට ගත් කෙනාට අදටත් නඩු පවරා නැහැ. එවැනි කාලයක් ගත වන්නේ නිවැරදි විදියට සාක්ෂි සොයා ගැනීමට අවශ්‍ය නිසයි. පාස්කු ප්‍රහාරයට අදාළ සියලු දෙනාට තරාතිරමකින් තොරව දඬුවම් ලබාදීමට වත්මන් රජය කටයුතු කරනවා. සහරාන් කියන අන්තවාදී දේශකයා ඉස්ලාම් රාජ්‍යයක් ඇති කිරීමට කටයුතු කළ යුතුයි කියන මතය සමාජගත කරන්න පියවර ගත්තා. මුස්ලිම් දරුවන් ඒ සඳහා පෙලඹවීමට ඔහු කටයුතු කළා. ඔහු අත්අඩංගුවට ගැනීමට එවකට පැවැති රජය කටයුතු කළේ නැහැ.

සහරාන් මේ ප්‍රහාරය එල්ල කරන තෙක්ම ඒ ගැන සෙවීමට යහපාලනය කටයුතු කළේ නැහැ. එවකට පැවැති රජය සහ ඒ රජයේ පැවැත්මට අනුබල දුන් සියලු දෙනා මේ ප්‍රහාරයට වගකිව යුතුයි. සහරාන්ට එරෙහිව පැවැති කරුණු අනුව ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළා නම් මෙවැනි ව්‍යසනයක් වන්නේ නැහැ. සහරාන්ගේ ගෝලයන් විසින් එදා පොලිස් නිලධාරීන් දෙදෙනෙක් මරණයට පත් කළා. ඒ ගැන විමර්ශනය කළා නම් මේ ප්‍රහාරය වළක්වා ගන්න පුළුවන්. වනාතවිල්ලුව පුපුරන ද්‍රව්‍ය සොයා ගත් විට සහරාන් කණ්ඩායම ඒ පිටුපස සිටින බවට හෙළි වුවත් ඒ ගැන එවකට පැවැති ආණ්ඩුව තැකීමක් කළේ නැහැ. බයිසිකල් පුපුරුවා හැරීම ගැන විමර්ශන කරන්නත් යහපාලනය අසමත් වුණා. දේශපාලන න්‍යාය පත්‍රයන්ට අනුව කටයුතු කරන්න වීම නිසා පොලිසියට සහ ටී.අයි.ඩී.යට සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වුණා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, දණ්ඩ නීති සංග්‍රහය අනුව අසාද් සාලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගත්තා. මුස්ලිම් නීතිය, ෂරියා නීතිය පමණක් අවශ්‍ය බවට අසාද් සාලි ප්‍රකාශ කර තිබෙනවා. එහෙත් ඔහු නිදහස් කිරීමට එවකට රජය කටයුතු කළා. ආරක්ෂක අංශය හා බුද්ධි අංශය මඟින් සහරාන්ට මුදල් ලබා දුන් බවට මේ සභාවේ ප්‍රකාශ කළා. සහරාන්ට සහ ඔහුගේ අනුගාමිකයන්ට 2015 පෙර පැවැති අපේ ආණ්ඩුව කාලයේ රජයෙන් කිසිදු වේතනයක් දී නැහැ. එය වගකීමෙන් යුතුව කියනවා. ඒ බවට කිසියම් කෙනෙකු ළඟ නිවැරදි තොරතුරු තිබෙන්නේ නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. 2016න් පසුව ඊබ්‍රාහිම් සහෝදරයන් විසින් ප්‍රචණ්ඩත්වය කරා යාම සඳහා සැලසුම් සැකසීමට සහරාන්ට රුපියල් ලක්ෂ 500ක් දී තිබුණා. ඉන් ලක්ෂ 300ක් ඔහුගේ අනුගාමීන් ළඟ තිබී අපි සොයා ගත්තා. මෙවැනි තත්ත්වයක් මත සහරාන් රජයේ වේතනයක් ගැනීමට කටයුතු කරයි ද කියලා අපි විපක්ෂයෙන් අහනවා.

පාස්කු ප්‍රහාරයට අදාළව සියලු මුදල් ලබාදුන්නේ දැනට අත්අඩංගුවේ සිටින ඊබ්‍රාහිම් සහ ඔවුන්ගේ පවුලේ අය විසිනි. ඔහු 2014 සිට ප්‍රහාරය දක්වා මූලධර්මවාදීන් ලෙස සිටිමින් අන්තවාදය ව්‍යාප්ත කර ප්‍රහාරය සිදුකිරීමට රුපියල් ලක්ෂ 500ක් වියදම් කර තිබෙනවා. ඊබ්‍රාහිම්ගේ පුතුන් දෙදෙනා ස්වයං ඝාතකයන් ලෙස මරණයට පත් වුණා. ඔහුගේ ලේලිය දෙමටගොඩදී සියදිවි හානි කර ගත්තා. ඊබ්‍රාහිම් නමැත්තා 2015 වසරේ ජනතා විමුක්ති පෙරමුණෙන් කෙසේ ඉදිරිපත් වුණාද කියන එකත් ගැටලුවක්. ජවිපෙ ජාතික ලැයිස්තුවට ඔහු ඇතුළත් වුණේ කෙසේද? ජවිපෙ ඊබ්‍රාහිම් සම්බන්ධ කර ගත්තේ ඇයි කියන ගැටලුව පැන නඟිනවා. තමන්ගේ අරමුණ ඉටුකර ගැනීමේ අදහසින් ඊබ්‍රාහිම් ජවිපෙ සමඟ සම්බන්ධ වුණා ද නැත්නම් ජවිපෙ මේ කිසිවක් නොදැන ඔහු සම්බන්ධ කර ගත්තා ද යන්න ගැන සොයා බැලිය යුතුයි. ජවිපෙ හිටපු මන්ත්‍රීවරයෙක් පිළිම වන්දනාව ප්‍රතික්ෂේප කරන බවට ප්‍රකාශ කර තිබෙනවා.

මාවනැල්ල ප්‍රතිමා හානි කිරීමේ පසුබිම විමසා බැලීමේදී එය ජමාද් ඉස්ලාම් සහ අයි. එස් අන්තවාදී මූලධර්මයේ ප්‍රධාන අංගයක් වන පිළිම වන්දනාව ප්‍රතික්ෂේප කරමින් සිදු වූවක් බවට පෙනී යනවා. ඊබ්‍රාහිම්, මහින්ද රාජපක්ෂ මහතාගෙන් සම්මානයක් ලබා ගත් බවට විපක්ෂයේ අය එල්ල කරන තවත් චෝදනාවක් වෙනවා. අපනයන ව්‍යාපාරය තුළ අත් කර ගත් සාර්ථකත්වය වෙනුවෙන් සමූහයකට ලබාදුන් සම්මානයකදී තමයි ඊබ්‍රාහිම්ට මේ සම්මානය හිමි වන්නේ. ඒ හැරුණු විට දේශපාලන එකතු වීමක් හෝ හඳුනා ගැනීමක් සිදු නොවූ බව මා වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනවා. මේ ප්‍රහාරයේ මහ මොළකරු විදියට නවුෆර් මවුලවි බව මා ප්‍රකාශ කළා. එය එසේ නොවන බව විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ සභාව තුළ පැවසුවා. රාජ්‍ය බුද්ධි අංශ වාර්තා, සැකකරුවන්ගෙන් ලබා ගත් සාක්ෂි, විදේශ බුද්ධි අංශ වාර්තා, ජනාධිපති කොමිෂන් සභා වාර්තා, අමෙරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව තමයි මේ පුද්ගලයා මහ මොළකරු විදියට අපි හඳුනා ගත්තේ. මීට අමතරව මහ මොළකරුවකු සිටින්නේ නම් ඒ ගැන තොරතුරු අපට ලබාදෙන්න.

නවුෆර් 1997දී කටාර් රාජ්‍යයට ගොස් අන්තවාදයට නැඹුරු වුණා. 2006 වසරේදී ලංකාවට පැමිණ වහබ්වාදය පතුරු වන කාත්තන්කුඩියේදී සංවිධානයක් ඇති කළා. 2008දී නැවත කටාර් ගොස් අරාබි සහ ඉංග්‍රීසි පරිවර්තකයකු ලෙස කටයුතු කළා. ඒ රටේ ද අන්තවාදී දේශන පවත්වා තිබෙනවා. ඉන්පසු තම බිරියගේ සහෝදරියගේ දියණිය සහරාන්ට විවාහ කර දුන්නා. ඔහු 2014න් පසුව ලංකාවේ අයිඑස්අයිඑස් සංවිධාන ශාඛාව භාරව කටයුතු කළා. 2016දී සහරාන්ව ඉස්ලාම් රාජ්‍යයක් ලෙස පෝෂණය කළේ ඔහු. සහරාන් වටා සිටි මවුලවිවරුන්ද මතවාදීව ඔහු මෙහෙය වූවා. පසුව සහරාන් ලවා ඔහුගේ සහෝදරියක් සහභාගි කර ගනිමින් ඉස්ලාම් රාජ්‍යයකට අවශ්‍ය කටයුතු සංවිධානය කළා. නවුෆර් සහ සහරාන්ගේ පරිගණක වාර්තාවලින් මතවාදී ආක්‍රමණයක් පළ කර තිබෙනවා. මෙවැනි මතවාදී අදහස් මුහුණු පොතේ පළ කළ පළමු ශ්‍රී ලාංකිකයා නවුෆර් බව හඳුනා ගත්තා. නවුෆර්ගේ භූමිකාව තුළ කණ්ඩායමේ න්‍යායාචාර්යවරයකුගේ කාර්යභාරයට වඩාත් සමීප වන බවට හෙළිව තිබෙනවා. අපේ විමර්ශන අනුව මහ මොළකරු නවුෆර් බව හඳුනා ගත්තා. සහරාන් මේ ප්‍රහාරයට යොමු කළේ නවුෆර් බව සහරාන්ගේ බිරිඳ වන හාදියා ප්‍රකාශ කරනවා.

මේ කරුණු මත තමයි අපි මේ මහ මොළකරු හඳුනා ගත්තේ. අමෙරිකානු වාර්තාවලින් ද ඒ බව පෙන්වාදී තිබෙනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නවුෆර්ට වඩා මහ මොළකරුවන් සිටින බවට රවුෆ් හකීම් මන්ත්‍රීවරයා ප්‍රකාශ කරනවා. එසේ සිටිනවා නම් ඒ පිළිබඳ විස්තර අපට දෙන්න. ඔහු කියනවා පාස්කු ප්‍රහාර චිත්‍රපටයේ නවුෆර් තිර රචකයාලු, සහරාන් ප්‍රධාන නළුවාලු, ස්වයං ඝාතකයන් සහාය නළුවන්ලු, සහරා සහායක නිළියක්ලු. අධ්‍යක්ෂ හා නිෂ්පාදකයා කවුද කියලාත් ඔහු අහනවා. සහරාන්ගේ සහෝදරයා වන දිවි නසා ගත් රිල්වාන් බෝම්බ හදන්න ගොස් බරපතල ලෙස තුවාල ලබා රෝහල්ගතව සිටින විට ඔහුගේ සුවදුක් බලන්න ගිය රවුෆ් හකීම් අඩුම තරමේ සහාය අධ්‍යක්ෂවරයෙක්වත් නොවන්නේ කෙසේද කියලා අපි අහනවා. ඔහුගේ ප්‍රකාශ හාස්‍යයට ලක් වෙනවා. රවුෆ් හකීම් කියන කතා වගේ සරත් වීරසේකර කියන කතා කවදාවත් ආපස්සට හරවා නැහැ. ඒ කී ප්‍රකාශ ඉදිරි කාලයේ යථාර්ථයක් වේවි. ජනතාව නොමග යැවීමට ද රවුෆ් හකීම් මෙවැනි ප්‍රකාශ කරන්නේ. අන්තවාදීන්ගේ සුවදුක් බලන්න ගිය පුද්ගලයන්ගෙන් යහපත් දෙයක් අපේක්ෂා කළ නොහැකියි. නවුෆර් ජනාධිපති කොමිෂමට ගෙනාවේ නැති බවට මේ සභාවේ චෝදනාවක් කළා. නමුත් දින හතරක් මේ කොමිෂම සාක්ෂි සටහන් කර ගන්න ඔහු ගෙන්නුවා.

2020 සැප්තැම්බර් මස ප්‍රශ්න කර තිබෙනවා. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වූවන්ට දඬුවම් කිරීම පමණක් නොව ඔවුන්ගේ සියලු දේපළ රාජසන්තක කිරීමටත් කටයුතු කරනවා. එසේ ලබාගන්නා මුදල්වලින් වින්දිතයන්ට අමතරව මුදල් ගෙවීම පිළිබඳවත් සලකා බලන්න පුළුවන්. අන්තර්ජාතික ත්‍රස්තවාදය පිළිබඳ විශේෂඥයන් වන මහාචාර්ය රොහාන් ගුණරත්න මහතා පවසනුයේ ආගමික අන්තවාදයෙන් මතුවන ත්‍රස්තවාදය ආරක්ෂක හමුදාවලට පමණක් පාලනය කළ නොහැකියි කියාය. ආගමික, අධ්‍යාපන සහ මාධ්‍ය ආයතනවල ද සහාය ඊට අවශ්‍ය වෙනවා. අයිඑස් හා වහබ්වාදීන් හඳුනා ගැනීමට බුද්ධි අංශයේ සහාය පමණක් නොව රටේ සමස්ත ජනතාවගේ සහාය අවශ්‍ය වෙනවා. අප හැම විපරමින් සිටින්නේ නම් එවැනි පුද්ගලයන් හඳුනා ගත හැකියි. අයිඑස් මතවාදීන්ට අනුව ඔවුන් හුදෙකලා වෙනවා. හුදෙකලා වන අය අන්තවාදයට යොමු වෙනවා. අන්තවාදයට යොමුව ත්‍රස්තවාදය කරා යනවා. මදුසා පාසල් තහනම් කරන්න අප කටයුතු කරනවා. පාස්කු ප්‍රහාරය නිසා මරණයට පත් වූ සහ තුවාල වූ සියලු දෙනාට සාධාරණය ඉටුකිරීම සඳහා අපි දිවිහිමියෙන් කැප වෙන බව ප්‍රකාශ කරනවා.

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මහතා (ස.ජ.බ.)**- රන්ජන් රාමනායක මහතා සිරගතවීම නිසා පුරප්පාඩු වූ මන්ත්‍රී ධුරයට මාව පත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. රන්ජන් රාමනායක මහතා සත්‍ය කතා කරන්නට ගොස් සිරගත වුණා. අපේ පක්ෂයේ නායකවරයා සහ අපි ඔහුගේ මේ අසුන ආරක්ෂා කර ගන්න උත්සාහ කළා. රන්ජන් රාමනායක මහතාගේ භූමිකාව මට කළ නොහැකියි. එතුමාගේ හැකියාව මට නැහැ. මේ රටේ පරිසරය විනාශ වෙමින් යනවා. ඒ සඳහා ඇතැම් නිලධාරීන් ද සහාය දෙනවා. එය කනගාටුදායකයි. පාස්කු ප්‍රහාරය සිදු වී වසර දෙකක් ගත වුණා. වත්මන් ආණ්ඩුව බලයට පැමිණීමට විතර ද මේ පාස්කු ප්‍රහාරය භාවිතා කළේ. බලය ලබා ගැනීමට වගේම බලය පවත්වා ගැනීමටත් මේ ප්‍රහාරය භාවිතා කිරීම සුදුසු නොවේ. අපේ රට ජාත්‍යන්තර ලෙස හුදෙකලා වෙලා සිටිනවා.

*(නියෝජ්‍ය කතානායක රංජිත් සියඹලාපිටිය මහතා මුලසුනට පැමිණියේය.)*

**දේශීය වෙදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි මහතා**- පාස්කු ප්‍රහාරය වළක්වා ගන්න තිබියදී වළක්වා නොගැනීම ගැන අපිට කනගාටුයි. ඒ අය තමයි අද වාර්තාව ගැන කතා කරන්නේ. රාජ්‍ය යන්ත්‍රණය දුර්වල කිරීමට යහපාලනය කටයුතු කළා. මූල්‍ය බුද්ධි ඒකකය විසුරුවා හැරියා. අන්තවාදී කල්ලි අපේ ඉඩම් අල්ලා ගත්තා. 2017 මහබැංකු වාර්තාවෙන් ඒ බව පෙන්වා දෙනවා. යහපාලනය කාලයේ විදේශ රටවලින් ත්‍රස්තවාදය සඳහා අපේ රටට මුදල් ආවා. මෙවැනි කෙරුවාවක් තමයි යහපාලනයෙන් ලැබුණේ. විදේශවලින් පැමිණෙන අන්තවාදීන්ට නිදහසේ සැරි සරන්න මෙරට ඉඩ හරින්න ඔවුන් කටයුතු කළා. අපේ රටේ අය වීසා නැතිව වෙනත් රටවලට ගිහිං සිටියත් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා. නමුත් මේ රටට පැමිණ අන්තවාදීන් වීසා නැතිව සිටියා. ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න යහපාලනය කටයුතු කළේ නැහැ.

විජයදාස රාජපක්ෂ මහතා මේ අපරාධය සිදු වන බවට හෙළි කළ විට ඔහු ඇමැති ධුරයෙන් නෙරපා හැරීමට යහපාලනය කටයුතු කළා. මේ අතර පිරිසක් මාවනැල්ල බුදු පිළිමවලට හානි කළා. ඒ හානි කළ අයට නීතිය ක්‍රියාත්මක කරන්න නොදී ඔවුන් බේරා ගැනීමට අසාද් සාලි කටයුතු කළා. අන්තවාදය පෝෂණය කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග රැසක් එකල ආණ්ඩුවෙන් ලැබුණා. වනාතවිල්ලුව සිද්ධියේදී හිනා වෙවී සිටි ද්‍රෝහියෝ ටික අද තප්පුලන්න පටන් ගෙන. ඒකයි අපට තිබෙන කනගාටුව. කරුණාරත්න, ප්‍රබෝධ සිරිවර්ධන අත්අඩංගුවට ගෙන වසර එකහමාරක් තබා ගත්තා. අදාළ කාලය තුළ ප්‍රබෝධ ලංකාවේ නොසිටි බව ඔප්පු කළ නිසා ඇප ලබා ගන්න පුළුවන් වුණා. මේ රටේ බුද්ධි අංශ අකර්මණ්‍ය කරන්න යහපාලනය කටයුතු කළා.

මූල්‍ය අපරාධ කොට්ඨාසය ගෙනැවිත් මෙරට පරිපාලන සේවාව, බුද්ධි අංශ සේවාව කඩා දැම්මා. ඉහළ අංශවල නිලධාරීන් වගකීම් පැහැර හැරි බවට යහපාලනයේ සිටි අය චෝදනා කරනවා නම් ඊට හේතුව පැවැති ආණ්ඩුවේ හැසිරීම බව මතක් කළ යුතුයි. විපක්ෂය අග මුල පටලවාගෙන අන්තවාදී කල්ලිවල අරමුණු වෙනුවෙන් පෙනී සිටිනවා. වගකිව යුත්තන් අත්අඩංගුවට ගන්නේ නැහැ කියලා ඔවුන් අපට චෝදනා කරනවා. වගකිව යුත්තන් අත්අංගුවට ගත්තාම ඇයි අත්අඩංගුවට ගන්නේ කියලා කෑ ගහනවා. දේශද්‍රෝහීන් පිනවීමේ න්‍යාය පත්‍රයක විපක්ෂය තවමත් ගමන් කරන බව අපට පේනවා. ජාතීන් අතර සමගි සම්පන්නභාවය ඇති කරමින් රට ඉදිරියට ගෙන යාමට වගකිව යුතුයි. හිජාස් හිස්බුල්ලා අත්අඩංගුවට ගැනීමේදී විපක්ෂය විරුද්ධ වනවා. පාස්කු ප්‍රහාරය සත්‍ය වසන් කිරීමට එමගින් බලපෑමක් වෙනවා. ඒ ගැන විපක්ෂය වගකිව යුතුයි. ලෝක ඉතිහාසයේ දරුණු ආර්ථික අර්බුදයකට අප මුහුණ දී සිටිනවා. ලෝක බැංකුවේ ප්‍රධානියා කියන විදියට මිලියන 600 ක් ජනතාව බඩගින්නේ මේ මොහොතේ සිටිනවා. එවැනි අවස්ථාවක පටු දේශපාලන අරමුණු වෙනුවෙන් කටයුතු නොකරන ලෙස විපක්ෂයට දැනුම් දෙනවා. පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන අද කිඹුල් කඳුළු හෙළන කණ්ඩායම් ජාතික ආරක්ෂාව දුර්වල කරන්නත්, බුද්ධි අංශ දුර්වල කරන්නත් දරන උත්සාහයට ඉඩ නොතැබිය යුතුයි.

**කෑගල්ල දිස්ත්‍රික් මන්ත්‍රී සුජිත් සංජය පෙරේරා මහතා (ස.ජ.බ.)** - පාස්කු ප්‍රහාරය ගැන සොයන්න විශාල මුදලක් වියදම් කර කොමිෂන් සභාවක් පිහිටෙව්වා. අපේ කාලයේ අසාද් සාලි ආණ්ඩුකාරවරයා බවට පත් කළේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා. අද එතුමා සිටින්නේ ආණ්ඩුව පැත්තේ. අන්තවාදයට අපිත් විරුද්ධයි.

***(දිවා ආහාරයෙන් පසුව මාතර දිස්ත්‍රික් මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා මුලසුනට පැමිණියේය.)***

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී මිලාන් ජයතිලක මහතා (පො.ජ.පෙ.)** - සහරාන්ට බෝම්බ ප්‍රහාරය සඳහා තඹ ලබාදීම නිසා රජයට රුපියල් මිලියන 6 කට වැඩි පාඩුවක් සිදු කර ගැනීමට යහපාලනය කටයුතු කර තිබෙනවා. අපි නෙවේ ඒ බව කියන්නේ කොමිෂන් සභා වාර්තාව තමයි කියන්නේ.

**විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය සහ ඉස්සන් ඇති කිරීම ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු මත්ස්‍ය අපනයන රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතා** - එල්.ටී.ටී.ඊ. සංවිධානයට ජාතියක්, ආගමක් තිබුණේ නැහැ. මේ සංවිධානය සිංහල, මුස්ලිම් නායකයන් පමණක් නොව තමන්ගේම ජාතියේ ලක්ෂ්මන් කදිරගාමර් වැනි නායකයන් පවා ඝාතනය කරන්න කටයුතු කළා. එවැනි සංවිධානවලට පක්ෂපාතීව සිට මේ සභාවේදීම කතා කරන මන්ත්‍රීවරුන් ගැන අපි කනගාටු වෙනවා. මේ විවාදය ආරම්භ කළ දිනයේ සිට විපක්ෂයේ මන්ත්‍රීවරුන් පැයක්, පැය භාගයක් මේ විවාදය නවත්වන්න කටයුතු කළා. රන්ජන් මන්ත්‍රීවරයා ගැන හෝ වෙනත් කරුණක් ගැන වාද කරන්න පටන් ගත්තා. පාස්කු ප්‍රහාරය ගැන අද ඇතැමුන්ට අමතක වෙලා තිබෙනවා. යහපාලන ආණ්ඩුව බුද්ධි අංශය මර්දනය කරන්න කටයුතු කළා. යුද හමුදාව, පොලීසිය උතුරෙන් ඉවත් කර ගන්න කියලා දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් මේ සභාවේ කියා සිටියා. පාස්කු ප්‍රහාරය සිදු වූවාට පසුව ඔවුන්ම මේ සභාව තුළ කියා සිටියා අපට යුද හමුදාවේ, පොලීසියේ ආරක්ෂාව දෙන්න කියලා. කොටි සංවිධානයට පක්ෂව කතා කරන මේ මන්ත්‍රීවරුන්ට අද ඒ බව අමතක වෙලා. 2016 වසරේ අධිකරණ ඇමැති විජේදාස රාජපක්ෂ මහතා අයිඑස්අයිඑස් සංවිධානයේ පුහුණුවට ලංකාවේ විශාල පිරිසක් ගිහිං සිටින බවට ප්‍රකාශ කළා. ඒ සංවිධානය පහු බසින විට ඒ සංවිධානයේ සාමාජිකයන් ලංකාවට ඇවිත් සිටිනවා කියලා හෙළි කළා. නමුත් එය අසත්‍ය ප්‍රකාශයක් බවට මුස්ලිම් මන්ත්‍රීවරුන් කළ ප්‍රකාශය එවකට පැවැති යහපාලන ආණ්ඩුව පිළිගත්තා. එසේ පිළිගෙන විජේදාස රාජපක්ෂ මහතා ඇමැති ධුරයෙන් නෙරපා හැරියා. කරු ජයසූරිය මහතා එදා විපක්ෂයේ සිටි අපට සභාව තුළ කතාවක් දෙන්න අවුරුදු එක හමාරක් ගත වුණා. නමුත් අපේ වත්මන් කතානායකවරයා අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අද විපක්ෂයට සභාව තුළ කතා කරන්න වේලාව දෙනවා. මේ ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වගකිව යුතු බවට විපක්ෂය අද පවසනවා. නමුත් ඔවුන්ට මේ වගකීමෙන් නිදහස් වෙන්න බැහැ. මෙරට ආර්ථිකයේ කඩා වැටීම ආරම්භ වූයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව නොවේ.

ඒත් විපක්ෂය ඒ බව සනාථ කරන්න සූදානම් වනවා. ඒ වගේම යහපාලන ආණ්ඩුවේ කඩා වැටීම ආරම්භ වුණේත් පාස්කු ප්‍රහාරයෙන් පසුවයි. ජනාධිපතිවරණය කල් දැමීමේ අරමුණෙන් මේ පාස්කු ප්‍රහාරය සිදු කළා ද කියන සැකයත් අපට තිබෙනවා. මේ ප්‍රහාරය නිසා රට තුළ වීමට තිබූ විශාල ව්‍යසනයක් නැවතුණේ කාදිනල්වරයාගේ ක්‍රියාකලාපය නිසායි. කාත්තන්කුඩිවලදී ඇති වූ ගැටුම මෙහෙය වන්නේ සහරාන් විසින්. යුද්ධය අවසන්ව පළමු වතාවට පසුව කාල බෝම්බයක් කාත්තන්කුඩිවල පිපුරුවා. බෝම්බ පරීක්ෂණ සිදු කරන විට සහරාන්ගේ සහෝදරයා පිපුරුමකට මුහුණ දීලා දැඩි ලෙස රෝගාතුර වෙනවා. ඒ ගැන එවකට නිලධාරීන් සෙව්වේ නැහැ. සෙව්වා නම් පාස්කු ප්‍රහාරය සිදු වන්නේ නැහැ.

**පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා (ජා.ජ.බ.)** - මුළු මහත් සමාජයම විනාශය කරා ඇදගෙන යාමට පාස්කු ප්‍රහාරය හේතු වුණා. එවකට පැවැති පාලනය මේ ප්‍රහාරය සම්බන්ධයෙන් වගකීම බාර ගත යුතුයි. මේ ප්‍රහාරය වළක්වා ගැනීමට අවශ්‍ය බුද්ධි තොරතුරු අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ලැබී තිබුණා. ඒත් ඒවා සැලකිල්ලකට ලක් නොකිරීම නිසා මෙවැනි ප්‍රහාරයක් එල්ල වුණා. ජාතික ආරක්ෂාව ඇති කරන බවට බලයට පත් වූ මේ ආණ්ඩුව යාපනයේ නගරාධිපති කළ ක්‍රියාව නිසා ඔවුන්ගේ අසමත්භාවය හෙළි වුණා. බුද්ධි අංශ නිසි ලෙස ක්‍රියාත්මක වුණා නම් යාපනයේ මේ සිදුවීම ගැන කරුණු අනාවරණය කර ගන්න එපායැ. එහෙම දෙයක් සිදු වුණේ නැහැ. යාපනය නගරාධිපතිවරයාගේ ක්‍රියාකලාපය නිසා මෙරට ජාතික ආරක්ෂාවට බලපෑමක් වුණා. නවුෆර් මවුලවි අත්අඩංගුවට ගෙන වසර දෙකක් ගත වීමෙන් පසුව තමයි ඔහු පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු විදියට හඳුනා ගත්තේ. නමුත් ඔහු පාස්කු කොමිෂන් සභාවටවත් කැඳවා නැහැ.

**මහජන ආරක්ෂක ඇමැති සරත් වීරසේකර මහතා** - නවුෆර් මවුලවි දෙපාරක්ම ජනාධිපති කොමිෂමට පැමිණ සාක්ෂි දුන්නා. සත්‍ය කරුණු නොදැන මේ සභාව තුළ නොකියන ලෙස ඉල්ලා සිටිනවා.

**විජිත හේරත් මහතා** - ඔහු දුන් සාක්ෂි සඟවන්නේ නැතිව ජනතාවට ඉදිරිපත් කරන්න.

**රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී ගාමිණී වලේබොඩ මහතා (පො.ජ.පෙ.)** - මුස්ලිම් ව්‍යාප්තවාදයක් ක්‍රියාත්මක වීම නිසා මේ පාස්කු ප්‍රහාරය සිදුව තිබෙනවා. මේ ව්‍යාප්තවාදය සඳහා ඉඩ නොතැබිය යුතුයි. එය වළක්වා ගැනීමට උපාය මාර්ගික සැලසුමක් ක්‍රියාවට නැංවීම අවශ්‍ය වෙනවා. මේ සඳහා පස් වැදෑරුම් වැඩපිළිවෙළක් හඳුන්වා දීමට මම කැමතියි. මේ හදිසි හස්තය හඳුනා ගැනීම සහ මර්දනය කිරීම එහි පළමු කාරණාවයි.

*(ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මහතා මුලසුනට පැමිණියේය.)*

**ගාමිණී වලේබොඩ මහතා** - දෙවැනි කරුණ වන්නේ මේ දෘශ්‍යමාන හස්තයට එරෙහිව මතවාදී අරගලයක් ක්‍රියාත්මක කිරීමයි. එක් රටක් එක් නීතියක් ප්‍රතිපත්තිය යථාර්ථයක් කිරීම තෙවැනි කරුණ ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. ඉස්ලාම් ව්‍යාපාරයට එරෙහිව ගෝලීය ව්‍යාපාර සමඟ අත්වැල් බැඳ ගැනීම සිව් වැනි කාරණාවයි. අන්තවාදී ඉගැන්වීම් අධ්‍යාපනය තුළින් සහමුලින්ම උපුටා දැමීම පස්වැනි කාරණාව ලෙස මම හඳුන්වා දෙනවා.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා (ස.ජ.බ.)** - මේ ප්‍රහාරයේ මහ මොළකරු නිවැරදිව සොයා එය ජනතාවට දැනුම් දීම රජයේ වගකීමක්. සියලු ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීම සඳහා විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් ස්ථාපිත කළා. එය වැදගත් අවස්ථාවක්. මේ ප්‍රහාරය නිසා සිදු වූ වැදගත් දෙයක් ලෙස එය හඳුන්වන්න පුළුවන්. ජනාධිපති කොමිෂන් සභා කියන වැදගත් කර්තව්‍යයට හානි කිරීමට මේ කොමිෂන් සභා වාර්තාව සමත් වෙලා තිබෙනවා. මේ කොමිෂන් සභාව මඟින් කැකිල්ලේ තීන්දු කිහිපයකුත් ලබාදී තිබෙනවා.

**රාජ්‍ය ඇමැති තේනුක විදානගම මහතා** - පාස්කු ප්‍රහාරය සම්බන්ධ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ගැන බොහෝ අඩුපාඩු විපක්ෂයේ හරින් ප්‍රනාන්දු, අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළා. 2018 පිහිටු වූ දින 52 ආණ්ඩුව තමයි මේ ප්‍රහාරයට හේතුව බව ප්‍රකාශ කරන්න යෙදුණා. එවැනි පදනම් විරහිත දේශපාලනීකරණ වෛරය සමාජගත කිරීමට උත්සාහ නොකරන ලෙස විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. මේ වාර්තාව කාදිනල්තුමා ඇතුළු කතෝලික ජනතාව පිළිගෙන තිබෙනවා. එහි නිර්දේශ කඩිනමින් ක්‍රියාවට නංවන ලෙස ඔවුන් ඉල්ලීම් කරනවා. මේ ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනා හඳුනා ගැනීමට මේ කොමිෂන් සභාවට හැකි වී ඇති බව ඒ වාර්තාවෙන් පැහැදිලි වෙනවා.

මේ ප්‍රහාරය සිදු වූ දින සිට මාස හතක් පුරා පරීක්ෂණ පැවැත්වුවත් ශානි අබේසේකර මහතාට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න යහපාලනය කටයුතු කළේ නැහැ. අනුර කුමාර මහතා මේ ප්‍රහාරය සම්බන්ධයෙන් අසන ප්‍රශ්නවලට වාර්තාවේ පිළිතුරු තිබෙනවා. සියලු කතෝලික ජනතාව ඉල්ලනුයේ මේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසයි. රජයක් විදියට අප ඒ දේ ඉටු කරනවා.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී උදය කුමාර් මහතා (ස.ජ.බ.)** -

මේ ප්‍රහාරය නිසා රටට විශාල කැළැලක් ඇති වුණා. ඒ වගේම මුස්ලිම් ප්‍රජාව මේ නිසා අපහසුතාවට පත් වුණා. මේ රට නිදහස ලබාගන්නා විට ශ්‍රී ලාංකිකයන් විදියට එකට එකතු වුණා. නමුත් එදා පටන් මෙරට බලය ලබා ගැනීමට ජාතිය, ආගම, භාෂාව උපයෝගී කර ගත්තා. හිටපු නායකයන් දිගින් දිගටම බලය ලබාගැනීමට ඒ කරුණු මුල් කර ගත්තා. ඒ නිසා තමයි මේ රටට මේ විනාශය වෙලා තිබෙන්නේ.

*පාර්ලිමේන්තුව මේ මස 20 වැනිදා උදේ 10ට යළි රැස් වේ.*

## සත්‍යය කතා කළ නිසා රන්ජන් සිරගත වුණා



මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම

## යහපාලනය රාජ්‍ය යන්ත්‍රණය දුර්වල කළා



රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි

## යහපාලන ආණ්ඩුව ප්‍රහාරයේ වගකීම භාර ගත යුතුයි



මන්ත්‍රී විජිත හේරත්

# එඩින්බරෝහි ආදිපාද අභාවයට රජයේත්-ජනතාවගේත් හෘදයංගම ශෝකය පළ කරනවා

## ජනපති දෙවැනි එලිසබෙත් රැජනට ශෝක පණිවිඩයක් යවමින් කියයි



එඩින්බරෝහි ආදිපාද පිලිප් කුමරුගේ අභාවය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව හා රජය වෙනුවෙන් සිය හෘදයංගම ශෝකය පළ කර සිටින බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා දෙවැනි එලිසබෙත් රැජන වෙත ශෝක පණිවිඩයක් නිකුත් කරමින් කියා සිටී.

ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ සෙනෙහසකින් බැඳී සිටි එතුමා දෙවන ලෝක යුද්ධ සමයේ ශ්‍රී ලංකාවේ ගත කළ කෙටි කාලය සතුටින් සිහිපත් කළේය.

ශ්‍රී ලංකාවේ ජනතාව එඩින්බරෝහි ආදිපාදතුමා මෙරට ගත කළ කාලය සහ පසුව දෙවැනි එලිසබෙත් රැජන සමඟ ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථා දෙක ඉමහත් සතුටින් සිහිපත් කරති.

පිලිප් කුමරුන්ගේ අභාවය ගැන බලවත් සංවේගය ප්‍රකාශ කරන අතර, බ්‍රිතාන්‍ය ජාතියට එතුමා කළ විපුල සේවය, එතුමාගේ කීර්තිමත් නාවික හමුදා වෘත්තීය ජීවිතය සහ පොදු රාජ්‍ය මණ්ඩලයට කළ මෙහෙය අපි ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරමු.

මගේ හා ශ්‍රී ලාංකික ජනතාවගේ ශෝකය රාජකීය පවුලේ සාමාජිකයන් වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර මේ ශෝක ජනක අවස්ථාවේ අපේ සිතිවිලි ඔබ හා ඔබේ රාජකීය පවුල සහ එක්සත් රාජධානියේ ජනතාව සමඟ බව සහතික වෙමි.

මහ රැජන! මගේ ඉහළම ප්‍රණාමය කරුණාකර පිළිගන්න.

# ඉතිහාසයේ ප්‍රථම වතාවට ගම්මිරිස්වලට ස්ථාවර මිලක්

## ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

**අනුර ප්‍රේමලාල්**

ඉතිහාසයේ ප්‍රථම වතාවට ගම්මිරිස් ගොවීන්ට ස්ථාවර මිලක් ලබාදී ඇති බවත්, ඒ අනුව සතොස අලෙවිසල්වලින් ගම්මිරිස් ග්‍රෑම් සීයක් රුපියල් එකසිය හැටක් වැනි අඩු මුදලකට ගත් හැකි බවත් වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ඉතිහාසය පුරාම දේශීය ගම්මිරිස් ගොවියාට සිය නිෂ්පාදන අලෙවි කරගත නොහැකි තත්ත්වයක් ඇති කරමින් මෙන්ම, එම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබීම හේතුවෙන් ගොවීන්ට සිදු වූ අසාධාරණය සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ වත්මන් රජයේ සෘජු මැදිහත් වීම තුළ ගොවියාට හා රජයටත්, පාරිභෝගික ජනතාවටත් ඉතාමත් ලාභදායී අන්දමින් ගම්මිරිස් මිල ගණන් පවත්වා ගත හැකි වූ ආකාරය මෙහිදී අමාත්‍යවරයා පැහැදිලි කරන කළේය.



ඒ මහතා මේ බව සඳහන් කළේ ගම්මිරිස් මිල ස්ථාවර කිරීම පිළිබඳ විශේෂ මාධ්‍ය හමුවක් වෙළෙඳ අමාත්‍යාංශයේ පැවැති අවස්ථාවට එක් වෙමින්ය.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද කීය. අතරමැදියන් අධිප්‍රමාණික ලාභ ලැබීම සඳහා වෙළෙඳපොළට ගම්මිරිස් ග්‍රෑම් 100ක් රු.250ත් 300ත් අතර මිලකට නිකුත් කර තිබියදී, රජයේ මැදිහත් වීමෙන් පසුව සතොස අලෙවිසල් ජාලය හරහා පාරිභෝගිකයාට ගම්මිරිස් ග්‍රෑම් 100ක් රු.160ක් වැනි ඉතා අඩු මිලකට ලබා දීමට කටයුතු කළා.

ගම්මිරිස් සම්බන්ධයෙන් සෘජුවම මැදිහත්ව කටයුතු කළ විෂය භාර රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා මෙම ගම්මිරිස් වගාකරුවන් හා සෘජු සම්බන්ධීකරණයෙන් හා ඔවුන්ගේ ගැටලු සඳහා පිළියම් යෙදීම සඳහා මෙලෙස කටයුතු කිරීමත් එම ගම්මිරිස් තොග සඳහා වෙළෙඳ අමාත්‍යාංශය හා ඒකාබද්ධව වෙළෙඳපොළ සකසා ගැනීමට කටයුතු කිරීම තුළ දේශීය ගම්මිරිස් වගාකරුවා ද, රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව හා සතොස අලෙවිසල් ජාලයද ඉතාම වගකීමෙන් යුතුව ගුණාත්මක බවින් ඉහළ ගම්මිරිස් ඉතාම අඩු හා සාධාරණ මිලකට පාරිභෝගිකයාට නිකුත් කිරීමේ හැකියාව ලබා ගත්තා. ගම්මිරිස් මිළ සතොස මඟින් මෙලෙස ස්ථාවර කිරීමට කටයුතු කිරීම හේතුවෙන් අනෙකුත් පෞද්ගලික සුපිරි වෙළෙඳසල් ජාලයද මීට අනුගත වන්නේ නම් රජයක් වශයෙන් කෘතඥ වනවා.

මෙම අවස්ථාවට ගම්මිරිස් වගාව පිළිබඳ විෂය භාර රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා ද සහභාගී විය.

# 'ගම සමඟ පිළිසඳර' ඉල්ලීමක් පල දරයි පොළොන්නරුව රජරට විද්‍යාලයේ දෙමහල් පුස්තකාලයට මුල්ගල්



**නුවන් කොඩිකාර සහ පොලොන්නරුව සමූහ**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති 'ගම සමඟ පිළිසඳර' වැඩසටහනේදී පොළොන්නරුව රජරට විද්‍යාලයේ විදුහල්පති ගිරිතලේ සිරි සුජාත හිමියන් කළ ඉල්ලීම ක්‍රියාවට නංවමින් නව දෙමහල් පුස්තකාලයට මුල්ගල් තැබීම පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

වසර 75කට පෙර ආරම්භ කළ රජරට විද්‍යාලයට වර්තමානයේ මහත් අවශ්‍යතාවක්ව පැවති මෙම පුස්තකාලය මඟින් 6 – 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන 2200ක් පමණ වන සිසු දරුවන් වෙනුවෙන්ද විද්‍යාලයේ 100කට අධික ගුරු මහත්ම මහත්මීන් වෙනුවෙන් පුස්තකාල අවශ්‍යතාව සැපිරෙයි.

ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍ය අයෝජනයෙන්, රුපියල් මිලියන 20ක් පමණ වැය කරමින් ඉදිකෙරෙන මෙම පුස්තකාලයේ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා යුද හමුදාවේ 12 වැනි ඉංජිනේරු සේවා බළකාය සිදු කරයි.

ඉදිරි පස් වසර තුළ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන මට්ටම ඉහළට ගෙන ඒමට සිය අමාත්‍යාංශයෙන් ලබාදිය හැකි උපරිම සහාය ලබාදෙන බවත්, ඒ සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන්ගේත්, විදුහල්පතිවරුන්ගේත්, ගුරු මහත්ම මහත්මීන්ගේත් කැපවීම අපේක්ෂා කරන බවත්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා පැවසීය

තම අමාත්‍යාංශය සතුව රුපියල් මිලියන 20,000ක මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර ඇති බවත් එම අරමුදල් 2015 වර්ෂයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ ධුර කාලයේදී වෙන් කර තිබුණු බවත්, හෙතෙම සඳහන් කළේය. නමුත් පසුගිය ආණ්ඩුව එයින් අධ්‍යාපනය නඟාසිටුවීමට යොදාගෙන ඇත්තේ මිලියන 300ක් පමණක් බව පැවැසූ ඒ මහතා. මුළු රටේම දරු දැරියන්ගේ අධ්‍යාපනය නඟාසිටුවීමට තම අමාත්‍යාංශය ඉතා සැලසුම් සහගතව ඉදිරි පස් වසර ඇතුළතදී මෙම මුදල් වියදම් කරන බවත් ප්‍රකාශ කළේය.

මෙම අවස්ථාවට උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හා පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරල, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා, කලාප අධ්‍යාපන කාර්යාල නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

# ලංකාගම පාලම ජනතා අයිතියට





**රක්ෂණ ශ්‍රියන්ත**

දකුණු පළාතේ ගාල්ල, නෙළුව, ලංකාගම සහ නිල්වැල්ල ගම්මාන යා කරමින් නාවික හමුදා පූර්ණ ශ්‍රම දායකත්වයෙන් අභිනවයෙන් ඉදි කළ ලංකාගම නිල්වැල්ල පාලම දකුණු පලාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ නාවික හමුදාදිපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතාගේ සහභාගීත්වයෙන් පෙරේදා (10) ජනතා අයිතියට පත් කෙරිණි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' සංකල්පය සාක්ෂාත් කරමින් නෙළුව ලංකාගම සහ නිල්වැල්ල ගම්මානයන්හි ජනතාව වෙත දීර්ඝ කාලයක් මුළුල්ලේ ගිං ගඟ තරණය කිරීමට පැවති ඉතා අවදානම් සහිත දුෂ්කර ගමන් මාර්ගය වෙනුවට ප්‍රදේශයේ ජනතාවගේ දිගුකාලීන අවශ්‍යතාවක් සපුරාලමින් වඩාත් ආරක්ෂිතව සහ පහසුවෙන් ගමනාගමන කටයුතු සිදු කර ගැනීමට හැකිවන පරිදි මෙම ලංකාගම නිල්වැල්ල පාලම අභිනවයෙන් ඉදි කෙරිණි. දකුණු පළාත් සභාවේ ප්‍රතිපාදන මත, මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම්කරණයෙන් හා ශ්‍රී ලංකා නාවික හමුදාවේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් ජුලි මස 28 වැනි දින මෙම පාලමේ ඉදිකිරීම් නාවික හමුදාව මඟින් ආරම්භ කෙරුණු අතර, කඩිනමින් ඉදිකිරීම් අවසන් කර ජනතා අයිතියට පත් කෙරිණි.

ලංකාගම නිල්වැල්ල පාලම දිගින් මීටර් 84ක් සහ පළලින් මීටර් 1.8 ක් වේ. මෙමඟින් ගම් වාසී ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා, රාජකාරී අවශ්‍යතාවන් මෙන්ම පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද පහසුවෙන් සිදු කර ගැනීමට හැකියාව ලැබේ.

මෙම පාලම විවෘත කිරීමේ අවස්ථාවට මැති ඇමතිවරුන්, දකුණු නාවික විධානයේ අණ්ඩාපති රියර් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා, සම්භාවනීය අමුත්තන්, නාවික හමුදා ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීහු පිරිසක් සහ ප්‍රදේශවාසීහු සහභාගී වී සිටියහ.

# අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂයකට පන්දහසේ දීමනාව දෙනවා

## රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

**අමිල ප්‍රභාත් වනසිංහ අනුරාධපුර අතිරේක**

සමෘද්ධිලාභී සහ අඩු ආදායම්ලාභීන් ඇතුළු පවුල් ලක්ෂ තිහකට වැඩි පිරිසකට රජයෙන් රුපියල් පන්දහසේ (5000) දීමනාව අද (12) සිට ලබා දෙන බව සමෘද්ධි කටයුතු හා මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා සඳහන් කළේය.

සමෘද්ධි සහා අඩු ආදායම්ලාභීන්ට අමතරව වැඩිහිටි දිමානාව ලබන පුද්ගලයන්, වකුගඩු දිමනාව ලබන පුරවැසියන්, ආබාධිත දිමනාව ලබන පුරවැසියන්, සියවස් සම්පූර්ණ පුරවැසියන් ආදි සියලු දෙනාද මෙම දිමනාව ලැබීමට සුදුසු පුද්ගලයන් ලෙස නම් කර තිබේ. ඒ සමගම මිට පෙර සකස් කර තිබූ ලයිස්තුව සකස් කිරීමෙන් පසුව අනුපවුල් හැටියට හඳුනා ගත් කණ්ඩායම් සිටී නම් ඒ කණ්ඩායම් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ මත මෙම දිමනාව ලබන්න සුදුසු කණ්ඩායම් බවට පත් වන බවද හෙතම පැවසීය.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බළකායත් එක්ව මෙය ක්‍රියාවට නංවා තිබේ.

අනුරාධපුරයේ දී ඊයේ (11) පැවති මාධ්‍ය හමුවකදී රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා මේ බව පැවසීය.

# 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සන්නාමය බලගන්වන්නේ අඩු-පාඩු හදා ගෙන ආණ්ඩුව ඉදිරියට ගෙන යෑමටයි

## ඇමැති විමල් වීරවංශ



**රක්ෂණ ශ්‍රියන්ත**

මේ රටේ අතිමහත් පොදු ජනතාව ඉතා බලවත් බලාපොරොත්තු පෙරදැරි කරගනිමින් ගොඩනගා දුන් ගමනක් එහි අඩු පාඩු නැති කොට, වඩා සවිමත්ව ඉදිරියට ගෙනයාමේ වගකීම ආණ්ඩුවට ඇති බවත් 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සන්නාමය බලගන්වන්නේ ද ඉහත ගමන අර්ථාන්විත සහ බලසම්පන්න කිරීමට බවත් කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා පැවසීය.

පෙරේදා (10) අනුරාධපුර සල්ගාදු පිටියේදී පැවති ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවිධානය කළ 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' වෙළෙඳ ප්‍රදර්ශනය විවෘත කරමින් ඒ මහතා මෙසේ කීවේය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ වීරවංශ අමාත්‍යවරයා මෙසේද සඳහන් කළේය.

'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සන්නාමය සමග බැඳුණු සංස්කෘතියක් හදන්න අප පසුගිය වසරේ දෙසැම්බර් 15 වැනිදා මූලික පියවර තැබුවා. ඒ යටතේ දැනට අදියර දෙකකින් මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා සන්නාමය ප්‍රදානය කර තිබෙනවා. ඒ වගේම දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට, නිෂ්පාදකයාට දෙස් විදෙස් වෙළෙඳපොළ අවස්ථා ලබාදීම සඳහා අප ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබෙනවා. අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය එම ක්‍රියාමාර්ග අනුව දැනටමත් ඉදිරි පියවර ගෙන තිබෙනවා. ඉන් පළමුවැන්න තමයි මෙවැනි 'මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළෙඳ ප්‍රදර්ශන' රට පුරා පැවැත්වීම. දෙවැන්න සියලු තත්ත්වයෙන් උසස් දේශීය නිෂ්පාදන, අන්තර්ජාලය ඔස්සේ ඕනෑම දෙස් විදෙස් ගනුදෙනුකරුවකුට සෘජුව ලබාගත හැකි madeinsrilanka.org අන්තර්ජාල වෙළෙඳ ද්වාරය අංග සම්පූර්ණ කර පවත්වාගෙන යෑම. එම කටයුත්ත මේ වසරේ මැද භාගය වන විට සිදු කිරීමට අපේක්ෂිතයි. තෙවැන්න තමයි මේඩ් ඉන් ශ්‍රී ලංකා බලයලත් අලෙවිසල් දේශීය වශයෙන් සහ විදේශීය රටවල ස්ථාපිත කිරීම. මේ වන විටත් චීනයේ බීජිං නුවර එවැනි බලයලත් අලෙවිසලක් අපේ දේශීය තරුණ ව්‍යවසායකයකු අරඹා තිබෙනවා.

මහා පරිමාණ නිෂ්පාදකයාගේ නිෂ්පාදන සමඟ තරග වැදීමට දේශීය සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයාට නොහැකි වී ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදනවල තිබෙන ගුණාත්මකභාවයේ අඩුවක් නිසා නොවෙයි. ඔවුන්ට තම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට, අලෙවිකරණයට අවශ්‍ය කරන මහා මුදල් කන්දරාව යෙදවීමට නොහැකි නිසයි. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයාට තනිව ජයගත නොහැකි ඒ අභියෝගය සාමූහිකව ජය ගත හැකි පියවරක් විදිහටයි අප මේ 'මේඩ් ශ්‍රී ලංකා සන්නාමය' ප්‍රවර්ධනය කරන්නේ. 'මේඩ් ඉන් ශ්‍රී ලංකා සන්නාමය' මිනිසුන්ගේ සිත් තුළ තදින් තහවුරු කර එම සන්නාමය සහිත ඕනෑම නිෂ්පාදනයක් මිලදී ගැනීමට පැකිළෙන්නේ නැති සමාජයක් බවට අපේ සමාජය පරිවර්තනය කිරීම අපේ ඉලක්කයයි.

එදා ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ මහතා දේශීයත්වය මත පදනම් වූ පාලනතන්ත්‍රයක් බලගන්වන බවට පොරොන්දුවක් ලබා දුන්නා. එම පොරොන්දුව කර්මාන්ත අමාත්‍යාංශය හැටියට සාක්ෂාත් කිරීමට වඩා නිවැරදිව පෙරමුණු ගැනීමට මෙම වැඩපිළිවෙළ ජනගත කළා.

අප රටක් හැටියට කොවිඩ් වසංගතයට සාර්ථකව මුහුණ දී තිබෙනවා. ඒ නිසයි වසර කිහිපයකට පසුව ජනතාවට අවුරුදු සැමරීම සඳහා සූදානම් වීමට හැකිව තිබෙන්නේ. පසුගිය වසරේ කොවිඩ් වසංගතය හේතුවෙන් අවුරුදු සැමරුම නතර වූවා. 2019 වසරේ දී අවුරුදු සමයේ අවසන් භාගයේ සහරාන්ලාගේ ත්‍රස්ත ප්‍රහාරය රටට එල්ල වුණා. මේ තත්ත්වය තුළ අප රටේ විනෝදාස්වාද කර්මාන්තය කඩා වැටී තිබෙනවා. ඒ වගේම දේශීය නිෂ්පාදකයාගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම අභියෝගයක් බවට පත්ව තිබෙනවා. මෙය සියලු තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දෙමින්, අප පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න මහතාගේ ඉල්ලීම ඉටු කරමින් මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළෙඳ ප්‍රදර්ශනය අනුරාධපුරයට ගෙන ආවා. මේ වෙළෙඳ ප්‍රදර්ශනය හා සමගාමීව කොළඹ පදනම් මාවතේ ද තවත් මෙවැනි වෙළෙඳ ප්‍රදර්ශනයක් මේ වන විට පැවැත්වෙමින් තිබෙනවා.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ නායකත්වයෙන් යුත් අපේ රජය එක පැත්තකින් ඉස්ලාම් අන්තවාදය එල්ල කර ඇති අභියෝගයට මුහුණ දෙමින් තිබෙනවා. මේ වන විට ඉස්ලාම් අන්තවාදය පතුරුවා හරින සංවිධාන ගණනාවක් තහනම් කර, පුද්ගලයන් ගණනාවක් අත්අඩංගුවට ගැනීමට අපේ රජය පියවර ගත්තා. කවර ආකාරයකවත් මර බියක්, ත්‍රස්තවාදයක් ඇති නොවීමට අපේ රජය පියවර ගනිමින් තිබෙනවා.

කොරෝනා වසංගතයට සාර්ථකව මුහුණදෙමින්, ජාතික ආර්ථිකය බිඳ වැටීමට ඉඩ නොදී, අපොස (සා.පෙ) අසමතුන් ලක්ෂයකට මෙන්ම උපාධිධාරීන් 50,000කට අධික පිරිසක් රාජ්‍ය සේවයට බඳවා ගනිමින් අපේ රජය අපේ සමත් බව පෙන්වා දෙමින් සිටිනවා. එපමණක් නොවේ, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් වැනි ගිවිසුම් අවලංගු කරමින්, ජිනීවා මානව හිමිකම් උගුලෙන් ඉවතට එමින් අප රජයක් ලෙස මේ රටේ ස්වෛරීභාවය තහවුරු කර දෙමින් සිටිනවා. මෙවැනි සාර්ථක ගමනක් යමින් සිටින විට විවිධ කුමන්ත්‍රණකාරී බලවේග එම ගමන අනෙක් පැත්තට හරවන්න උත්සහ කරනවා.

රටේ සම්පත් විකිණීම, රාජ්‍ය නායකයාගේ නාස්තිය, ආදී චෝදනා අපේ ආණ්ඩුවට එල්ල කරන්න බැරි වුණාම රජය ආනයනික පොල්තෙල්වල පිළිකාකාරක සංයෝග තිබෙන බව හඳුනාගත්තාම එය චෝදනාවක් ලෙස එල්ල කරන බංකොලොත් විපක්ෂයක් තමයි අද තිබෙන්නේ. පසුගිය දිනවල මේ අයගේ විකාරරූපී හැසිරීම පාර්ලිමේන්තුව තුළ දැකගත හැකි වුණා. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න, කර්මාන්ත අමාත්‍ය උපදේශක සුනිල් හෙට්ටිආරච්චි, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් රුවන් නවරත්න බණ්ඩාර, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ලක්ෂ්මන් විජේවර්ධන ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# දැන් පොහොරවලට ප්‍රමිතියක් තියෙනවා



# යහපාලන කාලේ මඩ පොහොර වෙනුවට විෂ පොහොර දීලා

## ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ

**නදී මාණික්කගේ**

පසුගිය ආණ්ඩුව රසායනාගාර වාර්තා වෙනස් කර මඩ පොහොර ලෙස විෂ පොහොර ගොවීන්ට බෙදා දී ඇතැයි කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පවසයි.

2019 වර්ෂයෙහි පමණක් බිලියන 1.5ක පොහොර මෙට්‍රික් ටොන් 81,00ක් ගෙනැවිත් ඇති බවත් ඒ වෙනුවෙන් රසායනාගාර වාර්තා 55ක් වෙනස් කර ඇති බවත් ඒ මහතා පෙන්වා දෙයි.

මේ පිළිබඳ සියලු විස්තර නිකුත් කර ඇති අතර පොහොර ආනයනකරුවන් විසින් පොහොර සාම්පල් ප්‍රමිතියට දී අනතුරුව බාල පොහොර ගෙන්වා ඇති බවත් රාජ්‍ය නිලධාරීන්, මැති ඇමති-වරු සියලු දෙනා පරීක්ෂණ වාර්තා වෙනස් කරමින් වස ගෙනැවිත් ගොවියාට බෙදා දීමට හවුල් යැයිද පැවසුවේය.

පසුගියදා මෙම ප්‍රමිතීන් වෙනස් කර අන්තර් ජාතික ප්‍රමිතියට අනුව ටෙන්ඩර් කළද කිසිම ආනයනකරුවකු එම ටෙන්ඩර් ඉල්ලා නොමැති බවත්, එය එසේ වන්නේ ප්‍රමිති-යට පොහොර ගෙන්වීමට ඔවුන්ට නොහැකි වූ නිසා බවත් පැවසූ ඒ මහතා විගණන වාර්තා මගින් මේ බව පැහැදිලි වෙනවා යැයි පැවසීය.

එළැඹෙන යල කන්නයේ සිට පොහොර දීමට පස් පරීක්ෂා කිරීමේ වාර්තාව අනිවාර්යයි. ඉතිහාසයේ පළමු වතාවට දිවයින පුරා සියලු දිස්ත්‍රික්ක තුළ ඉඩ-ම්වල පස් පරීක්ෂා කිරීමෙන් පසුව පොහොර දීමේ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කරනවා. මහනුවර දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේදී සියලු ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පස පරීක්ෂා කිරීමේ කට්ටල දෙමින් ඇමැතිවරයා මේ බව පැවැසීය.

අපේ රටේ කෘෂිකර්මයට වසර 2500ක ඉතිහා-සයක් තියනවා. එදා මෙදාතුර ඉතිහාසයේ තවත් සුවිශේෂ දවසක් අද. අපේ රටේ ගොවියා කල්පනා කළේ වැඩියෙන් පොහොර දැම්මොත් වැඩියෙන් අස්වැන්න ලැබෙනවා කියලයි. එහෙම පස් පරීක්ෂා කරලා පොහොර භාවිතය පිළිබඳව ජාතික වැඩසට-හනක් ක්‍රියාත්මක කරන්න මෙතෙක් බැරි වුණා.

මේක ක්‍රියාත්මක කරන්න වෙහෙසුණත් විශාල ධනස්කන්ධයක් මේ වෙනුවෙන් වැය වුණත් කිසි කෙනෙකුට මෙය කරන්න බැරි වුණා.

මොකද පොහොර ආනයනකරුවන් ඒ වැඩපි-ළිවෙළට වඩා ඉදිරියෙන් හිටියා. රටට පොහොර ගේන්න වුවමනා වුණා මිසක් රටට වෙන හානිය, ගොවියට වෙන හානිය, පොළොවට වෙන හානිය කවුරුවත් සැලකුවේ නෑ.

පස් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන රට පුරා මිලි-යන ගණන් වැය කර ඉදිකර තිබුණත් දෙපාර්තමේ-න්තුවේ චක්‍රලේඛන උපදෙස් දීලා තිබුණත් එය මහ පොළොවේ යථාර්ථයක් වෙලා තිබුණේ නෑ යැයි පැවසීය.

# කිරිබතට හාල් -පොල් ගන්න බැරි කැවුමක් බැද ගන්න තෙල් නැති අවුරුද්දක්

## අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ

**නදී මාණික්කගේ**



ආණ්ඩුව සහන මල්ල ඉල්ලන ජනතාවට ප්‍රමිති-යෙන් තොර ආහාර ද්‍රව්‍ය දීම සිදුකරනවා යැයි අයිතීන් උදෙසා කාන්තාවෝ සංවි-ධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ මහත්මිය පසුගි-යදා බත්තරමුල්ලේ පැවති මාධ්‍ය හමුවේදී පැවසුවාය. ඇය වැඩිදුරටත් මෙසේද කියා සිටියාය.

කෝවිඩ් වසංගතයත් එක්ක විශාල පිරිසකගේ රැකියා අහිමිවීම් වගේම ආදායම් අහිමිවීම් සිදු වුණා. අද වන විට ගුරුවරුන්, විදුලි සේවකයන්, ජල සේවකයන් මහ පාරේ උද්ඝෝෂණ කරනවා. ත්‍රීවිල් රථ රියදුරන්ට ආදායම් නැති නිසා මේ පාර අවුරුදු නැහැ කියනවා. මැදපෙරදිග විතරක් විදේශගත ශ්‍රමිකයන් 40,000ක් විතර කිසිම ආදායමක් නැතිව මේ රටට එන්න බැරිව ඉන්නවා.

හෝටල් ක්ෂේත්‍රවල සියලු දෙනාගේම ආදා-යම් බිඳ වැටිලා. ලීසිං එක ගෙවා ගන්න බැරිව ඉන්නවා. ගම්වල ඉන්න විශාල කාන්තා-වන් පිරිසක් ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් හෙම්බත් වෙලා. බඩු මිල වැඩිවෙලා. අනික් පැත්තෙන් විෂ පොල්තෙල් නිසා තමන්ගේ දරුවන්ට කොකිස් එකක් බැදලා දෙන්න බැරි භීතියකින් ඇලලුණු අවුරුද්දක් බවට පත්ව තිබෙනවා.

ඒ නිසා මේ අවුරුද්ද කිරි බතට සහල් නැති, කිරි බතට පොල් ගන්න බැරි, කොකිස්වලට කහ නැති, කැවුම් බැද ගන්න විෂ නැති තෙල් නැති, මුං කැවුමට මුං නැති අවුරුද්දක් වෙලා. පුංචි දරුවන්ගේ අවුරුද්ද උදුරා ගත්තු තත්ත්වයක් ඇති වී තිබෙනවා.

මේ පසුබිම තුළ සති දෙකකට සෑහෙන්න සහන මිලට බඩු මල්ලක් දෙන බව බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා කියා තිබෙනවා. මේ සහන මල්ල දෙන්නේ සතොසෙන් කීවා. පාරිභෝගිකයන්ට සහන මල්ල සොයා ගෙන, ඒවා තිබෙන සතොසවල් සොයා ගෙන යන්න ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා. රත්මලානේ පාරිභෝගිකයකුට සහන මල්ල සොයාගෙන පිළියන්දලටම යන්න සිද්ධ වෙලා. ඒ වෙනුවෙන් ත්‍රීවිල් ගාස්තුව රු.500/-කට ආසන්න මුදලක් ගෙවන්න සිදුවී තිබුණා. ලංකාවේම සතොස ශාඛා තිබෙන්නේ 431යි. ඒ අතරිනුත් සහන මල්ල තිබෙන්නේ කොහේද කියලා හොයාගෙන යන්න සිදු වෙලා යැයි පැවසුවාය.

# ජනතාවට ආහාර වෙනුවට වස කෑමට සිදු වෙලා



## එජාප සභාපති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ**

ස්වභාව ධර්මයෙන් කොරෝනා වසංගතය ලැබෙන විට ආණ්ඩුව තවත් වසංගතයක් ලෙස රටේ ආර්ථිකය දුර්වල කර වස විස සහිත ආහාර ද්‍රව්‍ය ජනතාවට දී තිබෙන බව එක්සත් ජාතික පක්ෂ සභාපති, හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා ප්‍රකාශ කළේය.

රටේ ජනතාවට වස විස සහිත ආහාර ද්‍රව්‍ය ගැනී-මට සිදුව ඇත්තේ ආණ්ඩුවේ ආකාර්යක්ෂම හා දුර්වල ආර්ථික පිළිවෙත නිසා බව හෙතෙම සඳහන් කළේය. වජිර අබේවර්ධන මහතා මෙම අදහස් පළ කළේ ඊයේ (11දා) පෙරවරුවේදී සිරිකොත පක්ෂ මූලස්ථානයේදී එජාප ක්‍රියා-කාරීන් පිරිසක් සමග පැවැති සාකච්ඡාවකදීය.

එහිදී තවදුරටත් ඒ මහතා මෙසේද කීය. සිංහල හින්දු අලුත් අවුරුද්ද ලබන මේ අවස්ථාවේදී මුළු මහත් රටේ ජනතාව ඉතාම අසීරු තත්ත්වයකට පත්ව සිටි-නවා. ස්වභාවිකව ඇති වූ කොරෝනා වයිරසය හේතු-වෙන් ශ්‍රී ලංකාව දැවැන්ත අර්බුදයකට තල්ලු වී තිබෙ-නවා සේම තවත් පැත්තකින් රජය වසංගතයක් නිර්මාණය කර තිබෙනවා. ඒ වසංගත-යෙන් රටේ ආර්ථිකය මුළුම-නින්ම බිඳ දමා වස විස සහිත ආහාර ද්‍රව්‍ය ජනතාවට දී තිබෙනවා.

වත්මන් ආණ්ඩුවේ ආකා-ර්යක්ෂම ආර්ථික පිළිවෙත නිසා අද මේ රටේ ව්‍යාපාර කඩා වැටී, ජනතාවගේ සියලු ආදායම් මාර්ග අහිමි වී තිබෙ-නවා. මේ තත්ත්වය මත වෙනත් අවුරුදුවල මෙන් රටේ ජනතාවට අවුරුදු සැමරීමට හැකි තත්ත්වයක් අද ඇත්තේ නැහැ.

ගෙදර ආර්ථිකය කඩා වැටීම නිසා ජනතාව හැමවි-ටම උත්සාහ ගන්නේ අඩුව-ටම තිබෙන ආහාර ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමටයි. එම භාණ්ඩ ගුණාත්මකභාවයෙන් ඉතාම අඩු තත්ත්වයක පැව-තියත් අතේ තිබෙන මුදලට කෙසේ හෝ එය ගැනීමට ජනතාව පෙළඹෙනවා. මේ අනුව අඩු මිලට ගැනීමට සිදු-වන්නේ බාල භාණ්ඩයි. එහෙ-මත් නැතිනම් නරක් වූ ශරීර-යට අහිතකර ආහාර ද්‍රව්‍යයයි.

එමෙන්ම ව්‍යාපාරික-යන්ද උත්සාහ ගන්නේ අඩු මිලට තිබෙන ආහාර ද්‍රව්‍ය හා භාණ්ඩ ආනයනය කර ජන-තාවට දීමටයි. ඒ අනුව ඔවුන්ට ලෝකයෙන් අඩුවට ගැනීමට තිබෙන්නේ තත්ත්වයෙන් බාල වස විස සහිත ආහාර ද්‍රව්‍යයයි. අද එවැනි ආහාර ද්‍රව්‍ය අපේ ජනතාවට දීමට කටයුතු කර තිබීම ඉතා ඛේදනීය තත්ත්ව-යක් යැයි පැවසීය.

# රෑ වෙන දේ දවල් කීමෙන් ඇමැති අපහාසයක් කරලා

## පා.ම. සී.වී. විග්නේස්වරන්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**


අත්අඩංගුවට ගත් යාපනය නගරාධිපතිවරයා මහාධික-රණයට ඉදිරිපත් කිරීමටත් පෙර, ඔහුට ඇප හිමිවන බව ඩග්ලස් දේවානන්දා ඇමැති-වරයා පැවසීමෙන් අධිකර-ණය හෑල්ලුවට ලක් කර ඇති බව දෙමළ ජනතා සන්ධා-නයේ නායක සී.වී. විග්නේ-ස්වරන් මන්ත්‍රීවරයා පැවසීය.

ඊයේ (11දා) යාපනයේදී මාධ්‍යවේදීන් අමතමින් මන්ත්‍රීවරයා කියා සිටියේ මේ සම්බන්ධයෙන් ඩග්ලස් දේවානන්දා ඇමැතිවරයාට එරෙහිව නීතිය ක්‍රියාත්මක විය යුතුව ඇති බවයි. එහිදි වැඩි දුරටත් අදහස් දක්වමින් ඔහු මෙසේ පැවසීය.

යාපනය නගරාධිපතිවරයා අත්අඩංගුවට ගැනීම වෙනම කාරණයක්. ඔහුව අත්අඩංගු-වට ගෙන යාපනය මහාධික-රණයට ඉදිරිපත් කිරීමට පෙර ඩග්ලස් දේවාන්නන්දා ඇමැ-තිවරයා නගරාධිපතිවරයාට ඇප ලැබෙන බව මාධ්‍යයට කිව්වා. ඔහුට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පවරෙන්නේ නැති බවත් සමාව ලැබෙන බවත් කිව්වා.

අධිකරණයේ කටයුතු කළ කෙනෙක් විදිහට මෙතැන විශාල වැරැද්දක් තිබෙන බව මට පෙනෙනවා. ඇමැ-තිවරයා ඒ ප්‍රකාශය කළේ අනුමාන ප්‍රකාශයක් විදිහට නෙමෙයි. රාත්‍රියේ වුණු දේ ඔහු දවල් කිව්වා.

යාපනය නගරාධිපති-වරයා අත්අඩංගුවට අරන් තියෙන්නේ යම් පිරිසකගේ සැලසුමක් අනුවයි කියලා මේක නිසා අපට ඉතාම පැහැදිලිව පෙනෙනවා. ජය මේකේ මුලටම ඉන්නවා. මේ ජවනිකාව මෙහෙම සිද්ධ වුණේ දකුණේ ජනතාවට පෙනෙන්නයි.



ඒක කොහොම වෙතත් ඩග්ලස් දේවානන්දා ඇමැති-වරයාට අධිකරණය හෑල්ලු-වට ලක් කිරීම සම්බන්ධ-යෙන් වෙනම චෝදනාවක් මේ සිද්ධිය එක්ක තියනවා. ඒක ගැන අවධානය යොමු වෙන්නට අවශ්‍යයයි.

ඇමැතිවරයා වීරයෙක් බව පෙන්වන්න ඔහු ජනාධිපති-වරයාට කතා කළා. ජනාධි-පතිවරයා සමාව දෙන්නම් කිව්වා කියන කාරණා දේශ-පාලන කරුණක්. ජනතාව තමන් ළඟ තියා ගන්න එහෙම එයා කිව්වට ස්වාධීන අධිකරණයේ සිදුවෙන දේවල් කල් තියා කෙනෙක් කියනවනම් ඒක බරපතළ වැරැද්දක්. වහාම මේ ගැන සොයා බැලිය යුතුයි යැයි පැවසීය.

# පොහොට්ටුව සියලු ජාතීන්ගේ පක්ෂයක්

## රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා



**ක්‍රිසන්ති විතාරණ**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජාතිවාදී පක්ෂයක් නොවන බවත් සමහරු ජාතිවාදී ගොඩට ඇදගෙන යන්න උත්සාහ කරන බවත් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පැවසීය.

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා මෙම අදහස් පළ කර සිටියේ පසුගිය (10දා) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ආසනයේ මාර්ග සංවර්ධන වැඩසටහන් කිහිපයකට සහභාගි වෙමිනි.

ඒ අනුව කන්තලේ ගංතලාව ආනන්ද මාවත ජනතා අයිතියට පත් කිරීම හා කන්තලේ රාජමහා විහාර ගොඩැල්ල මාවත සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කෙරිණි. මේ සඳහා රුපියල් මිලියන 75ක මුදලක් වෙන් කර තිබේ. සංවර්ධනය වන දුර ප්‍රමාණය කිලෝ මීටර් 2කි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජාතිවාදී පක්ෂයක් නෙමෙයි. සමහරු ජාතිවාදී ගොඩට අපිව ඇදගෙන යන්න හදනවා. අප ජාතිවාදී පක්ෂයක් නොවන බව පැහැදිලිවම කියනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සියලු ජාතීන් සමග වැඩ කරන පක්ෂයක්. සියලු ආගම් සමග එකතු වෙලා වැඩ කරන පක්ෂයක්. සමහර පක්ෂ ඔවුන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න දුවනවා. ඒක ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ පක්ෂයක්. එහි අප ජාති, ආගම්, පක්ෂ බේද බලන්නේ නැහැ. ඔවුන් යූ.එන්.පීද, ශ්‍රී ලංකාද, පොහොට්ටුද කියල බලන්නේ නැහැ. අප රටක් විදියට සියලු දෙනා වෙනුවෙන් රට දියුණු කරන්න, ආර්ථිකය සංවර්ධනය කරන්නයි බලන්නේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලෙස පළාත් සභා මැතිවරණය අප ඉක්මණින් තියෙනවා. ඒ සඳහා නීති සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුවට එම අණපනත් ගෙන එනවා. පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත වෙලා තියෙන ක්‍රමයක්. දැනට අහෝසි කරන්න විදියක් නැහැ. පළාත් සභා මැතිවරණය ඉක්මනින් තියලා ජනතාවගේ සර්ව ජන ඡන්දයට අයිතියක් ලබාදෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරාල සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය දේශපාලනඥයන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

# සෑම බද්දක්ම අප අඩු කළා

## මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**ක්‍රිසන්ති විතාරණ**

රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩරය දෙන ලද්දේ බිලියන පහළොවක් අඩුවෙන් ලංසු ඉදිරිපත් කළ අයට බව මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය. එහෙත් විපක්ෂයේ දේශපාලන කුහකත්වය ප්‍රදර්ශනය කරමින් විපක්ෂය ඊට බණින බවද ඇමැතිවරයා සඳහන් කළේය.

අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ඒ බව කියා සිටියේ පසුගියදා මහා මාර්ග අමාත්‍යාංශය ශ්‍රවණාගාරයේ දී මාර්ග සංවර්ධන අධිකාරියට අලුතින් බඳවා ගනු ලැබූ වැඩ පරිපාලකවරුන් සඳහා පත්වීම් ලිපි පිරිනැමීමේ අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා, මහා මාර්ග අධිකාරියේ 13,000ක් වැඩකරන වැඩ බිමකට තමයි තමුන්නාන්සේලා පත්වීම් ලබන්නේ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙලේ රැකියා ලක්ෂයක් ලබා දීමේ පොරොන්දුව එතුමා ඉටුකළා. එතුමා අද වෙද්දි 40,000කට ආසන්න පළමු වටයේ දී රැකි රක්ෂා දීලා දෙවනි අදියරේ 60,000කට රැකි රක්ෂා දෙන වැඩපිළිවෙලට එතුමා අතගහල



ඉවරයි. එතුමා පළවෙනි පොරොන්දුව ඉටුකළා. උපාධිධාරී රැකියා 67,000ක් ලබා දෙනවා කිව්වා. එතුමා දේශපාලන භේදයකින් තොරව ඒ පොරොන්දුව ඉටු කරපු නායකයෙක් විදියට එතුමා ඉතිහාසගත වෙනවා. ජනාධිපතිතුමන් ගම්වලට ආවම ගම්වල මිනිස්සු එතුමගෙන් ඉල්ලපු ඉල්ලීම් තමයි එතුමා ඉෂ්ට කරගෙන යන්නේ.

අප රට භාර ගෙන ටික කාලයක් යද්දි ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්න වගේ කොවිඩ් අර්බුදය ආව. අප ජනතාවට පොරොන්දු වුණා බදු අඩුකරනවා කියලා. හැම අතින්ම බදුවලින් පිරුණු ජනතාවට අපහසු වුණ රටක් නිර්මාණය වෙලයි තිබුණේ. ව්‍යාපාරිකයන්ට ආයෝජනය කරන්න රිව තිබුණා. පොරොන්දු වුනා වගේම අප හැම අතින්ම බදු අඩු



# යහපාලන ආණ්ඩුව අඩු කළ බෙහෙත් මිල දැන් වැඩි කරලා

## මහරගම එජාප ප්‍රධාන සංවිධායක නීතිඥ සුදත් ජයසුන්දර

**මැදකොළඹ සමූහ ආරියරත්න ගණේගොඩ**

විවෘත වෙළෙඳපොළේ දිනෙන් දින ඉහළ යන හාල්, පොල්, සීනි, එළවළු මිල අඩු කරන ලෙසත්, විෂ පොල්තෙල් වෙළෙඳපොළෙන් ඉවත්කොට දේශීය පොල්තෙල් සාධාරණ මිලට දෙන ලෙස හඬ නගමින් ඊයේ (11 දා) පෙරවරුවේ මහරගම එජාප ප්‍රධාන සංවිධායක නීතිඥ සුදත් ජයසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් මහරගම නගර මධ්‍යයේ උද්ඝෝෂණයක් පැවැත්විණි.

පරිප්පු කිලෝව 180යි. සීනි කිලෝව 140 යි. රාජපක්ෂ ආණ්ඩුව වැඩි කළ බෙහෙත්වල මිල අඩුකරව්! 2020 ජනවාරියේ වැඩිකළ වැටුප ආණ්ඩුව කපයි! යනුවෙන් සඳහන් විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් උද්ඝෝෂණයේ හඬ නැගූහ.

මෙම අවස්ථාවට එක්සත් ලක්වනිතා පෙරමුණේ සභාපති මහනුවර එජාප දිස්ත්‍රික් නායිකා ශාන්ති කෝන්ගහගේ මහත්මිය සමග හිටපු ඇමැතිනී සුනේත්‍රා රණසිංහ, පරිසරවේදිනි ආචාර්ය අජන්තා පෙරේරා, මහරගම නගර සභාවේ නාගරික මන්ත්‍රිනී ශ්‍රියානි සේනාරත්න, සීතාවක ප්‍රාදේශීය සභාවේ නාගරික මන්ත්‍රිනී කුමුදුනී ජයවර්ධන, අවිස්සාවේල්ල එ.ජා.ප. කළමනාකරු සුසන්ත අබේසූරිය යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මෙම උද්ඝෝෂණයට සහභාගි වූහ.

ඡායාරූපය - මැදකොළඹ සමූහ

# නව රැකියා අවස්ථා මෙරටට ගැනීමට විදෙස් ආයතන සමඟ සාකච්ඡා කරනවා

## රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය

**මහින්ද අලුත්ගෙදර**

ඉදිරියේ දී ඇතිවන රැකියා අවස්ථාවලට ගැලපෙන ලෙස තරුණ පරපුර නිර්මාණය කිරීම සඳහා රජයට වගකීමක් තිබෙන බව කලාපීය සහයෝගිතා රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය මහතා ප්‍රකාශ කළේය.

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් ඉදිරියේ දී ඇති වන බව පෙන්වා දෙන ඒ මහතා මේ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් අන්තර් ජාතික ආයතන සමඟ සාකච්ඡා කරන බවද රැකියාවක් කිරීම පමණක් නොව සාර්ථක ව්‍යාපාරිකයකු බිහි කරන්නේ කෙසේ ද යන්න ගැන සැලසුම් සකස් කළ යුතු බව පැවසීය.

ඒ මහතා මේ බව සඳහන් කළේ බත්තරමුල්ල, නෙළුම් මාවතේ පිහිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පක්ෂ මූලස්ථානයේදි පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ තාරක බාලසූරිය මහතා, කොවිඩ් වසංගතය නිසා සමහර ආයතන ඉදිරියට කරගෙන යන විලාසයේ වෙනස්කම් අප දැකලා තිබෙනවා. ඒ වෙනස්වීමත් සමගම අලුත් රැකියා අවස්ථා නිර්මාණය වී තිබෙනවා. කොවිඩ් යම්කිසි විදිහකට අඩු වුණාම තරුණයන්ට රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් හිමිවේවි කියා විශ්වාස කරනවා.

2000න් පස්සේ බිහිවූ තරුණයන්ගේ චර්යාවේ යම්කිසි වෙනසක් තිබෙනවා. විශේෂයෙන් අද තොරතුරු තාක්ෂණ ආයතන ගත්තාම ඉදිරියේ දි රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් එනවා. අප විදේශ අමාත්‍යාංශය දැනටමත් එක් එක් ජගත් ආයතන එක්ක සාකච්ඡා කරමින් යනවා. තරුණයන් රැකියාවක් කරනවා විතරක් නොවේ තරුණයන්ට ව්‍යාපාරිකයකු විදිහට සාර්ථක වන්නේ කොහොමද කියලා අපට සැලසුම් කරන්න පුළුවන්.

ඉදිරියේ දි වරාය නගරයට අදාළ නීති පද්ධතියක් සකසා චීන ආයෝජකයන් සහ කලාපීය ආයෝජකයන් ගෙන එන්න බලාපොරොත්තු වෙනවා. ඒ සංවර්ධනයත් එක්කම රැකියා උත්පාදනයක් ඇති වෙනවා.



පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක හා ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණේ නිශ්ශංක චතුරංග මහත්වරු ද මෙහිදී අදහස් දැක්වූහ.

### දවසේ රාහු කාලය

උදේ 07.35 සිට 09.08 දක්වා රාත්‍රී 07.47 සිට 09.15 දක්වා

### දින තත්ත්වය

මීන රවි 29 භාග බක් පුර පෑළවිය ලත් සඳු දින ඉර උදාව 06.04ට ඉර බැසීම 06.19ට රේවතී නැකත දහවල් 11.32න් ගෙවී අස්විද නැකත ලබයි. මැදින් අමාවක තිථිය උදේ 08.03න් ගෙවී බක්පුර පෑළවිය තිථිය ලබා පවතී. වෛධෘති යෝගය දහවල් 02.29න් ගෙවී විෂ්කම්භ යෝගය ලබයි. නාගකරණය උදේ 08.03න් ගෙවී කිංස්තුංගකරණය ලබා එය රාත්‍රී 9.10න් ගෙවී භවකරණය උදාව පවතී.

විෂ කලාව - ළැම අමෘත කලාව - මාපටැඟිලි මරු සිටින දිසාව - වයඹ

යෝගිනී - නැගෙනහිර සුබ දිශාව - උතුර



සුබසෙත
ජ්‍යෙෂ්ඨ කර්තෘ
ප්‍රවීණ
ජ්‍යොතිෂවේදී
**අජිත් ධර්මසිරි**

### 2021.04.10 සෙනසුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
06.04 සිට 07.04 දක්වා - සඳු හෝරාව
07.04 සිට 08.04 දක්වා - සෙනසුරු හෝරාව
08.04 සිට 09.04 දක්වා - ගුරු හෝරාව
09.04 සිට 10.04 දක්වා - කුජ හෝරාව
10.04 සිට 11.04 දක්වා - රවි හෝරාව
11.04 සිට 12.04 දක්වා - සිකුරු හෝරාව

**සවස**
12.04 සිට 01.04 දක්වා - බුධ හෝරාව
01.04 සිට 02.04 දක්වා - සඳු හෝරාව
02.04 සිට 03.04 දක්වා - සෙනසුරු හෝරාව
03.04 සිට 04.04 දක්වා - ගුරු හෝරාව
04.04 සිට 05.04 දක්වා - කුජහෝරාව
05.04 සිට 06.04 දක්වා - රවි හෝරාව

**රාත්‍රී**
06.04 සිට 07.04 දක්වා - සිකුරු හෝරාව
07.04 සිට 08.04 දක්වා - බුධ හෝරාව
08.04 සිට 09.04 දක්වා - සඳු හෝරාව
09.04 සිට 10.04 දක්වා - සෙනසුරු හෝරාව
10.04 සිට 11.04 දක්වා - ගුරු හෝරාව
11.04 සිට 12.04 දක්වා - කුජ හෝරාව

**අලුයම**
12.04 සිට 01.04 දක්වා - රවි හෝරාව
01.04 සිට 02.04 දක්වා - සිකුරු හෝරාව
02.04 සිට 03.04 දක්වා - බුධ හෝරාව
03.04 සිට 04.04 දක්වා - සඳු හෝරාව
04.04 සිට 05.04 දක්වා - සෙනසුරු හෝරාව
05.04 සිට 06.04 දක්වා - ගුරු හෝරාව

**බබාට නමක්**

මෙදින දහවල් 11.32 දක්වා රේවතී නැකත උදාවන බැවින් දෙ,දො, ච, චි අකුරු ද ඉන්පසු අස්විද නැකත උදාවන බැවින් එතැන් සිට උපදින දරුවන්ට චු, චෙ, චො, ල අකුරු ද දිනට අනුව ය, ර, ල, ව, ෂ, ස, හ අකුරු ද මුල් කොට දරුවාට නමක් තැබීම සුබයි.






## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - සුබ සතුට දැනෙන දිනක්**

මේෂ ලග්නයට අනුව අද ඔබගේ ජීවිතයේ සුවිශේෂී ජයග්‍රහණ රැසක් උදා වේ. සුබය. සතුට ඉතා හොඳින් දැනෙන දිනක් ද වේ. පොදු ජනතාව වෙනුවෙන් කාලය මිඩංගු කිරීමට සිදුවේ. විශේෂ උත්සවමය කටයුත්තක් සංවිධානය කිරීමට අවස්ථාව උදාවේ. දුරස්ථව සිටි බොහෝ දෙනෙකු තම නිවහනට පැමිණ සතුටු සාමිචියේ යෙදෙන දිනයක් ද වෙයි. තුනටියට අගුණයි. බර ඉසිලීම් ආදියෙන් පරිස්සම් වන්න.

**වෘෂභ ලග්නය - සියලු බලාපොරොත්තු ඉටු වේ.**

වෘෂභ ලග්නයට අනුව තම ආර්ථික ශක්තිය දැඩි වේ. රැකියා ස්ථානවලින් තම ව්‍යාපාරික ස්ථානවලින් ආදායම ගලා එන දිනකි. තමා බලාපොරොත්තුව සිටි ගෘහ අලංකාර කටයුත්තක් ඉතා ලෙහෙසියෙන් නිමා කර ගැනීමට හැකි වේ. හිතේ නොසන්සුන්තා ඇති වේ. කටයුතු අධික වීම ඊට හේතුව වුවද ඉවසීම සමානාත්මතාව ප්‍රගුණ කළ හොත් එම අපහසුතා ද මඟහරවා ගැනීමට හැකි වේ.

**මිථුන ලග්නය - අවුරුද්ද වෙනුවෙන් තෑගි භෝග ලැබේ**

මිථුන ලග්නයට අනුව තම සේවා ස්ථානයේ ප්‍රිය සම්භාෂණයකට සහභාගි වීමට හැකි වේ. සිංහල අවුරුද්ද වෙනුවෙන් තෑගි භෝග ලැබෙනු ඇත. තමා ඉල්ලා තිබූ ණය මුදලක් තමාට ලැබෙනු ඇත. දූ දරුවන් වෙනුවෙන් කෑම බීම ඇඳුම් ආයිත්තම් රැගෙන යාමට අවස්ථාව උදා වේ. යටි බඩේ අපහසුතා ආසාත්මිකතා මතු වනු ඇත. සැර උෂ්ණ කෑම බීම අවම කරන්න.

**කටක ලග්නය - මුදලක් ලැබේ**

කටක ලග්නයට අනුව අද ඔබට ජීවිතයේ වැදගත් සන්ධිස්ථාන කීපයක් පසුකිරීමට හැකි වේ. පෙර පිං මහිමය උදාවන දිනකි. තමා මීට ඉහත කෙනෙකුට දී තිබූ මුදලක් තමාට ලැබීම නිසා තම සිතට සතුට ඇති වේ. බලාපොරොත්තුව සිටි අරමුණු කීපයක් ඉටුකරගැනීමට ඒ නිසාම අවස්ථාව උදාවේ. විවාහ සහකරු හෝ සහකාරියගේ චිත්ත ප්‍රීතිය තමාට නොඅඩුව දැනෙනු ඇත.

**සිංහ ලග්නය - ගෘහ ජීවිතය සතුටුදායක වේ**

සිංහ ලග්නයට අනුව අද ඔබට තමා ඇසුරු කර පසුව ඈත්වී දුරස්වී සිටි මිතුරන් පිරිසක් මුණ ගැසේ. ඒ ප්‍රීතිය නිමිත්තෙන් ප්‍රිය සම්භාෂණයකට පවා සහභාගි වීමට අවස්ථාව උදා වේ. ගෘහ ජීවිතය සතුටුදායක වෙයි. නිවස අලංකාරය සඳහා කැපවීම නිසා අධික වෙහෙස මහන්සිය, තුනටියේ ආපදා මතු කෙරෙන නිසා අධික බර ඉසිලීමාදියෙන් වැළකී සිටින්න.

**කන්‍යා ලග්නය - ගෘහ භාණ්ඩ ලැබීමක්**

කන්‍යා ලග්නයට අනුව අද ඔබ සිය බිරිඳ හෝ ස්වාමියා සමග නිවසේ ගෘහ භාණ්ඩ ගැනීම සඳහා නිවසින් බැහැර යනු ඇත. සිතේ සතුට උපදවන අන්දමේ විසිතුරු භාණ්ඩ නිවසට ගෙන ඒමට හැකි වේ. දෙදෙනා අතර සුහදත්වය මෙන්ම සතුට අභිමානය මතු කෙරෙනු ඇත. තමාට හිතවත් පිරිසකගෙන් ඇප උපකාර ලැබේ. ගෘහ ජීවිතය යුග ජීවිතය සතුටුදායක වෙයි.

**තුලා ලග්නය - සිතේ කණස්සල්ල**

තුලා ලග්නයට අනුව අද ඔබට තම ආර්ථික පීඩාවක් දැනෙන දිනකි. තමාට ලැබෙන්නට තිබූ මුදලක් ප්‍රමාද වන ලකුණු පෙනෙන්නට තිබේ. ඒ නිසාම සිතේ කණස්සල්ල මතු වේ. සැලසුම් කරගෙන සිටි කටයුතු කීපයක් අතරමග නතර කිරීමට සිදුවේ. සිතේ කලකිරීම මතු කෙරේ. වියදම අධික වීම ලැබීම් අවම වීම නිසා ගෘහ ජීවිතයේ ගැටලු කීපයක් මතු කෙරේ.

**වෘශ්චික ලග්නය - එදිනෙදා කටයුතුවල සාර්ථකත්වයක්**

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. ආර්ථික වාසි දරු සම්පත් හිමිකම් මෙන්ම නව ආයෝජන කටයුතු සඵල වේ. තම ඥාති පිරිස් එකතුවක් මත තම එදිනෙදා කටයුතුවල සාර්ථක බව යළි ඇති කර ගැනීමට හැකි වේ. ගෘහ ජීවිතය යුග ජීවිතය තුළ යම් යම් බාහිර අතපෙවීම් නිසා දෙදෙනා අතර යම් යම් ගැටලු මතු කෙරෙනු ඇත. කල්පනාකාරී වන්න. සිතට කාලයක් තිස්සේ වද දුන් සිදුවීමක් නැවත සිහියට ඒමට පුළුවන.

**ධනු ලග්නය -සතුටුදායක දිනක්**

ධනු ලග්නයට අනුව අද ඔබට ජීවිතයේ සතුටුම දිනකි. ආර්ථික වාසි මෙන්ම වාහන ඉඩම් නිවාස හිමිකම් උදා කෙරේ. තමා කාලයක් තිස්සේ බලාපොරොත්තු වූ සතුටුදායක තත්ත්වය අද දින ඔබට උදාවනු ඇත. රැකියා ව්‍යාපාර අභිවෘද්ධිය උසස් නිලතල ලැබීම් උසස් අයගේ ඇසුර ද නොඅඩුව ලැබේ. තම දූ දරුවන්ගේ අවශ්‍යතා කීපයක් ඉටු වනු ඇත.

**මකර ලග්නය - නිවසේ උත්සවශ්‍රීයක්**

මකර ලග්නයට අනුව අද දින ඔබට කිසියම් දේපළක උරුමයක් ලැබෙන දිනකි. යටපත් වූ උරුමයක හිමිකම ද ඥාති පාර්ශව කෙරෙන් සහය ද නිවසේ උත්සවශ්‍රීයක් ඉසිලීම ද අද දින පෙනෙන්නට තිබේ. අඩුම තරමින් විවාහ මංගල කටයුත්තකට සහභාගි වීමට වුවද සිදුවන දිනකි. තම හිතෛෂී පිරිස් සමඟ විනෝද වීමට හැකි වන දිනකි. හිසේ බර ගතිය, සෙම ගතිය මතු කිරීම නිසා පීඩාකාරී වීමට පුළුවන.

**කුම්භ ලග්නය - විනෝද ගමනක්**

කුම්භ ලග්නයට අනුව අද ඔබට හදිසි ධනය උදා කෙරෙනු ඇත. තමා කෙනෙකුට දී තිබූ මුදලක් යළි ලැබේ. ඒ අයුරින්ම ව්‍යාපාරික ලාභ හා රැකියා අභිවෘද්ධිය උදා කෙරේ. මිතුරු කැලක් සමග විනෝද ගමනකට ද සහභාගිවීමට අවස්ථාව උදාවේ. තම දූ දරු පිරිස සමඟ එකතුව රස ආහාර පිළියෙල කරන දිනක් නිවසේ අලංකාරයද වතුපිටිවල පවිත්‍රතාව ද පිළිබඳ කැප වේ·

**මීන ලග්නය - නිවෙසේ අවශ්‍යතා රැසක් සපල වේ**

මීන ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. සිතේ සතුට අභිවෘද්ධිය ආර්ථික ලැබීම් ඇඳුම් පැලඳුම් හා ගෘහ උපකරණ සඳහා වියදම් කිරීමට පෙළඹෙන දිනකි. තම නිවසේ අවශ්‍යතා රැසක් සඵල කරවා ගැනීමට හැකි වේ. නිර්මාණශීලීබව යහපත් සිතිවිලි සහිතව කාලය ගත කිරීමට හැකි වේ. එදිනෙදා කටයුතුද සතුටින් කරගෙන යාමට ද හැකි වේ. තම ගෘහ ජීවිතය සතුටුදායක වේ. අඹුසැමි එකමුතුව වෙනදාට වඩා වැඩි වේ.

# පිලිප් කුමරු ලබන 17 දා ලොවින් සමු ගනී



**එඩින්බරෝ ආදිපාදගේ අවමංගල්‍යය පවුලේ සාමාජිකයන්ට සීමා වෙයි**

**පවුලේත් 30ක් පමණයි**

**අගමැති බොරිස් ජොන්සනුත් නෑ**

## මගේ පියා සුවිශේෂ තැනැත්තෙක්



**චාල්ස් කුමරු කියයි**

ලබන සෙනසුරාදා (17) පැවැත්වෙන එඩින්බරෝ ආදිපාදවරයාගේ අවමංගල්‍යයට අගමැති බොරිස් ජොන්සන් නොපැමිණෙන අතර, කොරෝනා වයිරස් සීමාවන් මධ්‍යයේ හැකි තරම් පවුලේ සාමාජිකයන්ට සීමා වූ චාම් අවමංගල්‍ය උත්සවයක් පැවැත්වෙන බව එරට අගමැති කාර්යාලය නිවේදනය කරයි.

වින්ඩ්සර්හි ශාන්ත ජෝර්ජ් දේවස්ථානයේ පැවැත්වෙන අවමංගල්‍ය උත්සවයට සහභාගී විය හැක්කේ ආදිපාදවරයාගේ දරුවන්, මුනුපුරන් සහ අනෙකුත් සමීප පවුලේ 30 දෙනකුට පමණි.

මෙම උත්සව අවස්ථාවෙන් ඈත්ව සිටින ලෙස මහජනතාවගෙන් ඉල්ලා තිබේ. වේල්ස් කුමරු සෙනසුරාදා ඔහුගේ ආදරණීය තාත්තාට උපහාර දැක්වීය. ග්ලූස්ටර්ෂයර්හි පිහිටි ඔහුගේ හයිග්‍රෝව් නිවසේ සිට අදහස් දක්වමින් චාල්ස් කුමරු කියා සිටියේ තම දිවංගත පියා "ඉතා සුවිශේෂ පුද්ගලයකු බවත් අන් සියල්ලටමත් වඩා ඔහු ගැන පවසා ඇති දේ ගැන මවිතයට පත් වනු ඇති" බවත් ය.

ආදිපාදවරයා සිකුරාදා වින්ඩ්සර් මාලිගයේ දී මිය යන විට වයස අවුරුදු 99කි. ඊයේ (11දා) උදෑසන කැන්ටබරි ආසන දෙව්මැදුරේදී ඔහු වෙනුවෙන් අනුස්මරණ දේව මෙහෙයක් පැවැත්වේ. පිලිප් කුමරුගේ අභිමතයන් පිළිබිඹු කරන බකිංහැම් මාලිගය ඊළඟ සති අන්තයේ අවමංගල්‍ය කටයුතු සාමාන්‍ය ආකාරයට කොරෝනා වයිරස් වසංගතයට අනුව සංවිධානය කර ඇත.

හැකි තරම් පවුලේ සාමාජිකයන්ට සෙනසුරාදා අවමංගල්‍යයට සහභාගී වීමට ඉඩ සලසා අගමැතිවරයා අවමංගල්‍ය කටයුත්තට සහභාගී නොවන බව දැනුම් දී ඇත.


මෙම උත්සවයට සහභාගී වීමට රාජකීය පවුලේ සාමාජිකයන් අතර සසෙක්ස්හි ආදිපාදවරයාද සිටින අතර, ඔහු සිය කැලිෆෝනියානු නිවසේ සිට එක්සත් රාජධානියට ගුවනින් පැමිණෙනු ඇත. දෙවන දරුවා ලැබීමට සිටින ඔහුගේ බිරියට සංචාරය නොකරන ලෙසට ඇගේ වෛද්‍යවරයා උපදෙස් දී ඇති බව බකිංහැම් මාලිගය පවසයි.

අවමංගල්‍ය දිනයේදී ජාතික විනාඩියක නිශ්ශබ්දතාවක් බ්‍රිතාන්‍ය සම්මත වේලාවෙන් 15:00 වැනි පැයට පැවැත්වේ. වේල්ස් කුමරු ඇතුළු රාජකීය පවුලේ සාමාජිකයන් දෙණ පිටුපසින් ගමන් කරන අතර, රැජන වෙනම දේවස්ථානය වෙත ගමන් කරනු ඇත. වසර 73ක විවාහ ජීවිතයක් ගත කර ඇති රාජකීය යුවළ ඉතාම ආදර්ශමත් අඹුසැමි යුවලක් ලෙස කාගේත් ප්‍රසාදය දිනාගෙන සිටියි. අමුත්තෝ සමාජමය වශයෙන් දුරස්ථව සිටින අතර කොරෝනා වයිරස් සීමාවන්ට අනුකූලව මුහුණු ආවරණ පැලඳ සිටී.

පෙරහර ගමන් කරන අතරතුර මිලිටරි තුවක්කු ආචාර වෙඩි තබනු ඇති අතර එය මිනිත්තු අටක් පැවැත්වීමටත් ඇඳිරි නීතිය සීනුව නාද වීමටත් කටයුතු යොදා තිබේ.

පිලිප් කුමරුගේ අභාවය වෙනුවෙන් මල්වඩම් සහ මල් පොකුරු තැබීමට මුදල් වියදම් නොකරන ලෙසත් ඒ වියදම්වලින් පුණ්‍ය ආයතනවලට ආධාර කරන ලෙස මාලිගය ඉල්ලීමක් සිදුකර තිබේ.









# ඉන්දියාවේ තෙවන කොවිඩ් රැල්ල වඩාත් දරුණු වෙයි



**මිලියන 100කට කොරෝනා එන්නත**

**රෝහල්-ප්‍රතිකාර මධ්‍යස්ථාන පිරී ඉතිරෙයි**

**දිනකට ආසාදිතයෝ 150,000ක්; මරණ 800යි**



මාරාන්තික තෙවන ආසාදන රැල්ල මධ්‍යයේ කොරෝනා වයිරස් එන්නත් මාත්‍රාව මිලියන 100කට වඩා ලබා දෙන "ලෝකයේ වේගවත්ම රට" බවට ඉන්දියාව පත්ව ඇති බව ඉන්දියාව පවසයි.

එය දින 85කින් මෙම ජයග්‍රහණය අත්කර ගත් අතර එක්සත් ජනපදය දින 89ක් සහ චීනය දින 102ක් ගත කළ බව සෞඛ්‍ය අමාත්‍යාංශය වැඩි දුරටත් පවසයි.

එහෙත් රට තුළ වාර්තාගත ලෙස දෛනිකව රෝගීන් 150,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර නව මරණ 800කට වඩා වාර්තා වී තිබේ.

මේ සතියේ ප්‍රාන්ත ගණනාවක මාත්‍රාවල හිඟයක් වාර්තා කර ඇති අතර ෆෙඩරල් රජය එහි මාත්‍රා මිලියන 40ක් ඇති බවත්, එන්නත් හිඟය පිළිබඳ චෝදනා මුලුමනින්ම පදනම් විරහිත බවත් අවධාරනය කරයි.

එන්නත් කිරීමේ මෙහෙයුම ජූලි මාසය වන විට මිලියන 250ක ජනතාවක් ආවරණය කිරීමට අපේක්ෂා කරන නමුත් විශේෂඥයන් පවසන්නේ එම ඉලක්කය සපුරා ගැනීම සඳහා වේගය තව දුරටත් ඉහළ නැංවිය යුතු බවයි. වයස අවුරුදු 45ට වැඩි සෑම දෙනාම එන්නත් එන්නත් කිරීම් සඳහා සුදුසුකම් ලබති.

බොහෝ මාත්‍රාවන් මේ දක්වා ලබා දී ඇත්තේ පෙරටුගාමී සේවකයන්ට සහ 60ට වැඩි අයටය. කොරෝනා ආසාදිතයන් වේගයෙන් ඉහළ යාම නිසා රෝහල්වල ඇඳන් හිඟවීම සහ දැඩි සත්කාර ඒකකවල තදබදයක් ඇති වී ඇතැයි එරට ආරංචි මාර්ග සඳහන් කරයි.



sports.dinamina@lakehouse.lk

SPORTS ක්‍රීඩා

# පෝක් සමුද්‍ර සන්ධිය තරණය කරමින්
# රොෂාන් අබේසුන්දරගෙන් ආසියානු වාර්තාවක්



නිරෝෂාන් ප්‍රියංකර

තලෙයිමන්නාරමේ සිට ඉන්දියාවේ ධනුස්කොඩි දක්වා පිහිනමින් නව ආසියානු වාර්තාවක් පිහිටු වීමට ශ්‍රී ලංකාවේ ගුවන් හමුදාවේ නායක ගුවන් භට රොෂාන් අබේසුන්දර සමත් වෙයි.

පෙරේදා (10) අලුයම 2.00ට පමණ තලෙයිමන්නාරමෙන් පිහිනීම ඇරඹූ 32 හැවිරිදි රොෂාන් ධනුෂ්කොඩි වෙත ගොස් ඊයේ පෙරවරු 7.00ට පමණ යළි තලෙයිමන්නාරමට ළඟා විය. මේ සඳහා තරණය කළ යුතු සමස්ත දුර ප්‍රමාණය වූ කිලෝමීටර් 59.3 පිහිනීම සඳහා රොෂාන්ට පැය 28 මිනිත්තු 19 තත්පර 43ක කාලයක් ගත විය.

මින් පෙර එම දස්කම පෙන්වා ඇත්තේ ශ්‍රී ලාංකික පිහිනුම්කරුවකු වන කුමාර් ආනන්දන් විසිනි. 1971 වසරේ එම වාර්තා පිහිටුවීමට කුමාර්ට පැය 51ක කාලයක් ගත වී තිබිණි. මෙහිදී රොෂාන් තලෙයිමන්නාරමේ සිට ධනුස්කොඩි දක්වා යෑමට පැය 10 මිනිත්තු 31ක කාලයක් ගත කළ අතර, එය ද නව ශ්‍රී ලංකා වාර්තාවක් බවට පත් විය.

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ මහතාගේ පූර්ණ සහයෝගය හා මග පෙන්වීම යටතේ මේ කාර්යයට එක් වූ රොෂාන්ගේ පුහුණුකරු ලෙස පිහිනුම් උපදේශක ආචාර්ය කේ. ඩබ්ලිව් යසරත්න මහතා කටයුතු කරයි.

මාතර මධ්‍ය මහ විද්‍යාලයේ ආදි සිසුවකු වන රොෂාන් පැවසුවේ මේ වාර්තාව තැබීමේ මූලික අරමුණ සාගරය පරිසරය රැක ගැනීමේ පණිවිඩය ලෝකයට රැගෙන යෑම බවයි.

සාගරයට පොලිතින් සහ ප්ලාස්ටික් දමන්න එපා යැයි ලෝකවාසීන්ට පණිවිඩයක් දීම ඉන් බලාපොරොත්තු වන බවත්, පොක් සමුද්‍ර සන්ධිය තරණය කිරීමට පැය 35කට ආසන්න කාලයක් ගත වනු ඇතැයි බලාපොරොත්තු වන බවත් තලෙයිමන්නාරමෙන් පිහිනීම ආරම්භ කිරීමට පෙර රොෂාන් පැවසීය.

මේ වාර්තාව පිහිටුවීමට පසුගිය කාලයේ දකුණු මුහුදු තීරයේදී පුහුණු තරග රැසකට එක් වූ රොෂාන් එහිදී කිලෝමීටර් 48ක දුරක් මුහුදු පිහිනුම් පැය 23කින් නිම කරමින් ජාතික වාර්තාවක් පිහිටුවීමට ද සමත් විය.

එහි මූලික අඩිතාලම දමමින් මාතර සිට මිදිගමට කිලෝමීටර් පහළොවක් පිහිනා ගොස් නව ශ්‍රී ලංකා වාර්තාවක් තැබූ ඔහු අනතුරුව මාතර සිට කොග්ගලට පිහිනා එම (කි.මී. 25) වාර්තාව යළි අලුත් කළේය.

අනතුරුව මාතර සිට ගාල්ල දඩල්ලටත් දඩල්ලේ සිට නැවත උණවටුනටත් කිලෝමීටර් 48ක් පිහිනා නව ජාතික වාර්තාවක් බිහි කළේය. ඒ සඳහා ඔහු පය 23ක කාලයක් ගත කර තිබිණි.

මින් පෙර පසුගිය මස 26-27 දෙදින පොක් සමුද්‍ර සන්ධිය තරණය කරමින් වාර්තාව පිහිටුවීමට රොෂාන් උත්සාහ කළ ද අන්තර්ජාතික මට්ටමෙන් ඇති කර ගත් එකඟතාවලට අවශ්‍ය ලිපි ලේඛනවල අඩුවක් හේතුවෙන් ඔහුට එවර එම අවස්ථාව අහිමි වී ගියේය.

# දිනුක් පක්ෂ්‍යානන්දය දිනවයි



දිනුක් ආලෝකගේ තුන් ඉරියව් දස්කම් හේතුවෙන් වත්තල සාන්ත අන්තෝනි විදුහල් පිලට එරෙහිව පළමු ඉනිමේ ජයක් ලැබූ රද්දොළුගම ශ්‍රී පක්ෂ්‍යානන්ද විදුහල් පිල ආර්.බී. ක්‍රිකට් පදනමේ අභියෝගතා කුසලාන අවුරුදු 15න් පහළ ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගයට සුදුසුකම් ලැබීමට සමත් විය.

රද්දොළුගම පක්ෂ්‍යානන්ද විදුහල් පිටියේ පසුගියදා පැවැති මේ තරගයේ පළමුව පන්දුවට පහර දුන් සාන්ත අන්තෝනි විදුහල් පිල ලකුණු 186කට සීමා කරමින් ලකුණු 31කට කඩුලු 5ක් බිඳ දැමූ දිනුක් ආලෝක අනතුරුව පක්ෂ්‍යානන්ද විදුහල් පිලේ ඉනිමේදී නොදැවී ලකුණු 68ක් රැස් කිරීමට සමත් විය. ඔහුට අගනා සහායක් දුන් හරිත දිනේන්ද්‍ර නොදැවී ලකුණු 57ක් රැස් කළේය.

# පාකිස්තාන යොවුන් පිලේ බංග්ලාදේශ සංචාරය නවතී

පාකිස්තාන අවුරුදු 19න් පහළ ක්‍රිකට් කණ්ඩායමේ බංග්ලාදේශ සංචාරය අත්හිටුවීමට බංග්ලාදේශ ක්‍රිකට් පාලක මණ්ඩලය කටයුතු කරයි.

බංග්ලාදේශය තුළ කොරෝනා රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම හේතුවෙන් මේ සංචාරය අත්හිටුවූ බව පාකිස්තානය ක්‍රිකට් ආයතනය ද තහවුරු කර තිබේ.

රට වසා දැමීමට රජය තීරණය කිරීමත් සමඟ අද ආරම්භ වීමට නියමිතව තිබූ මේ සංචාරය මින් පෙර 17 වැනිදා දක්වා සතියකින් කල් දැමීමට බංග්ලාදේශ ක්‍රිකට් බලධාරින් කටයුතු කළ අතර, යළි රට යහපත් තත්ත්වයට හැරීමෙන් පසු ක්‍රිකට් ආයතන දෙක එක්ව මේ තරගාවලිය පැවැත්වීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නියමිතය.

දෙපිල අතර, සිව්දින තරගයක් සහ එක්දින තරග 5ක් මේ සංචාරයට ඇතුළත්ව තිබූ අතර, එම තරග සිලෙට් සහ ඩකා නුවරදී පැවැත්වීමට කටයුතු යොදා තිබිණි.

කොරෝනා වසංගතයේ ව්‍යාප්තියෙන් පසු ලොව පැවැත්වෙන පළමු යොවුන් ක්‍රිකට් සංචාරය මෙය වන අතර, මේ වසංගතය හේතුවෙන් වත්මන් යොවුන් ශූරයන් වන බංග්ලාදේශයට මින් පෙර ඇෆ්ගනිස්තානය සමඟ තරගාවලියක් ද අහිමි විය.

# කමිල් - චාමික එන්සීසී පිලට එක්දින කිරුළ දිනා දෙති



කමිල් මිෂාර

නිරෝෂාන් ප්‍රියංකර

කමිල් මිෂාරගේ විශිෂ්ට ශතකයත් චාමික කරුණාරත්නගේ දක්ෂ පන්දු යැවීමත් හේතුවෙන් අන්තර් සමාජ එක්දින ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට ඇන්ජෙලෝ පෙරේරාගේ නායකත්වයෙන් යුත් එන්සීසී කණ්ඩායම ඊයේ සමත් විය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මෙහෙයවන තරගාවලියේ එස්එස්සී පිටියේ ඊයේ පැවැති අවසන් තරගයේදී එන්සීසී පිල හමුවේ ඉෂාන් ජයරත්නගේ නායකත්වයෙන් තරග කළ රාගම කණ්ඩායම ලකුණු 145කින් පරාජයට පත් විය.

තරගයේ කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් එන්සීසී පිල කඩුලු 7ක් දැවී ලකුණු 286ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹාගිය රාගම පිලට ඕවර 30.3කදී සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 141ක් පමණි.

එන්සීසී පන්දු යවන්නන් හමුවේ රාගම පිළිතුරු ඉනිමේදී සාර්ථක සබඳතාවක් ගොඩනැඟීමට කිසිදු පිතිකරු යුගලයකට අවස්ථාවක් නොලැබිණි.

ජනිත් ලියනගේ හුදෙකලා සටනක නිරත වෙමින් ලකුණු 42ක් රැස් කළේ පන්දු 71කිනි. මුල් කඩුලු 3 ළහිරු කුමාර සහ නිමේෂ් ද සිල්වා බිඳ දමද්දී මැද පෙළ ප්‍රබල පිතිකරුවන් තිදෙනකු යළි ක්‍රීඩාගාරයට හරවා යමින් තරගය එන්සීසී පිල දෙසට ගෙන යෑමට චාමික කරුණාරත්න සමත් විය. ලකුණු 2ක් රැස් කර සිටි ෂෙහාන් සඳරුවන් ආබාධයකට ලක්වීම ද රාගම පිලට අවාසියක් විය. පන්දු යැවීමේදී චාමික කරුණාරත්න කඩුලු 4ක් බිඳ දැමූ අතර, ඔහුට අනගි සහායක් දුන් ළහිරු කුමාර කඩුලු 3ක් දවා ගත්තේය.

පළමුව පන්දුවට පහර දුන් එන්සීසී පිලේ පළමු කඩුල්ලට මුළු ලකුණු 7දී බිඳ වැටීමෙන් පසු පිටියට පිවිසි කමිල් මිෂාර යළිත් වරක් ඉනිමේ වැඩිම ලකුණු ලාභියා වෙමින් ශතකයක් රැස් කිරීමට සමත් විය. මෙවර තරග වාරයේ තෙවැනි ශතකය ඊයේ වාර්තා කළ කමිල් පන්දු 132කදී හතරේ පහර 9ක් සමඟින් ලකුණු 113ක් රැස් කළේ පළමු පෙළ තරග දිවියේ ඉහළම ඉනිම ලෙසිනි.

ඔහු මුළු ලකුණු 255දී සිව්වැනි කඩුල්ල ලෙස පිටියෙන් ඉවත් වීමට පෙර කවීන් බණ්ඩාර සමඟින් තෙවැනි කඩුල්ලට ලකුණු 137ක් එක් කළ අතර, අනතුරුව සිව්වැනි කඩුල්ලට ලකුණු 98ක් එක් කළේ නායක ඇන්ජෙලෝ පෙරේරා සමඟිනි. කවීන් හතරේ පහර 6ක් සමඟ පන්දු 76කින් ලකුණු 65ක් සහ ඇන්ජෙලෝ පන්දු 43කදී හතරේ පහර 4ක් සහ හයේ පහරක් සමඟින් වේගවත් ලකුණු 61ක් වාර්තා කිරීමට සමත් විය.

අවසන් පූර්ව තරගයේදී එන්සීසී පිල වෙනුවෙන් ශතකයක් රැස් කරමින් විශිෂ්ට ඉනිමක් ක්‍රීඩා කළ උපුල් තරංගට ඊයේ රැස් කළ හැකි වූයේ ලකුණු 10ක් පමණි.

පන්දු යැවීමේදී ඉෂාන් ජයරත්න සහ බිනුර ප්‍රනාන්දු කඩුලු 3 බැගින් බිඳ දැමූහ.

**එන්සීසී** - 286/7යි. (ඕවර 60) කමිල් මිෂාර 113, කවීන් බණ්ඩාර 65, ඇන්ජෙලෝ පෙරේරා 61 (ඉෂාන් ජයරත්න 52/3, බිනුර ප්‍රනාන්දු 55/3)

**රාගම** - 141යි. (ඕවර 30.3) ජනිත් ලියනගේ 42 (චාමික කරුණාරත්න 37/4, ළහිරු කුමාර 30/3)



චාමික කරුණාරත්න

# දෝනි ලක්ෂ 12ක දඩ කයි



අයිපීඑල් තරගාවලියට එක්ව සිටින චෙන්නායි සුපර් කිංග්ස් කණ්ඩායමේ නායක මහේන්ද්‍ර සිං දෝනිට දඩ මුදලක් නියම කිරීමට අයිපීඑල් සංවිධායකයෝ කටයුතු කර තිබේ.

පසුගිය 9 වැනිදා ආරම්භ වූ 2021 අයිපීඑල් තරගාවලියේ වැන්කඩේ ක්‍රීඩාංගණයේ පෙරේදා දිල්ලි පිල සමඟ පැවැති දෙවැනි තරගයේදී නියමිත කාලය තුළ අදාළ ඕවර සංඛ්‍යාව සම්පූර්ණ නොකිරීම හේතුවෙන් මෙලෙස දෝනිට දඩ නියම කර ඇති අතර, එම මුදල ඉන්දීය රුපියල් ලක්ෂ 12කි. එය ආසන්න වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 32ක් පමණ වේ.

"අයිපීඑල්හි චර්යාධර්ම සංග්‍රහය යටතේ අවම අධි අනුපාත වැරදි සම්බන්ධයෙන් ඔහුගේ කණ්ඩායම විසින් මේ වාරයේ සිදු කරන ලද පළමු වරද මෙය බැවින් දෝනිට මේ රුපියල් ලක්ෂ 12ක දඩයක් නියම විය" යනුවෙන් අයිපීඑල් සංවිධායකයෝ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියහ.

මේ අතර, චෙන්නායි පිල සමඟ පැවැති එම තරගයෙන් දිල්ලි පිල කඩුලු 7ක ජයක් අත් කර ගැනීමට සමත් විය. තරගයේ පළමුව පන්දුවට පහර දුන් චෙන්නායි පිල දුන් ලකුණු 189ක ඉලක්කය පන්දු 8ක් ඉතිරිව තිබියදී සපුරාගත් දිල්ලි පිලට අහිමි වූයේ කඩුලු 3ක් පමණි.

දිල්ලි පිල ජයග්‍රහණය කරා ගෙන ප්‍රිත්වි ෂෝ සහ ශිකර් ධවාන් පළමු කඩුල්ලට ගොඩනැගූ සබඳතාව ලකුණු 138කි. ධවාන් හතරේ පහර 10ක් සහ හයේ පහර 2ක් සමඟින් පන්දු 54කින් ලකුණු 85ක් රැස් කළ අතර, හතරේ පහර 9ක් සහ හයේ පහර 3ක් සමඟින් ලකුණු 72ක් රැස් කළ ප්‍රිත්වි වැය කළේ පන්දු 38ක් පමණි. පන්දු යැවීමේදී ශර්දුල් ඨාකූර් කඩුලු 2ක් බිඳ දැම්මේය.

චෙන්නායි පිල වෙනුවෙන් සුරේෂ් රයිනා පන්දු 36කින් ලකුණු 54ක් වාර්තා ළ අතර, මොයින් අලී ලකුණු 36ක් සහ සෑම් කරන් පන්දු 15කින් ලකුණු 34ක් ඉනිමට එක් කළහ. නායක මහේන්ද්‍ර සිං දෝනි ලකුණු නොලබාම දැවී ගියේය.

පන්දු යැවීමේදී ක්‍රිස් වෝක්ස් සහ අවේෂ් ඛාන් කඩුලු 2 බැගින් දවා ගත්හ.

# පාකිස්තානයට වාර්තාගත ජයක්

මොහොමඩ් රිස්වාන්ගේ විශිෂ්ට පිතිහරඹය හේතුවෙන් දකුණු අප්‍රිකාව සමඟ පැවැති පළමු විස්සයි20 තරගයෙන් වාර්තාගත ජයක් අත් කර ගැනීමට සංචාරක පාකිස්තාන කණ්ඩායම සමත් වෙයි. මේ සමඟ තරග 4කින් සමන්විත විස්සයි20 තරගාවලිය 1-0ක් ලෙස පෙරමුණ ගැනීමට ද සංචාරකයන්ට හැකි විණි.

ජොහැනස්බර්ග්හිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් දකුණු අප්‍රිකාව කඩුලු 6ක් දැවී ලකුණු 188ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹාගිය පාකිස්තාන ක්‍රීඩකයෝ ඉනිම නිමාවීමට පන්දුවක් ඉතිරිව තිබියදී ජය අත් කර ගත්තේ කඩුලු 6ක් පමණක් දැවී තිබියදීය. මේ ජය වාර්තා අතරට එක් වූයේ විස්සයි20 පිටියේදී පාකිස්තානය හඹාගොස් ජය ගත් ඉහළම ඉලක්කය ලෙසිනි.

තරගයේ වීරයා වූ මොහොමඩ් රිස්වාන් පන්දු 50කින් ලකුණු 74ක් පාකිස්තාන ඉනිමට එක් කළේ හතරේ පහර 9ක් සහ හයේ පහර 2ක් සමඟිනි. ෆහීම් අෂ්රෆ් පන්දු 14කින් ලකුණු 30ක් සහ ෆකාර් සමාන් ලකුණු 27ක් වාර්තා කළහ. පන්දු යැවීමේදී බියුරන් හෙන්ඩ්‍රික්ස් කඩුලු 3ක් සහ ටබ්රයිස් ශම්සි කඩුලු 2ක් බිඳ දැමීමට සමත් විය.

දකුණු අප්‍රිකානු පිල වෙනුවෙන් නායක හෙන්රිච් ක්ලාසීන් පන්දු 28කින් ලකුණු 50ක් සහ ඒඩ්න් මාක්‍රම් පන්දු 32කින් ලකුණු 51ක් රැස් කිරීමට සමත් වූහ. පන්දු යැවීමේදී මොහොමඩ් නවාස් සහ හසන් අලී කඩුලු 2 බැගින් බිඳ දැමූහ.

දෙපිල අතර, තරග 4කින් සමන්විත විස්සයි20 තරගාවලියේ පළමු දෙවැනි තරගය අද (12) ජොහැනස්බර්ග්හිදීම පැවැත්වෙයි.



මොහොමඩ් රිස්වාන්

42nd OBSERVER – SLT-MOBITEL
SCHOOL CRICKETER OF THE YEAR
"Recognizing talent, inspiring greatness"
BMICH APRIL 20, 2021, 5.30 PM





LAKE HOUSE
SUNDAY OBSERVER
SLTMOBITEL The Connection

# සුබ ගමන් කුමරුනි, පිලිප්!



බ්‍රිතාන්‍යයේ දෙවැනි එලිසබෙත් රජනගේ ආදරණීය සැමියා-එඩින්බරෝහි ආදිපාද පිලිප් කුමරු අනූ නව වසරක් ආයු වළඳා පසුගිය දා අභාවප්‍රාප්ත වූයේය. ඔහු දිවි සැරිය නිම කළේ හැත්තෑ හතර වසරක විවාහ දිවියට සමු දෙමිනි. ඒ අනුව බ්‍රිතාන්‍ය රජ පවුලේ කිරුළ දැරූ රාජිනියකගේ වල්ලභයා ලෙස දීර්ඝ කාලයක් විසුවේ ද ඔහු ය. ඔහුගේ දේහය පිළිබඳ අවසන් කටයුතු දහහත් වැනි (17) දා සෙනසුරාදා රාජකීය සම්ප්‍රදායන් මධ්‍යයේ සිදු කිරීමට නියමිතව ඇත. අවසන් කටයුතුවලට පෙර දේව මෙහෙය පැවැත්වෙන්නේ සාන්ත ජෝර්ජ් දේවස්ථානයේය. වින්ඩ්සර් මාලිගයේ තැන්පත් කර ඇති දේහය ගෞරවාචාර මධ්‍යයේ සාන්ත ජෝර්ජ් දේවස්ථානයට රැගෙන ඒම සිදු කෙරෙනු ඇත. දේහය, දේවස්ථානයට රැගෙන යන්නේ එරට වේලාවෙන් පස්වරු 2.45ට පමණය.

පිලිප් කුමරුගේ ආදාහන කටයුතු කොරෝනා වසංගත සීමාවන්ට යටත්ව සිදු කෙරෙන බව ද සඳහන් වේ. බ්‍රිතාන්‍යයෙහි දැනට බල පවත්නා වසංගත නීති යටතේ ආදාහන උත්සවයකට සහභාගී විය හැකි වන්නේ තිස් දෙනෙකුට පමණි. ඒ අනුව පිලිප් කුමරුගේ අවමඟුල් උත්සවයට මහජනතාවට සහභාගි වීමට ඉඩ ලැබෙනු ඇත්ද යන්න සම්බන්ධයෙන් සැකයක් ඇත. කුමරුගේ දේහය දැක බලා ගැනීම සඳහා එක් රොක් නොවන මෙන් ද රාජකීය මන්දිර ඉදිරිපිට මල් කලඹ තැන්පත් කිරීමෙන් ද වළකින ලෙස බ්‍රිතාන්‍ය රජය සහ රාජකීය පවුලේ සාමාජිකයන් සාමාන්‍ය ජනයාගෙන් ඉල්ලීමක් ද කර තිබේ.

## සමාජ සත්කාර

බ්‍රිතාන්‍ය ජනයාගේ ගෞරවාදරයට පත් පිලිප් කුමරු උපත ලබා තිබෙන්නේ 1921 වසරේ ජුනි 10 වැනිදා ග්‍රීසියේ කෝර්ෆු දූපතේදීය. ඔහුගේ පියා ග්‍රීසියේ සහ ඩෙන්මාර්කයේ ඇන්ඩෲ කුමරුය. ඔහුගේ මව බැටන්බර්ග්හි ඇලිස් කුමරියයි. ඇලිස් කුමරිය බ්‍රිතාන්‍යයේ වික්ටෝරියා රැජිනගේ මී මිනිපිරියක බව සඳහන් වේ. ඇලිස් කුමරිය උපත ලබා තිබෙන්නේ පිලිප් කුමරු ජීවිතක්ෂයට පත් වින්ඩ්සර් මාලිගයෙහිම ය. 1903හිදී ඇන්ඩෲ කුමරු සමඟ විවාහ වූ ඇය ඔහුගේ ස්වාමියා දැරූ තනතුරු සහ තානාන්තරවලට අනුව ජීවත්වීමට හුරු වූවාය. ඇය දරුවන් පස් දෙනකු ලැබුවාය. ඉන් සිව් දෙනෙක් දියණියෝ ය. පවුලේ බාලයා පිරිමි දරුවකු වූ අතර ඔහු පළමුව සඳහන් කළ පිලිප් කුමරුය. ඇන්ඩෲ කුමරු සහ පවුල වරින් වර ග්‍රීසියෙන් පිටමං කළ බව වාර්තාවන්හි සඳහන් වේ. මේ අතර ඇලිස් කුමරිය 1930 පමණ වන විට හීනෝන්මාදය නමැති මානසික රෝගයෙන් පෙළෙන්නට වූවාය. ස්විට්සර්ලන්තයේ ස්ථාපිත උන්මත්තකාගාරයක් වැනි ස්ථානයක ඇ සෑහෙන කාලයක් රඳවා තබා ප්‍රතිකාර ලබා දී ඇත. මේ නිසා ඇය කලක් සිය සැමියාගෙන් වෙන්ව ජීවත් වූවාය. සුවය ලද පසු ඈ නොයෙක් සමාජ සත්කාරක වැඩපිළිවෙළවල යෙදෙමින් කාලය ගත කළාය. ග්‍රීසියේ දෙවන කොන්ස්ටන්ටයින් රාජ්‍ය පාලනය බිඳ වැටීමෙන් සහ 1967දී ග්‍රීසියේ හමුදා පාලනය පැනවීමෙන් පසු ඇලිස් කුමරිය එක්සත් රාජධානියේ බකිංහැම් මාලිගයේ වාසය කිරීමට පැමිණියාය. ඒ, ඇගේ ලේලියගේ-එනම් දෙවැනි එලිසබෙත් රජනගේ සහ පුතණුවන්ගේ එනම්, පිලිප් කුමරුගේ ආරාධනයෙනි. බකිංහැම් මාලිගයෙහි පදිංචියට පැමිණීමෙන් වසර දෙකකට පමණ පසු ඈ එහිදීම ජීවිතක්ෂයට පත් වූවාය. ඇගේ දේහය ඈ උපන් ස්ථානය වන වින්ඩ්සර් මාලිගයට පසුව රැගෙන එන ලද බව සඳහන් වේ.



## ජර්මනියේ අධ්‍යාපනය

1930 පමණ වන විට සිය බිරියගෙන් වෙන් වූ ඇන්ඩෲ කුමරුට 1931 වසරේ අග භාගය වන විට තම දියණියන් සිව් දෙනාගෙන් ද නිදහස් වන්නට ඉඩ ලැබුණේය. දියණියන් සිව් දෙනාම විවාහ වී සිටියේ ජර්මන් ජාතිකයන් සමඟය. බෑනාවරුන් නාසීන් සමඟ සම්බන්ධතා පැවැත්වූ අය හැටියට ද නම් කර ඇත. 1944 පමණ වන විට ඇන්ඩෲ කුමරු මොනාකෝ රාජ්‍යයේ මොන්ටේ කාර්ලෝහි පදිංචියට යන්නේය. 1939යෙන් පසු මිය යන තුරුම ඇන්ඩෲ කුමරු සිය දියණියන් නැවත නුදුටුවේය. පවුලේ උදවිය මේ අන්දමට සීසීකඩ විසිරී යද්දී පිලිප් කුමරුට කුමක් සිදු වීද? සිය අක්කලාට වඩා වයසින් බෙහෙවින් බාල වූ පිලිප් කුමරු 1930 වන විටත් පසු වූයේ නව හැවිරිදි වියෙහිය. කෙසේ වුවත් පිලිප් කුමරු සිය මව් පාර්ශ්වයේ ආච්චි අම්මා වූ වික්ටෝරියා මවුන්ට් බැටන්ගේ සෙවනෙහි එනම්, බ්‍රිතාන්‍යයේ හැදෙමින් වැඩෙමින් සිටියේය. පිලිප් කුමරු එහි ළඟා වූයේ 1928 වසරේදී පමණ බැව් සඳහන් වේ. මේ අනුව බලන විට පිලිප් කුමරුට සිය මව සමඟ සම්බන්ධ වූයේ ඉතා අඩුවෙන් බව පෙනී යයි.



බ්‍රිතාන්‍යයේ හැදෙමින් වැඩෙමින් සිටි පිලිප් කුමරුව 1933 පමණ වන විට ජර්මනියේ පාසලකට ඇතුළත් කරන ලදී. එම පාසල අයත් වූයේ ඔහුගේ එක් සොහොයුරියකගේ සැමියාගේ පවුලේ අයටය. එනිසා 'ඉස්කෝල කාසි' ගෙවීමෙන් තොරව ඔහුව පාසල් යැවීමට හැකියාව තිබිණ. නාසීන්ගේ බලපෑම් වැඩිවන විට ජර්මනියේ අධ්‍යාපනය නවතා ස්කොට්ලන්තයට පැමිණෙන්නට පිලිප් කුමරුට සිදු විය. ඒ වන විට ඔහු ජර්මන් පාසලේ අධ්‍යාපනය ලබා තිබුණේ වාර දෙකක කාලයක් පමණි.

ස්කොට්ලන්තයේ අධ්‍යාපනය නිම කිරීමෙන් පසු පිලිප් කුමරු රාජකීය නාවික හමුදා කොලීජියෙහි කැඩෙට් නිලධාරියකු ලෙස අධ්‍යාපනය නිම කළේය. ඒ 1939දී පමණය. ඉන් ඉක්බිති ඔහු නැවත ග්‍රීසියට පැමිණියේ සිය මව සමඟ ජීවත් වීමේ අරමුණ ඇතිවය. ඔහුගේ මව ඒ වන විට වාසය කළේ ග්‍රීසියේ ඇතැන්ස් නුවරය. ග්‍රීසියේ රජුගේ නියමය ප්‍රකාරව පිලිප් කුමරුට ග්‍රීසියෙන් පිටමං වන්නට සිදු වන්නේ ඉතා කෙටි කලකිනි. යළිත් බ්‍රිතාන්‍යට පැමිණෙන පිලිප් කුමරු නාවුක හමුදා නිලධාරියකුට අවශ්‍ය අධ්‍යාපනය තව දුරටත් ලබා බ්‍රිතාන්‍ය නාවුක හමුදාව සමඟ දෙවන ලෝක යුද මෙහෙයුම් කටයුතුවලට සහභාගී වන්නේය. එනම් නාසීන්ට එරෙහි මෙහෙයුම්වලටය. ඒ වන විට පිලිප් කුමරුගේ එක සොයුරියක්, ඇගේ සැමියා සහ දරුවෝ ගුවන් අනතුරකින් ජීවිතක්ෂයට පත්ව සිටියහ. අනෙක් සොයුරියන් දෙදෙනාගේ ස්වාමිපුරුෂයෝ නාසි හමුදාවන්ට පක්ෂපාතීව කටයුතු කරමින් සිටියහ. එය බලවත් ගැටලු සහගත තත්ත්වයක් බව බැලූ බැල්මටම පෙනී යයි. නාවුක නිලධාරියෙක් ලෙස ඔහු අදියරයෙන් අදියරය ඉදිරියට යමින් සිටියේය. ඔහුට තම නාවුක හමුදා වෘත්තීය කටයුතු තව දුරටත් ඉදිරියට රැගෙන යෑම 1946 වසර පමණ වනවිට ගැටලුවක් වී තිබිණ. ඒ අනෙකක් නිසා නොව ඔහු සහ එලිසබෙත් කුමරිය අතර හටගෙන තිබුණු ප්‍රේම සම්බන්ධය විවාහයක් දක්වා දිගු වෙමින් පැවැති නිසයි.

## පරිවාර කටයුතු

එලිසබෙත් කුමරිය සහ පිලිප් කුමරු අතර හමුව සිදු වන්නේ 1939දී පමණය. හය වැනි ජෝර්ජ් රජු සහ ඔහුගේ බිරිය එලිසබෙත් රැජන, ඩාර්ට්මවුත්හි රාජකීය නාවුක හමුදා කොලීජියට පැමිණි අතර ඔවුන්ගේ දියණියන් දෙදෙනා වූ එළිසබෙත් සහ මාර්ග්‍රට් කුමරියන්ට පරිවාර කටයුතු සිදු කිරීමට පැවරී තිබුණේ පිලිප් කුමරුටය. ඔහු එම කුමරියන්ට ඥාති සොයුරෙක් ද වූයේ ය. ඒ වන විට දහතුන් හැවිරිදි වියේ පසු වූ එලිසබෙත් කුමරිය සහ දහ අට හැවිරිදි වියේ පසු වූ පිලිප් කුමරු අතර ප්‍රේම සම්බන්ධයක් ඇති විණ. මුල් කාලයේදී දෙදෙනා අතර ලිපි හුවමාරු විය. එහෙත් පසුව මේ ප්‍රේම සම්බන්ධතාවය එලිසබෙත් කුමරියගේ මව්පියන්ට දන්වන්නට ඔහුට සිදු විය. එක්දහස් නවසිය හතළිස් ගණන් මැද භාගය වන විට ඔහුට එලිසබෙත් කුමරියගේ අත ගන්නට හය වැනි ජෝර්ජ් රජතුමාගේ කැමැත්ත ලැබිණ. 1947 වසරේදී එලිසබෙත් කුමරිය සහ පිලිප් කුමරු අතර විවාහය සිදු විය.

රාජකීය පවුලේ ඉහළම පෙළේ සාමාජිකයකු ඇමතීම සඳහා යොදා ගන්නා His Royal Highness නාමය විවාහයට පළමුව පිලිප් කුමරු වෙත පිරිනමන ලදී. එයට අමතරව ඔහුට එඩින්බරෝහි ආදිපාද තනතුරත් මෙරිඔනින් සහ බාරොන් ග්‍රීන්විච්හි අර්ල් තනතුරත් පිරිනැමිණ. පිලිප් කුමරු හමුදා සේවයෙන් ඉවත් වූයේ එලිසබෙත් කුමරිය, රැජන තනතුරෙහි 1952 වසරේදී අභිෂේක කිරීමෙන් පසුවය. පිලිප් කුමරු ඒ වන විට සිය හමුදා දිවියේ කොමාන්ඩෝ ධුරය දරමින් සිටියේ ය. එලිසබෙත් කුමරියගේ රාජාභිෂේකයෙන් පසු අට සියයකට අධික තනතුරු සංඛ්‍යාවක් භාරගෙන ඒවායෙහි රාජකාරී කටයුතු කරන්නට පිලිප් කුමරුට සිදු විය. ඔහු 2017 වසරේ අගෝස්තු මාසයේදී ඒ සියලු තනතුරුවලින් විශ්‍රාම ගත්තේ ය. එකී තනතුරුවලට අදාළ විවිධ අවස්ථාවන් 22219කට ඔහු 1952 වසරේ සිට 2017 වසර දක්වා කාලයේදී සහභාගී වී තිබුණේය. ඒ සමඟම ඔහුගෙන් යටපත් වූ ඔහුගේ හැකියාවන් ගැන ද සිහි කළ යුතුය. ඔහු ගුවන් නියමුවකු වශයෙන් ද කටයුතු කළ අයෙකි. පියාසර පැය පන්දහසක පමණ අත්දැකීම් ඔහුට ඇත. එසේම ඔහු ඉතා දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකි; පෝලෝ ක්‍රීඩකයෙකි.

## නිහඬ කුමරු



ඒ සියල්ලටම වඩා පිලිප් කුමරු ඉතා නිහඬ කෙනෙකු වන්නේය. දෙවැනි එලිසබෙත් රැජන සමඟ විවාහ වී හැත්තෑ හතර වසරක් ඉක්ම ගොස් ඇතත් ඔහු රජ පවුලේ සම්ප්‍රදායන්, සෙසු රාජකීයයන් මෙන්ම බ්‍රිතාන්‍ය ජනයා සමඟ කිසිදු කලෙක කිසිම ආකාරයක හෝ මතභේදාත්මක තත්ත්වයක් ඇති කර ගත්තේ නැත. රාජකීය පවුල් පසුබිමකින් පැමිණි කෙනකු නිසා ඔහු එම සම්ප්‍රදායන් ගැන පෘථුල අවබෝධයකින් යුතුව කටයුතු කළ බවට සැකයක් නොවේ. ඇතැම් විට ඔහුට ද ගැටලු, පීඩාවන් ඇතිවන්නට ඇත. ඒ සම්බන්ධයෙන් කරුණු දක්වන කුමරුගේ ඥාතී සොයුරියකගේ සැමියා විටෙක සඳහන් කර තිබුණේ මෙවැන්නකි.

"... ඔවුන් (රාජකීයයන්) ඔහුට ඉතා රෞද්‍රයි. ඔවුන් ඔහුට ලොකුකම් පෙන්නුවා. ඔවුන් ඔහුව පිටස්තරයෙක් හැටියට සැලකුවා. ..."

පිලිප් කුමරු තම මිතුරකු වන ගයිලෙන් බ්‍රැන්ඩ්ත්ට වරක් පවසා තිබුණේ "... මට ඉවත්ව සිටින්න යැයි ඔවුන් පවසා තිබෙනවා. ..." යනුවෙනි.



එහෙත් දෙවැනි එලිසබෙත් රැජන පවසන්නේ පළමුව ද, දෙවැනුව ද, තෙවැනුව ද, අවසාන වශයෙන් ද ඔහුගේ රාජකාරිය මා අපහසුතාවයට පත් කිරීම නොවේය යන්නයි.

හැත්තෑ හතර වසරක විවාහ දිවිය තුළදී පිලිප් කුමරු, දෙවන එලිසබෙත් රැජන අසලින්ම නොසෙල් වී සිටියේ ය. තම බිරිය සමාජයේ කැපී පෙනෙන විට එය නොරුස්සන සැමියන් බහුල ලෝකයේ පිලිප් කුමරුගේ හැසිරීම පුදුම සහගතය.






පිලිප් කුමරුගේත් දෙවැනි එලිසබෙත් රැජනගේත් බාල පුතණුවන් වන එඩ්වර්ඩ් කුමරු වරක් සඳහන් කළේ පිලිප් කුමරු වටිනා පාඩම් බාල පරම්පරාවට දීමට හැමවිටම ක්‍රියා කරන බවයි.

"... මගේ පියා සරලයි. ඒ වගේම නිහතමානියි. ඔහු තමන් ගැන කතා කිරීම විශ්වාස නොකරයි. ... ඔහු ඕනෑම කෙනෙකුට දෙන හොඳම අවවාදය තමයි; අනෙක් සියල්ල ගැන කතා කළත් ඔබ ගැන කතා නොකරන්න. ඔබ ගැන කිසිවකු උනන්දු වෙන්නේ නැහැ යන්නයි. ..."

පිලිප් කුමරුගේ නිහඬ ගති පැවතුම් විලියම් කුමරු වරක් විස්තර කර තිබුණේ මේ අන්දමෙනි.


"... ඔහු (පිලිප් කුමරු) රැජනට දක්වන්නේ ඇදහිය නොහැකි සහයක්. ඔහුගේ ශක්තිමත් පසුබිම, පෞරුෂය ගැන සලකා බලන විට පැත්තකට වී හෝ පසුපසට වී හෝ රැජනට සහයෝගය දෙන්නේ කෙසේ දැයි මම නොදනිමි. ... එය අප සැමගේ දෑස් විවර කරවන්නක්. ..."





**මංජුලා විජයරත්න**

# අලසකම දියුණුවට දරුණුම බාධාවයි



**නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ ධර්මාචාර්ය, ශාස්ත්‍රපති, කොට්ටාවේ හේමවංස හිමි**

කම්මැළිකම එසේත් නැත්නම් අලසකම පුද්ගල ජීවිතය පරිහානියට පත් කරයි. කුඩා කල සිටම දරුවන්ට උදෑසන නැගිට තමන්ගේ වැඩ තනිවම කරන්නට මව්වරුන් අනුබල දෙන්නේ තම දරුවන් අලසකමින් තොර දරුවන් කිරීම උදෙසා ය. ඒ තරමටම අලසකමින් තොර ක්‍රියාශීලී, වීර්යයෙන් යුක්ත වීම පුද්ගලයකුගේ ජීවිතයට මහත් ආලෝකයකි. පරම්පරා උරුමයෙන් යම් පුද්ගලයකුට කොතරම් ධනස්කන්ධයක් හිමිව තිබුණ ද එම පුද්ගලයා, අලසකම නිසා නිකරුණේ සිටිමින් තිබෙන ධනය නාස්ති කර ගැනීම අනුවණකමකි. අලසකමින් මිදී ජීවිත සොඳුරු කර ගැනීම මගින් සෑම පුද්ගලයකුටම දෙලොවම සුගතිගාමී කර ගත හැකි ය. පහත දැක්වෙන්නේ "අලසකම" බුදු දහමෙහි විස්තර කර ඇති ආකාරය පිළිබඳ නුගේගොඩ, සාන්ත ජෝන් විද්‍යාලයේ ධර්මාචාර්ය, සාස්ත්‍රපති, කොට්ටාවේ හේමවංස හිමියන් සමඟ සිදු කළ සංවාද සටහනකි.

> **අලසකම ඇති තැන වීර්යයට ඉඩක් නැහැ. වතුර භාජනය බොර දියෙන් පිරී පවතිනවා නම් ඒ ජලයෙහි පැහැදිලි ජලයට ඉඩක් නැහැ. ඒ වාගේම සිතේ අලසකම තිබෙනවා නම් නිවන් අවබෝධයට ඉඩක් නැහැ. එවැනි පුද්ගලයන්ට දියුණුවකුත් නැහැ. එවැනි මිනිසුන් මනුෂයන් ලෙස ඉපදිලා තිරිසනුන් වගේ මියැදෙනවා.**



## සදහම් මග

**■ ස්වාමීන් වහන්ස, බුදුදහමට අනුව අලසකම යනු කුමක් ද?**

බුදුදහමට අනුව අලසකම කියන්නේ සිත සහ කය දෙකෙහි උදාසීන බව. බුදු දහම අනුව ථීනමිද්දය ලෙස අලසකම හඳුන්වනවා. අලසකම දියුණුවට, ආලෝකයට, නිවන් අවබෝධයට බාධාවක් වෙනවා. ඒ නිසා අලසකම නීවරණ ධර්මයක් වෙනවා. නිවන් අවබෝධය අපේ බුදු දහමේ ප්‍රධාන සංකල්පයක්. ගිහි පැවිදි දෙපාර්ශ්වයටම දියුණුව වැදගත් වෙනවා. අලසකම තිබීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයටම දියුණුවක්, ආලෝකයක් ලබා ගන්න බැහැ. අලසකම ජීවිතයේ සෑම කාර්යකටම බාධාවක් වෙනවා. ධර්මය තුළින් ථීනමිද්දය හෙවත් අලසකම පාසි සහිත ළිඳකට, විලකට උපමා කර දක්වනවා.

**■ අලසකම නිසා මිනිසුන් පිරිහෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ කෙසේද?**

බුදු රජාණන් වහන්සේ උත්සාහය, වීර්යය , කැප කිරීම වැදගත්ව අගය කළ ශාස්තෘවරයෙක්. ඒ නිසාම අපේ බෝසතාණන් වහන්සේ තමන්ගේ බෝසත් දිවිය නිමා කරලා සම්මා සම්බුද්ධත්වයට පත් වෙනවා. අපේ බුදු රජාණන් වහන්සේ තරම් උත්සාහය, විර්ය ගැන කථා කළ, ශ්‍රාවකයා ඒ සඳහා මෙහෙයවූ වෙනත් කිසිදු ශාස්තෘවරයෙක් නැති තරම්. බුදු රජාණන් වහ්සේගේ බෝසත් අවදියේදී "මම බුදු වෙලා අන් අය අවබෝධ කරවමි යන්න සිතට ගත්තා. එලෙස බුදු රජාණන් වහන්සේ තම බෝසත් අවධියේදී ඉලක්කයක් තබා ගෙන එය ළඟා කර ගෙන, අන් පුද්ගලයින්වත් ඒ ඉලක්කයට යොමු කරනවා " යන්න ට සිතා කටයුතු කළා.

අලසකම තිබුණොත්, පාසල් දරුවෝ පාසල තුළත්, තරුණ තරුණියන් සමාජය තුළත්, පාලකයින් ආයතන තුළත්, ආගමික වශයෙන් පූජ්‍ය පූජක පක්ෂය ඒ සංස්ථා තුළත් පිරිහෙනවා. බෝහෝ අය නිසරු දෙයට අලස වන්නේ නෑ. සරු දෙයට අලස වෙනවා. උදාහරණ විදිහට, මිනිසුන් අල්ලස් ගැනීම, අනුන්ට රිදවීම, අනුන්ගේ වැටුප් නැති කිරීම සිදු කරනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින කෙනෙක් විදිහට බොහෝ අය වැරදි ක්‍රියා කරන්න අලසකමක් දක්වන්නේ නැති බව මට අත්දැකීම් තියනවා. විශේෂයෙන් ම ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ ඉහළ නිලධාරීන්, අනුන් උදෙසා තමන්ට කළ හැකි දේවල් නොපිරිහෙළා ඉටු කරන්න සිතට ගන්න ඕන. ඒ වාගේ ම සෑම ක්ෂේත්‍රයකම පුදගලයින් තමන්ට කළ හැකි දේවල් අනුන් වෙනුවෙන් කරන්න ඕන. ඇතැම් පුද්ගලයින් තමන්ට කරන්න පුළුවන් දෙයක් වුණත් කරන්න කැමති නෑ. පොඩි තැනින් ඇවිල්ලා ඉහළ තනතුරුවලට ගියපු බොහෝ නිලධාරින්, නරගරබද දියුණුවෙන් සිටින පුද්ගලයින්ට තමන්ට කරන්න පුළුවන් උපකාරයක් කරන්න කැමති නෑ. බොහෝ පුද්ගලයින් තමන්ට දෙයක් ලැබෙන්නේ නැත්නම් ඒ වැඩේ කරන්නේ නැහැ. කරපු වැඩෙන් තමන්ට ප්‍රයෝජනයක් වෙනවා නම් විතරක් ඒ වැඩේ කරනවා. අලසකම, ක්‍රෝධ සහිත බව, අනුවණ බව පිරිහීමට හේතුවක් බව බුදුරජාණන් වහන්සේ පරාභව සූත්‍රයේ 06 වන ගාථාවෙන් පැහැදිලි කර පෙන්වනවා. අලසකම තිබුණොත් මුළු සමාජ සංස්ථාවම පිරිහෙනවා.

**■ උප්පත්ති වාසනාව තිබූ පමණින්, අලස පුද්ගලයකුට ජීවිතය සාර්ථක කර ගැනිමට පුළුවන් ද?**

උප්පත්ති වාසනාව තිබු පමණින් අලස පුද්ගලයකුට ජීවිතය සාර්ථක කර ගන්න බැහැ. පෙර කරන ලද පින් ඇතිව මේ භවය උපත බැලුවට (ගති සම්පත්තිය), ඒ ජීවිතය මෙහෙය වීමේදී උත්සාහය, වීර්යය, වාගේ ම ධනාත්මකව වෙනස් වෙන්න සිතට ගන්න ඕන. අපට ලැබෙනවා වාගේ ම අනුන්ටත් ලබා දෙන්න ඕන. අපි අපේ ජීවිත ආලෝකවත් කර ගන්නවා වාගේම අනුන්ගේ ජීවිතත් ආලෝකමත් කර ගන්න ඕන. මඩිගේ මහානායක හාමුදුරුවෝ කියනවා වගේ මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම කළ යුතු වෙනවා. අපි කුමන තරාතිරමේ හිටියත්, අලසකමින් තොරව අන් අයට උදව් කරන්න ඕන. අලසකම ඇති තැන වීර්යයට ඉඩක් නැහැ. වතුර භාජනය බොර දියෙන් පිරී පවතිනවා නම් ඒ ජලයෙහි පැහැදිලි ජලයට ඉඩක් නැහැ. ඒ වාගේම සිතේ අලසකම තිබෙනවා නම් නිවන් අවබෝධයට ඉඩක් නැහැ. එවැනි පුද්ගලයන්ට දියුණුවකුත් නැහැ. එවැනි මිනිසුන් මනුෂයන් ලෙස ඉපදිලා තිරිසනුන් වගේ මියදෙනවා. පින් ඇතිව මනුෂයකු ලෙස ඉපදෙන පුද්ගලයන්ගේ එලොව මෙලොව සාර්ථක කර ගන්න වීර්ය තියෙන්න ඕන. ඒ නිසා උප්පත්ති වාසනාව තිබූ පමණින් අලස පුද්ගලයකුට ජීවිතය සාර්ථක කර ගන්න බැහැ. මිනිසුන්ගේ ඇඟිලි කපා මාලයක් සකසමින් සිටි අංගුලිමාලි තමන්ගේ වීර්ය නිසා අවසානයේදී අංගුලිමාල හාමුදුරුවෝ වුණා. අංගුලිමාල පෙර අවස්ථාවේදී නොමග ගියා. වීර්ය නිසා පසුව සුමගට යොමු වුණා. ඒ වාගේ ජීවිතය සාර්ථක කර ගන්න වීර්ය අනිවාර්යයෙන්ම තියෙන්න ඕන.

**■ ඇතැම් පුද්ගලයින් තමන්ගේ දැඩි අලසකම නිසා ජීවිතය නිකරුණේ නාස්ති කර ගන්නවා. ඒ පිළිබඳව ඔබ වහන්සේගේ අදහස කුමක් ද?**

අලසකම පාසි සහිත ළිඳක්, වැවක්. ළිදේ පාසි, දිය සෙවෙල්, කුණු රොඩු තියනවා නම් අපිට ඒ ළිදෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙන්නේ, ඒ අපද්‍රව්‍ය ඉවත් කරාට පස්සේ. ළිදේ පාසි, දිය සෙවෙල්, කුණු රොඩු තිබේ නම් ඒ ළිදෙන් අපිට ප්‍රයෝජනයක් ගන්න බැහැ. ඒ වගේ තමයි අපේ මිනිස් සිත. අපේ සිතේ රාග, දේවේෂ, මෝහ, ආදී අපමණ කෙලෙස්, කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ද , උද්දච්ජ, කුක්කුච්ච ආදී විවිධ ක්ෂේත්‍ර ධර්මයන් ඉවත් කරලා සිත පිරිසිදු කර ගන්න පුළුවන්, අපේ තරුණ ප්‍රජාව, දරුවන්, වැඩිහිටියන් ආදී සෑම පාර්ශ්වයක්ම අලසකමින් මිදී , උත්සාහයෙන් යුක්තව කටයුතු කරන්න ඕන. නිරෝගී , නිවැරදි, දක්ෂ යන්නට බුදුරජාණන් වහන්සේ කුසල් යන්නට හඳුන්වනවා. තමන් ඉන්න ක්ෂේත්‍රයට අනුව , ජාති, ආගම් කුල භේදයකින් තොරව අලසකමින් මිදී තමන්ගේ ජීවිත සොදුරු කර ගන්න කටයුතු කරන්න ඕන. උත්සාහයෙන් තොරව කටයුතු කිරීමෙන් ජීවිතය නාස්ති වෙනවා.

**■ අලසකමින් මිදී ජීවිතය සොදුරු කර ගැනීමට ඔබ වහන්සේ සමාජයට ලබා දෙන උපදේශය කුමක් ද?**

අලසකම අපේ ජීවිතයට ආලෝකය ඇති කිරීමට ඉඩ අහුරන දෙයක්. පුණ්‍යවන්ත මනුෂ්‍ය භවයක් ලබපු සෑම පුද්ගලයෙකුම තමන්ගේ ජීවිතය සාර්ථක කර ගන්න ඕන. වයසින් බාල, තරුණ, සහ වැඩිහිටි යන සෑම මිනිස් කොට්ඨාසයක්ම තමන්ගේ අරමුණු යහපත්ව ඉෂ්ට කර ගැනීමට කටයුතු කරන්න ඕන. උත්සාහය, විර්යය, සිහි නුවණ, විමසා බලා කටයුතු කිරීම යන ගුණාංග තිබුණොත් මිනිසුන්ගේ යසස වැඩෙනවා. අලසකමින් මිදී මිනිස් ජීවිත සුන්දර කර ගන්න මිනිස් ආකල්ප වෙනස් කර ගන්න ඕන. බුදුරජාණන් වහන්සේ මනස සකස් කර ගන්න කිව්වේ මිනිස් ආකල්ප වෙනස් කරන්න. භාවනා සංකල්පය, කුසල් දහම් ප්‍රගුණ කිරීමේ මානසික අභ්‍යාස යනාදීය අප නිරන්තරයෙන් සිදු කළ යුතු වෙනවා.

**මදාරා මුදලිගේ**

## බොදු දිවියට ඔවදන්



පව් කළ තැනැත්තා ඒ නිසා තමන්ම කෙලෙසෙන්නේය. පව් නොකළ තැනැත්තා ඒ නිසා තමන් පිරිසුදු වන්නේය. පිරිසිදුකම ද අපිරිසුදුකම ද පවතින්නේ තම තමන් තුළය. එක් අයෙක් තවත් අයෙක් පිරිසිදු නොකරන්නේය.

පෙර වැරදි කළත් පසුව වැරදි නොකරන තැනැත්තා වලාකුළින් නිකුත් වූ සඳ මෙන් මේ ලෝකය බබුළුවයි. ඇත්ත නොකියන බොරු කියන පරලොව ගැන නොතකන්නා වූ තැනැත්තාට නොකළ හැකි පව්කමක් නැත.

බියෙන් තැතිගත් මිනිස්සු පර්වත ද ආරාම ද, වෘක්ෂ ද චෛත්‍යයන් ද බොහෝසෙයින් සරණකොටයත්, එහෙත් මේ කිසිවක් බිය රහිත නොවේ. උතුම් ද නොවේ. මේ කිසිවක් සරණකොට ගොස් සියලු දුකින් මිදීමට හැකි නොවේ.

රාගය හා සමාන ගින්නක් නැත. ද්වේෂය තරම් අපරාධයක් නැත. ස්කන්ධයන්ගේ පරිහරණය හා සමාන දුකක් වෙන නැත. නිවනට වඩා සැපයක් වෙන නැත. (ධම්මපදය) ප්‍රියයන් හා අප්‍රියයන් කිසිදා එක් නොවිය යුතුය. ප්‍රියයන් නොදැකීම ද දුකකි. අප්‍රියයන් දැකීම ද දුකකි. කෙනෙකුට නොයෙක් පිරිවර ඇතත් සිදුවන දෙය වැළැක්විය නොහැක. තාරකා පිරිවරාගත් පුන්සඳ රාහු අල්ලාගනු නොලැබේ ද බේබද්දන්ට දෙන අවවාදය දිය යට සිටින කෙනෙකු ගිනි හුලකින් පුලුස්සන්නාක් වැනි දෙයකි. ප්‍රසිද්ධ ගුණවත් කුලයක හෝ දුර්ජනයෙක් උපන්නොත් එම කුලය විනාශ වේ. ශ්‍රී කාන්තාව චන්ද්‍රයා අමා ආදී උසස් දේ උපන් සාගරයෙන් විෂ හටගෙන විනාශයට ගියා මෙනි.

හීන කුලයේ ජනයෝ මහත්මයන් ඇසුරෙන් ඉසුරින් ආඪ්‍ය වී ගරු කටයුතු තත්ත්වයට පැමිණේ. ඒ කෙසේද යත් මල් දමෙහි මල් සමඟ එක් වූ කෙසෙල් පට්ටය රජුන්ගේ හිස්මුදුනට පැමිණෙන්නාක් මෙනි.

සිනිදු රේණුවලින්, වර්ණවත් පෙතිවලින් යුක්ත නෙළුම් මලෙහි කටු පේළියකින් යුක්ත නටුවක් ඇත. එමෙන්ම මිනිසාට යහපත් ගුණ හා නුගුණ ද ඇත්තේය. එමෙන්ම නිර්දෝෂී වූ කෙනෙකු මෙලොවෙහි ඉපදීමක් නැත්තේය. දුර්ජනයන්ගේ ගතිය කෙසේද කිවහොත් සඳුන්, කපුරු කස්තුරි ගෙන පිණිදියෙන් අනා ජලය සමඟ මිශ්‍රකොට රන් කෙන්ඩියෙන් ඉසිමින් ලූනු වැවුව ද කිසිදා ලූනුවල දුගඳ ඉවත්වන්නේ නැතිවාක් මෙනි.

අප්‍රමාණවූ ගුණයෙන් යුතු උතුමෝ කෙතරම් වෙහෙස ලදුවත් දුෂ්ට සිත් ඇත්තාහු නොවෙති. දිශාන්තයෙහි පැතිරුණාවූ සුවඳ ඇති සඳුන් කඳ කපන කල්හි ද මඩින කල්හි ද එකාකාරයෙන් සුවඳ විහිදුවයි.

එක කුස උපන් සිය සොහොයුරා වුවත් තමනට හිතවත් නැත්නම් නෙළුම් පත වැටුණු ජලය දුරුකරන්නාක් මෙන් දුරු කළ යුතුය. තමාගේ සිරුරෙහි වාත, පිත්ත, සෙම මරණයට කුපිත වීම සිදු වේ. එහෙත් වනයෙහි වූ ඖෂධ සුවයට පැමිණීම පිණිස හිතවන්නේය.

වර්ෂාව හා සුළඟ සමාන වූ කල්හි කුඹුරු වතුපිටි සශ්‍රීක වන්නාක් මෙන් යෝග්‍ය වූ රජුගෙන් හා නුවණැති ඇමැතියන්ගෙන් ලෝක සත්වයන් රැකෙති. මහත්වූ ගින්නෙන් හා සුළඟින් වනාන්තරය දැවෙන්නාක් මෙන් දුශ්චරිත ඇති රජුගෙන් හා දුෂ්ට අමාත්‍යයන්ගෙන් හැම තැන විනාශ වේ.

**පී.ඒ. කපුරුබණ්ඩාරආරච්චි**

# සිත නිවන යෝධයාකන්ද ආරණ්‍ය සේනාසනය











වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යෝධයාකන්ද ආරණ්‍ය සේනාසනය පිහිටා ඇත.හලාවත - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ හලාවත සිට කුරුණෑගල දෙසට කිලෝමීටර් 23ක් ගිය තැන 'මැද වැව' හන්දිය හමු වේ. එතැන් සිට උතුරු දෙසට දිවෙන මාර්ගයේ කිලෝ මීටර් එකක් ගිය විට යෝධයා කන්ද ආරණ්‍ය සේනාසනය හමු වේ. පළමු වන ගජබා රජුගේ 'නීලයෝධයා' විසින් ඉදිකළ කන්ද 'යෝධයා කන්ද' බව ජනප්‍රවාදයේ සඳහන් වේ.වතුරවිල සංඝ පරම්පරාවටසහ වනවාස නිකායට අයත් මෙම ආරණ්‍ය සේනාසනය මල්වතු අස්ගිරි පාර්ශ්වයට ද හිමකම් කියයි. නිස්කලංක සහ මනරම් පරිසරයකින් හෙබි සේනාසන භූමිය අක්කර විසිපහක් පමණ පුරා විසිරී පවතින වන ලැහැබකි. වන සතුන්ගෙන් ගහනය යෝධයාකන්ද ආරණ්‍ය සේනාසනය තවුස්දම් වඩන ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාට වැඩ වාසය කිරීමට ඉතා යෝග්‍ය ස්ථානයක් ලෙස ප්‍රසිද්ධය. ගුණසේකර රත්නායක හිටපු ගම් සභාපතිතුමා කරුණාසේන වෛද්‍යාචාර්තුමා 'යෝධයාකන්ද' සෙනසුනක් බවට පත් කිරීමට කටයුතු කළ පුරෝගාමීන් අතර වෙති. සේනාසන භූමියේ පිහිටි බෝධීන් වහන්සේලා දෙනම ද ඉපැරණිය. සංඝාවාස ගොඩනැගිල්ල, චෛත්‍යය, විහාර මන්දිරය, ධර්ම ශාලාව, භාවනාකුටි 06ක් ඉදිකර ඇත. සේනාසනයේ දායක පවුල් අසූවකි. දිවයිනේ නන්දෙස පිරිස් වාර්ෂික දානවල දායකත්වය ලබා ගෙන ඇත. 1994 වර්ෂයේ සිට සේනාසනාධිපති ධූරය උසුලනු ලබන්නේ වම්බටුවාමුල්ලේ උජිතනන්ද ස්වාමීන් වහන්සේය. තවුස්දම් වඩන භික්ෂූන් වහන්සේ පස් නමක් සහ දහම් අධ්‍යාපනය ලබන සාමනේර භික්ෂූන් වහන්සේ සිව් නමක් වැඩ වාසය කරති.

භික්ෂූන් වහන්සේ සහ බොදුනු ජනතාවගේ ප්‍රයෝජනය උදෙසා වටිනා දහම් ග්‍රන්ථවලින් සමන්විත 'සදහම් පුස්තකාලය'නමින් පුස්තකාලයක් ද ස්ථාපිත කර ඇත. සේනාසනයේ උන්නතිය සහ චිරස්ථිතිය උදෙසා කැමති පින්වතුන්ට ඒ සඳහා දායක විය හැකි බව සේනාසනාධිපති උජිතනන්ද හිමියෝ පැවසූහ.



**ඒ.පී. ගුණරත්න - මාදම්පේ සමූහ**




# කෝටි හතක් ලාබ ලබන මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය


වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන


සාමාන්‍යාධිකාරී ඒ. කමල් ප්‍රියන්ත ඒකනායක


සමුපකාර කෝප් සිටි කළමනාකරු නිමල් රූපසිංහ


ග්‍රාමීය බැංකු කළමනාකාරතුමිය ඉමයන්ති ඉරේෂා


ඉන්ධන පිරවුම්හල් කළමනාකරු ප්‍රසංග ජයසේන


හාඩ්වෙයාර් අංශයේ කළමනාකරු සජිත් මානවඩු



සමුපකාර හාඩ්වෙයාර් අලෙවිසල


ප්‍රධාන කාර්යාලය


ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන නිලධාරිතුමා


ඇසුරුම් අංශය


ගනුදෙනු පරිගණකගත කරමින්


සමුපකාර ඉන්ධන හල


ග්‍රාමීය බැංකුවේ ප්‍රධාන කාර්යාලය


උප කෝප් සිටිය

සමුපකාර සමිති කියූ විට අපට විශාල සේවාවක් සැපයූ වෙළෙඳ ස්ථාන ලෙස හැඳින්විය හැකිය. සමුපකාර මැනේජර් මහත්මයා කියූ සැණින් හිමිවූයේ විශේෂ ගෞරවයකි. විවෘත ආර්ථිකය ලංකාවට හඳුන්වා දීමෙන් පසු සමුපකාර පද්ධතිය විනාශ වී ගිය බව අප කව්රුත් දන්නා කරුණකි. එහෙත් ගමේ අදටත් ඒ සමුපකාරය කෙරෙහි දැඩි විශ්වාසයෙන් ඉන්නා ජනතාවක් සිටිති. 'සැමට උපකාරය' යන අර්ථය දෙමින් සමුපකාරය දුප්පත් ජනතාවට අඩු මිලට ඉතා හොඳම තත්ත්වයේ සියලුම අත්‍යවශ්‍ය දේ ලබාදෙන ස්ථානයක් ලෙස සමුපකාරය හැඳින්විය හැකිය. ඒ සමුපකාරය රජයේ ආයතනයක් හේතුවෙන් ඒ ආයතනවල වැඩ කරනා අය එම සමිති දියුණු කිරීමට උත්සාහ ගෙන නොතිබීමෙන් සමුපකාරය එන්න එන්නම වසා තැබීමට සිදු වූ බව කව්රුත් දන්නා දෙයකි. සමුපකාරයක හදවත ලෙස සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය හැඳින්විය හැකිය. ඒ අයගේ දක්ෂතා මත සමුපකාරයේ දියුණුව තීරණය වේ. අපට හමු වූ එවැනි දියුණුවෙන් දියුණුවට යන සමුපකාරයක් ලෙස මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය හැඳින්විය හැකිය. මැදවච්චිය විවිධ සේවා සමුපකාරයෙන් මුළු රටේම සමුපකාර සමිතිවලට ලබා දෙන්නේ මනා ආදර්ශයකි. ඒ පිළිබඳ මේ සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී තුමා ඇතුළු නිලධාරීහු මෙසේ අදහස් දක්වා සිටිය.

**මැදවච්චිය සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී ඒකනායකගේ කමල් ප්‍රියන්ත ඒකනායක මහතා,**

"මම සේවය කරපු වසර 13ක කාලය තුළ සමුපකාර සමිතියට ශුද්ධ ලාභය ලෙස රුපියල් කෝටි 32ක් උපයා දී තිබෙනවා. 2020/2021 වසරේ මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතියේ ශුද්ධ ලාභය කෝටි හතකට වැඩියි. මේ ආයතනයේ සේවක පිරිස 170ක් සිටිනවා. මේ සියලු දෙනාම සමුපකාර එකම පවුලක අය. මේ සියලු දෙනාම වේලාව ගැන හිතන්නේ නෑ, කළ යුතු වැඩ කොටස තමන්ගේම ආයතනයක් ලෙස සිතා හැම විටම වැඩ ටික කරනවා. මේ ආයතනය අපේ කියන හැඟීමෙන් සියලු දෙනාම කටයුතු කරන නිසා අපි හැමදාම ලාභ ලබනවා. මේ සමුපකාර සමිතියේ සේවය කරනා සියලු දෙනාටම අලුත් අවුරුද්දට රුපියල් 10,000ක පාරිතෝෂික දීමනා, රුපියල් 15,000ක් වටිනා බඩු මල්ලක්, රුපියල් 10,000ක උත්සව අත්තිකාරමක් ලබා දෙනවා."

"මේ වසරේ සමුපකාර සමිතිය වසර 50 සමරනවා. ඒ නිමිත්තෙන් ක්‍රියාකාරී ප්‍රාදේශීය කාරකසභා නියෝජිතයන්ගේ තෝරා ගැනීම මත සුබසාධන වැඩ 50ක් සැලසුම් කර තිබෙනවා. එක් වැඩසටහනකට රුපියල් 10,000 බැගින් දී තිබෙනවා. රජය රේඛීය අමාත්‍යාංශය මැදිහත් වී අප සමිතියට රාජාංගණය යාය 9 සහල් සැකසුම් මධ්‍යස්ථානයක් හා වී ගබඩාවක් දී තිබෙනවා. එම වී ගබඩාව නවීකරණය කරලා මේ වන විට වී කිලෝ ලක්ෂ තුනක් මිල දී ගෙන තිබෙනවා. එම වී කෙටීමෙන් පසු රාජාංගණය ස්පෙෂල් නමින් රජයේ සහතික මිලට කැකුළු සහල් ලබා දෙමින් සිටිනවා. ඒ වගේම මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය උතුරු මැද පළාතේ අත්‍යාවශ්‍ය සේවා සපයනා මෙන්ම බෙදාහරිනා කටයුතු සිදු කරනවා. ඒ වෙනුවෙන් අප ආයතනය මාසිකව රුපියල් කෝටි දෙකක පිරිවැටුමක් සිදු කරනවා. ඒ වගේම අනුරාධපුර නගරයේ තිබූ පාඩු ලැබූ ආයතනයක් ලබා ගැනීමෙන් පසු සමුපකාර කෝප් සිටි අනරාධපුර නව බස්නැවතුම ආසන්නයේ පසුගියදා (06) විවෘත කළා. රජයේ පාලන මිල යටතේ සියලු භාණ්ඩ දීමට කටයුතු කර තිබෙනවා."

"අප සමිතිය අලුත් අවුරුදු උත්සවය සඳහා පාරිභෝගිකයන්ට ඉතා උසස් තත්ත්වයේ පාරිභෝගික භාණ්ඩ සාධාරණ මිල ගණන් යටතේ ලබා දීමට කටයුතු යොදා තිබෙනවා. උත්සව සමයේ කිසිදු පාරිභෝගික භාණ්ඩයක් හිඟයකින් තොරව ලබා දීමට කටයුතු කර තිබෙනවා. සමෘද්ධි පොළ පවතින පූනෑව සහ ඇතාකඩ යන ප්‍රදේශවල අපගේ අලෙවි කුටි ඉදි කර අඩු මුදලට භාණ්ඩ ලබා දීමට කටයුතු කර තිබෙනවා."

"මැදවච්චිය ප්‍රදේශයේ සති පොළ භූමියේ ඇති ආර්ථික මධ්‍යස්ථානය මේ වන විට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන තිබෙනවා. ඒ භූමිය අප වෙත පවරා දෙන්නේ නම් අපට වී ගබඩා මධ්‍යස්ථානයක් වගේම ඉතා හොඳ අලෙවිසලක් මඟින් විශාල ලාභ උපයන ආයතනයක් බවට ඉතා කෙටි කලකින් පත් කළ හැකියි රජයේ අවධානය ද මේ සඳහා යොමු කරනවානම්."

"මැදවච්චිය ප්‍රදේශයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන්ට උසස් ගුණාත්මක හා ඵලදායීතාවයෙන් යුත් විවිධ වූ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බැවින් සමුපකාර සමිතියේ දැක්මට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමුපකාර ව්‍යාපාරය බවට පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපතිතුමා (ඩබ්ලිව්. එම්. සිරිතිස්ස වීරසේඛර මහතා), සමුපකාර දෙපාර්තමේන්තුවේ සියලුම දෙනාගෙන් ලැබෙනා සහයෝගය අගය කරන්න ඕනෑ. ඒ වගේම මේ ආයතනය දියුණු කිරීමට සේවක පිරිසගෙන් ලැබෙනා අතිමහත් සහයෝගයත් අගය කරන්නම ඕනෑ. පසුගිය මාර්තු මාසයේ අප ආයතනයේ ශුද්ධ ලාභය රුපියල් එක්කෝටි හාරලක්ෂයයි. (පඩි නඩි ඇතුළු සියලු වියදම්වලින් පසු) එම මාසයේ ආදායම රුපියල් කෝටි පහයි."

**මැදවච්චිය විවිධසේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු කළමනාකාරිණී ඉමන්ති ඉරේෂා මහත්මිය,**

"අප ග්‍රාමීය බැංකුව අලුත් අවුරුදු ගනුදෙනු අවුරුදු නැකතට පසුගිය වසරේ රුපියල් කෝටි දෙකහමාරකට වැඩිය ගනුදෙනු කළා. මම අවුරුදු 12ක් මේ ආයතනයේ සේවය කළා. සේවකයන් හත්දෙනෙක් සිටිනවා. අප සමිතිය සතු ග්‍රාමීය බැංකු ශාඛා 12ක් තුළ සාමාජිකයන් 15,000ක් සිටිනවා. අප සමිතියේ දියුණුව තියෙන්නේ සාමාන්‍යාධිකාරීතුමාගේ අති දක්ෂ වැඩපිළිවෙළ නිසයි. හරිම දක්ෂ ආයතන ප්‍රධානියෙක්. එය මේ මුළු උතුරු මැදම ප්‍රසිද්ධ කරුණක්."

"අප බැංකු පද්ධතිය තුළ ණය යෝජනා රාශියක් තිබෙනවා. ණය දිවි, ලීසිං, නිවාස ණය, වගා ණය, ව්‍යාපාරික ණය වාගේ විශාල ණය වැඩසටහන් රාශියක් පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙනවා. අලුත් අවුරුදු නැකතට ගනුදෙනු කරන්න විශාල පිරිසක් ගනුදෙනුකරුවන් අපට පැමිණෙනවා. බොල් ණය ප්‍රතිශතය 1.5යි. දැනට මේ ප්‍රධාන බැංකුවෙන් පමණක් රුපියල් කෝටි 20ක ණය නිකුත් කර තිබෙනවා. අපි කරන සේවාව ඉතාමත්ම සුහදශීලීව කරනවා. ඒ නිසා ජනතාව අප සමඟ එක් වී සිටිනවා. ඒ සාමාජිකයන් ලබා දීපු ප්‍රතිරූපය අපට හරිම වටිනවා. ඒ වගේම සේවයන්ටත් ගෞරවයක්. අනෙක් මූල්‍ය ආයතන සමඟ අපි ෆයිට් කරනවා. පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වාම අප ගනුදෙනුකරුවන් වෙනුවෙන් මේ ආයතනය විවෘතව තබනා අතර යම් අයෙක් එම වේලාවෙන් පසු පැමිණියත් අප ඒ ගනුදෙනුකරු හරවා යවන්නේ නෑ. අපි වේලාව බල බලා ඉන්නේ නෑ ගෙදර යන්න. අවුරුදු දා සේවය කරන සේවයන්ට අප ආයතනය රුපියල් 1500ක දීමනාවක් ලබා දෙනවා. මාසිකව අප බැංකුව රුපියල් කෝටි හතහමාරක ගනුදෙනු කරනවා. අවුරුදු නැකතට මෙවර ගනුදෙනු කරන සියලුම දෙනාට අප පලතුරු පැළය බැගින් බෙදා දෙනවා. අපට ටාගට් එකක් ජී. එම්. මහතා ලබා දී තිබෙනවා. ඒ ටාගට්වලට අප යනවා. ඒකයි මේ දියුණුවේ රහස."

**මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතියේ ඉන්ධන පිරවුම්හල් කළමනාකරු ප්‍රසංග ජයසේන මහතා,**

"මම මේ ආයතනයේ වසර අටක් සේවය කළා. සාමාන්‍යයෙන් දිනකට ඉන්ධන රුපියල් ලක්ෂ තිහක අලෙවි කරනවා. පෙට්රල්, ඩීසල්, සුපර් පෙට්රල්, සුපර් ඩීසල්, ලංකා ඔයිල් අලෙවි කරන අතර දිවා රාත්‍රී පැය විසිහතර පුරාම අප ආයතනය විවෘතයි. පසුගිය මාර්තු මාසයේ පමණක් රුපියල් දසකෝටි හතළිස් ලක්ෂයක ඉන්ධන අලෙවි කළා. මා යටතේ සේවකයන් 12ක් සිටිනවා. අපට පහසුකම් සියල්ලම ජී. එම්. මහතා ලබා දී තිබෙනවා. අපට දිරි දීමනා ලබා දෙනවා. සේවකයන් ඇගැයීමට ලක් කරනවා. අපගේ සේවාව ඉතා ඉහළ නිසා රාජ්‍ය ආයතන පවා අප සමඟ ගනුදෙනු කරනවා. පාරිභෝගිකයාට හොඳ සේවයක් අප ලබා දෙනවා. අප සමිතියේ ජී. එම්. මහතාගෙන් ලැබෙන නිදහස පිළිබඳව අපි අගය කරන්න ඕනෑ. ලක්ෂ 25ක ජෙනරේටරයක් පවා අපට ලබා දී තිබෙනවා. මේ මා සේවය කළ කාලය පුරාවටම කිසිම පැමිණිල්ලක් ලැබී නෑ. අප ආයතනය අපගේ සේවාව පිළිබඳව ඇගැයීම් කරනවා පාරිභෝගිකයන්. එය අපට ශක්තියක්. පසුගිය මාසයේ වැටුප් ආදි පරිපාලන සියලු වියදම් ගියාට පසු ශුද්ධලාභය ලෙස රුපියල් විසිඑක්ලක්ෂ හැටතුන්දහස් අටසිය එකක් වශයෙන් ලබා දී තිබෙනවා. හරිම සතුටුයි."

**මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතියේ මැදවච්චිය කෝප් සිටි කළමනාකරු නිමල් රූපසිංහ මහතා,**

"මම අවුරුදු 31ක් මේ ආයතනයේ සේවය කරනවා. අපි හරිම තෘප්තිමත්ව සේවාව කරනවා. මෙහි 17 දෙනෙක් වැඩ කරනවා. සියලු ගනුදෙනු පරිගණකගත කරනවා. අප සමිතියේ සියලු අංශවල දත්ත ජී. එම්. මහතාට තත්පර කිහිපයකදී දැනගත හැකි පරිදි මේ සමුපකාර ජාලය පරිගණකගත කර තිබෙනවා. එක් දිනක ආදායම රුපියල් ලක්ෂ අටක් පමණ වෙනවා. රුපියල් කොටි දෙකක පමණ වෙළෙඳාමක් මාසිකව සිදු කරනවා. අප ආයතනයෙන් රජයේ මිල ගණන්වලට ඕනෑම පාරිභෝගික භාණ්ඩයක් මිල දී ගත හැකියි. ඉහළ පරිපාලන දක්ෂතා නිසා අප සේවය කරන්නේ හරිම සතුටින්."

**මැදවච්චිය සමුපකාර සමිතියේ හාඩ්වෙයාර් අංශයේ කළමනාකරු සජිත් මානවඩු මහතා,**

"දිනකට රුපියල් ලක්ෂ දෙකක පමණ වෙළෙඳාමක් අප සිදු කරනවා. මාර්තු මාසයේ පමණක් රුපියල් ලක්ෂ විසිපහක වෙළෙඳාමක් සිදු කළා. ඉදිරියේදී අප ආයතනය කම්බි වර්ගද අලෙවි කිරීමට සූදානම්. සියලුම පේන්ට් වර්ග ඉතා අඩුම මිලට මෙහිදී මිල දී ගත හැකියි. ඉතාම ඉහළ ප්‍රමිතියක් ඇති භාණ්ඩ තමයි අපි අලෙවි කරන්නේ. මේ මැදවච්චිය නගරයේ ඉතාම අඩු මුදලකට හාඩ්වෙයාර් බඩු අලෙවි කරන්නේ අපි. මේ භාණ්ඩ නිෂ්පාදන ආයතනයෙන් ලබා ගන්නා විට ලැබෙන කොමිස් මුදල පවා අප ආයතනයටම බැර කරන ඉහළ පරිපාලනය නිසා අපට පාරිභෝගිකයාට ඉතා අඩු මිලට භාණ්ඩ ලබා දිය හැකියි. ඒකයි මේ ලාභ වැඩියෙන් ලබන්නේ. විශ්වාසය නිසා රාජ්‍ය ආයතන සියල්ලටම අපෙන් තමයි භාණ්ඩ ලබා ගන්නේ. ගෑස් අලෙවියත් අප සිදු කරනවා. ඉහළ පරිපාලනයේ ඇති ඉතා දක්ෂ පාලනය සමඟ සේවකයන්ට ලබාදෙන දිරි දිමනා නිසා මේ ආයතනවල කිසිම දිනක හොරකම් දූෂණ වංචා සිදු වන්නේ නෑ. සෑම කෙනෙක්ම තමන්ගේම ආයතනයක් ලෙස සලකා පැය අටේ සේවාව කියලා හිතන්නේ නැතිව වැඩ කරනවා. ඒ කැප කිරීම නිසා ආයතනය දිනෙන් දිනම දියුණු වෙනවා. ලබන වර්ෂයේ සිට සේවක වැටුප රුපියල් 10,000කින් - 15,000කින් වැඩි කිරීමට තීරණය කර ඇති බව අපට ආරංචියි. එයත් සතුටට කරුණක්."

**වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා මේ සමිතිය පිළිබඳව මෙසේ පවසා සිටියේය.**

"මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය මුළු රටටම ආදර්ශයක්. වංචාව දූෂණය හොරකම නැතිව යම් ආයතනයක් වැඩ කටයුතු කරනවානම් අනිවාර්යයෙන්ම ලාභ ලබනවා. රටේ සෑම ආයතනයකටම ලොකු ආදර්ශයක් දෙමින් මේ සමිතියේ පරිපාලන කටයුතු කරන නිලධාරීන් අගය කරන්න ඕනෑ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෞභාග්‍යා දැක්ම යටතේ බලාපොරොත්තු වන්නේද මේ වගේ වැඩ කරන නිලධාරීන්. මේ සමුපකාර ආයතනය පසුගිය කන්නයේ වී මිල දී ගැනීම් සිදු කර තිබෙනවා. දැනට රාජාංගණ ස්පෙෂල් නමින් මේ ආයතනයේ නිෂ්පාදිත සහල් රජයේ මිලට ජනතාවට ලබා දීම සිදු වනවා. සහල් මාෆියාව ඉවත් කිරීමට මේ අය ගෙන ඇති වැඩපිළිවෙළ හරිම වටිනවා. මැදවච්චිය සමුපකාරය වගේ රට පුරාම සමුපකාර සමිති වැඩ කටයුතු කරනවානම් ලංකාවේ සියලුම සමුපකාර සමිතිවලට ලාභ ලබන්න පුළුවන්. රජය වෙනුවෙන් වෙළෙඳ අමාත්‍යවරයා විදියට මේ කැප කිරීම් කරනා සියලුම සේවක, සේවිකා සහ පාලන අධිකාරියේ සියලු දෙනාටම ස්තූති කරනවා. හොඳට ආයතනයක් දියුණු කරනා විට පාරිභෝගිකයාගේ මෙන්ම රටේ මුළු ජනතාවගේම ගෞරවයට පාත්‍ර වනවා."

**චිත්‍රාරත්න කළුආරච්චි**
හිදෝගම සමූහ




# ශ්‍රී ලාංකේය තේ නාමයට සවියක් වූ වීරාව වත්ත


ප්‍රදේශයේ විහාරස්ථානයකට ඉදිකර දී තිබෙන බුදු මැදුර


කළමනාකාර අධ්‍යක්ෂ රොහාන් සොයිසා


වතු අධිකාරී තුෂාර විමලසූරිය

යටත්විජිත සමයේදී මෙරට වැවිලි භෝග ව්‍යාප්ත කිරීමට අත්හදා බලනා අවධියේදී ඒ සෑම භෝගයක්ම මධ්‍යම කඳුකර බිමේ වගා කිරීමට ඉංග්‍රීසි ජාතිකයන් උත්සුක වී තිබේ. පස, ජලය හා පරිසරයේ ඇති ගුණාත්මකභාවය හේතුවෙන් ඔවුන් එසේ කර ඇති අතර ඒ අනුව ඔවුන්ගේ මුල්ම කෝපි වගාව ගම්පොළත් තේ වගාව ඊට නුදුරින් ඇති ගලහ ලූල්කඳුර ප්‍රදේශයේත් අරඹා ඇත. මෙයින් තේ වගාව රටේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත වෙමින් මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් ලැබී ඇති අතර කඳුකරය පුරා ශක්තිමත් තේ වගාවක්ද ස්ථාපිත වී තිබේ.

මේ ආකාරයට තේ වගාව ඉදිරියට පැමිණියත් රජය සතු එම තේ අයිතිය 1992 වසරේදී පෞද්ගලීකරණය කරන ලදි.

ඒ සමගම බොහෝ තේ වතු නිසි නඩත්තුවක් නැතිව කඩා වැටී ඇති අතර ඉදිරියට ගමන් කර ඇත්තේ වතු සමාගම් කිහිපයක් පමණි. මේ සමග කුඩා තේ වතු ක්ෂේත්‍රය ආරම්භ වෙමින් එහි අද්විතීය වෙනසක ආරම්භය සනිටුහන් කිරීමට මධ්‍යම කඳුකරයේ මහනුවර පිහිටි වීරාව වත්ත සමත්ව තිබේ.

මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ උඩහේන්තැන්න ග්‍රාමසේවා වසමේ සුන්දර හරිත වර්ණ පරිසරයක පිහිටි වීරාව වත්ත එහි කළමනාකරණය හේතුවෙන්ම මෙසේ අද්විතීය ස්ථානයකට පැමිණ ඇත.

වර්ෂ 1999දී සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති මෙය විලකොළදෙණිය පුද්ගලික වතු සමාගම යටතේ පවතිනා අතර මෙහි වත්මන් කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස රොහාන් විමල් සොයිසා මහතා කටයුතු කරයි. ඔහු හේලිස් සමූහ ව්‍යාපාරයට අනුබද්ධිත ආයතනයක් වන සීමාසහිත ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් සමාගමේ ආරම්භක සාමාජිකයෙකි. වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව මනා දැනුමකින් පිරපුන් සොයිසා මහතා එම දැනුම භාවිත කරමින් මේ වතුයාය සඳහා සුදුසුම අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරමින් වීරාව වත්ත සඳහා ද විශිෂ්ට වතු අධිකාරිවරයකු පත්කර තිබේ.

වීරාව වත්තේ දැක්ම වන කුඩා තේ වතු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් ශ්‍රී ලාංකේය තේ නාමය ඔසවා තැබීම හා එහි මෙහෙවර වන තේ ක්ෂේත්‍රයේ නිවැරදි විද්‍යාත්මක ක්‍රම හා යහපත් වූ කෘෂිකාර්මික චර්යාවන් මඟින් සැලසුම් ක්‍රියාත්මක කරමින් අභියෝග ජය ගනිමින් උසස් තත්ත්වයේ අනර්ඝතම තේ අස්වැන්නක් ලබාදී රටේ ආර්ථිකයට ශක්තියක් වීම යන කාර්ය ඉෂ්ටසිද්ධ කිරීම සඳහා වතු අධිකාරී වන ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. එම් තුෂාර විමලසූරිය මහතා කටයුතු කර තිබීමම සොයිසා මහතාගේ තීරණයේ නිවැරදි බව පසක් කර අවසන්ය.

තුෂාර විමලසූරිය මහතාගේ පැමිණීම වීරාව වත්තේ අභිවෘද්ධියට හැරවුම් ලක්ෂ්‍යයක් වී තිබේ. ඔහුගේ ඇති උද්‍යාන අලංකරණය පිළිබඳ දැනුමද මුසු කරමින් අක්කර 42කින් යුත් මේ වත්ත දර්ශනීය මනස්කාන්ත තැනකට ගෙනැවිත් ඇත්තේ දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණයද දිනා ගනිමිනි.

වත්තේ ඇති කුඩා ජල පහරවල් එක්රැස් කර විද්‍යාත්මක ක්‍රමවේදයකට තේ දල්ලට නිරන්තරයෙන් ජල බිංදු එක්කර ඇත්තේ ඕනෑම කාලගුණයකට තේ ගස ඔරොත්තු දෙන අයුරිනි.

රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය හා මෙරට පාරම්පරික කෘෂි උපක්‍රම භාවිත කරමින් පරිසරයද රකින් ක්‍රියාවලිය හේතුවෙන් මේ තේ යාය නිරන්තරයෙන් දිස්වන්නේ නිල්ල පිරුණු මිටියාවතක් ලෙසිනි. මෙලෙස පරිසරය රැකීම මෙන්ම ආයතනයේ සේවකයන් රැකීමද කළමනාකාරීත්වයේ දක්ෂතාව පෙන්වන්නකි. සියලු සේවකයන්ට දිවා ආහාරය නොමිලේ දීමත් සෑම වසරකම සේවකයන්ගේ හා ප්‍රදේශවාසීන්ගේ දරුවන්ට අවශ්‍ය පාසල් උපකරණ කට්ටල නොමිලේ බෙදා දීම සියලු වතු සේවකයන්ට රුපියල් 1000ක දීමනාව දීම ආදි විවිධ සේවා හා කම්කරු සුබසාධන මෙනම හාම්පුතුන්ගේ වගකීම් ඉටු කිරීමද මෙහි සිදුවන සුවිශේෂී කරුණුය.

ප්‍රදේශයේ තේ වතු යායවල් අතරින් වීරාව වත්ත මෙලෙස විශේෂ ගුණ පෙන්වීම මේ ආයතනයට විවිධ තර්ජන එල්ලවීමට ද හේතු වී තිබේ. යම්කිසි පිරිසක් විසින් සැලසුම්සහගතව විවිධ අවලාද එල්ල කරමින් බාධා එල්ල කිරීම පසුගිය කාලයේ ද දක්නට ලැබී ඇත. මොවුන්ගේ අරමුණ වී ඇත්තේ වත්තේ වත්මන් පාලකයන් ඉවත්කොට ඉඩම් අල්ලා ගැනීමයි. නමුත් සාර්ථක වතු පාලකයන් වන කාර්ය මණ්ඩලය එම අභියෝගවලට නොසැලී වඩ වඩාත් ධෛර්මත්ව මුහුණ දෙමින් සිටී.

මේ වත්ත තුළින් ප්‍රදේශය තුළ සමාජ සත්කාරක වැඩසටහන් රැසක් දියත්කර තිබේ. ඒ අනුව ප්‍රදේශයේ ඇති විහාරස්ථාන ඇතුළු පූජනීය ස්ථානවලට උපකාර කිරීම, පළාතේ පවතිනා සියලුම රාජ්‍ය ආයතනවල වාර්ෂික උත්සයවලට අනුග්‍රහය දැක්වීම, දුගී දුප්පත් ගම් වැසියන්ට වියළි ආහාර බෙදා දීම, ප්‍රදේශයේ ඇති වැඩිහිටි නිවාස සඳහා ආහාර සපයා දීම, ගම්වාසීන්ට රුපියල් මිලියන 1.5ක් වැය කර මාර්ගයක් ඉදි කර දීම, සෑම වසරකම සේවකයන් හා ගම්වාසීන් වන්දනා චාරිකා රැගෙන යෑම, අවමංගල්‍ය අවස්ථාවලදී අනුග්‍රහය දැක්වීම ආදිය ප්‍රමුඛ වේ.

කුඩා තේ වතු ක්ෂේත්‍රයේ අද්විතීය වෙනසක හැරවුම් ලක්ෂ්‍යය වන සුන්දර වීරාව වත්ත රැක ගැනීම මෙරට තේ ආර්ථිකයට ශක්තියක් වනු නොඅනුමානය.


ප්‍රදේශයේ දුවාදරුවන්ට පාසල් උපකරණ බෙදාදෙන කළමනාකරණ අධ්‍යක්ෂවරයා


ගම්වාසීන්ට වියළි ආහාර ලබා දෙමින්


වතු පාලකවරුන්


වත්තේ පැරණිම සේවකයන් දෙදෙනා


වතු සේවකයන්ට නොමිලේ ආහාර


මාර්ගය ඉදිකිරීමේ අවස්ථාවට පැමිණි ගම්වාසීන්


වන්දනා ගමනකට සහභාගි වූවන්


වතු සේවකයන්

සුරංග දිල්හාන් - ගම්පොළ සමූහ

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# කෝටි හතරක මුදල් වංචාවක් කළ හිනා සක්විතිගේ ඇප ඉල්ලීම ඉවතට

මුදල් වංචා කිරීමේ චෝදනා රැසක් ලැබ සිටි රජරට හිනා සක්විති යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන සැකකරු ඕනෑම ඇප කොන්දෙසියක් මත මුදාහරින ලෙස අධිකරණයෙන් තෙවන වතාවටත් කළ ඉල්ලීම ඉවත දමමින් අප්‍රේල් මස (20) දක්වා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කරනා ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු නාලක ජයසූරිය මහතා (07) නියෝග කළේය.

මෙසේ රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණේ අංක දෙක යසපාල හේරත් මාවත සාලියවත්ත පුල්ලෙයාර් හංදිය අනුරාධපුර ලිපිනයේ පදිංචි කවිසේකර රූපසිංහ (රජරට හිනා සක්විති) නමැත්තායි.

යටියන්තොට පදිංචි කාන්තාවකට රුපියල් ලක්ෂ 50කට අධික වටිනාකමින් යුතු සුඛෝපභෝගි මෝටර් රථයක් ජපානයෙන් ආනයන කර දෙන බව පවසමින් රුපියල් ලක්ෂ 50ක මුදලක් ලබාගෙන මෝටර් රථය හෝ මුදල් නැවත ලබානොදීම හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට ඉදිරිපත්වී තිබූ පැමිණිල්ලකට අනුව සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබෙන අතර පුද්ගලයන් දස දෙනෙකුට අධික පිරිසක් රවටා රුපියල් කෝටි ගණනක මුදල් වංචාකර තිබෙන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව අනාවරණය කරගෙන තිබේ. සැකකරු අනුරාධපුර, කැකිරාව, මැදවච්චිය, මාතලේ, මහනුවර, මාවනැල්ල, යන ප්‍රදේශ රැසක පදිංචි ස්වාමින්වහන්සේ, වෛද්‍යවරුන් ගුරුවරුන්, කෝටිපති ව්‍යාපාරිකයන් ඇතුළු පුද්ගලයන් රවටමින් ජපන් මෝටර් රථ සහ ජපානයේ රැකියා ලබාදෙන බව පවසා රුපියල් කෝටි හතරකට ආසන්න මුදලක් වංචාකර තිබෙන අතර ඒ සම්බන්ධයෙන් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය ඇතුළු අධිකරණ කිහිපයක නඩු විභාග වෙමින් පවතී.

මුදල් වංචාකර සුඛෝපභෝගි දිවියක් ගතකර ඇති සැකකරු ආරක්ෂක අමාත්‍යංශයේ මාධ්‍ය ලේකම්වරයකු බව විවිධ පුද්ගලයන්ට පවසා තිබු අතර ප්‍රභූන් සමඟ ලබාගත් ඡායාරූප රැසක් සමාජ මාධ්‍ය ඔස්සේ පලකරමින් සිය වංචනික ක්‍රියාවන් සිදුකර තිබුණි. සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ පැමිණිල්ල වෙනුවෙන් කරුණු දැක්වූ ජ්‍යෙෂ්ඨ නීතිඥ කාලිංග රවින්ද්‍ර මහතා කියා සිටියේ සැකකරු මුදල් වංචාවන් රැසක් සිදුකර තිබෙන බවත් ඒ සම්බන්ධයෙන් අධිකරණවල නඩු විභාග වෙමින් පවතින බවයි.මුදල් ලබාගැනිමෙන් අනතුරුව එම මුදල් පියවීමට මුදල් නොමැති වසා දැමූ ගිණුමකින් චෙක්පත් නිකුත් කර තිබෙන බවත් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව තවදුරටත් පරීක්ෂණ සිදුකරන බවත් නීතිඥවරයා අධිකරණයට සැලකළේය. ලබාගත් මුදල් අධිකරණයේදි කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වෙමින් තවදුරටත් විවිධ පුද්ගලයන් රවටමින් මුදල් වංචාකරන බව නීතිඥවරයා අධිකරණයට දන්වා සිටියේය.සැකකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මදාරා විජේසිංහ මහත්මිය සැකකරු මාසයක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටින බැවින් ඔහුව ඕනෑම ඇප කොන්දේසියක් මත මුදාහරින ලෙස අධිකරණයෙන් අයැද සිටියාය.පැමිණිල්ලට එරෙහිව ඉදිරිපත් කරන චෝදනා බොහොමයක් තරයේම ප්‍රතික්ෂේප කරන බවත් නීතිඥවරිය අධිකරණයට දැන්වූවේය.

මොහු විසින් මුදල් වංචාවන් රැසක් සිදුකර ඇතත් නීතිය ක්‍රියාත්මක වීම නිසි අන්දමින් සිදුනොවන බව පවසමින් ව්‍යාපාරිකයන් ඇතුළු පිරිසක් ආරක්ෂක ලේකම්වරයාට හා පොලිස්පතිවරයාට පෙබරවාරි මස (01) පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි.මෙම සිද්ධිය මාධ්‍ය මගින් අනාවරණය කිරීමත් සමඟ උතුරු මැද පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබෙන අතර මුදල් වංචාවට හසුව සිටින සියලුම පුද්ගලයන්ට ඒ පිළිබඳ ප්‍රකාශ ලබාදීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයා අවස්ථාව සලසා තිබේ.

කේ. විජේසිරි නිශ්ශංක කරල්ලියද්ද සමූහ



# හුළු සහ මහවැලි ගංගාවල ජල මට්ටම පහළ බැහැලා

මෙම දිනවල පවතින වියළි කාලගුණයත් සමගම වික්ටෝරියා ජලාශයට ජලය ලැබෙන හුළුගගේ ගල් මල් ඔයේ හා මහවැලි ගඟේ ජල මට්ටම ඉතා ශීඝ්‍රයෙන් පහත වැටී තිබේ. මෙම ජලාශයට ජලය ලැබෙන ප්‍රධාන පෙලේ අතු ගංගාවක් වන ගල්මල් ඔයේ ජල මට්ටමද ඉතා ශීඝ්‍රයෙන් පහත වැටී තිබේ.

මෙම දිනවල පවතින වියළි කාලගුණයත් සමගම හුළුගගේ හා ගල් මල් ඔයේ ගල්පර ද මතුවීමට පටන් ගෙන ඇත. පවතින වියළි කාලගුණයත් සමගම ප්‍රදේශයට ජලය ලැබෙන ජල මුලාශ්‍රවල ජලය අඩු වීමෙන් ජනතාවට ලබා දෙන ජලයද මෙම දිනවල සීමාකර ඇත.මෙම වියළි කාලගුණය නිසා ප්‍රදේශයේ ළිං පිහිලි සිඳී වියළී යැමටත් පටන් ගෙන තිබෙන බව ජනතාව පවසති

සනත් ගමගේ - ලුණම සමූහ

# හුංගම - කිවුල ගණිකා මඩමක් වටලා කතුන් තිදෙනෙක් අත්අඩංගුවට

සම්භාහනය කිරීමේ මුවාවෙන් ගණිකා නිවාසයක් පවත්වාගෙන යනු ලැබූ හුංගම පොලිස් වසමේ කිවුල ප්‍රදේශයේ මධ්‍යස්ථානයක් වටලා එහි සිටි කාන්තාවන් තිදෙනෙක් හා කළමනාකරු අත්අඩංගුවට ගත් බව හුංගම පොලීසිය කියයි. විහාරස්ථානයක් ආසන්නයේ පවත්වාගෙන ගිය මෙම ගණිකා මඩම සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහ ජනතාවගෙන් ලද පැමිණිලි මත අගුණකොලපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයෙන් සෝදිසි වරෙන්තුවක් ලබාගෙන පොලිස් උපාය දූතයකු යොදවා මේ සම්බාහන මධ්‍යස්ථානය වැටලූ බව පොලීසිය පවසයි.

තිස්සමහාරාමය, අම්තිරිගල, හා දෙයියන්දර ප්‍රදේශවල පදිංචි අවුරුදු 18,30 හා 36 යන වයස්වල පසුවන කාන්තාවන් තිදෙනෙක් මෙම ගණිකා මධ්‍යස්ථානයේ සිටිය දී අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව පොලීසිය කියයි. මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලැබූ එහි කළමනාකරු ද පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. ඔහුද දෙයියන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බවද පොලීසිය කියයි. සැකකාරියන් තිදෙනා සහ සැකකාර කළමනාකරු අගුණකොලපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

හුංගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ක්‍රිෂාන්ත ජයසිංහ මහතාගේ උපදෙස් මත දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක කේ.පී.ජී.ජී. සමීර, පොලිස් සැරයන් 17465 රසික, පොලිස් කොස්තාපල් වරුන් වන 72896 සුජිත්, කාන්තා පොලිස් කොස්තාපල් 1404 පුණ්‍යකාන්ති, සිවිල් ආරක්ෂක නිලධාරි 14489 මල්ලිකාරච්චි යන නිලධාරිහු මෙම වැටලීමට සහභාගී වූහ.

දිනමිණ
දැසත
දස අත ම එක තැන

එච්.එම්.නන්දාවතී පතිරාජ වාරියපොල මධ්‍යම සමූහ

# පොල්පිතිගම කිරි ගොවියෝ 19කට රු.75,000ක මුදල් ආධාර


පොල්පිතිගම පශු වෛද්‍ය කොට්ඨාසය තුළ වෙසෙන කිරි ගොවි ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීම සඳහා කිරි ගොවීන් 19 දෙනෙකුට රුපියල් 75 000 බැගින් වූ ආධාර මුදලක් ලබා දීම පසුගියදා සිදු කෙරිණි.



මෙදින කිරි ගොවීන්ගේ කිරි නිෂ්පාදන ක්‍රියාවලියේ දී මුහුණ දීමට සිදු වී ඇති ගැටලු පිළිබඳ සාකච්ඡාවක් පශු සම්පත් ගොවිපළ ප්‍රවර්ධන කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය එච්.එම්.ඩී.බී. හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මිල්කෝ ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලසන්ත වික්‍රමසිංහ සත්ත්ව නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වයඹ පළාත් අධ්‍යක්ෂ බී.සී.එස්.පෙරේරා යන මහත්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා ප්‍රදේශයේ කිරි ගොවි ව්‍යවසායකයන් මේ අවස්ථාවට සහභාගී වී සිටියහ.

## ජනපොත

හෝමාගම පනාගොඩ රොමියල් මාවත අංක 711/7 පදිංචි ඒ. ප්‍රේමසිරි ගුණසේකර මහතා මුළු දිවයිනටම බලපාන පරිදි සාමවිනිසුරුවරයකු ලෙස පසුගියදා දිවුරුම් දුන්නේය. ඒ මහතා ගොඩගම, පනාගොඩ ප්‍රේදශයේ සමිති සමාගම් ගණනාවක සමාජ සේවා හා ආගමික සේවා කටයුතුවලටද මුල් තැන දී කටයුතු කරන ප්‍රදේශයේ ප්‍රසිද්ධ සමාජ සේවකයෙකි.



කුමාරි දිසානායක - ඉබ්බාගමුව සමූහ

# තෝරයාය ජල ව්‍යාපෘතිය ලබන 12දා ජනතා අයිතියට



පවුල් දහසකට සෙත සැලසෙන කුරුණෑගල, තෝරයාය ජල ව්‍යාපෘතිය එළැඹෙන දොළොස් (12) වැනිදා විවෘත කිරීමට නියමිතය. රුපියල් ලක්ෂ 3500කට වැඩි මුදලක් වැය වන මෙම ව්‍යාපෘතියේ මුල් අදියර යටතේ තෝරයාය ප්‍රදේශයේ පවුල් කිහිපයකට පානීය ජලය ලබා දීමට සැලසුම් කර ඇති අතර දෙවැනි අදියර යටතේ තෝරයාය 722, 719, 708 යන වසම්වල අනිකුත් පවුල් සඳහා ජල පහසුකම් ලබා දීමට නියමිත බව වයඹ ජල සම්පාදන මණ්ඩලයේ සහකාර සාමාන්‍ය අධිකාරි ජී.ඩබ්ලිව්. දේශප්‍රිය මහතා පැවසීය. ඒ අනුව ඉදිරියේ දී තෝරයාය මුස්ලිම් පල්ලිය ඇතුළු ප්‍රදේශය තෝරයාය විද්‍යාලය, වලස්ගල රජමහ විහාරය, කෝං ගස්වල නන්දාරාමය, කෝන්ගස්වල ස්වර්ණ ප්‍රදීප විද්‍යාලය, තෝරයාය අත්තාරික් මුස්ලිම් විද්‍යාලය ඇතුළු පාසල් සහ පූජනීය ස්ථාන මූලික කරගත් ප්‍රදේශවල සියලු පවුල්වලට දෙවන අදියර යටතේ ජලය ලබා දීමට නියමිතය.

සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

# මාතලේ නිවාස සැලසුම් නීතිය පර්චස් තුනට සීමා වෙයි

මාතලේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ නිවාස සැලසුම් අනුමත කර ගැනීම සඳහා අවම වශයෙන් පර්චස් 5.5ක් තිබිය යුතු යැයි තිබූ නීතිය පර්චස් 3 දක්වා අඩු කරලීමට මාතලේ මහනගර සභාවට ගෙන ආ යෝජනාව ඒකමතිකව සම්මත වුණි.

මාතලේ මහ නගර සභාවේ නගරාධිපති සන්දනම් ප්‍රකාශ් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවති මහ සභාව සඳහා උප නගරාධිපති අමිල නිරෝෂණ මහතා විසින් ගෙන ආ යෝජනාව එසේ ඒකමතිකව සභා සම්මත විය.මෙහිදී උප නගරාධිපතිවරයා කියා සිටියේ මාතලේ මහ නගර සභා බල ප්‍රදේශයේ විශේෂයෙන්ම විහාරපාර, අගලවත්ත, මීවත්තකුඹුර පාර, එම්සි පාර,ඔය පහල වැනි ප්‍රදේශයන් හි විශාල එකම ඉඩමේ පවුල් ගණනාවක් ජීවත්වන අතර පර්චස් 10ක් වැනි ඉඩමක පවුල් තුනක් පමණ එකම නිවෙසේ ජීවත් වුවත් මෙම නීතිය හේතුවෙන් වෙන් වෙන්ව නිවාස ඉදිකර ගැනීමට නීතියෙන් ඉඩ නොමැති බැවින් දරුවන් පාසල් සඳහා ඇතුළත් කර ගැනීමේ සිට මෙම ජනතාව විශාල ප්‍රශ්න රැසකට මුහණ දී සිටින නිසා මෙම යෝජනාව ගෙන එන බවයි. එහිදී පක්ෂ විපක්ෂ නියෝජිතියන් එම යෝජනාවට පක්ෂව අදහස් දැක්වූ අතර එම යෝජනාව ඒකමතිකව සම්මත කිරීමට නගරාධිපති සන්දනම් ප්‍රකාශ් මහතා කටයුතු කළේය.

පී. මද්දුමගේ - මාවරල සමූහ

# හලෝ කියන් යද්දී අකුණු සැර වැදිලා

අකුණු සැර වැදීමෙන් 34 හැවිරිදි විවාහක පුද්ගලයකු මියගොස් ඇති බව මාලිම්බඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම මහතා පැවැසීය. මෙසේ මියගොස් ඇත්තේ මාලිම්බඩ පදිංචි දුමින්ද ඉන්දික විතානගේ නමැති මගී ප්‍රවාහන බස් රථ හිමි අයෙකි.

මී ගවපාලනයේ යෙදුණු මොහු එදින ගවයන් දක්කාගෙන ඒම සඳහා මාලිම්බඩ වෙනිඅකුල වෙල්යායට,යතුරු පැදියකින් ගොස් පාර අයිනේ යතුරු පැදිය නවතා හෙල්මටයත් පැලැඳ ජංගම දුරකතනයෙන් කතා කරමින් යන අතර තුර අකුණු සැර වදින්නට ඇති බව විශ්වාස කෙරේ. හදිසි මරණ පරීක්ෂණය මිරිස්ස හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයේ හදිසි මරණ පරීක්ෂක පී.කේ. ජයලත් මහතා විසින් පවත්වා පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත දේහය මාතර මහ රෝහල වෙත යැවීමට නියම කර ඇත. සිද්ධිය පිළිබඳ මාලිම්බඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයවික්‍රම මහතාගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක චන්ද්‍රපාල මහතා පරීක්ෂක කටයුතු මෙහෙය වීය.

පී.පී.ජී. සුගතදාස - තිහගොඩ සමූහ

# දකුණේ පාරිභෝගික වැටලීම්වලින් ලක්ෂ 10ක්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දකුණු පළාත් කාර්යාලයේ නිලධාරීහු මෙම වසරේ මාර්තු මාසය තුළ දකුණ පළාතේ වංචනික වෙළෙඳුන්ට එරෙහිව සිදු කරන ලද හදිසි වැටලීම්වලින් අත්අඩංගුවට ගෙන අධිකරණයේ ඔවුනට එරෙහිව නඩු පවරා දඩ වශයෙන් රුපියල් ලක්ෂ 10කට ආසන්න වාර්තා ගත දඩ ආදායමක් රජයට උපයා දීමට සමත් වූහ.

දකුණ පළාතේ ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාස මට්ටමින් එම ජංගම වැටලීම් සිදුකර ඇත. ඒ අනුව මෙම වසරේ මාර්තු මාසයේ දකුණු පළාතේ සිදුකරන ලද සම්පූර්ණ වැටලීම් සංඛ්‍යාව 147කි. භාණ්ඩ මිල ප්‍රදර්ශනය නොකිරීම, කල් ඉකුත්වූ භාණ්ඩ අලෙවිය හා අලෙවිය සඳහා ප්‍රදර්ශනය කර තැබීම, වැඩි මිලට භාණ්ඩ අලෙවිය, වගකීම් සහතික නිකුත් නොකර විදුලි භාණ්ඩ අලෙවිය, අත්‍යවශ්‍ය භාණ්ඩ සඟවා තැබීම්, භාණ්ඩ මිල ප්‍රදර්ශනය නොකිරීම්, සහල් වැඩි මිලට විකිණීම් හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විධාන උල්ලංඝණය කිරීම් ආදී වැරදි යටතේ මොවුනට විරුද්ධව නඩු පවරා ඇත.

ඩී. මිහිදුකුල කොච්චිකඩේ විශේෂ

# මීගමුව දිසා මහ රෝහලේ 6 වැනි වාට්ටුවට ප්‍රමාණවත් පහසුකම් නෑ

මීගමුව දිසා මහ රෝහලේ 6 වැනි වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා බොහෝ අඩුපාඩු පවතින බැවින් එම රෝගීහු මහත් දුෂ්කරතාවට පත්වන බව රෝහල් ප්‍රකාශකයෙක් පැවැසීය.



එම රෝහලේ ඇඳන් ඇත්තේ පනස් දෙනෙකුට පමණක් වන අතර දිනපතාම අසූවක් පමණ රෝගීන් රෝහලට ඇතුළත් වන නිසා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නැති නිසා ඔවුන්ට ප්‍රතිකාර කිරීමේ දී කාර්ය මණ්ඩලයට මහත් අපහසුතාවට පත්වෙති. ඇතැම් රෝගීන් පුටුවල, බංකුවල,වාඩි කරවා තබන අතර ඇතැමෙක් රාත්‍රියට බිම වැතිර නිදා ගනිති.රෝගියකු රාත්‍රියට හොර රහසේ වාට්ටුවෙන් පිටව ගියහොත් දැනගැනීමටවත් නොහැකිය. මෙහි පවතින දුෂ්කරතා ගැන බලධාරීන් දැනුවත් කිරීමෙන් පසු ඒ සඳහා වෙනම වාට්ටුවක් ඉදිකර තිබුණත් වසර දෙකක් පමණ සිට රෝගීන්ට නේවාසිකව ප්‍රතිකාර ගැනීමට එහි අවස්ථාව නැති බවද වාර්තා වේ. නිල බල ඇත්තෝ තමන්ගේ රෝගියෙක් පැමිණියොත් දුරකතනයෙන් දැනුම් දී ඇඳක් ලබාදීම කරන බැවින් ඔවුන්ට මෙම අසරණ රෝගීන්ගේ වේදනා පෙනෙන්නේ නැත. වාට්ටුවේ හෙදි කාර්ය මණ්ඩලයේ ද කණිෂ්ඨ සේවකයන්ගේ ද අඩුවක් පවතින බැවින් මෙම වාට්ටුවේ සේවය කිරීමට විශාල වෙහෙසක් දැරීමට සිදුව ඇත. මෙම වාට්ටුවට ඇතුළත් වන්නේ කපා කොටා ගැනීම් සහ විවිධ අනතුරුවලට ලක් වූවන්ය.

ඒ සඳහා ප්‍රතිකාර කිරීමට සුදුසු පසුබිමක් වාට්ටුව තුළ තිබිය යුතුය. එබැවින් අසරණ රෝගීන් වෙනුවෙන් මේ සම්බන්ධව බලධාරීන්ගේ කඩිනම් අවධානය යොමුවිය යුතුයැයි එම දුෂ්කරතාවලට පත්ව ප්‍රතිකාර ලබන රෝගීන් ද පැවසූහ.

ඩබ්ලිව්. ක්‍රිස්පිල් බෙනඩික් - ප්‍රනාන්දු පුත්තලම සමූහ

# බල්ලන් සපා කෑමෙන් තුවාල ලැබූ කතුන් 3ක් රෝහලේ

අයාලේ යන බල්ලන් සපාකෑමෙන් තුවාල ලබා කාන්තාවන් තුන් දෙනෙක් ප්‍රතිකාර සඳහා පුත්තලම රෝහලට ඇතුළත් කර ඇත.

පුත්තලම අනුරාධපුර පාරේ සාලියවැව හන්දිය අසලදී මෙම බල්ලන් සපාකෑම සිදුවී ඇති අතර බල්ලන් සපා කෑමෙන් තුවාල ලබා මෙලෙස රෝහල් ගතකර ඇත්තේ සාලියවැව ගම්මානයේ පදිංචි අවුරුදු 54,55 සහ 78 වයස්වල පසුවෙන සාලියවැව පදිංචි කාන්තාවන් තුන්දෙනෙකි.

නොයෙක් පුද්ගලයන් විසින් බල්ලන් ගෙනැවිත් මහමඟ අතහැර දමා යෑම නිසා මෙසේ මහමඟ සුනඛ ගහණය වැඩිවී ඇති බව මේ පිළිබඳ විමසීමේදී එම පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක ඒ.එම්.එස්. අතපත්තු මහතා පැවසීය.

එම්. ඒ.ආර්.මනුකුලසූරිය - හිරියාල සමූහ

# ඉබ්බාගමුව අවට කඩවල නාඩු සහල් මිල හිතුමතේට

සාමාන්‍ය පාරිභෝගිකයා වැඩි වශයෙන් පරිභෝජනය කරන නාඩු සහල් සඳහා කිලෝව රුපියල් 96ක් ලෙස රජය මගින් පාලන මිලක් නියම කර තිබියදී ඉබ්බාගමුව, ගොකරැල්ල සහ මැල්සිරිපුර ප්‍රදේශයන්හි බොහෝ වෙළෙඳසල්වල නාඩු සහල් කිලෝ පහක රුපියල් 480ක ඇසුරුම රුපියල් 550කට අලෙවි කරන බව මහජනයා පෙන්වා දෙති.

ඒ අනුව මෙම කුඨ වෙළෙඳුන් විසින් නාඩු සහල් කිලෝවක් අලෙවි කරනු ලබන්නේ රුපියල් 110 බැගිනි. මේ සහල් ඇසුරුම්වල පිටුපස උපරිම සිල්ලර මිල වශයෙන් මුද්‍රණය කර ඇත්තේ රුපියල් 480ක් වශයෙනි. එසේ තිබියදී රුපියල් 550 බැගින් අලෙවි කිරීම නීතිය හෑල්ලුවකට ලක් කිරීමකැයි පෙන්වා දෙන මහජනයා මේ සම්බන්ධයෙන් නොපමාව සොයා බලා මෙම කූඨ වෙළෙඳුන් නීතියේ රැහැනට කොටුකර ගැනීම සඳහා පියවර ගන්නා ලෙස කුරුණෑගල පාරිභෝගික සේවා අධිකාරියේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

පුත්තලම සමූහ ඩබ්.ක්‍රිස්පිල් බෙනඩික් ප්‍රනාන්දු

# ඉන්දියාවේ සිට හොරෙන් ගෙනා එන්සාල් සහ බීඩි කොළ තොගයක් අත්අඩංගුවට

ඉන්දියාවේ සිට හොර රහසේ මුහුදු මාර්ගයෙන් මෙරටට ගෙන එමින් තිබූ එන්සාල් හා බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවන් පස් දෙනෙක් නාවික හමුදා නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

වෙන්නප්පුව සින්දාත්‍රිය වෙරළට බටහිරින්වූ මුහුදේදී නාවික හමුදාවේ රංගල කඳවුරේ නිලධාරි කණ්ඩායමක් 10 දා අලුයම සැකකටයුතු ධීවර යාත්‍රාවක් පරීක්ෂා කළ අවස්ථාවේ නීතිවිරෝධී අන්දමින් ගෙන එමින් තිබූ මෙම බීඩි කොළ හා එන්සාල්ද සමඟ සැකකරුවන් මෙසේ අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත.

පොලිතීන් මලු 22 ක අසුරා තිබූ බීඩිකොළ කිලෝ 770 ක් හා එක් පොලිතින් මල්ලක අසුරා තිබූ එන්සල් කිලෝ පහ (05)කුත් මෙහිදී සැකකරුවන් සමඟ අත්අඩංගුවට ගත් නාවික හමුදා නිලධාරීන් එම බීඩි කොළ සහ එන්සාල් රේගුවට භාරදී සැකකරුවන් තමහාරයට ගෙන වැඩිදුර විමර්ශන සිදුකරයි.

ඩී. මිහිදුකුල කොච්චිකඩේ

# ආබාධිත කකුල සුවකර දෙන්නම් කියා රු.50000ක් අරන්

තමාගේ ආබාධිත කකුල සුවකර දෙන්නම් කියලත් දේව වරමක් ලබා දෙන්නම් කියලා රුපියල් 50,000 ක් ලබාගෙන ඒවා ඉටු කළේ නැතැයි කියන සිද්ධියක් සම්බන්ධව මීගමුව පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ උප පොලිස් පරීක්ෂක ජේ.එම්. රෝහණ මහතා ඉදිරියේදී ඉකුත්දා විමර්ශනයට ගැනුණි.

වාර්තා වන අන්දමට කරුණු මෙසේය. මෙම සිද්ධියට සම්බන්ධ පැමිණිලිකාර කාන්තාව ඇතුළු චූදිත කාන්තාවන් දෙදෙනා මීගමුව වැල්ලවීදිය කුඩාපාඩුව ගම්මානවල පදිංචි කරුවන් ය. පැමිණිලිකාරිය වැල්ලවීදිය ග්‍රාමයේය ඇගේ ආබාධිත කකුල තරමක් කෙටිය, එසේම දේව වරමක් බලාපොරොත්තුවෙන් ඇය සිට ඇත කුඩාපාඩුව ගම්මානය තුළ දේව වරමින් සාස්තර කියන කාන්තාවක් සිටින බවත් ඇයට ලෙඩුන් සුව කිරීම මෙන්ම දේව වරම් ලබා දීමට පුළුවන් බවත් කියමින් ප්‍රදේශයේ සමාජ සේවිකාවක් වශයෙන් ප්‍රසිද්ධ කාන්තාවක් ඉදිරිපත්ව තිබේ. මෙම සමාජ සේවිකාව පසුගිය සුනාමි ව්‍යසනයේදී සමාජ සත්කාරක සේවා වල යෙදෙමින් කා අතරත් ප්‍රසිද්ධ ව සිටී.

පැමිණිලිකාර කාන්තාව තමාගේ ආබාධය සුව කර ගැනීමට සහ දේව වරමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ශාස්ත්‍ර කියන කාන්තාවට සමාජ සේවිකාව මාර්ගයෙන් තමාගේ බැංකු ගිණුමේ තිබූ අවසාන රු.50000 ලබාගෙන ඒය පඩුරු වශයෙන් දුන් බව පැමිණිල්ලෙන් කියවේ. දින සති මාස වශයෙන් ගෙවිය ගියාද පැමිණිලිකාරිය ට තමාගේ බලාපොරොත්තු ඉටු නොවීය. ඇයට ඉන්පසු පොලිසියේ පිහිට පැතීමට සිදුවිය.

ශාස්ත්‍ර කියන කාන්තාව තමා රුපියල් 50,000 ක් පැමිණිලිකාර කාන්තාවගෙන් ලබාගත් බවත් එම පොරොන්දු ඉටුකිරීමට නොහැකි වූයේ මේ වන විට මිනිසුන් විවිධ අපරාධ සිදු කරමින් දෙවියන් කෝප කර සිටීම නිසා යයි ඇය පොලීසියට පවසා තිබේ. මේ අවස්ථාවේ සාස්තර කියන කාන්තාව තමා ලබාගත් රුපියල් 30000 ක මුදලද සමාජ සේවිකාව ලබාගත් රුපියල් 20,000ක මුදලද පැමිණිලිකාර කාන්තාවට ගෙවීමට එකඟ වී සිද්ධිය සමතයකට පත්විය.

මෙහිදී උප පොලිස් පරීක්ෂක රෝහණ මහතා පැමිණිලිකාරිය ට දේව විශ්වාසයක් තිබීම හොඳ බවත් එහෙත් මෙවැනි රැවටිලිකාරයන්ට අසු නොවී බුද්ධිමත්ව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

ගඟ ඉහල සමූහ - ජගත් ජනප්‍රිය

# පරාජය වසාගන්න එජාපය විවිධ මඩ ප්‍රචාර පතුරුවනවා

**මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ඒ. විරසිංහ**









වසර 5ක් රට ආපස්සට ගෙන ගිය එක්සත් ජාතික පක්ෂයේ අය මෙවර මැතිවරණයේදී අන්ත පරාජය වසාගන්න විවිද මාධ්‍ය මගින් ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා රට කරන විදිය දැක අද විපක්ෂය විවිද මඩ පාරවල් ගසමින් ජනතාව නොමග යවනවා. එයට රටේ බුද්ධිමත් ජනතාව අසුවන්නේ නැතයැයි හිටපු මධ්‍යම පළාත් සභා මන්ත්‍රී හා මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ඒ. විරසිංහ මහතා පැවසීය.

ඒ මහතා එසේ පැවසුවේ උඩුනුවර ආසනයේ කඳුරට ජාතික සවිබල පදනම මඟින් වැනිලා ගොවීන් හට පැළ බෙදා දීමේ උත්සවයක් ගෙලිඔය සද්ධාතිස්ස පිරිවණේදි පැවති අවස්ථාවෙදීය තව දුරටත් අදහස් දක්වමින් අද රට කෘෂිකාර්මික රටක් බවට ස්වයංපෝෂිත රටක් බවට පත් කරන්න එතුමා ගෙන ඇති තීරණවලට පිටරටින් භාණ්ඩ ගෙන්වා කොමිස් ගත් අයට බඩේ පාර වදින නිසා විවිධ කතා කියමින් රජය අපහසුතාවට පත්කරනවා. කොවිඩ් වසංගතය ලෝකය පුරාපැතිරී ගිය නිසා අපරටට පමණක් නොව මුළු ලෝකයේම ආර්ථිකය අද කඩා වැටී තිබෙන්නේ එයට බුද්ධිමත්ව ක්‍රියාකරමින් රට ගෙන යන නායකයා හෙලා දකින්න හදනවා.අද උඩුනුවර ආසනයේ පල්කුඹුර ඇටිලොන් වත්ත උඩ අළුදෙනිය ගම්මානවල වැනිලා ගොවීන් 125කට වැනිලා වැල් ලබාදෙමින් කෘෂි කර්මාන්තයට අත දෙන්න මහා සංසරත්නය සමඟ මෙම පදනම කරන සේවය අප අගය කරනවා අප රජයෙන් ලබාදීමට හැකිදේ ලබාදීමට පියවර ගන්නා අතර කෘෂිකර්ම ආමාත්‍ය මහින්දානන්ද අළුත්ගමගේමහතාගේ සුභාසිංෂණි නායක හිමි ඇතුළු සියළු දෙනාට පුද කරනවා.

මෙම අවස්ථාවට උඩුනුවර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේකබාධිකාරි කඳුරට ජාතිකසවිබල පදනමේ අනුශාසක පුජ්‍ය ගලහා සිරි ශාන්ත නායක හිමි උඩුනුවර ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් බංඩාර කඳුරට ජාතික සවිබල පදනමේ සභාපති ජගත්කුමාර යාපා එම පදනමේ ප්‍රචාරක ලේකම් ආනන්ද විජේසුන්දර මහත්වරුන් ඇතුළු පළාත් සභා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහභාගිවූහ

දිනමිණ දිසත දස අත ම එක තැන

එස් . දියගහගේ දකුණු පළාත් සංචාරක

# මාධ්‍යවේදී ලලිත් චාමින්දගේ නැන්දණිය අභාවප්‍රාප්ත වෙයි

මාධ්‍යවේදී ලලිත් චාමින්ද මහතාගේ නැන්දණිය වූ අක්මීමණ වලහන්දුව සේනානායක මාවතේ පදිංචිව සිටි කේ. කේ. සිරියාවතී මහත්මිය (82) පරලෝ සැපත් වූවාය.

සිරියාවතී මහත්මිය ගාල්ල අනුලාදේවී බාලිකා විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිනි වයි. ආර්. ශ්‍රියාණි මහත්මියගේ ආදරනීය මැණියන්ද වේ. සිරියාවතී මහත්මියගේ දේහය අක්මීමණ වලහන්දුව සේනානායක මාවතේ පිහිටි "ශ්‍රියාණි " නිවසේ තැන්පත්කර ඇති අතර ආදාහන කටයුතු අද (12) සවස 4.00 ට අක්මීමණ කුරුඳුවත්ත ආදාහනාගාරයේදී සිදු කෙරේ.

ගාල්ල දිස්ත්‍රික් සංචාරක - ධම්දාස සිරිවර්ධන

# 'ආදරණීය වෙළෙන්ඳා' කරන්දෙණිය අවුරුදු පොළ මෙදා සරුයි



සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් පැවැත්වෙන ආදරණීය වෙළෙන්දා සමෘද්ධි අභිමානී වෙළෙඳ ප්‍රදර්ශනය හා පොළ අප්‍රේල් 09 , 10 දිනවල කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිටදී පැවැත්විණ සහනදායී මිලට බඩු අලෙවිය සිදු විය.

ගාල්ල දිස්ත්‍රික් සංචාරක - ධම්දාස සිරිවර්ධන

# පුංචි පොළේ වෙළෙඳුන්ට අවුරුද්දට සහන

අම්බලන්ගොඩ හා අවට ප්‍රදේශවල ග්‍රාමීය නිෂ්පාදන හා කෘෂි බෝග ගෙනැවිත් නගරයේ අලෙවි කරන අම්බලන්ගොඩ පුංචි පොළේ වෙළෙඳ ප්‍රජාවට අවුරුද්ද වෙනුවෙන් සහල් මල්ලක් හා රුපියල් 5000 ක අවුරුදු අත්තිකාරමක් ලබාදීමට අම්බලන්ගොඩ පුංචි පොළ වෙළෙඳුන්ගේ සුබසාධක සංගමය කටයුතු කළේය.

එමෙන්ම සියලුම වෙළෙඳුන්ට නිල ඇඳුමක් ද හඳුන්වා දුන් අතර මේ අවස්ථාවට සංගමයේ ප්‍රධාන අනුශාසක අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරී සහන් අබේවර්ධන සභාපති කේ. ඩබ්ලිව්. කුමාරි ලේකම් රම්‍යා පත්මිණී, භාණ්ඩාගාරික ගයාන් මධුශංක මහත්වරුඇතුළු පිරිසක් එක්ව සිටි අතර වෙළෙඳ ප්‍රජාවට සහල් මලු ඉබා දුන් අයුරු ඡායාරූපයේ දැක්වේ.



**ඡායාරූපය - ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක**

අනුරාධපුර මධ්‍යම විශේෂ-බී.එම්.විජේසූරිය

# රූපලාවන්‍ය නිෂ්පාදන තොගයක් අත්අඩංගුවට

ශරීරයට හිතකර නොවන මෙරට ප්‍රමිති ආයතනයේ කිසිදු ලියාපදිංචියක් නොමැතිව අනුරාධපුර නගරයේ අලෙවිකළ ස්ථාන තුනක් වටලා රුපියල් ලක්ෂ අසූවක පමණ රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ප්‍රමාණයක් පාරිභෝගික සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ඩී.එම් සුදර්ශන දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අධ්‍යක්ෂ ජනරාල් සුදර්ශන දිසානායක මහතා (10දා) අනුරාධපුර දිස්ත්‍රික් පාරිභෝගික සේවා අධිකාරි කාර්යාලයේ නිලධාරින් සමග සිදුකළ හදිසි වැටලීමේදී මෙම ස්ථානවල තිබී කිසිදු ආකාරයකින් මිනිස් සිරුරට හිතකර නොවන ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන රැසක් අත්අඩංගුවට ගැනීමට නිලධාරින්ට හැකිවී තිබේ.

අනුරාධපුර නව බස්නැවතුම් පොළ ඉදිරිපිට පිහිටි රූපලාවන්‍ය නිෂ්පාදන අලෙවි ස්ථානයක් හා අනුරාධපුර බැංකු පෙදෙසේ පිහිටි රූපලාවන්‍ය නිෂ්පාදන අලවිකරනා ස්ථාන දෙකක් වටලා එම භාණ්ඩ විශාල තොගය අත්අඩංගුවට ගෙන තිබුණි.

තරුණ කාන්තාවන් විසින් සුදුවීම සඳහා භාවිතා කරන වයිට්නින් ක්‍රීම් පේෂ් වොෂ් බොඩි ලෝෂන් ක්‍රීම් වර්ග සුවද විලවුන් සබන් වර්ග පේෂ් පවුඩර් බොඩි ස්ප්‍රේ මස්කාරා ඩියෝට්රට් තොල් ආලේපන(ලිෆ්ටික්) ලිප් බාම් නිය ආලේපන මුහුණට යොදනා පැක්වර්ග ස්ක්‍රබ් අයිෂැඩෝ මුහුණට යොදන මාස්ක් ඇතුළු රූපලාවන්‍ය නිෂ්පාදන දහස් ගණනක් අත්අඩංගුවට ගෙන තිබුණි.



ඩී.එස් ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

# මහ වැස්සට ලොරියක් ගසාගෙන යයි

තෙළුල්ල පන්සල අසලින් ගගේයාය මාර්ගයේ කිරිඳි ඔය හරහා ඇති සපත්තු පාලමෙන් එගොඩට යෑමට ගිය ඩිමෝ බට්ටා වර්ගයේ ලොරිරථයක් කිරිඳිඔයේ සැඩපහරට හසුවී ගසාගෙන ගොස් ඇතැයි කුඩාඔය පොලීසිය පවසයි.

එම ප්‍රදේශයට ඇදහැලුණු මහ වැස්සත් සමග කිරිඳිඔයේ ජල මට්ටම වැඩිවී තිබෙන අතර සපත්තු පාලමමෙන් එගොඩට යෑමට ගිය ලොරිරථය සැඩපහරට හසුවී ගසාගෙන ගොස් ඇති අතර රියැදුරු ලොරි රථයෙන් ඉවතට පැන දිවිබේරාගෙන ඇත. සිද්ධිය පිළිබඳව කුඩාඔය පොලීසිය පරීක්ෂණ පවත්වන අතර කිරිඳිඔයේ තිබෙන ලොරි රථය ගොඩගැනීමට පොලීසිය කටයුතු කරගෙන යයි.

ආර්. එල්. දියගහගේ අහංගම සමූහ

# මාර්ග සළකුණු සටහන් කිරීමෙන් අනතුරු අවම වෙලා

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අහංගම නගරයේ මහා මාර්ගවල සළකුණු සටහන් කිරීමෙන් පසුව අහංගම නගරයේ මාර්ගවල පැවති තදබදය වැළකී ගොස් ඇති අතර නිතර නිතර සිදුවූ මාර්ග අනතුරුද අවමවී ඇතැයි අහංගම පොලිසිය පවසයි.

අහංගම නගරයේ මහා මාර්ගවල අවශ්‍ය ස්ථානවල කහ සහ සුදු ඉරි සටහන් කිරීමෙන් පසුව මේ තත්ත්වය උදාවී තිබේ.

අහංගම නගරය හරහා දුම්රිය ධාවනය වන අවස්ථාවලදී අහංගම ඉමදුව මහා මාර්ගයේ විශාල රථවාහන තදබදයක් පැවතුනි. එමෙන්ම නගරයේ මහා මාර්ගවලට අවහිර වන පරිදි රියැදුරන් විසින් රථවාහන නතර කිරීම නිසා නිතර නිතර මාර්ග අනතුරුද සිදු විය.

විජිත උදය කුමාර-දකුණු පළාත්

# රැකවරණය අහිමි දරුවන් භාරකරුවකු යටතේ රැක බලා ගැනීම බොහෝ රටවල සිදු කෙරෙනවා

## දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ



රැකවරණය අහිමි වූ දූ දරුවන් ළමා නිවාස වලට යොමු කිරීම යල්පැන ගිය ක්‍රමයක් බවත් ඔවුන් රජයේ අධිකරණය යටතේ භාර කරුවකු යටතේ රැක බලා ගනිමින් පාසල් අධ්‍යාපන කටයුතු වලට යොමු කිරීම ලෝකයේ බොහෝ රටවල සිදු කෙරෙන කටයුත්තක් බවත්, අද ලබා දෙන මෙම ශිෂ්‍යාධාර මුදල දරුවන්ගේ කටයුතු සඳහාම යොදවන ලෙස එම දරුවන්ගේ භාරකරුවන්ගෙන් ඉල්ලා සිටින බවත් දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේ මහතා පැවසීය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ දකුණු පළාතේ දෙමාපියන් දෙදෙනාම අහිමි, මව හෝ පියා අහිමි, මව හා පියා අහිමි, මව හා පියා හා දෙදෙනාම ආබාධිත දරුවන් සඳහා මාතර මහා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ පැවති ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහනට සම්බන්ධ වෙමිනි.

දකුණු පළාත් පරිවාස හා ළමා කොමසාරිස් මහේෂ් රාජිත කරුණානායක මහතාගේ සංකල්පයක් මත 2014 වර්ෂයේදී මෙම වැඩසටහන ආරම්භ කළ අතර පසුගිය වසරේ ළමුන් 600ක් සඳහා රුපියල් ලක්ෂ 72ක මුදලක් ලබා දී ඇති අතර මේ වසරේ දකුණු පළාතේ දූ දරුවන් 362ක් සඳහා රු ලක්ෂ 43ක මුදලක් ලබා දී ඇත.

පරිවාස දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා පරිවාස නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් හා විදුහල්පතිවරුන්ගේ නිර්දේශය මත නිවැරදි ක්‍රමවේද භාවිතා කරමින් මෙම දරුවන් තෝරා ගන්නා ලද අතර එක් අයකුට රු.1000 බැගින් අවුරුද්දකට රු.12000ක මුදලක් ලබා දෙනු ඇත.

මෙම මුදල මේ කාලය තුළ ප්‍රමාණවත් මුදලක් බව තමා නොසලකන බවත් ඉදිරියේදී එම මුදල වැඩි කිරීමට පරිවාස කොමසාරිස්තුමා සමග සාකච්ඡා කරන බවත් එම දරුවන් සම්බන්ධව රජය සොයා බලන බවට මෙමගින් තහවුරු වන බවත් දරුවන්ගේ අධ්‍යාපන හා රැකවරණය සම්බන්ධව රජය අවධානයෙන් සිටින බවත් එමෙන්ම මෙම දරුවන් පිළිබඳ ගෞරවයක් රජයට ඇති බවත් එමෙන්ම මෙම දරුවන් බලා ගන්නා භාරකරුවන්ට ගෞරවයක් හා සහනයක් සලසමින් හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දිරිමත් කිරීම සඳහා මෙම මුදල ලබා දෙන බවත් එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේ මහතා පැවසීය.

මෙම අවස්ථාව සඳහා දකුණු පළාත් පරිවාස කොමසාරිස් මහේෂ් රාජිත කරුණානායක මහතා ඇතුළු පළාත් පරිවාස කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් පිරිසක් සහභාගී විය.

# ප්‍රසම්පාදන දැන්වීමයි

## (ජාතික තරගකාරී ලංසුකරණය)

### වාරිමාර්ග අමාත්‍යාංශය

## මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

### මොරගහකන්ද, කෝන්ගහවෙල

වාරිමාර්ග අමාත්‍යාංශය, මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගුරුවල හා වැල්ලේවෙල කොට්ඨාසයන්හි නැවත පදිංචි කරන ලද පවුල් සඳහා 2021 මැයි හා ජූනි මාස සඳහා වියළි ආහාර සලාකය ලබාදීමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. මෙම මිල ගණන් විවෘත කරන දින සිට **දින 60 ක්** දක්වා වලංගු විය යුතුය.

**සැපයිය යුතු වියළි ආහාර වර්ග හා විස්තර :**

❐ ලංසු කැඳවීමේ අංකය - MKDP/SUP/Q/5204

❐ අවශ්‍ය වියළි ආහාර වර්ගය සහල් - (දේශීය බඩබත්) නාඩු = 125310Kg

| | |
|---|---|
| හාල්මැස්සෝ | = 4115Kg |
| පරිප්පු | = 8235Kg |
| සීනි | = 8235Kg |
| සැමන් 400g | = ටින් 7875 |
| සැමන් 200g | = ටින් 715 |
| කිරිපිටි | = පැකට් 200 |

❐ සැපයිය යුතු ස්ථානය - මොරගහකන්ද ප්‍රධාන ගබඩාව වෙත

**උපදෙස් හා කොන්දේසි**

**ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීම**

1. අදාළ ද්‍රව්‍ය වල විස්තර අඩංගු මිළ ගණන් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර කට්ටලය ලිඛිත ඉල්ලීමක් මගින් පහත සඳහන් ලිපිනය සහිත කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් සතියේ වැඩ කරන දිනයන් තුළදී 2021.04.15 දින සිට 2021.05.10 දින දක්වා පෙ.ව 9.00 ත් ප.ව 3.00ත් අතර, කාලය තුළ පැමිණ රු. 1000.00 ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගිණුම් අංශයට ගෙවීමෙන් පසු ලබාගත හැකිය.

**මිල ගණන් ඉදිරිපත් කිරීම**

❐ මිල ගණන් ඉදිරිපත් කිරීමට ලබා ගත්තා ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද මිල ගණන් පහත සඳහන් ලිපිනයට ලැබෙන ලෙස 2021.05.11 වෙනි දින ප.ව 2.30ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ මුද්‍රා තබා කාර්යාලීය ටෙන්ඩර් පෙට්ටියට යොමු කළ යුතු වේ.

❐ මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි ටෙන්ඩර් අංකය සඳහන් කිරීම අත්‍යවශ්‍යවේ.

❐ 2021.05.11 ප.ව. 2.30ට මිල ගණන් පත්‍ර විවෘත කරනු ලබන අතර, නියමිත වේලාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට අවශ්‍ය නම් එම අවස්ථාවට සහභාගී විය හැකිය.

**වැඩි විස්තර සඳහා :**

01. **ප්‍රසම්පාදන ඉංජිනේරු,**
**ප්‍රසම්පාදන අංශය,**
**මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය,**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය,**
**මොරගහකන්ද, කෝන්ගහවෙල**
**දුරකථන අංකය - 066 - 2053601**







### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ලංසු සඳහා ආරාධනය

## One Stop Shop ඉදි කිරීම

### කුරුදුවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශය මහනුවර

1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මහනුවර දිස්ත්‍රික්කයේ කුරුදුවත්ත ගොවිජනසේවා බල ප්‍රදේශයේ One Stop Shop ඉදි කිරීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් කාලය දින 90කි.
2. ජාතික තරගකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මඟින් ලංසු කැඳවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය සඳහා වන මුළු ඇස්තමේන්තුගත පිරිවැය **රු. මිලියන** 50ට අඩු බැවින් අංක 04/2016 (ii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය අදාළ වන්නේය.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු භාර ගැනීමේ අවසාන දිනය දක්වා වලංගු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ C6 සහ C5 යටතේ ලියාපදිංචි වී සිටිය යුතුයි. තවද, එම ලියාපදිංචිය කොන්ත්‍රාත් ප්‍රදානය කරන දිනය දක්වා වලංගු විය යුතුය. තවද, වාර්ෂික පිරිවැටුම සනාථ කිරීම සඳහා ලංසුකරු විසින් ලංසුපත සමඟ 2020, 2019, 2018 වර්ෂ සඳහා විගණනය කරන ලද අවසන් මූල්‍ය ප්‍රකාශන සහ පසුගිය අවුරුදු තුන ඇතුළත සිදු කරන ලද සමාන වැඩ සාර්ථකව නිම කිරීම සඳහා වන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.(වැඩ නිම කිරීම සහ ප්‍රදානය කිරීමට අදාළ සහතික වල සහතික කරන ලද පිටපත්)
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු මහනුවර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ **නියෝජ්‍ය කොමසාරිස්** වෙතින් ලබා ගත හැකි අතර, එම ලිපිනයේදී ඕනෑම රාජකාරි දිනක 09.00 පැය හා 16.00 පැය අතර, ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.
5. ආපසු නොගෙවනු ලබන රු. 3,500.00 ගෙවීමෙන් අනතුරුව **2021.04.12** වෙනි දින සිට **2021.04.27 දින දක්වා 09.00 පැය හා 15.00 පැය** අතර අදාළ ගොවිජන සංවර්ධන මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.
6. ලංසුවෙහි අනු පිටපත සහිතව මුල් පිටපත, **2021.04.28 වෙනි දින 14.00 පැය** හෝ ඊට පෙර ලැබෙන පරිදි ඇමුණුමේ සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදීමට හෝ ලියාපදිංචි තැපැල් මඟින් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ඉහත සඳහන් ලිපිනයේදී ලංසු විවෘත කරනු ලැබේ.
7. ලංසු භාර ගැනීම සඳහා නියම කොට ඇති අවසාන දිනයේ සිට හෝ දීර්ඝ කරනු ලබන දිනයේ සිට දින 60ක් දක්වා ලංසු වලංගු විය යුතුය.
8. සියලුම ලංසු සඳහා පහත සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.
   - ලංසු ලේඛනයේ 09 වෙනි කොටසේ ඇතුළත් කොට ඇති ආකෘතියට අනුව
   - ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, මහනුවර නමින්
   - රු.110,000.00 ක වටිනාකමින් යුත්
   - 2021.06.28 වෙනි දින දක්වා වලංගු
   - ලංසු දත්තයන්හි 16.0 ඡේදයේ සඳහන් නියෝජිතායතනයක් විසින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක් හෝ
   - **රු. 55,000.00** ක වටිනාකමින් යුත් ආපසු ගෙවනු ලබන තැන්පතුවක් **මහනුවර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය** වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපතේ මුල් පිටපත ලංසුව සමග අමුණා එවිය යුතුය.

**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**නො.42 ,ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,**
**කොළඹ 07.** 2021.04.12

## සෞඛ්‍ය අමාත්‍යාංශය

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

# තනතුරු පුරප්පාඩු

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව**

**භාර අරමුදලෙහි පහත සඳහන් තනතුර සඳහා නිසි සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයෙහි නියුතු අයදුම්කරුවන් පූර්ණකාලීනව ආයතනයෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශ කරමින් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත්‍ර යොමු කළ යුතුය.**

## අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)

1. **අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :**

1.1 **බාහිර අයදුම්කරුවන් සඳහා :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය, මූල්‍ය, වාණිජ්‍යය, නීතිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු පරිපාලන මූල්‍ය කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද සහ සහ එයින් වසර 05 ක් රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාගත මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ගිණුම්කරණය, කළමනාකරණ , මූල්‍ය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක සම සාමාජිකත්වය දරා තිබීම සහ සාමාජිකත්වය දැරීමෙන් අනතුරුව පරිපාලන මූල්‍ය කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ලබා තිබීම සහ එයින් වසර 05 ක් රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාපිත මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක පළපුරුද්ද ලබා තිබීම.

1.2 **ද්විතීය යන පදනම මත අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය, මූල්‍ය, වාණිජ්‍යය, නීතිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ කාණ්ඩයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවයක් සහිතව පළපුරුද්ද ලබා තිබීම.

**සටහන :**

අභ්‍යන්තර අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් පැවතීම අමතර සුදුසුකමක් වේ.

2. **වැටුප් පරිමාණය :**

HM 2-3 :රු. (98,215 - 12 X 2,700 - 130,615)

EPF -15%, ETF - 3%, ජීවන වියදම් දීමනාව, පැමිණීමේ දීමනාව (රු.10,000/-) සහ සෞඛ්‍ය රක්ෂණාවරණය

**වෙනත් කරුණු :**

**සෑම අයදුම්කරුවෙක් ම,**

- වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 57 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සහ ද්විතියන පදනම මත අයදුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව බල නොපානු ලැබේ.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය. තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතු අතර දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි විය යුතුය. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගැනීම සිදු කරනු ලැබේ.
- සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ජාතිය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් සඳහන් කළ යුතු තොරතුරු ඇතුළත් ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමගලේකම් , සෞඛ්‍ය අමාත්‍යාංශය, සතොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021/04/25 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- 2021 පෙබරවාරි මස 15 වන දින පළ කරන ලද පුවත්පත් දැන්වීම අනුව අයදුම්කරුවන් විසින් යොමු කරන ලද අයදුම්පත් ඉහත කාර්යය සඳහා වලංගු අයදුම්පත් වශයෙන් සලකනු ලැබේ.
- අයදුම්පත්‍ර කෙටි ලේඛනගත කිරීමේ අයිතිය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් දරනු ලැබේ.
- අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර භාර ගනු නොලැබේ.
- මේ සම්බන්ධයෙන් ඔබ විසින් වැය කරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

**ලේකම්**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**සතොස මහලේකම් ගොඩනැගිල්ල,**
**27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02**

## තනතුරු ඇබෑර්තු

**උතුරු පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2021**

1) **උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා තාක්ෂණවේදී සේවයේ ජනපද නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

2) **උතුරු පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

දෙමළ හා සිංහල භාෂා මාධ්‍යය මගින් උක්ත තනතුරු වලට අදාළ තරග විභාග උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත වී ඇති අතර, මෙම තනතුරු පුරප්පාඩු තරග විභාගයක් මගින් සම්පූර්ණ කිරීමට නියමිතයි. මේ සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වනුයේ 2021.05.07 වේ.

අයදුම්කරුවන් www.np.gov.lk → Recruitment and Exam → Advertisement - යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් හා උතුරු පළාත් සභාවට අයත් පළාත් පාලන කාර්යාලවලින් ද උක්ත තනතුරු වලට අදාළ බඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු ලබා ගෙන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අයදුම් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**S. තිරුවාකරන්,**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු පළාත.**
**12.04.2021**

## රැකියා ඇබෑර්තු

සී/ස බළපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සාමාන්‍යාධිකාරී තනතුර
    වැටුප් පරිමාණය 101:7

02. බැංකු සේවා නිලධාරී
    වැටුප් පරිමාණය 111:9

03. ගණකාධිකාරී
    වැටුප් පරිමාණය 103:8

04. අභ්‍යන්තර විගණක
    වැටුප් පරිමාණය 105:11

05. වාණිජ කළමනාකරු
    වැටුප් පරිමාණය 106:9

**වයස :** අවුරුදු 23 - 45 අතර

දැනට සමු. සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

**සුදුසුකම් :** ඕනෑම විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැක.

තමා විසින් පිළියෙල කරන ලද අයදුම්පත, අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල මුල් පිටපත් සමග ගරු සභාපතිතුමා නමට ලියාපදිංචි තැපෑලෙන් 2021-05-05 දිනට ප්‍රථම එවිය යුතුය.

තමා අයදුම්කරන තනතුර අයදුම්පත බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**සී/ස බළපිටිය වි.සේ.ස. සමිතිය,**
**ගාලු පාර,**
**බළපිටිය.**
**දුරකථන අංකය : 091-2258229**

# යළි මතකය අවදි කරන

# පුත්තලමේ සමූපකාරය



සභාපති
එල්.එස්.චින්තක



උප සභාපති
ඩබ්ලිව්.එල්.ඩොනිල් රෝබස්



අධ්‍යක්ෂක
ශ්‍රිකාන්ත බණ්ඩාර



අධ්‍යක්ෂක
විමල් කුසුම්සිරි



ඒ.ජී.සෙනෙවිරත්න



එස්.ඒ.රත්නපාල



ඒ.එම්.එස්.අත්තනායක



සාමාන්‍යාධිකාරී
රසිකා කුලසේකර






"සමූපකාරය" වනාහි සමාජය ආරම්භයේදී ම ස්ථාපිත වූ මූලික සමාජ සංස්ථාවකි. එය ස්භාව ධර්මයා සමඟම වර්ධනය වූවකි. ස්භාව ධර්මයාද විවිධ කොටස් සංකලනය වී වර්ධනය වන ආරම්භය හෝ අවසානය නිශ්චය නොවන, සත්‍යතාවකි. සමූපකතාරයද, විවිධ සමාජීය කොටස් ඒකරාශි වූ සමාජ ප්‍රගතිය අරමුණ කරගත් ජීවන ක්‍රමයකි.

මීට දශක 4කට පමණ පෙර කාල වකවානුවේදී සමූපකාරය ඉතාමත්ම ජනප්‍රිය වචනයක් බවට පත්ව තිබුණි. 1970-77 කාල සමයේ මෙරට භාණ්ඩ හිඟයක් ඇති වුණු අවස්ථාවේ විවිධකාරයේ බඩුබාහිරාදිය මිල දී ගැනීම සඳහා සමූපකාර පෝලිම්වල සිටි බව අපගේ වැඩිහිටියන්ගේ මනසේ ඇඳි සිතුවම් අදටත් නොමැරී මතකය අවදිකරන අවස්ථා එමටය. එලෙස එක් කාල සමයක සමූපකාරය ලාංකිකයන්ගේ අවශ්‍යතා රැසක් සපුරාලන ස්ථානයක් බවට පත්ව තිබුණත් රටේ විවෘත ආර්ථිකය ගොඩනැගීමත් සමඟ වර්තමානයේ "සමූපකාරය" යන වචනය අපට නිතර අසන්නට නොලැබුණත් වර්තමානය වන විට එය ජනතාවගෙන් ගිලිහියාමේ පෙර නිමිති පහළ වෙමින් තිබෙන යුගයක නැවතත් වැළලී ගිය සමූපකාරට නව ජීවයක් එක්කාසු කරමින් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමේ යුග මෙහෙවරක නියුතු වන සීමා සහිත පුත්තලම විවිධ සේවා සමූපකාර සමිතියේ වත්මන් සභාපති එච්.ඒ.පී.එල්.එස්.චින්තක මහතා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය අපමණ වෙහෙසක් දරමින් කටයුතු කිරීම ප්‍රසංශනීයයි.

ජනතා හදවතෙන් මැකී වියැකී ගිය සමූපකාර සන්නාමය නව මුහුණුවරකින් ජනතාව අතරට රැගෙන ඒමේ ක්‍රියාන්විතයේ පෙර ගමන්කරුවෙකු වූ සභාපති එච්.ඒ.පී.එල්.එස්.චින්තක මහතා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය අද වන විට විශාල ව්‍යාපෘති රැසක් දියත් කරමින් ජනතාව සමග අත්වැල් බැදගෙන පුත්තලම පුරවරයේ රත්තරං නාමක් දිනා ගැනීමට කටයුතු කර තිබේ.

1990 දශකයේ ආරම්භ කරන ලද සීමා සහිත පුත්තලම විවිධ සේවා සමූපකාර සමිතිය දීර්ඝ ඉතිහාසයකට නැගම් කියමින් පුත්තලම සහ වනාතවිල්ලුව ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ තුළ ව්‍යාප්ත කර ඇති විශාලතම ව්‍යාපාරික සන්ධිස්ථානයක් ලෙස පැහැදිලිව නිර්වචනය කල හැකිය. පුත්තලම 1, පුත්තලම 2, වට්ටකන්ඩල්, මයිලන්කුලම, වනාතවිල්ලුව, විජයපුර, එළුවන්කුලම, කරතිව්, පාලවිය, අට්ටවිල්ලුව, පොත්තුවිල්ලුව, කල්අඩිය, සිරම්බිඅඩිය, මානවේරිය ආදි ප්‍රදේශවලින් අද වන විට සාමාජිකයින් 10000ක් පමණ සාමාජිකත්වය දරණ මෙහි මහ සභාවේ සමාජිකයින් 72 දෙදෙනෙකු සමඟින් සභාපති ඇතුළුව අධ්‍යක්ෂක මණ්ඩලයේ සමාජිකයින් 7 දෙනෙකු කටයුතු කරන අතර, මෙහි පරිපාලන ව්‍යුහය සැකසී ඇත්තේ වර්තමානයේ සමාන්‍යාධිකාරි රසිකා සංජීවනී කුලසේකර මහත්මිය ඇතුළු, විධායක නිළධාරි, කළමණාකරු, ක්ෂේත්‍ර නිළධාරි, කළමණාකරන සහයකවරු, අලෙවි සහයකයින්, පොම්ප ක්‍රියාකරුවන්, රියදුරු සහ රිය සහයක යන කාර්ය මණ්ඩලයේ දායකත්වයෙනි.

සමූපකාර සමිතිය යටතේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පිරිදි ග්‍රාමිය බැංකු 07ක්, ඉන්ධන පිරවුම් හල් 02ක්, කෝප්සිටි 08ක් ස්ථාපිත කරමින් ජනතාවට පුළුල් හා කඩිනම් සේවාවක් ලබා දීමට කටයුතු කරමින් තිබේ.

ග්‍රාමිය බැංකු සේවාව යටතේ දියත් කර ඇති වැඩසටහන් අතරින් ජනතාවට සැපයෙන සේවාවන් ලෙස තැන්පත් කිරීම් සහ ආපසු ගැනීම්, ණය ලබා දීම, ළමා ඉතුරුම් තැන්පත්, රන් ලිය වනිතා ගිණුම්, ස්වර්ණාභරණ උකස් සේවාව, සහන පොළි අනුපාත යටතේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ණය පහසුකම්, ස්වයං රැකියා සඳහා ණය, කිරි ගව පාලනය සඳහා අවශ්‍ය මූලම්‍ය ණය පහසුකම්, අධ්‍යාපන කටයුතු සඳහා ණය පහසුකම් සහ සමාජ ආරක්ෂණ වැටුප්, ගොවි විශ්‍රාම වැටුප් සහ පාරිභෝගිකයින්ගේ පහසුව සඳහා විදුලි බිල්පත්, ජල බිල්පත්, දුරකථන බිල්පත්, රක්ෂණ මුදල් ගෙවීම ආදිය සඳහන් කල හැකිය. තවද කෝප් රක්ෂණ සමාගමේ අනුබද්ධිත නියෝජිතයෙකු ලෙස ග්‍රාමිය බැංකුව සේවා සැපයීම නිරන්තරයෙන් සිදුකරනු ලබයි.

ඉන්ධන පිරවුම් හල් මඟින් සියලුම වාහන සඳහා අවශ්‍ය පෙට්‍රල්, සුපර් පෙට්‍රල්, ඩීසල්, සුපර් ඩීසල්, ඔයිල් වර්ග සහ ලිහිසිතෙල් වර්ග සැපයීම සිදුකරනු ලබන අතර, රාජ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරිව රාජ්‍ය ආයතන සඳහා ණය ක්‍රමය යටතේ ඉන්ධන නිකුත් කිරීම තුළින් වයඹ පළාතේ පිහිටා ඇති සමූපකාර ඉන්ධන පිරවුම් හල් අතරින් කීර්තියක් අත්පත් කර ගැනීමට සමත්ව තිබේ.

පාරිභෝගික සේවා අංශය යටතේ ඕනෑම වේලාවක රජයේ පාලන මිළ යටතේ අලෙවි වන සියලුම පාරිභෝගික භාණ්ඩ කෝප්සිටි ජාලය මඟින් පාරිභෝගික වෙත ලබා ගැනීමට හැකියාව තිබේ.

සභාපති තුමන්ගේ නව සංකල්පයක් පෙර දැරි කරගෙන ලබන්නාවූ සිංහල හින්දු අලුත් අවුරුදු උදාව නිමිති කරගෙන සාමාජිකයින් සඳහා ග්‍රාමිය බැංකුව මඟින් ණය පදනම යටතේ රුපියල් දස දහසක් වටිනා බඩු මල්ලක් ලබා දීමට විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙන අතර, "අවුරුදු පොළ,, වැඩසටහන තුළින් දිළිදු පාරිභෝගික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් රුපියල් දහසක් වටිනා වියළි සළාක මල්ලක් අලෙවි කිරීම ආරම්භ කර තිබේ.

පුත්තලම විවිධ සේවා සමූපතකාර සමිතිය මඟින් සිව් දෙස සිසාරා ව්‍යාප්ත කර ඇති අයඩීන් මිශ්‍ර පිරිපහදු කල කුඩු ලුණු අලෙවි ව්‍යාපෘතිය සහ බෝතල් කල පිරිසිදු පානිය ජලය පාරිභෝගික සැමට සහනදායි පහසු මිළට ලුණු මිළදී ගැනීමේ හැකියාව සලසා ඇති අතර, මේ වන විට ලක්මී සමාගමේ බලයලත් අලෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කරන මොවුන් පුත්තලම මූලික රෝහලේ නේවාසික රෝගීන් සඳහා උදේ, දිවා, රාත්‍රි ලබා දෙන ආහාර සඳහා අවශ්‍ය වියළි ආහාර සහ කුළුබඩු ඇතුළු මස්, මාළු, බිත්තර, එළවලු ලබා දීමේ වැඩසටහනට සෘජු දායකත්වය දෛනිකව ලබා දෙමින් තිබේ.

තවද, පුත්තලමේ පිහිටා ඇති සියලුම රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සැපයීමේ කාර්ය මෙන්ම පුත්තලම මූලික රෝහල සහ පුත්තලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ජල නළ පද්ධති, විදුලි බල පද්ධති නඩත්තුව සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය නිසැකවම ලබා දෙන්නේද පුත්තලම විවිධ සේවා සමූපකාර සමිතිය මඟිනි.

මේ සියල්ල අභිබවමින් සමාජ සත්කාරක සහ සමාජ සුභසාධන වැඩසටහන් වලදී ප්‍රමුඛත්වයක් දරන රාජ්‍ය ආයතනයක් ලෙස වගකීම් එකහෙලා ඉටුකරන මොවුන් ප්‍රදේශයේ දිළිඳු පවුල් වල දරුවන් ඉලක්ක කර ගනිමින් නොමිලේ අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් ස්ථාපිත කර ඇති පුත්තලම විවිධ සේවා සමූපකාර සමිතියේ ශ්‍රී රාහුල පෙර පාසල මඟින් සෑම ළමයෙක් සඳහාම නොමිලේ නිළ ඇඳුම්, සපත්තු, පොත්, පොත් බෑග් සහ අනෙකුත් උපකරණ ලබා දී ඔවුන්ගේ නැණස පෑදීමට විශේෂ පුහුණුව ලත් ගුරුවරියක් සහ ගුරු සහයක වරියකගේ සේවාව ලබා දීමට කටයුතු කර තිබේ. එකී පෙර පාසලේ මේ වන විට නොමිලේ දරුවන් 60ට ආසන්න ප්‍රමාණයක් අධ්‍යාපන කටයුතු වල නියැලේ.

තවද සීමා සහිත පුත්තලම විවිධ සේවා සමිතියේ සමාන්‍යාධිකාරි වරයෙකු ලෙස වසර ගණනාවක් සේවයේ නියතුව 2018 වසරේදී දිවංගත වූ වසන්ත කුමාර විජේසූරිය මහතාගේ දරුවන්ගේ අධ්‍යාපනය නඟාසිටුවීම පිණිස වයඹ පළාතේ සමූපකාර සමිති 22ක් ඒකාබද්ධවී වසන්ත විජේසූරිය අරමුදල නමින් පුත්තලම ග්‍රාමිය බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කර එමඟින් මාසිකව ලැබන පොලී අනුපාතය සිය දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා ලබා දීමට ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ.

තවද, ඕනෑම අපදා තත්ත්වයකිදී රජයේ නියෝජිත ආයතනක් ලෙස මහජනතාව වෙනුවෙන් සහන සැලසීමට පසුහට නොවන මොවුන් ඔවුන්ට අවශ්‍ය වියළි සලාක, පිසූ ආහාර සහ සෞඛ්‍ය ඇතුළු ඔවුන්ගේ යටිතල පහසුකම් සැපයීමට අමිල මෙහෙවරක් කරනු ලබයි.

මෑත යුගයේදී අඳුරු දේශාපලනයෙන් වැසී ගිය පාරිභෝගිකයා සහ සමූපකාරය අතර තිබූ දුරස්ථ භාවයට විරාමයක් තබමින් වළපල්ලට වැටුන සමූපකාරයට ජීවයක් දෙමින් දිනෙන් දින දියුණු වන තරඟකාරී ව්‍යාපාරික ලෝකයත් සමඟ උරෙන් උර ගැටී ව්‍යාපාරික ලොවේ කිරුළ දරණට පාරිභෝගිකයා එක්ක අත්වැල් බැද ගෙන සනාථ සෙනෙහසින් නවමු ලොවක් වෙත පා තබන සීමා සහිත පුත්තලම විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපති තුමණ් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට "දිනමිණ,, අපගේ ප්‍රාර්ථනය දිනෙන් දින දියුණුවට පත්වෙමින් පාරිභෝගිකයාට සහනයක් සැලසීමට හැකි වේවා යන්නයි.

සටහන සේයා රූ
වනාතවිල්ලුව සමූහ
කේ.ප්‍රියංකර කළුපහන



සම්මානය









කාර්ය මණ්ඩලය









# අඳුර මැඩලූ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව











ටිපර් රථ රියදුරන් සහ රිය සහයකවරු





ප්‍රාදේශීය සභා ස්ථාපිත කිරිමට ප්‍රථම ප්‍රාදේශිය සංවර්ධනය අරමුණු කොටගෙන විවිධ යාන්ත්‍රණ පැවතිනි. මෙහිදි රාජ්‍ය පාලන සමය තුළ ප්‍රාදේශිය සංවර්ධනය සඳහා ගම්සභා ක්‍රමය ක්‍රියාත්මක වු බවට මහාවංශය,සෙල්ලිපි, ලෙන් ලිපි, ටැම් ලිපි, රොබට් නොක්ස් වාර්තා සාක්ෂි සපයයි.

පසුව යටත් විජිත අවධිය තුළ ඩොනමෝර් සහ සොල්බරි යෝජනා තුළ ප්‍රාදේශිය සංවර්ධනය අරමුණු කොටගෙන විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

අනතුරුව (1948) නිදහසින් පසු මෙරට ග්‍රාමීය හා නාගරික අංශ අතර පවතින දැඩි ආර්ථික අසමතුලිතතාවය තුරන් කිරීම සහ ග්‍රාමීය ප්‍රාදේශිය ඌණ සංවර්ධනයේ අසමානතාව අවම කිරීම සඳහා විවිධ සංවර්ධන ප්‍රතිපත්ති පදනම් කොටගත් උත්සාහයන් දරනු ලැබිය.

නමුත් රජය විසින් සංවර්ධනය සඳහා මෙසේ සැලසුම් සකස් කළද සැලසුම් සම්පාදන ක්‍රියාවලිය හා ආර්ථික තිරණ ගැනිම අතර සබඳතාවයන් නොමැතිකම තුළ මෙම සංවර්ධන සැලසුම් අසාර්ථක විය.

අනතුරුව පසුගාමී සංවර්ධනය සහ සංවර්ධන ප්‍රතිඵල අසමාන ලෙස බෙදීයාම සිදුවන්නේ මධ්‍යගත පාලන සංවර්ධන තුළින් හා මෙම මධ්‍යගත ආර්ථික සැලසුම්කරණය හා රාජ්‍ය මැදිහත් වීම ජාතික සංවර්ධන දෘෂ්ටියකින් සිදුවන අතර එය ක්‍රියාත්මක වීමේදී නාගරිකත්වයට පක්ෂපාති බවක් දක්වන බව පැහැදිලිවු බැවින් ග්‍රාමීය මට්ටමේ සහභාගිත්වය ලබා ගැනීමේ හා සර්ව ආර්ථික අසමතුලිතතාවයන් නැති කිරීම සඳහා විමධ්‍යගතකරණ ලද සංවර්ධන වැඩසටහන් 1970 දශකයේදී රජය විසින් හඳුන්වා දෙන ලදී. එවැනි වැඩසටහන් අතර ප්‍රාදේශිය සංවර්ධන මණ්ඩල, දිසා දේශපාලන අධිකාරී ක්‍රමය සහ විමධ්‍යගත අය වැය වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් අමාත්‍ය ක්‍රමය දිස්ත්‍රික් සංවර්ධන සභා වැඩසටහන් යනාදිය ප්‍රමුඛතාවක් ගනු ලැබේ. නමුත් මෙහිදී 1987 දී අංක 15 දරන ප්‍රාදේශිය පරිපාලන හා සංවර්ධන සම්බන්ධයෙන් ගත් වඩා ප්‍රමුඛතම වැඩසටහන ලෙස ප්‍රාදේශිය සභාව හැඳින්විය හැකිය. මෙහිදි ආණ්ඩුවේ බලතල වලින් සෑහෙන ප්‍රමාණයක් මධ්‍යයේ සිට පරිධිය දක්වා පුළුල් විකාශයක් සනිටුහන් විය.

එයින් පසුව ලංකාවේ සෑම අස්සක් මුල්ලක් පාසාම සිව් දෙස සිසිරා ප්‍රාදේශිය සභා ස්ථාපිත වීමත් සමඟ ග්‍රාමිය ජනතාවගේ සුකවිහරනය වෙනුවෙන් වගකීමෙන් බැඳී ජනතා මෙහෙවරක පෙරටුගාමිත්වය සිය සභාවට පැවරිණි.

අද අප කතා බහට ලක් කරනු ලබන්නේ එසේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් නිරන්තරයෙන් ඇප කැප වූ යෝධ සංවර්ධනයේ අරුණළු කිරණ විහිදුවාලන පුත්තලම දිස්ත්‍රික්කයට අයත් වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාව පිළිබඳවය,

වර්ග කිලෝ මීටර් 710ක භූමි වපසරියකින් සමන්විත වනාතවිල්ලුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය එක් පසෙකින් රමණීය මී ඔයෙන්ද තවත් පසෙකින් විල්පත්තුව ජාතික වනෝද්‍යානයටද මායිම්ව පිහිටා තිබේ.

වනාතවිල්ලුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජීවත් වන බහුතරයක් සිංහල. දෙමළ, මුස්ලිම් ලෙස බහු මිශ්‍ර සමාජයකට නෑගම් කියන මොවුන්ගේ ප්‍රධාන ජීවිකාව ලෙස කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, කජු කර්මාන්තය ආදි තමන්ටම අවේණික රැකියා වල නිරත වෙති.

මොවුන්ගේ සමාජීය, ආර්ථික, සංස්කෘතික මෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපනය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් නගා සිටුවීමට නිරායාසයෙන්ම වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාව ඇප කැප වී කටයුතු කරනු ලබන්නේ වත්මන් සභාපති දේශමාණ්‍ය එම්.එම්. සමන්ත මුණසිංහ මහතා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ පූර්ණ දායකත්වය පෙරටු කර ගනිමිනි.

ප්‍රදේශයේ ජීවත් වන මහ ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම තුළින් ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාව විසින් වනාතවිල්ලුව පුරවරයට යෝධ සංවර්ධනය එක්කාසු කර හමාරය.

ඒ අනුව ආර්.ඕ. තාක්ෂණයෙන් යුත් ලක්ෂ තිහක් පමණ වටිනා ජල පිරිපහදු කට්ටලයක් කරතිව් දකුණ වසමේ ප්‍රතිලාභි පවුල් 300ක් ඉලක්ක කරමින් ඉදිකර ඔවුන්ගේ පානිය ජල අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කිරීම තුළින් සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ප්‍රජාවක් බිහිකරලීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ බවට පත්ව තිබේ.

තවද සභාවට අදායම් මාර්ගයක් ලෙස දැනට අරුවක්කාඩුව හුණු ගල් නිධියේ සිට හුණු ගල් ප්‍රවාහනය සඳහා සභාව සතු ටිපර් රථ වලට අමතරව ලක්ෂ 234ක වටිනාකමකින් යුත් නව ටිපර් රථ හතරක් ජන සතු කර ඇති මොවුන් අමතරව ට්‍රැක්ටර් රථයක් හා ටේලර් තුනක් ඝණ අප ද්‍රව්‍ය කළමණාකරණය සහ නිසි ලෙස කසළ බැහැර කරමින් පිරිසිදු වටපිටාවක් නිර්මාණය කිරීමේ වැඩසටහනට දායකත්වය සපයනු ලැබේ.

පවුල් 1600ට පමණ සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලැබෙන ආකාරයේ ලක්ෂ 15ට ආසන්න මුදලක් වැයකර ඉදිකර ඇති වට්ටකන්ඩල් මහජන පුස්තකාලය තුළින් ප්‍රදේශයේ දූ දරුවන්ගේ නැණස පෑදීමට දැඩි ප්‍රයත්නයක් දැරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ බවට පත්ව තිබේ.

තවද, කැඩී බිඳී ගිය සියලුම වැව් පිළිසකර කරමින් කෘෂි කර්මාන්තය හා මිරිදිය ධීවර කර්මාන්තය නගා සිටුවීමට ඇප කැප වූ මොවුන් මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව රැකියාවේ නියැලෙන ධීවරයින්ගේ ආර්ථිකය ශක්තිමත් කරනු පිණිස අවශ්‍ය ධීවර ආම්පන්න සහ මත්ස්‍ය පැටව් වැව් වලට මුදා හැරීම සිදු කරනු ලැබේ.

වසමට ගෙයක් යන තේමාව යටතේ හිසට සෙවණක් නැතිව ලතවන දිළිඳු ජනතාව ඉලක්ක කර ගනිමින් අධියර දෙකක් යටතේ නව නිවාස 32ක් රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් ලබා දීම සිදු කෙරුණි.

කාපට් මාර්ග දස ලක්ෂයේ වැඩසටහන යටතේ ග්‍රාමිය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුළින් මිදිවත්ත මාර්ගයේ කිලෝ මීටර් 4ක් කල්අඩිය මාර්ගය කිලෝ මීටර් පහකට ආසන්න දුරක් කාපට් අතුරා ප්‍රතිසංස්කරණ කිරීම සඳහා ලක්ෂ 890ක පිරිවැයක් යොදා වැඩ කටයුතු ආරම්භ කර තබේ.



අමාත්‍ය සනත් නිශාන්ත



අමාත්‍ය පියංකර ජයරත්න



චින්තක අමල් මායාදුන්න (පා.මන්ත්‍රි)

සමාජ සවි බල ගැන්වීම් වැඩසටහන යටතේ ප්‍රදේශයේ සෑම වසමක පිහිටා ඇති වැඩිහිටි සමිති සඳහා පුටු 50 බැගින් ගබා දීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මකව කර ඇති අතර, තෝරා ගත් වැඩිහිටි සමිතිවල සාමාජිකයින් සෑම මසකම දීර්ඝ හා කෙටි දුර චාරිකා සඳහා යොමු කරනු ලැබේ.

සභාපති තුමන්ගේ නව සංකල්පයක් පෙරදැරිව “අධ්‍යාපනය නඟා සිටුවීමට,, අත්වැළක් ලෙස හෙට ලොව දිනන දරුවන් වෙනුවෙන් වව්චර් පත් ලබා දීමට කටයුතු කර තිබේ.

ප්‍රදේශයේ විරැකියාවෙන් පෙළෙන දිළිදු පවුල් වල තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් රැකියා දස ලක්ෂය වැඩසටහන යටතේ රැකියා 100ට ආසන්න ප්‍රමාණයක් වනාතවිල්ලුවෙන් වරම් ලැබීමට අවශ්‍ය භාග්‍ය උදාකර දී තිබේ.

“සපිරිගම,, ව්‍යාපෘතිය යටතේ සෑම වසමකටම රුපියල් ලක්ෂ 20 බැගින් මූලම්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් ප්‍රදේශයේ සංවර්ධනයට සෘජු දායකත්වයක් ලබා දී ඇති මොවුන් පාසල් වල වැසිකිළි පද්ධති නවීකරණය කරමින් දරුවන්ගේ සෞඛ්‍ය ඇතුළු යටිතල පහසුකම් නගාසිටුවීම උදෙසා වැසිකිළි විශාල ප්‍රමාණයක් අලුතින් ඉදිකර දීමට කටයුතු කර තිබේ.

සෑම මසකම මෘත සායන වල ගැබිණි මාතාවන් සහ ළමුන් ඉලක්ක කර ගනිමින් සමබල පෝෂදායි ආහාර වේලක් ලබා දෙමින් ඔවුන්ගේ පෝෂණය සුරක්ෂා කිරිමට කටයුතු සම්පාදනය කරන මොවුන් පාසල් ළමුන් උදෙසා ආකල්ප හා දැණුම වර්ධනය කිරීමේ විනෝදාස්වාදමය උපදේශණ වැඩසටහන් මාලවක් දියත් කරනු ලැබේ.

පෙර පාසල් ළමුන්ගේ දැණුම සහ කුසලතා ආකල්ප හැකියා වර්ධනය කිරීම සදහා වැඩසහන් රැසක් ක්‍රියාත්මක කල මොවුන් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සහ දැණුවත් කිරීමේ විශේෂිත වූ අධ්‍යාපනික වැඩසටහනක් ප්‍රදේශය පුරා ක්‍රියාත්මකව පවතී.

“නිල්ල පිරුණු හෙටක්,, තේමා යටතේ රුක් රෝපණ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් ප්‍රදේශයේ පැළ රෝපණය කිරීමේ ක්‍රියාන්විතය ආරම්භ කි තිබේ.

ලක්ෂ 438ක ප්‍රතිපාදන යටතේ භූගත ජල ටැංකි පද්ධතියකින් සමන්විත පානිය ජල සැපයුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන ආරම්භ කර එහි වැඩකටයුතු සිදුකිරිමට යෝජිතව තිබේ. තවද මංගලපුර ප්‍රදේශයේ ලීටර් 20000ක ධාරිතාවකින් යුත් ජල ටැංකි ඉදිකර ප්‍රදේශයේ පානිය ජල අවශ්‍යතාවය සපුරාලීමට වැඩසහන් රැසක් ක්‍රියාත්මක කර තිබේ.

අමතරව වනාතවිල්ලුව ළමා උද්‍යානය පිළිසකර කර ළමයින්ට සොඳුරු තෝතැන්නක් බවට ළමා උද්‍යානය පත් කර ඇති අතර, සෑම වසරක් පාසාම ලේ දන් දීමේ විශේෂ වැඩහනක් ප්‍රදේශයේ අඛණ්ඩව සංවිධානය කරනු ලැබේ.

අඩු ආදායම් ලාභි පවුල් වල දරු දැරියන් ඉලක්ක කර ගනිමින් සාමාන්‍ය පෙළ හා උසස් පෙල විෂයධාරා සඳහා සම්මන්ත්‍රණ වැඩසටන් මාලාවක් ක්‍රියාත්මක කර තිබේ.

කලා ඔය දිය නෑමේ ස්ථානයට පැමිණෙ දෙස් විදෙස් සංචාරකයින්ගේ පහසුව සඳහා ලක්ෂ 40ක මූලම්‍ය පතිපාදන යටතේ කලාඔය නාන තොටුපල සංවර්ධය කිරීම සහ කුට්ටිගල් ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම මෙන්ම වනාතවිල්ලුව වාහන සේවා මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම සිදු කරනු ලැබේ.

දෙස් විදෙස් සංචාරක ආකර්ශණය දිනූ ගගේවාඩිය සංචාරක පුරවරය තුළට පැමාණෙ සංචාකරයින්ට අධික්ෂණ මධ්‍යස්ථානයක් රුපියල් ලක්ෂ හැටකට ආසන්න මුදලක් වැයකර ඉදකිරීමට කටයුතු සම්පාදනය කර ඇති වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාව එයට අමතරව අඩු ආදායම් ලාභි නිවාස නොමැති තැනැත්තන් සඳහා එළුවන්කුලම ප්‍රදේශයෙන් නිවාස 100ක් සහ මංගලපුර නිවාස 25ක්, මොරපතාව නිවාස 25කින් සමන්විත විශේෂිත නිවාස යෝජනා ක්‍රමයක් දියත් කර තිබේ.

සභාපති තුමන් විසින් ප්‍රදේශයේ සෑම විහාරස්ථානයකම ඉදිකිරීම් කටයුතු සඳහා මූලම්‍ය සහ අමුද්‍රව්‍ය ලබා දීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, මල්විල විහාරය ඇතුළු විහාරස්ථාන තුනක් සඳහා ලක්ෂ තිහ බැගින් ජල ටැංකි තුනක් පරිත්‍යාග කර තිබේ.

ප්‍රදේශයේ තරුණ තරුණියන් ඉලක්ක කර ගිනිමින් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය නංවාලීමේ අරමුණින් වනාවිල්ලුවේ අත්පංදු ක්‍රීඩාංගණයක්, ශරීර සුවතා මධ්‍යස්ථානයක්, ඇවිදීමේ මංතීරුවක් ඇතුළු මංගලපුර ප්‍රදේශයට අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක් ඉදිකර දීමට කටයුතු සිදුකර ඇති අතර, එල්ලේ ක්‍රීඩාව හා මලල ක්‍රීඩාව නගා සිටුවීමට අවශ්‍ය උපදෙස් හා පුහුණුව ලබා දෙමින් තිබේ.

ග්‍රාමිය කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සදහා යෝජිත අංග සම්පූර්ණ ඇඟළුම් කර්මාන්ත ශාලව ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින මොවුන් දැනට වේවැල් ආශ්‍රිත අත්කම් නිර්මාණයේ යෙදෙන ශිල්පීන්ගේ කුසලතා වර්ධනය කිරීම තුළින් අවශ්‍ය ආර්ථිකය නගා සිටුවීම සඳහා එළුවන්කුලම රාල්මඩුව ප්‍රදේශයේ ආරම්භ කර ඇති වේවැල් ගම්මානය තුළින් මේ වන විට රටේ වේවැල් නිෂ්පාදනයට සෘජු දායකත්වයක් ලබා දී තිබේ.

අභ්‍යාසලාභින් සඳහා ජපන් රැකියා ලබා දීම තුළින් ග්‍රමිය ජනතාව ජාත්‍යන්තරය දක්වා ගෙන යාමේ වැඩසටහන මේ තුළින් නිර්මාණය කෙරේ. කිරි ගව, කජු, රෙදි ආශ්‍රිත ස්වයං රැකියාවේ යෙදෙන කාන්තාවන් දිරිගන්වමින් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපුරා ලීම ඇතුළු ප්‍රදේශයේ සංවර්ධන වැඩසටහන් අතරින් වීථි ලාම්පු අලුත් වැඩියාව සහ අලුතින් සවි කිරීම, බොක්කු ඉදිකිරීම කාණු පද්ධති පිළිසකර කිරීම, ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම ආදි මහජන සේවා අඛණ්ඩව පුරා වසර ගණනාවක් සිදුකරන වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාවේ සභාපති තුමන් විසින් ඔහුගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් මේ වන විට අඩු ආදායම් ලාභි දිළිදු පවුල් ඉලක් කරගනිමින් ව්‍යාප්ත කර ඇති සෙවිළි තහඩු ලබා දීමේ වැඩසටහන තුළින් මේ වන විට ප්‍රතිලාභි පවුල් 100ක් සුදුසුකම් ලබා තිබේ.

වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාවේ වත්මන් සභාපති දේශමාණ්‍ය එම්.එම්. සමන්ත මුණසිංහ මහාතා ප්‍රමුඛ උප සභාපති එස්.එච්.එම්.ඉබ්‍රාහිම්, මන්ත්‍රීවරුන් වන කේ.එල්. බී. ඇනස්ටන්, ඩී.එම්.ජී.කේ.බණ්ඩාර, ජී.ජී.බී.නන්දසිරි, ඒ.එම්.බී. ගිහාන්, එස්.පී.එස්.කේ.කුමාර, එච්.පී.සිල්වා, ඒ.ආර්.ඒ.සමාන්, එන්.පී.ඒ.මුනාෆ්, (නැසී ගිය) එච්.එච්. එම්. නෆීල්, ඒ.එම්. අනස්දීන් ඩබ්ලිව්.ඩබ්ලිව්. ෆැන්සිස්, ඩී.එම්.ආර්.මංගලිකා, එම්.ඒ.කේ.ඒ. චතුරංග යන මහත්ම මහත්මියන් සහ වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාවේ සමස්ථ කර්ය මණ්ඩලය 92කින් සමන්විතවේ.

ශ්‍රි ලංකාවේ අඩු ආදායම් ලාභි ප්‍රාදේශිය සභා අතිරින් අති දුෂ්කර ප්‍රාදේ සභා බල ප්‍රදේශයක් වූ වනාතවිල්ලුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය වෙලා ගෙන ඇත්තා වූ අඳුරු අප්‍රසන්න වලාපටලය දියකර පාකර හරිමින් ලහිරු මඬලේ මිණි කිරණෙන් ඒකාලෝකමත් කිරීමට අපමණ වෙහෙසක් දරමින් ඇපකැපවන වත්මන් රජයේ ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය පියංකර ජයරත්න, පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි චින්තක අමල් මායාදුන්න යන අය මේ යෝධ සංවර්ධනයේ නියමුවන් ලෙස මසමාණවක පුරපුරක් බිහිකරලීමේ උදාතර ජාතික මෙහෙවරක නියතු වන මොවුන්ගේ ශ්‍රමාභිනන්දනය අගය කල යුතුව තිබේ.



එම්.එම්.සමන්ත මුණසිංහ (සභාපති)



එස්.එච්.එම්. ඉබ්‍රාහිම් (උප සභාපති)



කේ.එල්.බී. ඇනස්ටන්



ඩී.එම්.ජී.කේ.බණ්ඩාර



ජී.ජී.බී.නන්දසිරි



ඒ.එම්.බී.ගිහාන්



එස්.පී.එස්.කේ.කුමාර



එච්.පී.සිල්වා



ඒ.ආර්.ඒ.සමාන්



එච්.එම්.අයි.බී. හේරත් (ලේකම්)



ප්‍රදීපන්



එම්.ඒ.කේ.ඒ. චතුරංග



ඩී.එම්.ආර්.මංගලිකා



ඩබ්ලිව්.ඩබ්ලිව්.ෆැන්සිස්



ඒ.එම්.අනස්දීන්



එච්.එච්.එම්.නෆීල්

සටහන සේයා රූ
වනාතවිල්ලුව සමූහ
කේ.ප්‍රියංකර කළුපහන

# OPPO වෙතින් අලුත් අවුරුද්දට නව ගීතයක්



ශ්‍රී ලංකාවේ ජනප්‍රියම ජංගම දුරකථන හා උපාංග සන්නාමය වන OPPO මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් නවතම ගීතයක් හඳුන්වාදී තිබේ. මෙය ගායනා කරනු ලබන්නේ OPPO සන්නාම තානාපතිනියක සහ The Voice වැඩසටහනේ පුහුණුකාරිනියක වන ජනප්‍රිය ගායිකා උමාරියා සිංහවංශ විසිනි. මීට අමතරව ජනප්‍රිය රංගන ශිල්පී හා ගායක ගයාන් ගුණවර්ධන සහ නර්තන ශිල්පී රමෝද් මාලක ප්‍රමුඛ Cool Steps නර්තන කණ්ඩායමද මේ ගීතයට දායක වී ඇත.

සුන්දර ගැමි පරිසරයක රූපගත කර ඇති මේ ගීතයේ රූප රචනය තුළ සාම්ප්‍රදායික අවුරුදු චාරිත්‍ර වාරිත්‍රද නිරූපණය කෙරේ. මෑතකදී වෙළෙඳපොළට හඳුන්වා දීමෙන් අනතුරුව පාරිභෝගිකයන් අතර ඉක්මනින් ජනප්‍රිය වූ, අලුත් අවුරුදු කාලයේදී විශේෂ දීමනාවන්ද සමඟ මිලදීගත හැකි OPPO F19 Pro දුරකථන මාදිලියද මේ රූප රචනය තුළදී දැකගත හැක.

"මේ ගීතයත් සමඟ අපට ශ්‍රී ලාංකික සංස්කෘතියට පෙරටක් වඩා සමීප වීමට අවස්ථාව උදා වුණා. ඒ වගේම අලුත් අවුරුද්දේ සැබෑ අරුත අනුව යමින් මේ මස 13 වැනිදා (හෙට) දක්වා ක්‍රියාත්මක වන 'එරබදු වාසි' ප්‍රවර්ධන වැඩසටහනත්, 18වැනිදා දක්වා ක්‍රියාත්මක වන 'OPPO සර්විස් වාසි' ප්‍රවර්ධන වැඩසටහනත් හඳුන්වා දීමට අප කටයුතු කර තිබෙනවා." OPPO Sri Lanka ප්‍රධාන විධායක නිලධාරී බොබ් ලී මහතා පැවසී ය.

"සුවිශේෂී තරුණ කලාකරුවන් පිරිසක් සමඟ වැඩ කිරීමට ලැබීම මට අපූරු අත්දැකීමක් වුණා. රටේ සංස්කෘතියට තව තවත් සමීප වීමට OPPO දරන මේ උත්සාහය අගය කළ යුතුයි." උමාරියා සිංහවංශ පැවසුවා ය.

"OPPO වටිනාකම්වලට සහ F19 Pro මාදිලියේ සුවිශේෂීත්වයන්ට සමගාමීව අපගේ නිර්මාණශීලීත්වයට පූර්ණ නිදහස දීමට OPPO කටයුතු කළා. මේ ව්‍යාපෘතියට දායක වීමට ලැබීම මට මහත් සතුටක්." ජනප්‍රිය රංගන ශිල්පී හා ගායක ගයාන් ගුණවර්ධන පැවසීය.

# ආයතනික තාක්ෂණ විසඳුම් දෙන්න Softlogic - Huawei එක්වෙයි




ලොව ප්‍රමුඛතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සැපයුම්කරු වන Huawei (හුවාවේ) සහ සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී (Softlogic Holdings PLC) හි අනුබද්ධ සමාගමක් වන, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මෘදුකාංග සහ දෘඩාංග විසඳුම් සම්පාදකයකු ලෙස නම් දරා ඇති සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස්(Softlogic Information Technolgies) පුද්ගලික සමාගම සමඟ, නව්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වන එන්ටර්ප්‍රයිස් සොලියුෂන්ස් (Huawei Enterprise Solutions), ක්ලවුඩ් (Cloud) සහ පරිගණක භාවිත කෘතීම බුද්ධි (Artificial Intelligence) විසඳුම් ශ්‍රී ලංකා වෙළෙඳපොළට හඳුන්වා දීමට සේවා සැපයීමේ හවුල්කාරිත්වයක් මෑතකදී ප්‍රකාශයට පත් කළේය.

ඩිජිටල් ආර්ථිකය වර්තමානයේ රටේ සහ කර්මාන්තවල වර්ධනයේ ප්‍රධාන සාධකයක් ලෙස ස්ථිරව පිහිටුවා ඇති අතර නූතන ආර්ථිකයට ඩිජිටල් තාක්ෂණයන්හි වැදගත්කම අවිවාදිතය. දශක 3කට පමණ පෙර තොරතුරු තාක්ෂණ සමාගමක් ලෙස ආරම්භ වූ සොෆ්ට්ලොජික් සමාගම තාක්ෂණික යටිතල පහසුකම් නවීකරණය සඳහා අද රටේ ප්‍රමුඛ පෙළේ ස්ථානයක නම් දරයි. ශ්‍රී ලංකාවේ දේශීය ව්‍යාපාර වල වර්ධනය ළඟා කර ගැනීම සඳහා අවැසි උපාය මාර්ග සැකසීමට උපකාරී වන තාක්ෂණය කළමනාකරණය කිරීම සඳහා නව්‍ය ක්‍රම සොයා ගැනීමට මෙමගින් වන්නේ මහත් සේවයකි.

"පසුගිය දශකය තුළ බොහෝ තාක්ෂණික විප්ලව වුණා. අන්තර්ජාල විප්ලවය, ජංගම දුරකථන විප්ලවය සහ සමාජ මාධ්‍ය විප්ලවය මින් කිහිපයක්. කෙසේ වෙතත් මේ වෙනස්කම්වලට අනුගත නොවූ සංවිධාන රාශියක් ශ්‍රී ලංකාවේ තිබෙනවා. සොෆ්ට්ලොජික්හි අප උත්සාහ කරන්නේ ඩිජිටල්කරණයට පරිවර්තනය කිරීමට ඔවුන්ට උපකාර කිරීමටයි. " සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස්හි ප්‍රධාන විධායක / අධ්‍යක්ෂ රොෂාන් රසූල් මහතා පැවසීය.

මේ අවස්ථාවට සහභාගි වෙමින් Huawei ශ්‍රී ලංකා ප්‍රධාන විධායක නිලධාරි ලියැන් යී මහතා මෙසේ පැවසීය, "සොෆ්ට්ලොජික් සමඟ ඇති කර ගත් මේ සම්බන්ධතාවය මඟින් ශ්‍රී ලංකා වෙළෙඳපොළට අපගේ නව්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම්, උදාහරණ ලෙස ක්ලවුඩ් තාක්ෂණය දීමට අපට හැකි වීම ඉතා වැදගත්. මේ සඳහා දුරකථන සේවා මෙන්ම ආයතනික ජාල, උපාංග සහ ක්ලවුඩ් සේවා සහ සබැඳි විසඳුම් ලෙස අද්විතීය තරගකාරි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) කළඹක් Huawei සතුයි. "

# Lanka SSL සමාගමට ජාතික රන් සම්මානයක්




ලංකා ස්පෙෂල් ස්ටීල් සමාගම (Lanka SSL) වයර් අලෙවි ක්ෂේත්‍රයෙහි විශ්වාසවන්ත නාමයක් වශයෙන් දීර්ඝ කාලීන පාරිභෝගික විශ්වාසය දිනා ගෙන සිටින අතර, ඊ. බී. ක්‍රීසි ඇන්ඩ් කොම්පැණි පීඑල්සී සමූහයෙහි සාමාජික සමාගමකි. පසුගියදා පැවති CNCI Achiever Awards 2020 සම්මාන උලෙළෙහිදී නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි Extra Large තරග අංශයෙන් ජාතික රන් සම්මානය (National Gold Award) දිනාගන්නට Lanka SSL සමාගම සමත් විය.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීම හා ප්‍රවර්ධනය, ඵලදායීතාව, වර්ධනය හා ක්‍රමෝපාය, සමීක්ෂණ හා සංවර්ධන ක්‍රියාවලින්, සේවක සුබසාධනය සහ සමාජයට මෙන්ම ආර්ථිකයට දෙන දායකත්වයන් ඇතුළු තවත් බොහෝ කරුණු මේ සම්මාන උලෙළෙහි සම්මාන නිර්දේශයන් සම්බන්ධයෙන් සලකා බලයි.

"මේ වර්ෂයේ CNCI Achiever Awards සම්මාන උලෙළෙහිදී වැදගත්ම සම්මානයන් දෙකක් ජයග්‍රහණය කරන්නට හැකි වීම ගැන අප ඉතා ආඩම්බරයට පත් වෙනවා. මීට පෙර අපගේ සමාගම කුසලතා සම්මානයකින් පිදුම් ලැබූ අතර, මෙවර අප හිමි කර ගත් ජාතික මට්ටමේ ඉහළම රන් සම්මානය එයින් බොහෝ ඉදිරියට ගිය සාර්ථකත්වයක් පෙන්නුම් කරනවා. ඉලක්කගත සැලසුම් අනුව කටයුතු කරමින් සාර්ථක ව්‍යාපාර ප්‍රතිඵල පෙන්නුම් කිරීමට අප සතු දක්ෂතාවයයි. මේ ජයග්‍රහණයන් පසුපස සිටින විශ්වාසනීය පාරිභෝගික පිරිස හා ව්‍යාපාරික පාර්ශ්වකරුවන් සියලු දෙනා වෙත ස්තූතිය පළ කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා." Lanka SSL සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රවීන් ද සිල්වා මහතා පැවසීය.

# පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙතින් සූර්ය පැනල රක්ෂණාවරණයක්



තිරසර හා පරිසර හිතකාමී බලශක්ති නිෂ්පාදන ක්‍රමවේද දිරිගැන්වීම සඳහා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළට අත්වැලක් වීමේ අරමුණින් විශේෂ රක්ෂණාවරණයක් හඳුන්වා දීමට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජීවිත නොවන රක්ෂණ සමාගමක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම පියවර ගෙන තිබේ. මේ නව රක්ෂණාවරණය මඟින් රට පුරා නිවාස, කාර්යාල හා සූර්ය බලශක්ති උද්‍යානවල සවි කර ඇති සූර්ය පැනල සඳහා මූල්‍යමය රැකවරණයක් හිමි වේ.

මේ වන විට රටේ ගොඩනැගිලිවල සූර්ය පැනල සවි කිරීම සහ සූර්ය බලශක්ති නිෂ්පාදන භාවිතය වේගයෙන් ජනප්‍රිය වෙමින් පවතී. මේ නිෂ්පාදන සඳහා සැලකිය යුතු මුදලක් ආයෝජනය කිරීමට වන නිසා, ඒ වෙනුවෙන් මෙබඳු රක්ෂණාවරණයක් හඳුන්වා දීම බෙහෙවින් කාලෝචිත පියවරකි. තම ආයෝජනයට රටේ ප්‍රමුඛතම රක්ෂණ සමාගමක් වෙතින් රැකවරණය ලැබීම ගනුදෙනුකරුවන්ගේ සිත්වල සැහැල්ලුව ඇති කරන සාධකයක් වනු නොඅනුමානය. මූලික රක්ෂණාවරණය යටතේ ගිනි, අකුණු, කුණාටු, සුළිසුළං, ගංවතුර, භූමිකම්පා සහ හදිසි අනතුරු මෙන්ම විදුලිය හේතුවෙන් වන ගිනි ගැනීම ආදී අවස්ථාවන් හට මෙමඟින් ආවරණය ගත හැකිය. අමතර ගාස්තුවකින් තොරව තවත් අතිරේක ආවරණ හඳුන්වා දීමටද පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම සැලසුම් කර ඇති අතර, එය ගනුදෙනුකරුවන්ට බෙහෙවින් වාසිදායක වනු ඇත.




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 80-100 | 110 | 70 | 60-70 | 50-60 | - | ගෝවා | 95 |
### වාරිමාර්ග අමාත්‍යාංශය

## තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

### කන්දකැටිය වාරිමාර්ග කඳවුරෙහි ව්‍යාපෘති කළමනාකරු කාර්යාලය සඳහා වැඩිදියුණු කිරීම් කටයුතු

**ලංසු අංක : PD/TRP/Infra/06/2018**

1. වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දකැටිය වාරිමාර්ග කඳවුරෙහි ව්‍යාපෘති කළමනාකාර කාර්යාලයේ වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. අදාළ ඉදිකිරීම් කාලය මාස 3 කි.
2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගත වූ අයකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

   සීඩා ලියාපදිංචිය : C5 හෝ C6 ශ්‍රේණිය
4. කොන්ත්‍රාත් ප්‍රදානයට අවශ්‍ය සුදුසුකම් අතරට මේවාද ඇතුළත්ය. විස්තර ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.
5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කන්දකැටිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති ඉංජිනේරු - දුරකථනය/ ෆැක්ස් අංකය : 055-2245626 ඊමේල් - pdthalpitigala@gmail.com වෙතින් ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයේදී සතියේ දිනවල, 0900 පැය හා 1500 පැය අතර, කාලය තුළ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.
6. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 7500.00 ගෙවීමෙන් හා පහත ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2021.04.12 දින සිට 2021.05.03 දින දක්වා, 0900 පැය හා 1500 පැය අතර, කාලය තුළ, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක. එක් එක් කට්ටලයක් සඳහා ගෙවීම් මුදලින්ම කළ යුතුවේ.
7. ලංසු පිටපත් දෙකක් වශයෙන්, පහත සඳහන් ලිපිනයට 2021.05.04 දින 1300 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ පසුව 2021.05.04 දින 14.00 පැයට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු, දින 91 ක් දක්වා වලංගු විය යුතුය.
9. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක් කන්දකැටිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියෙහිදී, 2021.04.22 දින පෙරවරු 10.00 ට පැවැත්වීමට නියමිතය.
10. සියලුම ලංසු සමග, රුපියල් 225,000.00 වටිනා **"ලංසු ඇපකරයක්"** බැගින් තිබිය යුතුය. එම ලංසු ඇපකරය 2021.08.31 දින දක්වා වලංගු විය යුතුය.
11. යථා පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තැබූ ලංසු කවරයක බහා එහි වම් ඉහළ කෙළවරේ, **"කන්දකැටිය වාරිමාර්ග කඳවුරේ ව්‍යාපෘති කළමනාකාර කාර්යාලයේ වැඩිදියුණු කිරීම්"** සහ ලංසු අංක PD/TRP/Infra/06/2018 යනුවෙන් සඳහන් කළ යුතුය.

   ඉහතින් යොමු කළ ලිපිනය වනුයේ:

**ව්‍යාපෘති අධ්‍යක්ෂ, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය,**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව,**
**කන්දකැටිය.**
**දුරකථන / ෆැක්ස් : 055-2245626**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

N - 101

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

Item 01

Strapping Rolls for Fully Automatic Heavy Duty strapping machines - 700 Rolls

ලංසු කැඳවීමේ අවසාන දිනය : 30-04-2021 - 2.00 pm

යොමු අංකය : SCP02/NCB/08/STR/2021-9

2021-04-30 දින ප.ව. 2.00 ට ලංසු කැඳවීම අවසන් වන අතර එම වේලාවටම විවෘත කරනු ලැබේ. ලංසුවලට අදාළ ලිපිලේඛන පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සැපයීම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ. සෑම ලංසුවක් සඳහාම ආපසු නොගෙවන රු. 2,000.00 ක ගාස්තුවක් සමග ලංසු අයදුම්පතක් ඉහත සඳහන් ලංසු කැඳවීම අවසන් කරන දිනයට පෙර දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පැමිණ ලබාගත යුතුයි.

වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

**ගංගානි ලියනගේ**
**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, ඩැනිස්ටර් ද සිල්වා මාවත,**
**කොළඹ 08.**
**2021-04-12**
**දුරකථන - ෆැක්ස් - 011-2694898**
**වෙබ් අඩවිය :** www.documents.gov.lk

# පුවත්පත් නිවේදනය

## රා තැබෑරුම් රේන්ද විකිණීම - 2021/2022 වර්ෂය

## මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පුත්තලම දිස්ත්‍රික්කය

2021 ජූලි මස 01 දින සිට 2022 ජුනි මස 30 දින දක්වා, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා ටෙන්ඩර්පත් 2021.05.17 වන දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2021.04.16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2021.05.17 පෙ.ව. 10.30 | රු. 1,000/- |
| 02. | මුන්දලම | උඩප්පුව | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2021.05.17 පෙ.ව. 10.30 | රු. 1,000/- |
| 03. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2021.05.17 පෙ.ව. 10.30 | රු. 1,000/- |
| 04. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2021.05.17 පෙ.ව. 10.30 | රු. 1,000/- |

**දිනය : 2021.03.30**

**ජේ.ඒ. විජානි වසන්තිකා,**
**ප්‍රාදේශීය ලේකම්,**
**මුන්දලම.**

නිවාස හා ඉඩම්

616

ගේ දොර ඉඩකඩම්
කොළඹ
දිස්ත්‍රික්කය
විකිණීමට

වැල්ලම්පිටියේ පර්චස් 5.9 ඉඩම ලක්ෂ 18 ට විකිණීමට ඇත. අමතන්න. 0761513282. කොළඹට කි.මී. 2.5 යි. 027357

වැල්ලවත්ත ඉඩමක් විකිණීමට ඇත. නො . 145/3, ගාලුපාර, වැල්ලවත්ත ලංකා බැංකුව අසල පර්චස් 5.57 තැනිතලා ඉඩම විකිණීමට ඇත. අඩි 20 ක පිවිසුම් මාර්ගයෙන් හා නිරවුල් ඔප්පුද සහිතයි. නිවාස හා අනෙකුත් සියලුම ගොඩනැගිලි සඳහා ඉතා සුදුසු ඉඩමකි. වැඩි විස්තර සඳහා අමතන්න. ඒ. අමීර් අලි 0777636349 027782

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

## කොළඹ 05 පිහිටි, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ පවත්නා ගොඩනැගිල්ල නවීකරණය කිරීම - පියවර 1

**කොන්ත්‍රාත් අංකය : SMGJ/ADM/05/01/02**

1. මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින් පහතින් විස්තර කොට ඇති පරිදි, **කොළඹ 05 පිහිටි මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ පවත්නා ගොඩනැගිල්ල නවීකරණය කිරීම - පියවර 1** සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය (වැට් රහිතව) **රුපියල් මිලියන 25 කි.**

   අදාළ කාර්යයට, පවත්නා ගොඩනැගිල්ලේ වහල දීර්ඝ කිරීම, වහළ ස්ලැබ් ජලරෝදනය කිරීම හා අවශ්‍ය යාන්ත්‍රික හා විදුලිමය සේවා සැපයීම ද ඇතුළත්ව, පළමු මහලේ ලොබි ප්‍රදේශ හා දෙවන මහලේ ලොබි ප්‍රදේශය නවීකරණ කටයුතු සම්පූර්ණ කිරීම ඇතුළත් වේ. අදාළ කාර්යය, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශයේ එදිනෙද කටයුතුවලට අවහිරතා හා බාධා නොවන අයුරින් සංවිධානය කළ යුතු වේ. අදාළ රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනෙකුත් කාර්යාල මෙම ගොඩනැගිල්ලේ පිහිටා ඇති බැවින් නවීකරණ කටයුතු කෙරෙමින් පවත්නා අතරතුර අමාත්‍යාංශයේ කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට හැකි විය යුතු ලෙසට කටයුතු සංවිධානය කළ යුතු වේ.

   අදාළ වැඩබිම, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටා ඇත.

   අදාළ ඉදිකිරීම් කාලය **දින 84 කි**

2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගත වූ අයකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය,
   - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (සීඩා) ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ක්ෂේත්‍රයෙහි C4 හා C5 ශ්‍රේණිවල ලියාපදිංචිය සතුවිය යුතුය.
   - ලංසු මුදල **රුපියල් මිලියන 5.0** ඉක්මවන සෑම ලංසුවක් සඳහාම (පනතේ 2 වගන්තිය බලන්න) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතෙහි 8 කොටස ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ වලංගු සහතිකයක් සතුවිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානයට අවශ්‍ය සුදුසුකම් අතරට මේවාද ඇතුළත්ය.
   - ■ පසුගිය වසර පහ තුළ ඉටුකළ ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් **රුපියල් මිලියන 50 ක්** විය යුතුය.
   - ■ පසුගිය වසර පහ තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු/ උප කොන්ත්‍රාත්කරු ලෙස සමාන ස්වභාවයේ හා සංකීර්ණතාවයේ හා ව්‍යාපෘති වටිනාකම අවම වශයෙන් **රුපියල් මිලියන 25 ක්** හෝ ඊට වැඩි වටිනාකමින් යුත් ගොඩනැගිලි නවීකරණ ව්‍යාපෘතියක් සාධාරණ කාල රාමුවක් තුළ සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය.
   - ■ තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය, මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර රුපියල් මිලියන 15 කට නොඅඩු විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩි දුර විස්තර, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ - සැලසුම් (**දුරකථන - 011-2589087, ෆැක්ස් : 011-2369790, ඊමේල් smjadm@gmail.com**) වෙතින් ලබාගත හැකි අතර, **2021.04.15 දින සිට 2021.04.30 දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර,** කාලය තුළ, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

6. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් අටදහසක් (රුපියල් 8,000.00) ගෙවීමෙන් හා කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ, පරිපාලන අංශයේ පරිපාලන නිලධාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2021.04.15 දින සිට 2021.05.05 දින දක්වා, 09.00 පැය හා 15.00 පැය අතර,** කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතු වේ.

7. ලංසු, පිටපතක් සහිතව, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත, **2021.05.07 දින 14.00 පැයට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු, **2021.08.05** දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා රුපියල් තුන් ලක්ෂයක් (රුපියල් 300,000.00) වටිනා, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමට ගත්, **2021.09.02** දින දක්වා වලංගු, ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

10. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, **2021.04.28 දින 10.00** පැයට, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ, 02 වන මහලේ, සම්මන්ත්‍රණ කාමරයේදී පැවැත්වීමට නියමිත අතර, එයට පසුව වැඩබිම් චාරිකාවක් සංවිධානය කෙරේ.

    ඉහතින් යොමු කළ ලිපිනය වනුයේ :

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC),**
**මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල**

## තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන
## අරමුදල් සැපයුම - ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන OPEC අරමුදල සහ ශ්‍රී ලංකා රජය

**ණය අංක : 13170 P**

- ➢ **ශ්‍රී සුමංගල ම.ම.වි, වාරියපොළ. (21/06/E/Wari/OPEC/NCB/C3)**
- ➢ **අල් - අක්ෂා ජාතික පාසල, කල්පිටිය. (21/07/E/Put/OPEC/NCB/C4)**
- ➢ **ධම්මිස්සර ජාතික පාසල, නාත්තන්ඩිය. (21/08/E/Wen/OPEC/NCB/C5)**
- ➢ **විජයබා ජාතික විදුහල, මහව (21/09/E/Maho/OPEC/NCB/C6)**

**සඳහා යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම.**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන OPEC අරමුදල (OFID) වෙතින් තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එහි ලැබීම් වලින් කොටස්, ශ්‍රී සුමංගල ම.ම.වි. වාරියපොළ (21/06/E/Wari/OPEC/NCB/C3), අල් - අක්ෂා ජාතික පාසල, කල්පිටිය. (21/07/E/Put/OPEC/NCB/C4), ධම්මිස්සර ජාතික පාසල, නාත්තන්ඩිය (21/08/E/Wen/OPEC/NCB/C5) සහ විජයබා ජාතික විදුහල, මහව (21/09/E/Maho/OPEC/NCB/C6) යන විද්‍යාල සඳහා යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් යටතේ ගෙවීම් කිරීම සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (වයඹ පළාත) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත විස්තර කොට ඇති පරිදි යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් දැන් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු කේත අංකය | යෝජිත කොන්ත්‍රාත්තුවේ ශීර්ෂය | දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය | අවශ්‍ය CIDA ශ්‍රේණිය (ගොඩනැගිලි) | කොන්ත්‍රාත් කාලය (දින) | ඉංජිනේරු ඇස්තමේන්තුව (VAT හැර) (රු. මිලියන) | ලංසු සුරක්ෂණ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 21/06/E/Wari/OPEC/NCB/C3 | වාරියපොල ශ්‍රී සුමංගල ම.ම.වි. සඳහා යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | වාරියපොල | C4 හෝ C3 | 280 | 56 | 650,000/- |
| 21/07/E/Put/OPEC/NCB/C4 | කල්පිටිය අල්අක්ෂා ජාතික පාසල සඳහා යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | පුත්තලම | C4 හෝ C3 | 280 | 55 | 650,000/- |
| 21/08/E/Wen/OPEC/NCB/C5 | නාත්තන්ඩිය දම්මිස්සර ජාතික පාසල සඳහා යෝජිත තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | වෙන්නප්පුව | C4 හෝ C3 | 280 | 54.8 | 650,000/- |
| 21/09/E/Maho/OPEC/NCB/C6 | මහව විජයබා ජාතික විදුහල සඳහා යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම. | මහව | C4 හෝ C3 | 280 | 56.4 | 650,000/- |

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවූවකු විය යුතු අතර, ඉහත සඳහන් ශ්‍රේණි සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සුදුසුකම් අවශ්‍යතාවයන්ට පහත සඳහන් උපමානයන්ද ඇතුළත් වේ.
   (අ) පසුගිය වසර පහ තුළ නිමාකළ ඉදිකිරීම් කාර්යයන් හි වාර්ෂික ප්‍රමාණයේ සාමාන්‍යය අඩුතරමින් රුපියල් මිලියන 11.00 ක් වත් විය යුතුය.
   (ආ) ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම්වල අවම වටිනාකම් අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය හැකි යම් අත්තිකාරම් ගෙවීම් හැර රු. මිලියන 18.00 ට නොඅඩු විය යුතුය.
   (ඇ) කාර්ය මණ්ඩලයට NDT (සිවිල්) හෝ සමාන සුදුසුකම් සමග වසර 5 ක පළපුරුද්ද සහිත හෝ NCT සමග වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහිත තාක්ෂණ නිලධාරියකු ඇතුළත් විය යුතුය.
   (ඈ) ලංසුකරු සමාන ස්වභාවයේ තනි ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් පසුගිය වසර පහ තුළ අඩුතරමින් රු. මිලියන 42.00 ක වටිනාකමට සම්පූර්ණ කර තිබිය යුතුය.
   (ඉ) ලංසුකරු 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, සහතිකය ඉදිරිපත් කළ යුතුය.

5. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණය හා අනුකූලව මෙහෙයවනු ලැබේ.

6. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට, **කුරුණෑගල, පළාත් සභා කාර්යාල සංකීර්ණයේ, 2 වන මහලේ වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ** වෙතින් (දුරකථන 037-2222700 / 037-2225057, ෆැක්ස් 037-2223186) වෙතින් **2021 මැයි 6 වැනිද** තෙක් කාර්යාල වේලාවන්හිදී වැඩිමනත් තාක්ෂණ තොරතුරු ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

7. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (වයඹ පළාත) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා එක් එක් ඉදිකිරීම සඳහා ආපසු නොගෙවන රුපියල් දෙළොස් දහස් පන්සියයක් (රු. 12,500/-) බැගින් ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 12 දින සිට 2021 මැයි 6 දින දක්වා කාර්යාල දිනයන්හි කාර්යාල වේලාවන් (09.00 පැය සිට 16.00 පැය) තුළ ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබාගත හැකිය. **ගෙවීම් කළ යුත්තේ මුදලිනි.**

8. පූර්ව - ලංසු රැස්වීමක්, (වයඹ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 2021 අප්‍රේල් 29 වැනිද 10.00 පැයට පැවැත්වෙනු ඇත.

9. ලංසු බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "**(පාසලේ නම) සඳහන් යෝජිත තෙමහල් තාක්ෂණ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලංසු**" යනුවෙන් සඳහන් කළ මුද්‍ර තැබූ ලංසු 2021 මැයි 7 වැනිද 10.00 පැයට හෝ ඊට පෙර කුරුණෑගල, නුවර පාරේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති "**ටෙන්ඩර් පෙට්ටියේ**" "**තැන්පත්**" කළ යුතුය. නැතහොත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. **2021 මැයි 7 වැනිද** 10.00 පැයට ලංසු භාරගැනීම අවසන් වේ. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට රිසි ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී **(වයඹ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ. ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී** ලංසු විවෘත කෙරේ.

   සියලුම ලංසු සමග ඉහත සඳහන් කර ඇති පරිදි "ලංසු සුරක්ෂණයක්" ඉදිරිපත් කළ යුතුය.

10. ඉහත සඳහන් කළ ලිපිනය මෙසේය.

**ඒ.එස්.කේ. ජයලත්,**
**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (වයඹ),**
**නුවර පාර, කුරුණෑගල.**

**දුරකථනය** : 037-2222422
**ෆැක්ස් අංකය** : 037-2222422
**වෙබ් ලිපිනය** : www.nwpedu.lk

**දිනය : 2021 අප්‍රේල් 12**

දිනමිණ
LOADING
කාලත්‍රයේ ඩිජිටල් දොරටුව
2021 අප්‍රේල් 12

නව නිපැයුම් පොකුර පිටුව 02
මූලරූපී කලල පිටුව 03
මේසය යට ජිම් එක පිටුව 05
බැටරි වගේ මාළු අස්ටී පිටුව 06



# දෙසොහොයුරන් හැදූ නව නිපැයුම් පොකුර







මනුල් රන්දිම බණ්ඩාර ජයමහ සහ ලිතිල් රමුදිත බණ්ඩාර ජයමහ සොහොයුරෝය. මනුල්, උසස් පෙළ විද්‍යා අංශයෙන් හදාරා විශ්වවිද්‍යාල දොරටු විවර වන තෙක් බලා සිටියි. ලිතිල්, කුරුණෑගල මලියදේව විද්‍යාලයේ 12 වැනි ශ්‍රේණියේ අධ්‍යාපනය ලබයි. අනෙක් බොහෝ පාසල් සිසුන්ගෙන් ඔවුන් දෙදෙනා වෙනස් වන්නේ පරිගණකයට, ජංගම දුරකතනයට ලොල්ව කාලය කා දමනු වෙනුවට සෑම විටම සිය දැනුම මෙහෙයවමින් නව නිර්මාණකරණයේ නිරත වන හෙයිනි.

මනුල්, මේ වන විට සම්මාලාභී නව නිර්මාණ කිහිපයක්ම එළිදක්වා ඇත. එදිනෙදා කටයුතු පහසු කර ගැනීමේ උපකරණ නිර්මාණය කිරීම මනුලගේ විනෝදාංශයකි. එහි ජයග්‍රාහී එක් කඩඉමක් වන්නේ පොල් ගෑම, පොල් මිරිකීම සහ පොල් පෙරීම එකම උපකරණයකින් කළ හැකි නව උපකරණයක් නිර්මාණය කිරීමයි.

## බහුකාර්ය බ්ලෙන්ඩරය

එදිනෙදා ජීවිතයේදී ගෘහිණියෝ ආහාර පිසීමේදී පොල් ගෑම, පොල් මිරිකීම හා පොල් කිරි පෙරා ගැනීම යන ක්‍රියා වෙන වෙනම සිදු කරති. මනුල්ගේ නව නිර්මාණය (Coconut Milk Producer) නිසා මේ ක්‍රියාවලිය පහසු කාර්යයක් වී ඇත. ඔහු නිර්මාණය කර ඇති බහුකාර්ය බ්ලෙන්ඩරයෙන් විනාඩි කිහිපයක් ඇතුළත පොල් ගෙඩියක් ගා, මිරිකා පෙරා ගැනීමට පුළුවන. ගාගත් පොල් මිරිකීමකින් තොරව ගැනීමටද හැකි අයුරින් මේ උපකරණය තනා ඇත. මිරිකා ගත් පොල් පිටතට ගැනීමට කුඩා කරාමයක් සවි කර ඇත. සාමාන්‍ය බ්ලෙන්ඩරයකින් සිදු කරන කටයුතු වන මිරිස්, ගම්මිරිස් කෙටීම, පලතුරු යුෂ ගැනීම ආදි කාර්යයන්ද මෙම උපකරණය භාවිතයෙන් ඉටුකර ගත හැකිය. මෙම උපකරණය පහසුවෙන් පිරිසුදු කරගැනීමට හැකි අයුරින් නිමවා තිබීම ද විශේෂත්වයකි. මනුල්ගේ මෙම නව නිර්මාණයට 2020 වසරේ නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පැවැත්වූ 'සහසක් නිමැවුම්' ප්‍රදර්ශනයේදී ආහාර තාක්ෂණ අංශයේ රන් පදක්කමක් හිමි විය.

## ඇන්කර් බෝල්ට් ජොයින්ට් ඇණය

මනුල්ගේ ඊළඟ නව නිර්මාණය ඉදි කිරීම් සහ කාර්මික ක්ෂේත්‍රය අරබයා කරන ලද්දකි. මේ ක්ෂේත්‍රයන්හිදී ඇන්කර් බෝල්ට් ඇණය බර ද්‍රව්‍ය රැඳවීම සඳහා බහුලව භාවිත කරයි. විශේෂයෙන්ම බිත්තවල විවිධ දෑ එල්ලීම සහ රැඳවීම සඳහා මෙම ඇන්කර් බෝල්ට් ජොයින්ට් ඇණය භාවිත කරයි. සාමාන්‍ය ඇණයක් බිත්තියට විද එහි යමක් රැඳවීමේදී අදාළ රඳවන දේ බරින් වැඩි නම් බිත්තිය පසාරු කරගෙන ඇණය බුරුල් වී බිමට කඩාවැටෙයි. මනුල් වැඩිදියුණු කර ඇති මෙම ඇණය බර වැඩි වූ විට බිත්තිය කඩාගෙන නොපැමිණ එම බර දරා සිටීමට හැකිය.



මනුල් රන්දිම බණ්ඩාර

ඔහුගේ මෙම ඇණය රේලි පීලි ශක්තිමත්ව රැඳවීම සඳහා භාවිත කර ඇති යකඩ කූඤ්ඤය වෙනුවට ද වැඩි දියුණු කර භාවිත කළ හැකි අතර, එය දීර්ඝ කාලයක් ශක්තිමත්ව රේල් පීල්ල ස්ථාවරව රඳවා තැබීමට සමත්ය. මනුලගේ මෙම නව නිර්මාණයට 2020 සහසක් නිමැවුම් තරගාවලියේ පාසල්, ඉංජිනේරු අංශයේ රිදී සම්මානය දිනා ගැනීමට සමත් විය.

## බෝට්ටු පාලකය

2020 සහසක් නිමැවුම් තරගාවලියේදී පාසල්, භෞතික විද්‍යා අංශයේ රන් සම්මානයක් දිනා ගැනීමට සුළං මඟින් ගමන් ගන්නා භ්‍රමණය වන පෙති යුගලයක් සහිත බෝට්ටුවක් පාලනය කිරීම සඳහා සකසනු ලැබූ නිමැයුමට (Maneuvering System for Two Propeller Air boat) හැකි විණි. මේ වන විට නිෂ්පාදනය කෙරෙන වායු පීඩන බෝට්ටු ධාවනයේදී එක්වර තිරිංග තද කර නවතා ගත නොහැකිය. බොහෝ විට අධික වේගයෙන් ගමන් කරන බෝට්ටු එකවර නවතාගත නොහැකි නිසා ජලයේදී අනතුරට ලක් වන අවස්ථා බොහෝය. මනුල්ගේ නිර්මාණය මඟින් වායු බෝට්ටුව එකම අක්ෂයක් ඔස්සේ අංශක 360ක් හැරවීමට හැකිය. ගංවතුර වැනි ආපදා තත්ත්වවලදී හදිසි භාවිතය සඳහා වඩාත් සුදුසුය.


සිය සහෝදරයා මෙන්ම කුඩා කල සිටම නව නිර්මාණකරණයට යොමු වූ ලිතිල් රමුදිත බණ්ඩාර ජයමහ මේ වන විට කුරුණෑගල මලියදේව විද්‍යාලයේ 12 වැනි වසරේ ජීව විද්‍යා අංශයෙන් ඉගෙනුම ලබමින් සිටියි. පවුලේ දෙවැනියා වන ලිතිල් වැඩිමහලු සහෝදරයාගේ දක්ෂතා ඉක්මවා යමින් අන්තර්ජාතික ජයග්‍රහණ තමන් සතු කරමින් ලක්මව ලෝකය හමුවේ බැබළවීමට සමත්ව සිටින්නෙකි.

## නවීන කෙක්ක

හෙතෙම, නව නිර්මාණකරුවන්ගේ කොමිසම 2016 වසරේදී පැවැත්වූ සහසක් නිමැවුම් තරගාවලියේදී රන් පදක්කමක් දිනා ගැනීමට සමත් විය. ගෙඩි කඩන නවීන කෙක්කට තායිලන්තයේ පැවැති Bangkok International Intellectual Property, Invention, Innovation and Technology Exposition තරගාවලියේ දී රිදී සම්මානයක් දිනා ගැනීමට සමත් විණි. මෙම විදෙස් තරගාවලියට සහභාගි වීම සඳහා නව නිර්මාණකරුවන්ගේ කොමිසම විසින් සුවිශේෂි සහායක් සහ අනුග්‍රහයක් ලිතිල්ට දෙන ලදි. ලිතිල් හැදූ කෙක්කෙන් විවිධ ගෙඩි වර්ග කඩා ගැනීමට හැකිය. ගහට ඇති උස අනුව කෙක්ක උස් පහත් කළ හැකි අතර, පහළින් පාපැදියක බ්‍රේක් හැඩල ආකාරයෙන් පාලනය කළ හැකි කතුරක ආකාරයේ මුවහත් තල දෙකක් කෙක්කේ කෙළවර සවිකර ඇත. ඉන් එකක් කෙක්කටද, අනෙක පහත සිට පැමිණෙන කේබලයටද සවිකර ඇත. මෙම තල දෙක, කඩා ගැනීමට බලාපොරොත්තු වන ගෙඩියේ නැට්ට මැදි කොට පහළ ඇති ලීවරය තද කළ විට කේබලයට සවි කර ඇති මුවහත් තලය අනෙකට ළං වී ගෙඩියේ නැට්ට කැපී යයි. බිම සිටින්නකුට ඉහළ තිබෙන ගෙඩියේ නැට්ටට නියමිත ආකාරයෙන් මුවහත් තල දෙක පිහිටා ඇත්ද යන්න දැන ගැනීම සඳහා කුඩා කැමරාවක් සවි කර ඇත. එහි දර්ශන පහළ සිටින්නාට කෙක්කටම සවි කර ඇති තිරය මඟින් නිරීක්ෂණය කරමින් අදාළ තල දෙක ගෙඩියේ නැට්ට වෙත ගෙන ගොස් කපා දැමිය හැකිය. ගසේ ඉහළ කැමරාවෙන් නිරීක්ෂණය කළ හැකි නිසා කඩා ගැනීමට සුදුසු ගෙඩි පමණක් කඩාගත හැකි නිසා එලදාව අපතේ යෑමක් සිදු නොවේ.



ලිතිල් රමුදිත බණ්ඩාර



## නවීන පීලි පිරිසුදුකරණය

වැසි සමයේදී සෞඛ්‍ය අංශවල වැඩි අවධානයක් යොමු වන නිවෙස්හි පීලි ආදිය පහසුවෙන් පිරිසුදු කරගත හැකි නවීන පීලි පිරිසුදුකරණයට 2017 වසරේ පැවැති සහසක් නිමැවුම් තරගාවලියේදී ලෝකඩ පදක්කමක් හිමි විය. මෙම වසරේදීම ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සංවිධානය කළ සමස්ත ලංකා නව නිර්මාණ තරගාවලියේදී පීලි පිරිසුදුකරණය ප්‍රථම ස්ථානය හිමි විය. ඉහත කෙක්කට යොදා ඇති තාක්ෂණය යම්කිසි ප්‍රමාණයක වෙනසකට භාජනය කර ඇති මෙම නව නිර්මාණය මඟින් පීල්ලක ඇති අපද්‍රව්‍ය පහළ සිට ඉවත් කර ගැනීමට හැකිය. ලිතිල් මේ සඳහා ඉහලන කුඩයක තාක්ෂණය භාවිත කරමින් පහළ සිට කෙක්කේ ඉහළ සවි කර ඇති අතක් ආකාරයේ දැති මඟින් පීල්ලේ අපද්‍රව්‍ය ඉවත් කිරීමට හැකි අයුරින් මෙය සකසා ඇත. මේ කෙක්ක, පීල්ලක ඇති අපද්‍රව්‍ය පහසුවෙන් ග්‍රහණය කර ගැනීම සඳහා නැමී දෙකක් පිහිටන ආකාරයෙන් නිර්මාණය කර ඇත. වෙළෙඳපොළේ විවිධාකාර වැහි පීලි ඇති අතර ඒවායේ වක්‍රාකාර බව අනුව මෙම කෙක්කේ ඉහළ කොටස අපද්‍රව්‍ය ග්‍රහණය කර ගත හැකි ආකාරයෙන් වක්‍රකාර ලෙස පීල්ල තුළට යොමු කළ හැකි වීම ද සුවිශේෂ ලක්ෂණයකි. පීල්ල වෙත යොමු වූ අතට අපද්‍රව්‍ය ග්‍රහණය කර ගැනීම පහළ සිට නිරීක්ෂණය කළ හැකි අයුරින් කුඩා කැමරාවක් සහ තිරයක් මේ කෙක්කට ද සවි කර ඇත. කැමරාවෙන් පීල්ල ප්‍රථමයෙන් නිරීක්ෂණය කර අපද්‍රව්‍ය ඇති ස්ථාන හඳුනාගෙන එම අපද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ඇති හැකියාව නිසා නිකරුණේ කාලය අපතේ යෑම ද සිදු නොවන අතර, වහලට නැඟ පීලි පිරිසුදු කර ගැනීමට යෑමේදී ඇති විය හැකි අනතුරුද මෙවැනි ආකාරයේ තාක්ෂණයක් භාවිත කිරීමෙන් මඟහරවා ගත හැකිය.



## මානය සහ දර්ශකය සහිත පුනීලය

ලිතිල් නිර්මාණය කළ මානය සහ දර්ශකය සහිත පුනීලයට 2016 වසරේ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සංවිධානය කළ සමස්ත ලංකා නව නිර්මාණ තරගාවලියේදී ප්‍රථම ස්ථානය දිනා ගැනීමට හැකි විණි. මෙම පුනීලය මඟින් විනිවිද නොපෙනෙන බෝතල, බූලි, බැරල්, ටැංකිවලට ද්‍රාවණ පුරවා ගත හැකිය. මේ පුනීලයේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ අදාළ බෝතලයේ හෝ බැරලයේ ද්‍රාවණ පිරවිය යුතු මට්ටම තීරණය කර පුනීලය සවි කළ විට පෙර නිගමනය කළ ප්‍රමාණයට පමණක් ද්‍රාවණය පිරීමයි. එම නිසා ද්‍රාවණ උතුරා නොයන බැවින් අපතේ යාමක් සිදු නොවේ. මිලෙන් ඉහළ ද්‍රවණ අපතේ නොයවා පිරවීම සඳහා මෙය ඉතා සුදුසු උපකරණයකි.




පී.කේ. බණ්ඩාර

'ද්වාර' යනු විද්‍යා-තාක්ෂණ ලිපි අන්තර්ගත අතිරේකයකි. නව නිපැයුම් පිළිබඳ හඳුන්වා දීම මෙන්ම කාලීන විද්‍යා-තාක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහිදී විශේෂය. 'ද්වාර' අතිරේකයේ විද්‍යා ප්‍රබන්ධයක් ද සතිපතා පළ වේ. මේ අතිරේකයට පාඨක ඔබටත් ලිපි සහ විද්‍යා ප්‍රබන්ධ ලිවිය හැකිය.

'ද්වාර', දිනමිණ, අංක: 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක් හවුස්, කොළඹ 10.
dwara@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
කාංචනා අමිලානි



# වෛද්‍ය ඉතිහාසයේ පළමු වරට නිපදවූ මූලරූපී කලල

මිනිස් ජීවිතයේ ප්‍රාථමිකම අවධිය වන්නේ මව්කුසේ ගත කරන කලල අවධියයි. ඩිම්බ සෛලයක් හා ශුක්‍රාණුවක් එක් වී සෑදෙන යුක්තාණුව ඉන් පසුව අදියරෙන් අදියර විභජනය වෙමින්, සෛල ප්‍රමාණය සංඛ්‍යාත්මකව වැඩි කර ගන්නේ එම ක්‍රියාවලියේදී වර්ධන අවස්ථා ගණනාවක් පසු කරමිනි. බ්ලාස්ටෝසිස්ට් යනු එලෙස පසු කරන එක් ප්‍රාථමික අවස්ථාවකි. යුක්තාණුව බෙදීමෙන් හට ගත් සෛල සියයක් පමණ අන්තර්ගත වන, ප්‍රමාණයෙන් මිලිමීටරයකටත් වඩා කුඩා බ්ලාස්ටොසිස්ට් මඟින් සිරුරේ වන සෑම සියලු පටකයක්ම නිපදවීමට දායකත්වය දක්වයි. එනම් සිරුරේ සෙසු සියලු පටක හා අවයව තැනෙන්නේ මෙම බ්ලාස්ටෝසිස්ටය විභාජනය වීමෙන් හට ගන්නා සෛලවලිනි. කොටින්ම මිනිසාගේ මුල් තැනුම් ඒකකය ලෙස බ්ලාස්ටොසිස්ටය හැඳින්වීමේ වරදක් නැත. එබඳු බ්ලාස්ටොසිස්ටයකට පෙනුමෙන් සේම ක්‍රියාකාරිත්වයෙන්ද හැමතින්ම සමාන සෛල පොකුරක් විද්‍යාගාර තත්ත්ව යටතේ තැනීමට, වෛද්‍ය ඉතිහාසයේ පළමු වරට විද්‍යාඥයන් පිරිසක් පසුගිය දා සමත් බව 'නේචර්' නමැති විද්‍යා සඟරාව වාර්තා කර තිබිණි.

## ඇටමිදුලු සෛල

'බ්ලාස්ටොයිඩ' යනුවෙන් නම්කොට ඇති මෙම සෛල ගොනු නිර්මාණය කොට තිබෙන්නේ ඇටමිදුලු සෛල හෙවත් ප්‍රාථමික සෛල හෝ ක්‍රියාකාරීත්වය ප්‍රති සකසන ලද චර්මීය සෛල ඇසුරෙනි. ඒ එවැනි සෛල, සාමාන්‍යයෙන් බ්ලාස්ටොසිස්ටයක් ගර්භාශය තුළ නිර්මාණය වීම සඳහා අවශ්‍ය කරන රසායනිකයන්ගෙන් පෝෂිත සූපයක් අඩංගු, ත්‍රිමාණ උල්පත් තුළ වර්ධනය වන්නට සැලැස්වීමෙනි. එලෙස පෝෂණ මාධ්‍ය තුළ වර්ධනය වීමට සැලැස්වූ සෛල ගොනු දින 6–8 අතර කාලයේදී සිය විහින්ම බෝල හැඩැති බ්ලාස්ටෝසිස්ට බවට පරිවර්තනය වී තිබෙන්නේ, සාමාන්‍ය බ්ලාස්ටෝසිස්ටයක් තුළ අන්තර්ගත වන සෑම සෛල වර්ගයක්ම එයාකාරයෙන්ම අන්තර්ගත වන පරිදිය. එපමණක්ද නොව මෙම කෘත්‍රිමව නිර්මාණය කළ බ්ලාස්ටොයිඩ, ගර්භාෂයේ බිත්තියක් මත ඇලෙමින් වර්ධනය වන සැබෑ බ්ලාස්ටොසිස්ට අනුකරණය කරමින්, රෝපිතය අඩංගු දීසී බිත්තිවලට යා වූ බව මෙම පර්යේෂණය සිදු කළ විද්‍යාඥයන් පවසන්නේ මහත් මවිතයකින් යුතුවය.

## සදාචාරාත්මක ගැටලු

මෙවැනි බ්ලාස්ටොයිඩ කෘත්‍රිමව නිර්මාණය කර ගැනීමට හැකි වීමේ වැදගත්කම වන්නේ කලල ප්‍රාථමික අවධියේදී ඒවායේ වර්ධනය වන අයුරු වඩාත් විස්තරාත්මක ලෙස අධ්‍යයනය කිරීමට මින් ලැබෙන හැකියාවයි. විශේෂකොටම ගර්භිණී අවධියේ මුල් කාලයේදී ගබ්සා වීමට හේතු අවබෝධ කර ගැනීමටත්, ඇතැම් විකෘතිතා උපතින්ම හටගන්නේ ඇයිද යන්නට හේතු අනාවරණය කර ගැනීමටත්, මෙන්ම විවිධ ඖෂධ, පාරිසරික ධූලක හා වයිරස් ආසාදනවලින් ගර්භිණී වියේදී කලලයට එල්ල වන බලපෑම් පිළිබඳ විමර්ශණය කිරීමටද මෙම නවතම සොයා ගැනීමෙන් හැකියාව ලැබෙනු ඇත. මෙම අධ්‍යයනය සඳහා පුරෝගාමී වූ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හොසේ පෝලෝම පවසන පරිදි එය මානව වර්ධනයේ මූලිකම අවධි පිළිබඳ පෙර නොවූ විරූ ආකාරයේ අවබෝධයක් ගැනීමට නව ප්‍රවේශයක් සපයනු ඇත.

මීට පෙර කලල ප්‍රාථමික අවධියේ සංකූලතා සම්බන්ධයෙන් වැඩිදුර හැදෑරීම වඩාත්ම සීමාසහිත වී තිබුණේ කලල ගැනීමේදීත්, ඒවා පර්යේෂණ සඳහා යොදා ගැනීමේදීත් එල්ල වූ සදාචාරාත්මක ගැටලු නිසාවෙනි. සාමාන්‍යයෙන් එලෙස කලල ලබා ගැනුණේ අන්තර්රෝපිත සංසේචනයෙන් (නල දරුවන් - IVF තාක්ෂණයෙන්) දරුවන් ලබා ගැනීමට පෙලඹෙන යුවළ විසින් විද්‍යාවේ ප්‍රගමනය පතා කරනු ලබන පරිත්‍යාග ඇසුරිනි. එලෙස පරිත්‍යාග කරනු ලබන අතිරේක කලල පවා සදාචාර විරෝධී බවට එල්ල වූ චෝදනා නිසා එබඳු පරිත්‍යාගද ඉතාම සීමාසහිත විය. ඊට අමතරව මෙවැනි කලල අධ්‍යයන සඳහා යොදා ගැනීමටද සදාචාරාත්මක හේතු මත නීතියෙන් අවසර හිමිව තිබෙන්නේ කලලයට දින දාහතරක් වයස් වන තෙක් පමණක් නිසාද, විද්‍යාඥයන් මුහුණ පා සිටියේ අතිශය අසීරු තත්ත්වයකටය. මේ සියලු වාරණ නිසා කලල මූලික අවධියේ මානව වර්ධනය පිළිබඳ වැඩිදුර හැදෑරීම් සෑහෙන දුරට සීමාව තිබූ බව අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් බ්ලාස්ටොයිඩ නම් මෙම නවතම සොයා ගැනීම නිසා එකී සීමා මායිම් සියල්ල ඉවත්ව ගොස්, මානව වර්ධනයේ කලල මූලික අවධිය පිළිබඳ මෙතෙක් පැවති ගැටලු සේම අබිරහස් බොහෝමයක් නිරාකරණය කර ගැනීමට හැකියාව ලැබෙනවාට සැකයක් නැත.



## අබිරහස් කළු පෙට්ටිය

"ඇත්තටම අප මේ සොයාගැනීම නිසා පුදුම විදිහට උද්‍යෝගිමත් වෙලයි ඉන්නේ. කලලයේ ප්‍රාථමිකම අවධි පිළිබඳ හැදෑරීම මේ වන තෙක්ම බොහෝ දුරට සීමා වෙලයි තිබුණේ. ඇත්තටම මේ විෂයය අබිරහස් පිරුණු කළු පෙට්ටියක් විදිහටයි මේතාක් සැලකුණේ. ඒත් මේ සොයා ගැනීමත් එක්ක ඒ තත්ත්වය සහමුලින්ම වෙනස් වනවා."

බ්ලාස්ටොයිඩ නිපදවීමේ පර්යේෂණයට එක් වූ ටෙක්සාස් සවුත්වෙස්ටර්න් වෛද්‍ය මධ්‍යස්ථාන විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය 'ජුන් වුන්' මානව කලල මූලික අවධිය සම්බන්ධයෙන් කිරීමට නියමිත අනාගත අනාවරණ ගැන බලාපොරොත්තු පළ කරන්නේ එලෙසය. විශේෂයෙන්ම සංජානනීය රෝග හා උපත් ආබාධ හට ගැනීමට හේතු වන තත්ත්ව කලල මූලික අවධියේදී ක්‍රියාත්මක වන ආකාරයන් කල් ඇතිව හඳුනා ගැනීමට, බ්ලාස්ටොයිඩ පිළිබඳ පර්යේෂණ ඉවහල් වනු ඇත. කෙසේ වුවද මහාචාර්ය පෝලෝ හා වූ පවසන්නේ මෙම බ්ලාස්ටොයිඩ ඒවායේ වර්ධනයේ මුල් සතියේදී, බ්ලාස්ටොසිස්ට හෙවත් කලල මූලික අවධියට සමාන වුවද, සති ගණනක ඇවෑමෙන් ඒවා තව දුරටත් ස්වභාවික බ්ලාස්ටොසිස්ටවලට සමානකම් දක්වන්නේ නැති බවය. මේ නිසා ඒවා කලල ලෙස වැඩි වර්ධනය කොට ගර්භාශය තුළ රෝපණය සඳහා යොදා ගැනීමට හැකියාවක් නැත. විද්‍යාගාර තත්වත්ව යටතේ ප්‍රාථමික සෛල හෝ චර්මීය සෛල යොදා ගනිමින්, එකවර දහස් ගණනින් නිපදවිය හැකි බ්ලාස්ටොයිඩ සම්බන්ධයෙන් සදාචාරාත්මක ගැටලු මතු වීමටද ඇත්තේ අවම සම්භාවිතාවකි. කාලයත් සමඟ වැඩිදුර පර්යේෂණවලින් මානව කලලවලට වඩාත් සමාන බ්ලාස්ටොයිඩ නිපදවීමට හැකියාව ලැබුණහොත්, ඒවා ගර්භාෂ තුළ රෝපණය කිරීමෙන්, ස්වාභාවික සංසේචනයකින් තොරව දරුවන් බිහි කිරීමටද අනාගතයේ යම් දිනෙක බැරි නොවනු ඇත. එය නියත ලෙසම මානව සංහතියේ නව පරිච්ඡේදයක ඇරඹුමක්ද වනු ඇත.

රුක්ලන්ති පෙරේරා



# මහා බාධක කොරල් පරය වැනසෙයි ද?




ඔස්ට්‍රේලියාවේ මහා බාධක කොරල් පරය ඉතා වැදගත් ස්වාභාවික සම්පතක් සේ සැලකෙයි. සැතපුම් 1429ක් දිගට විහිදී ඇති මේ කොරල් පරය ගෝලීය කාලගුණ විපර්යාස හේතුවෙන් විනාශ වී යෑමේ අවදානමකට මුහුණ දී ඇත. ඔස්ට්‍රේලියා විද්‍යා ඇකඩමියේ විද්‍යාඥයන් සඳහන් කරන ආකාරයට ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම එහිලා තීරණාත්මක කාරණයක් ලෙස බලපා තිබේ. උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5කින් ඉහළ යෑම මහා බාධක කොරල් පරය විනාශ වීමට සෑහෙන බව විද්‍යාඥයෝ සඳහන් කරති.

වත්මන් කාබන්ඩයොක්සයිඩ් විමෝචනය සැලකිල්ලට ගත් විට ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5කින් ඉහළ යෑම 2025 වන විට ඉතා පහසුවෙන් සිදු වනු ඇති බව විද්‍යාඥයන්ගේ උපකල්පනයයි. ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5කින් ඉහළ ගිය හොත් මහා බාධක කොරල් පරයෙන් 70%ත්-99% අතර ප්‍රමාණයක් විනාශ වී යා හැකි බවට ගණන් බලා ඇත. ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 2කින් පමණ ඉහළ ගියහොත් මහා බාධක කොරල් පරයෙන් ඉතිරි වනු ඇත්තේ 1%ක් පමණක් බව විද්‍යාඥයෝ පෙන්වා දෙන්නෝය. ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5කින් ඉහළ යෑම නැවැත්වීමට කෙසේවත් නොහැකි බව ද විද්‍යාඥයෝ පවසති.

මහා බාධක කොරල් පරය මේ වන විට සුදු පැහැ වෙමින් පවත්නා බවට ද තොරතුරු වාර්තා වේ. එකී සුදු පැහැවීම හෙවත් බ්ලීචින්ග් වීම පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනුණේ 2020 වසරේදීය. සාගර ජලයේ උෂ්ණත්වය අසාමාන්‍ය ලෙස ඉහළ නැඟීම හේතුවෙන් මහා බාධක කොරල් පරය සුදු වන බව විද්‍යාඥයන් පෙන්වා දී තිබේ. එම සුදු වීම මහා බාධක කොරල් පරය වඳ වී යෑමට යොමු කරවන්නක් බව ද විද්‍යාඥයෝ පවසති. පසුගිය ඔක්තෝම්බර් මාසයේදී කරන ලද පර්යේෂණයකින් තහවුරු වූයේ මහා බාධක කොරල් පරය සුදු පැහැයට හැරීම පසුගිය වසර 25කට ආසන්න කාලය මුළුල්ලේ අනුක්‍රමයෙන් සිදුව ඇති බවකි. ඒ හේතුවෙන් කොරල් පරයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් සුදු පැහැ ගැන්වී ඇති බව ද විද්‍යාඥයන්ට තහවුරුව තිබේ. සාගර උෂ්ණත්වය ඉහළ යන විට කොරල් පර සමඟ සහජීවී සම්බන්ධතාවයක් ඇති කරගෙන සිටින වර්ණවත් ඇල්ගී විශේෂ, කොරල් මතින් ඉවත් කෙරේ. එවිට කොරල් ජීවීන්ට ආහාර හිඟයක් ද ඇති වේ. කෙසේ වුවත් වර්ණවත් ඇල්ගී කොරල් මතින් බැහැර වීමත් සමඟම වාගේ කොරල් සුදු පැහැ වීම ආරම්භ වේ.

ඕස්ට්‍රේලියා මහාද්වීපය වියළි භාවයෙන් වැඩි ස්ථානයක් ලෙස සැලකෙයි. 2019-2020 කාල පරාසයේදී දරුණු ළැව් ගිනි තත්ත්ව එහි ඇති විණ. මහා බාධක කොරල් පරයේ කොරල් සුදු පැහැයට හැරීම වසර පහක කාල පරාසයක් ඇතුළතදී කැපී පෙනෙන අන්දමෙන් තුන් වරක් සිදු වනු දැකිය හැකි වූයේය. නොගැඹුරු මුහුදේ තද කොරල් මත ඇති ආවරණයෙන් සියයට පනහකට ආසන්න ප්‍රමාණයක් ඉවත් වීමට එකී තත්ත්වය හේතු විණ.

ඕස්ට්‍රේලියාව උණුසුම් වීම ඉතා වේගයෙන් සහ මහා පරිමාණ වශයෙන් සිදු වීම හේතු කරගෙන මහා බාධක කොරල් පරය සහ තවත් ස්වාභාවික සම්පත් රැසක්ම විනාශයට පත් වෙමින් තිබෙන බව සනාතව ඇත. උෂ්ණත්වය වැඩිවීම කිසියම් ආකාරයකින් වළකා ගන්නට මිනිසා සමත් වුව හොත් මහා බාධක කොරල් පරවලට සහ අනෙකුත් ස්වාභාවික සම්පත්වලට සිදුව ඇති හානිය නැවත සකසා ගැනීමට හැකි වනු ඇති බවද විද්‍යාඥයෝ පවසති.

මහා බාධක කොරල් පරය ආශ්‍රිතව මත්ස්‍ය විශේෂ 1625කට ආසන්න සංඛ්‍යාවකුත්, මෘද්වංශික විශේෂ 3000කට ආසන්න සංඛ්‍යාවකුත් තල්මස් සහ ඩොල්ෆින් විශේෂ 30කට ආසන්න සංඛ්‍යාවකුත් ජීවත් වෙති. මහා බාධක කොරල් පරය හානියට පත් වුව හොත් ඒ හේතුවෙන් එම ජීව විවිධත්වයට ද හානි පැමිණෙනු ඇති බව විද්‍යාඥයෝ පෙන්වා දෙති.






# බැටරි වගේ වැඩ කළ මාළු අස්ථි

ඕනෑම ජීවියකුගේ අස්ථි පද්ධතිය එම ජීවියාගේ පැවැත්මට බෙහෙවින්ම වැදගත් වේ. වසර මිලියන ගණනකට පෙර ජීවත් වූ ජීවීන්ගේ අස්ථි පද්ධතිය එම ජීවීන්ට වැදගත් වූයේ කෙසේ ද? ඔවුන්ගේ අස්ථි ක්‍රියා කළේ කෙසේ ද? වැනි කාරණා අනාවරණය කර ගැනීම සඳහා පර්යේෂණයක් සිදු කෙරිණි. පර්යේෂණය සිදු කර තිබෙන්නේ ජර්මනියේ බර්ලින් ස්වභාවික කෞතුකාගාරයේ විද්‍යාඥ පිරිසකි. එම පර්යේෂණයේදී විශේෂ අවධානයක් යොමු කර තිබෙන්නේ වසර මිලියන 423කට පළමුව, එනම් සිලුරියන් යුගයේදී ජීවත් වුණු මත්ස්‍යයකුගේ අස්ථිවල ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය අනාවරණය කර ගැනීම සඳහාය. වසර මිලියන 423කට පළමුව ජීවත් වූ එම මත්ස්‍ය විශේෂය පසු කලෙකදී වඳ වී ගොස් ඇත. මත්ස්‍ය විශේෂය ඔස්ටියෝස්ට්‍රැසි (Osteostraci) යනුවෙන් හඳුන්වා තිබේ.

එම මත්ස්‍යයාගේ පොසිලය පිළිබඳ අධ්‍යයනය කළ විද්‍යාඥයන් පවසන්නේ මත්ස්‍යයා හනු රහිත එකකු බවයි. මත්ස්‍යගේ අස්ථි සෛල විද්යුත් කෝෂ (බැටරි) මෙන් ක්‍රියා කරන්නට ඇතැයි විද්‍යාඥයෝ පවසති. එය මත්ස්‍යයාට දිගු දුරක් පිහිනීමට උපකාරී වන්නට ඇත යන්න විද්‍යාඥයන්ගේ අනුමානයයි. අස්ථි සෛල, ඇතැම් පටක කොටස් දිය කර හරිමින් මත්ස්‍යයාගේ රුධිරයට අවශ්‍ය කැල්සියම්, පොස්පරස් සහ අනෙකුත් ඛනිජ ලවන මුදා හැර ඇති බව විද්‍යාඥයන්ට පර්යේෂණයෙන් තහවුරුව තිබේ. එසේම පහසුවෙන් මුදාහැරිය හැකි අන්දමට ඇතැම් පෝෂක කොටස් ගබඩා කර ගැනීමත් එම අස්ථි සෛලවලින් කෙරී ඇත. අස්ථි සෛල එකිනෙකක් ඉතා සියුම් චැනලවලින් සම්බන්ධ වී තිබී ඇති බව ද විද්‍යාඥයෝ පෙන්වා දෙති. එම චැනල මිනිස් කෙස් ගසක් මෙන් දහස් වාරයක් තරම් කුඩාය. චැනල ඔස්සේ විද්යුත් රසායනික සංඥා හුවමාරු කර ගැනීම පහසු වන්නට ඇතැයි අනුමාන කෙරේ. අස්ථියේ පැවැති එම චැනලද පුදුමයකට මෙන් වසර මිලියන හාරසියයකට අධික කාලයක් මුළුල්ලේ ආරක්ෂා වී තිබී ඇත.

මත්ස්‍යයාගේ අස්ථි සෛලවල ක්‍රියාකාරිත්වය සහ ඒවායෙහි ව්‍යුහය සැලකිල්ලට ගෙන ත්‍රිමාණ ආකෘති සකසා ගැනීමට විද්‍යාඥයෝ සමත්ව සිටිති. විද්යුත් කෝෂයක ඉලෙක්ට්‍රෝඩවලින් කෙරෙන කාර්යයට සමාන කාර්යයක් මේ අස්ථි සෛල මඟින්ද කෙරී ඇත. ඔස්ටියෝස්ට්‍රැසි මත්ස්‍ය විශේෂයේ අස්ථි සම්බන්ධයෙන් කෙරුණු මෙම අධ්‍යයනය ඉතා වැදගත් එකක් සේ සැලකෙයි. එමඟින් ගත් දැනුම පදනම් කරගෙන ජීවී අස්ථි පරිණාමය වී ඇති අන්දම අනාවරණය කරගත හැකි බව විද්‍යාඥයෝ පවසති.



mail online ඇසුරෙනි
මංජුලා විජයරත්න



# කාලගුණය පාලනය කිරීමට හැකි නම්

අනුව දශකයේ රූපවාහිනී ප්‍රේක්ෂකයන් අතර අතිශයින්ම ජනප්‍රියත්වයටත්, ජනාදරයටත් පත් සුප්‍රකට එක්ස් ෆයිල්ස් රහස් පරීක්ෂක කතාංග මාලාව කෙරෙහි බැඳුණු සිත් ඇති නරඹන්නකු නම් එහි විකාශය කෙරුණු 'රේන් කින්ග්' කතාංගය ඔබට මතක ඇතුවාට සැක නැත. නිරන්තරයෙන්ම පාහේ ගුප්ත, අභිරහස්මය, පැහැදිලි කළ නොහැකි සිදුවීම්දාම කේන්ද්‍ර කරගත් කතා ඔබ හමුවට ගෙන එක්ස් ෆයිල්ස්හි මෙම කතාංගය පැහැදිලිවම වෙනස් ආරක නිර්මාණයක් වූයේ ඉන් ආදරය හා බැඳුණු කාලගුණ විපර්යාසයන් ගැන අමුතුම ආකාරයේ කතාවක් ගෙන හැර පෑම නිසයි. වචනයට පෙරළා ගැනීමට අපොහොසත් වූ ප්‍රබල ආදරණීය හැඟීම් සමුදායක් නිසා එක්තරා නගරයක කාලගුණය සිය අභිමතය පරිදි පාලනය කිරීමට හැකි 'හොල්මනක්' වැන්නකු වීමට ඔබටත් හැකි වුව හොත් ඔබ කුමක් කරනු ඇතිද? ඉඩෝරයෙන් දැවී ගිය වගාවකට වට වැස්සක් වස්වන්නට හෝ ගම්බිම් විනාශ කරමින් හමා යන්නට නියමිත සුළි සුළඟක් වළක්වා ලන්නට හෝ අරඹන්නට නියමිත දිගු සංචාරය පුරා සුවදායක කාලගුණයක් පවත්වා ගැනීමට හෝ පුළුවන්කම තිබුණා නම් එය කවර නම් අත්දැකීමක් වනු ඇති ද? සැබවින්ම යම් දිනෙක ඔබට කාලගුණය පාලනය කිරීමට හැකියාව ලැබෙනු ඇති ද?

## කාලගුණ පාලන අමාත්‍යාංශය

කාලගුණය යනු නිරන්තරයෙන් වෙනස් වන, පූර්ණ ලෙසම ස්වභාව ධර්මයාගේ අණසකට නතු වූ සංසිද්ධි මාලාවක ප්‍රතිඵලයකි. දැනටමත් ලොව පුරා පිහිටි කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථාන එකොළොස් දහසකින් සෑම පැයක් පාසාම පාරිසරික උෂ්ණත්වය, ආර්ද්‍රතාව හා සුළඟ පිළිබඳ පාඨාංක ගනු ලබන්නේය. දිනකට දෙවරක් ස්ථාන නව සියයකින් කාලගුණ බැලූන ගුවන්ගත කරන්නේ තව දුරටත් කාලගුණික දත්ත රැස් කර ගැනීමටය. දිනෙන් දින දියුණු වන තාක්ෂණික දැනුමත් සමඟ කාලගුණ පෙරයීම්ද වඩාත් සංවර්ධිත තත්ත්වයකට පත් වුවද, තවමත් අපට එළැඹෙන දිනයේදී වර්ෂාවෙන් ගැලවීමට කුඩයක් ඇවැසි ද, නැති ද කියා ස්ථිරවම පැවසීමේ හැකියාවක් නැත. පවත්නා කාලගුණික තත්ත්වය පාලනය කරනවා විනා එය නිර්මාණය කිරීමේ හැකියාවක් අප සතු නොවූවද යම් දිනක එවැනි අසාමාන්‍ය බලයක් අප සතු වුවහොත් ලොව කෙබඳු ස්වරූපයක් ගනු ඇතිද? කාලගුණය පාලනයේ වගකීම කවරෙකුට පැවරෙනු ඇතිද? කාලගුණ පාලන අමාත්‍යාංශය යනුවෙන් ඒ සඳහාම වූ පාලන ඒකකයක් ස්ථාපනය කිරීමට රජයන්ට සිදුවනු ඇතිද? පෞද්ගලික අංශ විසින් කාලගුණ පාලනයේ ඒකාධිකාරියක් තමන් සතු කර ගැනීම වැළැක්වීමට එවන් නියාමන ඒකකයක් අවශ්‍ය වනවාට සැකයක් නැත. කාලගුණ පාලන හැකියාව යුද අවියක් ලෙස භාවිත කිරීමට සතුරු රටවල් පෙලඹෙනු ඇති ද?

## වලාකුළු බීජායනය

ඈත අතීතයේ සිට අද දක්වාම මිනිසා කාලගුණය පාලනය කිරීමට උත්සාහ දරමින් සිටින බව නොරහසකි. නිදසුනක් ලෙස පුරාණ ස්වදේශික අමෙරිකානු ගෝත්‍ර වන පුඑබ්ලෝ, හෝපි හා සූනිවරු නියං සමයන්හීදී ඔවුන්ටම ආවේණික වූ සාම්ප්‍රදායික කෙම් ක්‍රම හා නර්තන උපයෝගී කර ගනිමින් වර්ෂාව ලබා ගැනීමට යුහුසුලු වත්දී, කාලයත් සමඟ එයද වාණිජකරණයට ලක් වූයේ වර්ෂාව දීමට ඉදිරිපත් වන වංචනික වෙළෙඳුන්ගේ ආගමනයකටද මුලපුරමිනි. දේව හාස්මකින් එය සිදු කරන බවට මෙවැන්නන් ව්‍යාජ මත ගෙනහැර පෑවද, සැබවින්ම සිදු වූයේ වලාකුළුවලින් වැසි ඇද වැටීමට පොලඹවන රසායනික හෝ වායු වර්ග වායුගෝලයට මුදා හැරීමකි. සැබෑ ලෙසම කාලගුණය යම්තාක් දුරකට හෝ පාලනය කරමින් වර්ෂාව ගැනීමට සිදු කළ පර්යේෂණවල මුල්ම සාර්ථක ප්‍රතිඵලය ලැබුණේ 1946දී ඇමරිකා එක්සත් ජනපදයේ විද්‍යුත් පර්යේෂණ විද්‍යාගාරයේ සේවයේ නියුතු රසායනික විද්‍යාඥයන් වූ වින්සන්ට් ෂැෆර්, බර්නාඩ් වොනෙගට් හා අර්වින් ලැන්ග්මර් 'වලාකුළු බීජායනය' සම්බන්ධයෙන් කළ අත්හදා බැලීම්වලිනි. 'ග්ලැසියර ජනන වලාකුළු බීජායනය' (glaciogenic cloud seeding) නම් මෙම ක්‍රමයේදී වන්නේ ඉතාම පහළ උෂ්ණත්වයකට මිදී ඝනීභවනය වූ වලාකුළු මතට අයිස් ස්ඵටික එල්ලකොට හිම වැසි නිර්මාණය කිරිමකි. පසු කලකදී අයිස් වෙනුවට සිල්වර් අයඩයිඩ් වලාකුළු මතට එල්ල කිරීමෙන් හිම සේම වර්ෂාවද වඩාත් සාර්ථක අයුරින් නිර්මාණය කිරීමට ඔවුහු සමත් වූහ. වලාකුළුවල අන්තර්ගත තෙතමනය ඝනීභවනය වී ජලය හෝ හිම ලෙස අවක්ෂේප වීමට නම් යම් අතිරේක සහයක් ඇවැසි වන අතර, සිල්වර් අයඩයිඩ්, අයිස් හෝ පසුව අනාවරණය කරගත් පරිදි ලවණ අංශුද ඒ සඳහා උත්ප්‍රේරක ලෙස ක්‍රියා කරන්නෝය. වලාකුළුවල ක්ෂුද්‍ර භෞතිය ක්‍රියාකාරීත්වයට එලෙස බලපෑම් එල්ල කිරීමෙන් ඒවායේ සිදු වන ජල වාෂ්ප අවක්ෂේප වීම් ඉහළ ගිය කල, වායුගෝලයේ උෂ්ණත්වය අනුව හිම හෝ වැසි ලෙස පතිත වීම සිදු වන බව මෙබඳු කෘත්‍රිම වැසි ඇති කිරීම පදනම් වූ න්‍යාය විය.



## වැසි පාලනය

අද වන විට මේ න්‍යාය අනුව යමින් මිනිසා වැසි පාලනය කිරීමට සමත්ව සිටින්නේ ගුවන් යානා හෝ ගුවන් යානා නාශක අවිවලින් රසායනික ද්‍රව්‍ය වලාකුළු මතට මහා පරිමාණයෙන් ඉසීමෙනි. එලෙස කාලගුණය පාලනය කොට පැවැත්වූ මිහිතලයේ දැවැන්තම උත්සවයක් ලෙස 2008 බීජිං වසන්ත ඔලිම්පික් උලෙළ ඉතිහාසගත වී තිබේ. 2010 වසරේදී ලේසර් කිරණ ආධාරයෙන් වැසි වලාකුළු නියං ප්‍රදේශ කරා ඇද ගැනීමේ නවතම ක්‍රමයක් හඳුන්වා දුන්නේ ස්විට්සර්ලන්තයේ ජිනීවා විශ්වවිද්‍යාලයේ ජෙරෝම් කැස්පාරියන් විසිනි. වායුගෝලයේ පවත්නා පරමාණු වෙතින් ඉලෙක්ට්‍රෝන ඉවත්කොට, වැහි අංශු තැනීමට ඉවහල් වන ධනාත්මක ලෙස ආරෝපිත අංශු විශේෂයක් තැනීම මත මෙම ක්‍රමය පදනම් විය. සැබවින්ම මිනිසා එලෙස පාලනය කිරීමට සමත්ව සිටින්නේ වර්ෂාව පමණක් නොවේ.

## ලේසර් ස්පන්දන

අකුණු වලාවන් වෙත ලේසර් ස්පන්දන නිකුත් කොට, අකුණු ගමන් ගන්නා දිශානතිය වෙනස් කිරීමටත්, විශේෂිත ලේසර් කිරණ නිකුත් කොට, විනාශකාරී අකුණු කුණාටු මර්දනය කිරීමටත් විද්‍යාගාර තත්ත්ව යටතේ මිනිසා දැනටමත් සමත්ව සිටින්නේය. ඝනීභවනය වූ වලාකුළක් වෙත වියළි අයිස් නිකුත් කොට මිහිතලය දවන තාප තරංග මැඩලීමත්, චාවෝස් න්‍යාය ව්‍යුත්පන්න කරමින් ටොනේඩෝ හා චණ්ඩ මාරුතවල ප්‍රබලත්වය අඩු කිරීම හා ඒවායේ දිශානතිය වෙනස් කිරීමත් දැනටමත් අත්හදා බලා තිබේ. එපමණක් නොවේ; සයුරු තලය මතට ජෛවීය බාදනයට ලක් වන තෙල් වර්ගයකින් සියුම් තට්ටුවක් පතිතකොට, වාෂ්පීකරණය අවම කිරීමෙන් චණ්ඩ මාරුත හට ගැනීමේ ක්‍රියාවලිය අඩපණ කිරීමටත් ඇවැසි දැනුම සේම තාක්ෂණයද දැනටමත් අප සතුය. සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන චන්ද්‍රිකාවලින් නිකුත් කරන ක්ෂුද්‍ර තරංග භාවිතයෙන් ටොනේඩෝ හට ගැනීමට මුල් වන පුනීල හැඩැති වලාකුළු අඩපණ කිරීමේ යන්ත්‍රණයක්ද විද්‍යාගාර මට්ටමින් යෝජනා වී තිබේ. කාලගුණය මිනිස් සිතැඟි පරිදි පාලනය කිරීමට හැකි වන දිනය වැඩි ඈතක නොවන බව විශ්වාසයෙන් යුතුව කියන්න බිය විය යුතු නැත. එවැනි හැකියාවක් ලැබුණු දිනක කාලගුණික විපර්යාසය හේතුවෙන් ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබෙන පරිසර උෂ්ණත්වය ද යළි යථා තත්ත්වයට පත් කිරීමට අපට බැරි නොවනු ඇත.



රුක්ලන්ති පෙරේරා

**විද්‍යා ප්‍රබන්ධය**

# විරාන්ගේ නීතිය

## බග්ස් 09

"උඹට පිස්සුද රන්ජන්! අපි මෙතනින් ඉක්මනට යන්න ඕනෑ."

"මීට වඩා පාළු තැනක් තොපිට හම්බ වෙන්නෙ නෑ. මිනීමරුවෝ... මෙතනම වැඩේ ඉවර කරපල්ල!" මම ආවේගයෙන් දිගින් දිගටම කෑගැසුවෙමි. කුටියේ බිත්තිවල වැදී මගේ ශබ්දය දෝංකාර දෙමින් මටම ඇසෙයි.

මඳක් කල්පනාකාරීව සන්සුන්ව සිටි විරාන් කුටිය තුළට ගොස් එහි තිබුණු ලැප්ටොප් එක හා රවුටරය රැගෙන එළියට පැමිණියේය.

"මචං, උඹ හිතන්නෙ මොනවද කියල මම දන්නෙ නෑ, ඒත් තීරණයක් ගන්න ගොඩක් දත්ත තියෙන්න ඕන. මේ කාමරේ ඇතුළෙ කෑගහන උඹට ඇහෙන්නෙ, උඹේම දෝංකාරය විතරයි. උඹේම දෝංකාරය විසින් උඹවම තහවුරු කරනව. කිසිම තාර්කික බවක් නෑ."

ඔහුගේ සන්සුන් බව විසින් මා ද යම් පමණකට සන්සුන් කෙරිණි.

"උඹල නෙවෙයිද බොස්වයි සුදර්මන්වයි මැරුවෙ?"

"රන්ජන්, ඔව් නෑ සරල උත්තර කිසිම ප්‍රශ්නෙකට නෑ. හැම දෙයක්ම පිටිපස්සෙ හේතු ගොඩක්, තීරණ ගොඩක් තියෙනව. මේක ලොකු චෙස් ගේම් එකක් කියල හිතපන්. හැම මූව් එකකම පිටිපස්සෙ තියෙන හේතුව නිර්මාණය කරන්න ක්‍රීඩකයන් දෙන්නම දායක වෙනව. එහෙම තැනකදි මට ඕක නෑ කියන්න බෑ. විශේෂයෙන් මේ ස්කේල් එකේදී සියලු බල රටා හරිම සංකීර්ණයි. හැබැයි මම උඹට මෙහෙම කියන්නම්: අපේ අත්වල ලේ නෑ. මේ සිදුවීමට අපේ සෘජු සම්බන්ධයක් නෑ." ඔහුගේ පිළිතුර සෘජු එකක් නොවුණත් එය බාර ගැනීම හැර වෙන කළ හැකි යමක් නොවීය.

අපේ සංවාද අතර විරාන්ගේ දුරකතනය නොනවත්වාම නාද විය. අවසානයේ එයට සවන් දුන් විරාන් 'කොරෝශෝ... කොරෝශෝ' යනුවෙන් පිළිතුරු දෙමින් ඉක්මනින් පැමිණෙන ලෙස මට සංඥා කොට රේල් පාරෙන් පහළට බසින්න විය.

ඔහු පසුපස යනු හැර කළ හැකි අන් කිසිවක් නොවූයෙන් මම ද නැවතත් බෑගය රැගෙන රේල් පාරෙන් පහළට බැස ඔහු පැමිණි කැබ් රථයට ගොඩ වීමි.

"මොකක්ද 'කොරෝශෝ' කියන්නේ?" මම විරාන්ගෙන් ඇසීමි.

"රුසියානු භාෂාවෙන් හරි, හරි කියන එක." විරාන් සිනා සෙමින් පැවසීය.

"ඒ මගේ ආදරණීය ලාඩා, එයා බය වෙලා, ලාඩා කියන්නේ ස්ලාව් මිථ්‍යා කතාවල ඉන්න සුන්දරත්වයට අධිපති දෙවඟනගෙ නම, ඒ නමටම ගැළපෙන රුසියානු කෙල්ලෙක්, යක්කු ගස් නඟින වෙලාවෙ සයිබීරියානු සීතලෙන් ගැහි ගැහි එයා අපි ගැන කලබල වෙලා..." රථය පණ ගන්වන අතර ඔහු එයට එකතු කළේය.

"විරාන්, මම දන්නවා උඹ මේ කතා කියන්නේ මාව සන්සුන් කරන්න කියල, මම සන්සුන් වෙලා ඉන්නේ. දැන් මට දැනගන්න ඕන මොනවාද වෙන්නේ කියල..."

"මම පැහැදිලි කරන්නම් මචං, ඒත් අපි පුළුවන් තරම් ඉක්මනින්, පුළුවන් තරම් වේගයෙන්, මෙතැනින් පුළුවන් තරම් ඈතට යන්න ඕන." විරාන් 'ඉතාම' යන වචනය බැරෑරුම් ලෙස උච්චාරණය කරමින් මගේ උඩු හිතට පමණක් සීමා නොවී යටි හිතටත් කිඳා බසින පරිදි එතැනින් පලා යෑමේ අවශ්‍යතාව අවධාරණය කළේය. කිසිත් නොකියූ මම ඔහුට අවනත වූයෙමි.

"හා හොඳයි, මං එන්නම්. හැබැයි මම උඹ කියපුව ඔක්කොම එහෙමම විශ්වාස කළා කියල හිතන්න එපා." මම පැවසීමි.

"දෙක, හතර, අට" රථය මඳ දුරක් ධාවනය වන විට විරාන් තනියම මුමුනන්න විය. මම ප්‍රශ්නාර්ථයක් සමඟ ඔහු දෙස බැලුවෙමි.

"මචං... මගෙ හිතේ තියෙනවා යම් ඉලක්කම් රටාවක් හදන නීතියක්. දෙක, හතර, අට කියන ඉලක්කම් රටාව මේ නීතියට එකඟයි. උඹට කියන්න පුළුවන් ද මොකක්ද ඒ නීතිය කියල?" විරාන් මගෙන් ඇසීය. මම මුහුණ පුලුටු කරගෙන විරාන් දෙස බලා සිටියෙමි. නැවතත් පෙර දින රැයේ කළ ලෙසින්ම මහා කලබලයකට මැදිව සිටින මගෙන් හෙතෙම විකාර ප්‍රශ්නයක් අසයි.

"දාසය, තිස් දෙක, හැට හතර කියන නොම්මරත් උඹේ ඔය නීතියට එකඟයි ද?" මම ඇසීමි.

"ඔව්."

"එහෙනම් රටාව හදන නීතිය තමා ඉස්සෙල්ල සංඛ්‍යාව දෙකෙන් වැඩි කරලා ඊළඟ එක ගන්න එක."

"නෑ, වැරදියි."

"මොකක්? විස්ස, හතළිහ, අසූව, එකසිය හැට... උඹේ නීතියට එකඟයි ද?"

"ඔව් අනිවාර්යෙන්."

"ඉතින් මේ ඉස්සෙල්ල සංඛ්‍යාව දෙකෙන් වැඩි කරලා නේ බං."

"ඔව්, ඒත් ඒක නෙමේ නීතිය."

"හරි. දෙසීය, හාරසීය, අටසීය එක්දාස් හයසීයත් උඹේ නීතියට එකඟයි ද?"

"ඔව්, ඒත් නීතිය මොකක් ද?"

මම කෝපයට පත් වීමි.

"ඉතින් ඉස්සෙල්ලා සංඛ්‍යාව දෙකෙන් වැඩි කරලා නේ බං ඊළඟ එක එන්නේ, එහෙම නෙවෙයි නම් මම දන්නේ නෑ උඹේ විකාර හේතුව."

"මචං මම උඹට කිවුවේ මගේ හිතේ තියෙන නීතිය හොයාගන්න කියල. ඒ වුණත් උඹ දිගටම කළේ උඹේ හිතට ආපු නීතිය වුණ ඉස්සෙල්ල සංඛ්‍යාව දෙකෙන් වැඩි කිරීම කියන හේතුව තහවුරු කර ගන්න විදිහෙ ප්‍රශ්න අහන එක." සන්සුන් නිවුණු හඬකින් විරාන් පැවසීය.

ඔහු නිවැරැදිය. මා දිගින් දිගටම උත්සාහ කළේ ඔහු පැවසූ ලෙසම මගේ හිතේ තිබූ දෙය තහවුරු කරගැනීමට ය. මුවින් නොබිණූ මම විරාන් දෙස බලා උන්නෙමි.

"මේක තමා සාමාන්‍ය මිනිස් ස්වභාවය, අපි එළිය හොයන්නෙ අපි හිතන දේ තහවුරු කරගන්න ඕනෑ ඒවා මිසක් ඇත්ත හොයාගන්න අවශ්‍ය දේවල් නෙවෙයි." විරාන් පැවසීය.



"හරි. මොකක් ද උඹේ නීතිය?" අවසානයේ මම විමසීමි. ඔහුගේ නීතිය වූයේ පෙර සංඛ්‍යාවට වඩා පසු සංඛ්‍යාව වැඩි එකක් වීම පමණකි. ඉතින් ඒ අනුව ආරෝහණ පටිපාටියකට ලියවුණු ඕනෑම සංඛ්‍යා පන්තියක් විරාන්ගේ නීතියට අනුකූල විය.

පරාජය බාර ගත් මම නිහඬ වීමි. අධික තෙහෙට්ටුවත් පීඩනයත් හමුවේ මට රථය තුළම නින්ද ගොස් අවදි වන විට මධ්‍යම රාත්‍රියත් පසු වී තිබිණි. කැබ් රථය පාළු පෙදෙසක නවතා තිබූ අතර විරාන් රථයෙන් පිටත දුරකතන ඇමතුමකය. මා රථයෙන් එළියට බසින හඬ අසා ඔහු ඇමතුම විසන්ධි කොට මා කරා පැමිණියේය.

"හොඳට නින්ද ගියා නේද?" ඔහු සිනා සෙමින් මගෙන් ඇසුවේය.

"ඉතින් උඹට කොහොමද මචං?" කිසිවක් නොවුණ ලෙසකින් සහ මේ දැන් හදිසියේම ඔහු මට හමු වුණාක් වැනි ස්වරයකින් විරාන් මගේ දරු දෙදෙනා ගැනත් බිරිය ගැනත් විමසා සිටියේය. ඒවාට මම නොසැලකිලිමත් ලෙස පිළිතුරු දුනිමි.

ඉන් පසුව රථය තුළ වූ පරිගණකය විවෘත කළ ඔහු එහි වූ රූප රාමු පෙළක් මට පෙන්වීය.

"දෙයියනේ!" මට කියවිණි. රාත්‍රී තැපැල් දුම්රියක් පීලි පැන මා පැය කිහිපයකට පෙර සැඟව සිටි කුටියේ ගැටී එය මුළුමනින්ම විනාශ වී ගොසිනි. විරාන් සිනා සෙමින් මා දෙස බැලුවේය.

"ඉතිං ඔහොම තමයි, මචං අපි පරිස්සම් වෙන්න ඕනෑ" යැයි පවසමින් කුටියෙන් ගෙනා රවුටරය, පරිගණකය ඇතුළු දේවල් පාර අයිනේ ගොඩගසා ඒවාට ගිනි තැබීය. මගේ නොසැලකිලිමත් බව නිසා හට ගත් කුමක් හෝ හේතුවක් නිසා විනාශ කිරීමට සිදු වූ ඉලෙක්ට්‍රොනික උපාංග දෙස බලමින් මම පශ්චාත්තාප වීමි.

"අපරාදේ....!"

එවිට විරාන් සිනා සෙමින් මදෙස බැලීය.

"මුදල් වටිනාකම අතින් ගත්තොත් මේක සැලකිය යුතු දෙයක් වත් නෙමේ, ඒත් උඹ උන්නු කුටිය ආවරණය කරලා ෆැරඩේ කූඩුවක් තනලා තිබුණෙ සුපිරි සන්නායකවලින්. ඒ කුටියේ වටිනාකම ඇමෙරිකන් ඩොලර් මිලියන සීයකටත් වැඩියි...!"

"මොනවා..? එච්චර?"

"ඔව් රන්ජන්, හැබැයි මුදල් කියන්නේ එහිම වූ වටිනාකමක් නැති, මිනිස්සු පිළිගන්න නිසා පමණක් වටිනාකමක් ආදේශ වුණු හුවමාරු මාධ්‍යයක්. ඉතිං ඒ ගැන අපි කවුරුත් ලොකුවට කරදර වෙන්නෙ ඕනෑ නෑ. ඒත් උඹේ අතේ ඔය තියෙන සංකීර්ණ ගණකය හදන්න මේ ලෝකෙ තියන ඉතාම දුර්ලභ ඛනිජ සහ ලෝහ පාවිච්චි කරනව. ඒ වගේ ඇත්තටම දුර්ලභ දේවල් හැර අනිත්වා සැබෑ ප්‍රශ්න නෙවෙයි."

"හරි. මට මේ ඔක්කොම පැහැදිලි කරපං මචං... බග්ස්ල කියන්නේ කවුද? මෙටා පැටර්න් කියන්නේ මොකක් ද? මගෙ ඔළුව යකාගෙ කම්මල වගේ." මම විරාන්ගෙන් ඉල්ලා සිටියෙමි.

"අපි යමු, මම ඔක්කොම කියල දෙන්නම්."

අනතුරුව අපි නැවතත් කැබ් රථයේ නැඟී ගමන් කරමින් සිටියෙමු. මඳ නිහඬ බවකින් පසුව විරාන් මා මෙතෙක් විශ්වාස කළ යථාර්ථය මගේ දෑස් ඉදිරියේ නිරුවත් කිරීම ඇරඹීය.

මතු සම්බන්ධයි

**රංගන ප්‍රෂාද් ආරියදාස**

වර්ෂ 2021ක් වූ අප්‍රේල් මස 12 වැනිදා සඳුදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.